# අ.පො.ස.(උ.පෙළ)විභාගය

## වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යූහය හා මූලාකෘති ප්‍රශ්න

## 5 වෙළුම

51 - චිත්‍ර කලාව
52 - නර්තනය (දේශීය)
54 - සංගීතය (පෙරදිග)
56 - සංගීතය (බටහිර)
57 - නාට්‍ය හා රංග කලාව (සිංහල)
59 - නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
NETS

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස.(උ.පෙළ) විභාගය

## වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න

## 5 වෙළුම

51 - චිත්‍ර කලාව

52 - නර්තනය (දේශීය)

54 - සංගීතය (පෙරදිග)

56 - සංගීතය (බටහිර)

57 - නාට්‍ය හා රංග කලාව (සිංහල)

59 - නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා
ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න
5 වෙළුම

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ප්‍රථම මුද්‍රණය - 2018

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**මූල්‍ය අනුග්‍රහය**

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) මගිනි.

# විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

කිසියම් පාඨමාලාවකින් ලබාගත් දැනුම හා අවබෝධය මැනීමට විවිධ ක්‍රමවේද උපයෝගී කර ගැනෙයි. ඒ අතුරින් ලිඛිත විභාග වර්තමානයේ භාවිත වන වඩාත් ප්‍රචලිත ක්‍රමයයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සම්පිණ්ඩිත ඇගයීම් ක්‍රමවේදය අතර සම්බන්ධතාවක් එමගින් ගොඩනැගෙන බවත්, සාධන මට්ටම් තීරණය වන බවත් සැලකිල්ලට ගැනෙයි.

වසර 2017 දී 12 ශ්‍රේණිය සඳහා නව විෂය නිර්දේශ හඳුන්වා දෙනු ලැබී ය. එම සිසුන් අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා ප්‍රථම වතාවට පෙනී සිටිනුයේ 2019 වසරේ දී ය. එම සංශෝධිත විෂය නිර්දේශවලට අනුකූල ව 2019 සහ ඉන් පසුව පැවැත්වෙන අ.පො.ස.(උ.පෙළ) විභාග සඳහා පෙනී සිටින සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ මූලාකෘති ප්‍රශ්න මෙහි ඇතුළත් කර ඇත.

අ.පො.ස.(උ.පෙළ) විෂය නිර්දේශ සංශෝධනය වීමත් සමග ඊට උචිත පරිදි ප්‍රශ්න පත්‍රවල ව්‍යුහයේ ද වෙනස්කම් සිදු කිරීමට ද අවශ්‍ය විය. ඒ අනුව විෂය කාණ්ඩ ගොනු කර, එක් එක් කාණ්ඩ තුළ ප්‍රශ්න පත්‍ර ව්‍යුහයේ අනන්‍යතාව රැක ගැනීමට උත්සාහ දරා ඇත. ඒ ඒ විෂයන්ට අදාළ විද්වත් කමිටු මගින් මෙම ව්‍යුහ තීරණය කරන ලද අතර, ඒ අනුව මූලාකෘති ප්‍රශ්න ද සකස් කෙරිණි.

අධ්‍යාපන මිනුම් සහ ඇගයුම් පිළිබඳ විශ්වාසය සහ අවධානය වැඩි වෙමින් පවතින යුගයක අ.පො.ස.(උ.පෙළ) මට්ටමේ දී එම ඇගයුම් කාර්යය කෙරෙන්නේ කෙසේ දැයි සියලු පාර්ශ්ව දැනුවත් කිරීම වැදගත් ය. අ.පො.ස.(උ.පෙළ) විභාගය ප්‍රධාන වශයෙන් සහතිකකරණය අරමුණු කරගත් සාධන පරීක්ෂණයකි. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වෙනත් ජාතික මෙන්ම ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන විසින් මෙම විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනෙන නිසා මෙහි තේරීම් පරීක්ෂණයක ලක්ෂණ ද ගැබ්ව ඇත. එබැවින් මෙම කෘතියෙහි දැක්වෙන ප්‍රශ්න පත්‍ර ව්‍යුහ සහ මූලාකෘති, ප්‍රශ්න පරිශීලනය කිරීම මගින් සිසුන්ට මෙම විභාගයේ දී මුහුණ දීමට සිදුවන්නේ කුමන ආකාරයේ ඇගයීමකට ද යන්න පිළිබඳ ව මනා අවබෝධයක් ලබාගත හැකි ය. එම නිසා සිසුන් විභාගයට සූදානම් කිරීමේ දී පාසල්වල විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ටත් ඒ හා සම්බන්ධ මගපෙන්වන්නන්ටත් පාසල් ප්‍රජාවටත් මෙය මහෝපකාරී වනු ඇත.

මෙම උපදෙස් සංග්‍රහයෙහි I කොටසෙහි විභාගය සම්බන්ධ පොදු තොරතුරු ද, II කොටසෙහි ප්‍රශ්න පත්‍රවල ව්‍යුහ සහ ස්වභාවය ද ඇතුළත් වන අතර III කොටසෙහි එක් එක් විෂයය සඳහා මූලාකෘති ප්‍රශ්න ඇතුළත් වේ.

මෙහි ඇතුළත් ප්‍රශ්න පත්‍ර ව්‍යුහ හා මූලාකෘති ප්‍රශ්න සකස් කිරීමේ දී සහයෝගය දුන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරී මණ්ඩලයටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, සියලු ම විෂයන්හි පාලක පරීක්ෂකවරුන්ටත්, සම්පත් පුද්ගල මහත්ම මහත්මීන්ටත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලයටත් මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනටත් (ESDP) මෙය මැනවින් මුද්‍රණය කර දුන් විශ්ව ග්‍රැෆික්ස් ආයතනයේ කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2018.10.10

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රී අබේගුණසේකර<br>විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | ජේ.ඒ.ජේ.ආර්. ජයකොඩි<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **සහය සම්බන්ධීකරණය** | : | කේ.ඒ.එච්.එච්. කුරුප්පු<br>සහකාර විභාග කොමසාරිස් |
| | | එල්.ජී.එස්. සමරකෝන්<br>සහකාර විභාග කොමසාරිස් |
| | | ඒ. ක්‍රිෂ්ණගෝපි<br>සහකාර විභාග කොමසාරිස් |
| | | ඩී. ආර්. එන්. කේ. ගමගේ<br>සහකාර විභාග කොමසාරිස් |
| | | පී. ඒ. වෙනුර චන්දික<br>සහකාර විභාග කොමසාරිස් |
| | | කේ. එම්. ජයන්ත කුමාර<br>සහකාර විභාග කොමසාරිස් |
| | | කේ.ඩබ්ලිව්. නිලංකා කිරිඇල්ල<br>සහකාර විභාග කොමසාරිස් |
| **පරිගණක පිටු සැකසුම** | : | කේ.පී.ඩී.ඒ. මදුවන්ති දිසානායක<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර |
| | | ඕ. එම්. දර්ශනී සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| | | එම්. ඒ. චතුරිකා මධුමාලි<br>දත්ත සටහන් සහකාර |
| | | ආර්. ඩී. ඉෂානි කෞෂල්‍යා<br>දත්ත සටහන් සහකාර |
| | | පී. එච්. ඉමාෂා රාජපක්ෂ<br>දත්ත සටහන් සහකාර |
| | | එස්. ඉන්දූෂා<br>දත්ත සටහන් සහකාර |
| **පිටකවරය නිර්මාණය** | : | එස්.එච්. සමන් කුමාර<br>කළමනාකරණ සහකාර |

# ඇතුළත පිටු

**පිටු අංකය**

I කොටස

විභාගය හා සම්බන්ධ පොදු තොරතුරු ............................................................... 1

II කොටස

ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය හා ස්වභාවය ..................................................................... 6

III කොටස

මූලාකෘති ප්‍රශ්න ........................................................................................... 7

(51) චිත්‍ර කලාව ........................................................................................... 9

(52) නර්තනය (දේශීය) ...................................................................................... 22

(54) සංගීතය (පෙරදිග) ..................................................................................... 31

(56) සංගීතය (බටහිර) ....................................................................................... 44

(57) නාට්‍ය හා රංග කලාව (සිංහල) ...................................................................... 100

(59) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) ...................................................................... 146

ඇමුණුම 01 ................................................................................................. 159

ඇමුණුම 02 ................................................................................................. 182

ඇමුණුම 03 ................................................................................................. 186

# I කොටස
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

## විභාගය හා සම්බන්ධ පොදු තොරතුරු

## 1. හැඳින්වීම

අ.පො.ස.(උ.පෙළ) විභාගය ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. මෙය ප්‍රධාන වශයෙන් සහතිකකරණ විභාගයක් වශයෙන් පැවැත්වුව ද විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට සහ අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීමත් මෙම විභාගයේ ප්‍රතිඵල මත පදනම් ව සිදු කරන බැවින් මෙය තේරීමේ විභාගයක් වශයෙන් ද භාවිත වේ.

එසේම මධ්‍යම මට්ටමේ රැකියා ලබාගැනීම සඳහා ද මෙම විභාගයේ ප්‍රතිඵල මූලික සුදුසුකමක් වශයෙන් සැලකේ. වර්ෂ 2014 දක්වා අ.පො.ස.(උ.පෙළ) විභාගය 12 සහ 13 ශ්‍රේණිවල විෂය නිර්දේශ පදනම් කොටගෙන ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය හා කලා යන විෂය ධාරා හතර යටතේ පැවති අතර 2015 වසරේ සිට ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය, කලා, ඉංජිනේරු තාක්ෂණවේදය සහ ජෛවපද්ධති තාක්ෂණවේදය යන විෂය ධාරා යටතේ විභාගය පැවැත්වේ.

## 2 විභාගය සඳහා ඉල්ලුම් කිරීම

### 2.1 පාසල් අයදුම්කරුවෝ

විභාගයට අයදුම් කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ පාසල් අයදුම්කරුවන්ගේ නම්, ඉල්ලුම් කරනු ලබන විෂය හා මාධ්‍යය යන තොරතුරු ද සමග විදුහල්පති විසින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එහිදී අයදුම්කරුවන්ගේ නම උප්පැන්න සහතිකයේ තිබෙන ආකාරයට නිවැරදි ව සම්පූර්ණ කිරීමත් විෂයය, විෂය අංක හා මාධ්‍යය නිවැරදි ව සටහන් කිරීමත් පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කළ යුතු ය.

### 2.2 පෞද්ගලික අයදුම්කරුවෝ

පාසල පදනම් කරගත් නව තක්සේරුකරණ වැඩපිළිවෙළ යටතේ පන්ති කාමරය තුළ තක්සේරුකරණය සිදු කිරීම බාහිර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/01/12/12/05/08/i හා 2017.10.31 දිනැති ලිපිය මගින් පෞද්ගලික අයදුම්කරුවන් එම අවශ්‍යතාවෙන් නිදහස් කර ඇත. (ඇමුණුම 03)

විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ලබන පුවත්පත් දැන්වීමක් මගින් පෞද්ගලික අයදුම්කරුවන් සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී එසේ ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්‍රයක් නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට් පත්‍රය ද සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත පුවත්පත් දැන්වීමෙහි සඳහන් පරිදි නියමිත දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

## 3. විෂය තෝරා ගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කොට ඇති අංක 2016/13 හා 2016.04.26 දිනැති **"අ.පො.ස.(උ.පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන"** යන චක්‍රලේඛය (ඇමුණුම 01) අනුව මෙම විභාගයේ දී විෂයන් තෝරාගත යුතුය.

අ.පො.ස.(උ.පෙළ) සඳහා නව විෂය නිර්දේශ 2017 වසරේ 12 ශ්‍රේණිය සඳහා හඳුන්වා දුන් අතර, එම විෂය නිර්දේශ පදනම් කොටගෙන ප්‍රථම වතාවට අ.පො.ස. (උ.පෙළ) විභාගය පැවැත්වෙන්නේ 2019 වසරේ දී ය. ඉහත සඳහන් 2016/13 චක්‍රලේඛයේ අඩංගු විධිවිධාන අනුව ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය, කලා, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂය ධාරා සඳහා අදාළ විෂයයන් තෝරාගත යුතු ය.

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා ප්‍රධාන විෂයයන් තුනකට පෙනී සිටිය යුතු අතර ඊට අමතරව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමට බලාපොරොත්තු වන සිසුන් "**සාමාන්‍ය පොදු පරීක්ෂණය**" ප්‍රශ්න පත්‍රයෙන් ද සමත් විය යුතු ය. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා නොබැලුව ද "**සාමාන්‍ය ඉංග්‍රීසි**" ප්‍රශ්න පත්‍රයට ද සිසුන්ගේ අභිමතය පරිදි පෙනී සිටිය හැකිය.

### 3.1 අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා අනුමත විෂය

සියලුම විෂය ධාරා සඳහා ශිෂ්‍යයන් විසින් තෝරාගත යුතු විෂය සංයෝජන පිළිබඳ කොන්දේසි ඇමුණුම 01 හි ඇතුළත් අංක 2016/13 චක්‍රලේඛයෙහි සඳහන් වේ.

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා අනුමත විෂය සහ විෂය අංක පහත දැක්වේ. විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ දී අදාළ විෂය අංක භාවිත කළ යුතු ය.

| | විෂයය | විෂයය අංකය | |
|---|---|---|---|
| (01) | භෞතික විද්‍යාව | 01 | |
| (02) | රසායන විද්‍යාව | 02 | |
| (03) | ගණිතය | 07 | |
| (04) | කෘෂි විද්‍යාව | 08 | |
| (05) | ජීව විද්‍යාව | 09 | |
| (06) | සංයුක්ත ගණිතය | 10 | |
| (07) | උසස් ගණිතය | 11 | |
| (08) | සාමාන්‍ය පොදු පරීක්ෂණය | 12 | |
| (09) | සාමාන්‍ය ඉංග්‍රීසි | 13 | |
| (10) | සිවිල් තාක්ෂණවේදය | 14 | |
| (11) | යාන්ත්‍රික තාක්ෂණවේදය | 15 | |
| (12) | විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය | 16 | |
| (13) | ආහාර තාක්ෂණවේදය | 17 | |
| (14) | කෘෂි තාක්ෂණවේදය | 18 | |
| (15) | ජෛව සම්පත් තාක්ෂණවේදය | 19 | |
| (16) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 20 | |
| (17) | ආර්ථික විද්‍යාව | 21 | |
| (18) | භූගෝල විද්‍යාව | 22 | |
| (19) | දේශපාලන විද්‍යාව | 23 | |
| (20) | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 24 | |
| (21) | ශ්‍රී ලංකා ඉතිහාසය | 25 | I පත්‍රය |
| (22) | ඉන්දීය ඉතිහාසය | 25A | |
| (23) | යුරෝපා ඉතිහාසය | 25B | II පත්‍රය |
| (24) | නූතන ලෝක ඉතිහාසය | 25C | |
| (25) | ගෘහ ආර්ථික විද්‍යාව | 28 | |
| (26) | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | 29 | |

| | | |
|---|---|---|
| (27) | ව්‍යාපාර සංඛ්‍යානය | 31 |
| (28) | ව්‍යාපාර අධ්‍යයනය | 32 |
| (29) | ගිණුම්කරණය | 33 |
| (30) | බුද්ධ ධර්මය | 41 |
| (31) | හින්දු ධර්මය | 42 |
| (32) | ක්‍රිස්තියානි ධර්මය | 43 |
| (33) | ඉස්ලාම් | 44 |
| (34) | බෞද්ධ ශිෂ්ටාචාරය | 45 |
| (35) | හින්දු ශිෂ්ටාචාරය | 46 |
| (36) | ඉස්ලාම් ශිෂ්ටාචාරය | 47 |
| (37) | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | 48 |
| (38) | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 49 |
| (39) | චිත්‍ර කලාව | 51 |
| (40) | නර්තනය (දේශීය) | 52 |
| (41) | නර්තනය (භරත) | 53 |
| (42) | සංගීතය (පෙරදිග) | 54 |
| (43) | සංගීතය (කර්ණාටක) | 55 |
| (44) | සංගීතය (බටහිර) | 56 |
| (45) | නාට්‍ය හා රංග කලාව (සිංහල) | 57 |
| (46) | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | 58 |
| (47) | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | 59 |
| (48) | ඉංජිනේරු තාක්ෂණවේදය | 65 |
| (49) | ජෛවපද්ධති තාක්ෂණවේදය | 66 |
| (50) | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 67 |
| (51) | සිංහල | 71 |
| (52) | දෙමළ | 72 |
| (53) | ඉංග්‍රීසි | 73 |
| (54) | පාලි | 74 |
| (55) | සංස්කෘත | 75 |
| (56) | අරාබි | 78 |
| (57) | මැලේ | 79 |
| (58) | ප්‍රංශ | 81 |
| (59) | ජර්මන් | 82 |
| (60) | රුසියන් | 83 |
| (61) | හින්දි | 84 |
| (62) | චීන | 86 |
| (63) | ජපන් | 87 |

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා උක්ත විෂයයන් අතුරෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 2016/13 චක්‍රලේඛයට අනුව ප්‍රධාන විෂයයන් තුනක් තෝරාගත හැකිය. එම ප්‍රධාන විෂයයන්ට අමතරව මෙම විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය සහ සාමාන්‍ය ඉංග්‍රීසි යන විෂයයන් දෙක සඳහා ද ඉදිරිපත් විය යුතු ය.

* **සාමාන්‍ය පොදු පරීක්ෂණය (12)**

  ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකට අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ඇතුළත් වීම සඳහා මෙම විෂය සඳහා තීරණය කරනු ලබන අවම ලකුණු මට්ටමක් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. එක් අවස්ථාවක දී මෙම් සුදුසුකම සපුරා තිබීම පසු අවස්ථාවක විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ කර ගත හැකිය. මෙම විෂය සඳහා ලබාගන්නා ලකුණු, Z ලකුණ ගණනය කිරීම සඳහා අදාළ කරගනු නොලැබේ.

* **සාමාන්‍ය ඉංග්‍රීසි (13)**

  මෙම විෂයය අ.පො.ස.(උ.පෙළ) ප්‍රධාන විෂයයක් නොවේ. සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා ලබා ගන්නා ලකුණු හෝ සාමාර්ථය හෝ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කරගනු නොලැබේ. එහෙත් මෙම විෂයය සඳහා ලබාගන්නා ප්‍රතිඵලය අ.පො.ස.(උ.පෙළ) විභාග සහතිකයේ වෙනම සටහන් කෙරේ.

## 4. ශ්‍රේණි තීරණය කිරීම

එක් එක් විෂයය සඳහා ලබාගන්නා දළ ලකුණු අනුව පහත සඳහන් ආකාරයට ශ්‍රේණි තීරණය කෙරේ.

| ලකුණු පරාසය | ශ්‍රේණිය |
|---|---|
| 75 - 100 | A - විශිෂ්ට සාමාර්ථය - (Distinction Pass) |
| 65 - 74 | B - අධිසම්මාන සාමාර්ථය - (Very Good Pass) |
| 50 - 64 | C - සම්මාන සාමාර්ථය - (Credit Pass) |
| 35 - 49 | S - සාමාන්‍ය සාමාර්ථය - (Ordinary Pass) |
| 00 - 34 | F - අසමත් - (Fail) |

## 5. පාසල පදනම් කරගත් තක්සේරුකරණය

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති අංක 23/2017 හා 2017.06.01 දිනැති “පාසල පදනම් කරගත් තක්සේරුකරණය 6 - 13 ශ්‍රේණි සඳහා වර්ෂ 2017 සහ ඉන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම” යන චක්‍රලේඛය (ඇමුණුම 02) අනුව මෙම වැඩපිළිවෙළ 2017 සිට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී.

### 5.1 අරමුණු

12 හා 13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන්ගේ අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී මැනිය නොහැකි හැකියා, නිපුණතා ආදිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකෙරෙන අතරතුර මැන බැලීමත් දුබලතා හා ප්‍රබලතා හඳුනාගෙන දුබලතා ඇති සිසුන් සිටිත් නම් ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මෙහි අරමුණ වේ. මෙම වැඩපිළිවෙළ යටතේ පන්ති කාමරයේදී ඉගෙනුම ලබන විෂයයන් සඳහා තක්සේරුකරණය සිදුකරනු ලබන අතර සිසුන් විසින් සිදු කරනු ලබන කණ්ඩායම් ව්‍යාපෘතිය ද තක්සේරුකරණයට භාජනය කෙරේ.

### 5.2 තක්සේරුකරණය සිදු කෙරෙන ආකාරය

5.2.1 පන්ති කාමරයේ ඉගෙනුම ලබන විෂයයන් සඳහා තක්සේරුකරණය

(අ) පන්ති කාමරයේ ඉගෙනුම ලබන සෑම විෂයයක් සඳහා ම වාරයකට එක් අවස්ථාවක් මගින් තක්සේරුකරණය සිදු කෙරේ.

(ආ) මෙහිදී පාසල පදනම් කරගත් තක්සේරුකරණය සඳහා හඳුන්වා දී ඇති ඉගෙනුම් - ඉගැන්වීම් තක්සේරුකරණ ප්‍රභේද භාවිත කළ යුතුය.

(ඇ) පන්ති කාමරයේ ඉගෙනුම ලබන සෑම විෂයයක් සඳහා ම වාරයකට තක්සේරුකරණ අවස්ථා එක බැගින් 12 ශ්‍රේණියේ වාර තුන සඳහා තක්සේරුකරණ අවස්ථා 03ක් ද, 13 ශ්‍රේණියේ 1 හා 2 වාර සඳහා තක්සේරුකරණ අවස්ථා 02ක් ද වශයෙන් අවුරුදු දෙක සඳහා තක්සේරුකරණ අවස්ථා 05 ක් සිදු කෙරේ.

(ඈ) මෙම තක්සේරුකරණ අවස්ථා 05 හි ලකුණු, 13 වන ශ්‍රේණියේ දෙවන වාරය අවසානයේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගනු ලැබේ. මෙම ලකුණු අනුව තීරණය කරනු ලබන නිපුණතා මට්ටම් අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල ලේඛනයේ වෙනම තීරයක පහත සඳහන් ආකාරයට ඇතුළත් කෙරේ.

| පාසල පදනම් කරගත් තක්සේරුකරණ ලකුණු | නිපුණතා මට්ටම | |
|---|---|---|
| 9, 10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව | - (Excellent Level Competency) |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව | - (High Level Competency) |
| 6, 7 | සම්මාන මට්ටමේ නිපුණතාව | - (Credit Level Competency) |
| 4, 5 | ආසන්න නිපුණතාව | - (Near Competency) |
| 1, 2, 3 | නිපුණතා මට්ටමට ළඟා නොවූ | - (Not reached the Competency Level) |

5.2.2 කණ්ඩායම් ව්‍යාපෘතිය මගින් තක්සේරුකරණය

පළමුවතාවට අ.පො.ස.(උ.පෙළ) හදාරණ සෑම සිසුවකුම කණ්ඩායම් ව්‍යාපෘතිය නිම කළ යුතු ය.

5.2.2.1 කණ්ඩායම් ව්‍යාපෘතිය

(අ) කණ්ඩායම් ව්‍යාපෘතිය සඳහා සිසුන් 6 සිට 10 දෙනකුගෙන් යුක්ත කණ්ඩායමක් පාසලේ අදාළ ගුරුභවතුන් විසින් නම් කළ යුතු ය.

(ආ) කණ්ඩායම් ව්‍යාපෘතිය සඳහා ද කණ්ඩායම මගින් සුදුසු මාතෘකාවක් ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතු ය.

(ඇ) 12 ශ්‍රේණිය 3 වන වාරය සහ 13 ශ්‍රේණිය I වන වාරය ඇතුළත දී මෙම ව්‍යාපෘතියේ කටයුතු නිම කළ යුතු ය.

(ඈ) කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, විවිධ ආයතන හා පුද්ගලයින් සමග කටයුතු කිරීම සහ ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලබාදීම මෙම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වේ.

5.2.2.2 ව්‍යාපෘතිය තක්සේරුකරණය

(අ) නිර්ණායක 5ක් යටතේ ව්‍යාපෘතිය තක්සේරු කෙරෙන අතර ගුරුභවතුන් විසින් එක් එක් නිර්ණායකය අනුව සිසුන් කටයුතු කර ඇති ආකාරය අධ්‍යයනය කොට ලකුණු ලබා දීම සිදු කරනු ඇත.

(ආ) ව්‍යාපෘතිය සඳහා මුළු ලකුණු 20 ක් ලබා දෙන අතර එම ලකුණු විභාග දෙපාර්තමේන්තුවට ගෙන්වා ගෙන 10 ට පරිවර්තනය කරනු ලැබේ.

(ඇ) මෙම ව්‍යාපෘතියේ ලකුණු අනුව තීරණය කරනු ලබන නිපුණතා මට්ටම ද, 5.2.1 (ඈ) හි සඳහන් ආකෘතියට අනුව අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල ලේඛනයෙහි ඇතුළත් කෙරේ.

## II කොටස

### අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

| විෂය අංකය සහ විෂයය | I පත්‍රය | | | | | | | | | II පත්‍රය | | | | | | | | | | | | | III පත්‍රය/ ප්‍රායෝගික පරීක්ෂණය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | I කොටස | | | | II කොටස | | | | | I කොටස | | | | | II කොටස | | | III කොටස | | | | | | | |
| | කාලය (පැය) ** | ප්‍රශ්න ස්වභාවය * | වරණ සංඛ්‍යාව | ප්‍රශ්න සංඛ්‍යාව | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | ප්‍රශ්න ස්වභාවය * | ප්‍රශ්න සංඛ්‍යාව | තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | | කාලය (පැය) ** | ප්‍රශ්න ස්වභාවය * | වරණ සංඛ්‍යාව | ප්‍රශ්න සංඛ්‍යාව | අනිවාර්යය ප්‍රශ්න සංඛ්‍යාව | තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | ප්‍රශ්න ස්වභාවය * | ප්‍රශ්න සංඛ්‍යාව | තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | ප්‍රශ්න ස්වභාවය * | ප්‍රශ්න සංඛ්‍යාව | තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව | කාලය (පැය) ** | ප්‍රශ්න ස්වභාවය * | ප්‍රශ්න සංඛ්‍යාව / අයිතම සංඛ්‍යාව | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව/ ඉදිරිපත් කළ යුතු අයිතම සංඛ්‍යාව |
| (51) චිත්‍ර කලාව | 3 | 1 | 5 | 40 | 40 | 3 | 7 | 4/7 | 'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ', 'ඉ' කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් | 3 | 6 | | 1 | 1 | | | | | | | | 1 | 3 | 6 | 10 | 1 |
| (52) නර්තනය (දේශීය) | 2 | 1 | 5 | 25 | 25 | 2 | 25 | 25 | | 3 | 3 | | 2 | 2 | | 3 | 3 | 1/3 හෝ 2/3 | 3 | 3 | 1/3 හෝ 2/3 | 5/8 | • | 6 | 10 | 10 |
| (54) සංගීතය (පෙරදිග) | 2 | 1 | 5 | 30 | 30 | 2 | 20 | 20 | | 3 | 3 | | 3 | | 2/3 | 3 | 2 | 1/2 | 3 | 3 | 2/3 | 5/8 | • | 6 | 10 | 10 |
| (56) සංගීතය (බටහිර) | 2 | 1 | 5 | 25 | 25 | 2 | 25 | 25 | | 3 | 3 | | 1 | 1 | | 3 | 3 | 2/3 | 3 | 3 | 2/3 | 5/7 | • | 6 | 4 | 4 |
| (57) නාට්‍ය හා රංග කලාව (සිංහල) | 3 | 1 | 5 | 40 | 40 | 3 | 6 | 4/6 | එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් | 3 | 1 | 5 | 40 | 40 | | 3 | 6 | 4/6 | | | | II කොටසේ A, B වලින් ප්‍රශ්න දෙක බැගින් ප්‍රශ්න හතරකට | • | 6 | 4 | 4 |
| (59) නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | 3 | 1 | 5 | 40 | 40 | 3 | 6 | 4/6 | | 3 | 1 | 5 | 40 | 40 | | 3 | 6 | 4/6 | | | | | • | 6 | 10 | 10 |

* **ප්‍රශ්න ස්වභාවය**

1. බහුවරණ
2. වෙනත් වාස්තවික
3. ව්‍යුහගත
4. අර්ධ ව්‍යුහගත
5. රචනා
6. ප්‍රායෝගික

• එක් එක් ප්‍රායෝගික පරීක්ෂණයට අනුරූපව කාලය වෙන් කෙරේ.

** කාලය පැය **තුනක්** ලබාදී ඇති සියලු ම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න කියවා පිළිතුරු ලියන ප්‍රශ්න තෝරාගැනීමට **පැය තුනට අමතර විනාඩි 10 ක කාලයක්** දෙනු ලැබේ.

## III කොටස
## මූලාකෘති ප්‍රශ්න

අ.පො.ස.(උ.පෙළ) විභාගය ද්විතීයික අධ්‍යාපනය අවසානයේ පැවැත්වෙන අවසාන සහතිකකරණ විභාගයයි. මෙම විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල, වෙනත් උසස් අධ්‍යාපන ආයතන සහ අධ්‍යාපන විද්‍යාපීඨ වැනි ආයතනවලට සිසුන් තෝරා ගැනීම ද සිදු කෙරෙන බැවින් මෙහි තේරීමේ පරීක්ෂණයක ලක්ෂණ ද අඩංගු වේ.

ඒ අනුව අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී සාධන පරීක්ෂණයක තිබිය යුතු ලක්ෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු අතර, මෙහි ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් තේරීම ද සිදු කරන බැවින් ඒ පිළිබඳ ව ද අවධානය යොමු කර ඇත.

ඒ අනුව ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ලිඛිත විභාග ක්‍රමයේ දී ප්‍රධාන වශයෙන් ම රචනා පරීක්ෂණ සහ වාස්තවික (විෂය බද්ධ) පරීක්ෂණ භාවිත කෙරේ. රචනා ස්වරූපයේ පිළිතුරක දී පරීක්ෂකයාගේ පුද්ගල බද්ධතාව බලපාන අතර වාස්තවික ස්වභාවයේ ප්‍රශ්නයක් සඳහා එක් නිවැරදි පිළිතුරක් පමණක් තිබීම නිසා එය සම්පූර්ණයෙන් ම පුද්ගල බද්ධතාවෙන් තොර වේ. මෙම රචනා සහ වාස්තවික යන අන්ත දෙක අතරට ගැනෙන “ව්‍යුහගත කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න” කෙරෙහි වර්තමාන පරීක්ෂණ ක්ෂේත්‍රයේ වැඩි අවධානයක් යොමු වී තිබේ. ව්‍යුහගත ප්‍රශ්නයක් මගින් දිය යුතු පිළිතුරු, ප්‍රශ්නයෙන් කියවෙන යම් යම් සීමා තුළ ඇඩි සේ පාලනය කෙරේ. ඒ අනුව පිළිතුරු පත් ලකුණු කිරීමේ දී පරීක්ෂකවරුන් අතරේ ලකුණු දීමේ සංගතතාව ආරක්ෂා කරගත හැකි වන නිසා වාස්තවික හා ව්‍යුහගත ස්වරූපයේ ප්‍රශ්නවලට පරීක්ෂණ ක්ෂේත්‍රයේ වැදගත් ස්ථානයක් හිමි වේ.

ඒ අනුව අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී ද අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් රචනා ප්‍රශ්න භාවිත කෙරෙන අතර වාස්තවික වර්ගයේ ප්‍රශ්න සකස් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. එසේම අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී හුදෙක් ස්මරණය මත පමණක් නොරැඳී අවබෝධය, භාවිතය, විශ්ලේෂණය, සංශ්ලේෂණය සහ ඇගයීම වැනි ඉහළ මානසික හැකියා මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න සකස් කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. හැකිතාක් දුරට ප්‍රායෝගික සිද්ධිවලට අදාළ ව ප්‍රශ්න සකස් කෙරෙන අතර එහිදී යමක් පැහැදිලි ව තේරුම් ගැනීම, උගත් මූලධර්ම වෙනත් සමාන අවස්ථාවක දී යොදා ගැනීම, ගැටලු විසඳීම, තර්කනය, නව යෝජනා/සැලසුම් ඉදිරිපත් කිරීම, කරුණු සංසන්දනය කිරීම, භාෂාව මැනවින් භාවිත කිරීම සහ අදහස් පැහැදිලි ව ඉදිරිපත් කිරීම ආදී හැකියා සිසුන් තුළ කොතෙක් දුරට වර්ධනය වී ඇත්දැයි මැන බැලෙන ආකාරයට එම ප්‍රශ්න සකස් කෙරෙනු ඇත.

මෙම III වන කොටසෙහි, ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු පිරිනැමෙන ආකාරය සමග මූලාකෘති ප්‍රශ්න ඇතුළත් කර ඇති අතර ඒවා **ආදර්ශ ප්‍රශ්න පත්‍ර නොවේ**. එබැවින් ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී ප්‍රශ්නවල අන්තර්ගත **අනුකොටස් සංඛ්‍යාව සහ ලකුණු බර තැබෙන ආකාරය** ප්‍රශ්න සකස් කිරීම සඳහා පදනම් කර ගැනෙන විෂය කොටස් අනුව අවස්ථානුකූල ව **වෙනස් විය හැකිය.**

මෙහි සඳහන් මූලාකෘති ප්‍රශ්නවලට අමතරව වාස්තවික සහ රචනා පරීක්ෂණ සඳහා භාවිත කෙරෙන, **8 වන පිටුවෙහි සඳහන් සියලු ම ප්‍රශ්න වර්ග ඇතුළු ව වෙනත් ප්‍රශ්න වර්ග ද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍රවලට අවස්ථානුකූල ව ඇතුළත් කිරීමේ අයිතිය විභාග කොමසාරිස් ජනරාල් සතු ය.**

වාස්තවික/විෂය බද්ධ පරීක්ෂණ (Objective Tests)

- සැපයීමේ වර්ගය (Supply Type)
- තේරීමේ වර්ගය (Selection Type)
  - ඇඳීමේ වර්ගය (Matching Type)
  - දෙවරණ වර්ගය (Alternative Type)
  - බහුවරණ වර්ගය (MCQ Type)
    - ප්‍රශ්න වර්ගය (Question Type)
    - අසම්පූර්ණ ප්‍රකාශන වර්ගය (Incomplete Statement Type)
    - ප්‍රතිෂේධාත්මක වර්ගය (Negative Type)
    - සම්බන්ධිවරණ වර්ගය (Combined Response Type)
    - හොඳම පිළිතුරු වර්ගය (Best Answer Type)
    - බහු පිළිතුරු වර්ගය (Multiple Response Type)
    - පොදු පිළිතුරු වර්ගය (Common Response Type)
    - ආදේශ වර්ගය (Substitution Type)
    - යුගල වගන්ති වර්ගය (Double Statement Type)
    - ප්‍රකාශය හා හේතුව වර්ගය (Assertion & Reason Type)

**රචනා පරීක්ෂණ (Essay Tests)**

- **රචනා වර්ගයේ ප්‍රශ්න (Essay Type Questions)**
  - විවෘත ප්‍රතිචාර වර්ගය (Open Response Type)
  - ඇවුරු ප්‍රතිචාර වර්ගය (Controlled Response Type)
- **ව්‍යුහගත රචනා ප්‍රශ්න (Structured Essay Type Questions)**
  - ආකෘතිය මගින් ව්‍යුහගත කිරීම (Structuring by using subsections)
  - සැපයෙන තොරතුරු මගින් ව්‍යුහගත කිරීම (Structuring by information provided)
  - කාර්යය මගින් ව්‍යුහගත කිරීම (Structuring by function)

# (51) චිත්‍ර කලාව

## ප්‍රශ්න පත්‍ර ව්‍යූහය

**I පත්‍රය** - **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.
I කොටස - වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40කි.** ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් **ලකුණු 40කි.**
II කොටස - මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත වේ.
"අ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - ශ්‍රී ලංකාව ව්‍යූහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**
"ආ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - ඉන්දියාව ව්‍යූහගත රචනා වර්ගයේ ප්‍රශ්න **දෙකකි.**
"ඉ" කොටස - සංස්කෘතික පසුබිම හා රසවින්දනය - යුරෝපය ව්‍යූහගත රචනා වර්ගයේ ප්‍රශ්න **දෙකකි.**
"අ" කොටසින් ප්‍රශ්න දෙකක් හා "ආ", "ඉ" යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60 කි.
I පත්‍රයට මුළු ලකුණු 100කි.

**II පත්‍රය** - **කාලය : පැය 03යි. මුළු ලකුණු 100කි.**
ද්‍රව්‍ය බලා ඇඳීම සඳහා යොමු කරවන **එක්** ප්‍රශ්නයක් පමණක් ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

**III පත්‍රය** - **කාලය : පැය 03යි. මුළු ලකුණු 100කි.**
මෙය "අ", "ආ" හා "ඉ" ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
"අ" කොටස - චිත්‍ර සංරචනය මාතෘකා 04 යි.
"ආ" කොටස - මෝස්තර නිර්මාණය මාතෘකා 03 යි.
"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ මාතෘකා 03 යි.
මෙම කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක් වර්ණ චිත්‍රයක් පමණක් නිර්මාණය කළ යුතු වේ.

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : | I පත්‍රය | = | 100 |
| | II පත්‍රය | = | 100 |
| | III පත්‍රය | = | 100 |
| | අවසාන ලකුණ | = | 300 ÷ 3 = 100 |

**I පත්‍රය**

**සැලකිය යුතුයි :**
* **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

---

**I කොටස**

ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් A, B, C, D, E ලෙස නම් කර ඇති කැටයම් ඇතුළත් පින්තූර ඇසුරින් තෝරන්න.


A


B


C


D


E

**1.** A අක්ෂරයෙන් දැක්වෙන මුරගල කැටයම

(1) අනුරාධපුර යුගයේ කැටයම් සිහිපත් කරන්නකි.

(2) නාරජ රුවක් නිරූපණය කරවන අල්පෝන්නත නිර්මාණයකි.

(3) විවිධ සංකේත එකතු වූ නව නිර්මාණයකි.

(4) විහාර දොරටුවල යෙදෙන ආරක්ෂක සංකේතයකි.

(5) අනුරාධපුර යුගයේ විශිෂ්ටතම මුරගල ලෙස සැලකේ. (.......)

**2.** B අක්ෂරයෙන් දැක්වෙන ඉසුරුමුණියේ පිහිටි ගලේ නෙළා ඇති කැටයම

(1) ශෛලීගත ලක්ෂණ නිරූපිත උන්නත නිර්මාණයකි.

(2) පිහිටි ගලේ ස්වභාවය උපයෝගී කරගනිමින් නෙළන ලද අධි උන්නත නිර්මාණයකි.

(3) ඇතුන්ගේ තාත්වික ක්‍රියාශීලී චලන නිරූපනය කෙරෙන උන්නත නිර්මාණයකි.

(4) ජලය ලැබීමේ නිමිත්ත සංකේතවත් කෙරෙන අධි උන්නත නිර්මාණයකි.

(5) ඇතුන්ගේ තාත්වික ඉරියව් නිරූපිත අධි උන්නත නිර්මාණයකි. (.......)

**3.** C අක්ෂරයෙන් දැක්වෙන කැටයම

(1) IV බුවනෙකබාහු රජ සමයේ යාපහුව මාළිගයේ කැටයම් කළ පුවරු කැටයමකි.

(2) I බුවනෙකබාහු රජ සමයේ ද්වාර මණ්ඩපය අත්තිවාරමේ ඇති කැටයම් පුවරුවකි.

(3) ගඩලාදෙණිය විහාරයේ කණුවල කැටයම් කල, කැටයම් පුවරුවකි.

(4) සංගීතකරුවන් හා නාට්‍යාංගනාවෝ දැක්වෙන ගම්පොල යුගයේ කැටයම් පුවරුවක කොටසකි.

(5) සාමාන්‍ය ජන ජීවිතයේ සිද්ධීන් පෙන්නුම් කරන කැටයම් පුවරුවකි. (.......)

**4.** D අක්ෂරයෙන් දැක්වෙන කැටයම් නිර්මාණයෙන් දැක්වෙන්නේ,

(1) එල්ලෝරාවේ කෛලාසනාථ කෝවිලේ ගර්භගෘහයේ ඇති එක් කැටයමකි.

(2) කෛලාසනාථ කෝවිලේ එක් පුවරු කැටයමකින් උපුටා ගන්නා ලද කොටසකි.

(3) මාමල්ලපුරම් හි දුර්ගා කෝවිලේ විමානයක් තුළ දක්නට ලැබෙන කොටසකි.

(4) මාමල්ලපුරම් ගංගාව රෝහණය පෙන්වන කැටයම් කොටසකි.

(5) අජන්තා ගුහාවේ දක්නට ලැබෙන ගුප්ත යුගයේ පුවරු කැටයමකින් ගත් එක් කොටසකි. (.......)

**5.** E අක්ෂරයෙන් දැක්වෙන කැටයම

(1) ඩේසියානු යුද්ධ ජයග්‍රහණය සැමරීමට කොන්ස්ටන්ටයින් අධිරාජයා ඉදි කරන ලද කුලුනු කැටයමකි.

(2) ඩේසියානු යුද්ධ ජයග්‍රහණය සැමරීමට ටයිටස් අධිරාජයා විසින් ඉදිකරන ආරුක්කු කැටයමකි.

(3) සටන් දර්ශන සහිත කොන්ස්ටන්ටයින් අධිරාජයා විසින් ඉදිකරන ලද ආරුක්කු කැටයමකි

(4) රෝමන්වරුන්ගේ බල පරාක්‍රමය පෙන්වන ගෘහ නිර්මාණ අතුරින් ඉතා උසස් ශිල්පීය ලක්ෂණ පෙන්වන කැටයමකි.

(5) ඩේසියානු යුධ ජයග්‍රහණය සැමරීමට ට්‍රැජන් අධිරාජයා විසින් ඉදිකරන ලද ට්‍රැජන් කුලුනු කැටයම් කාණ්ඩයකි. (.......)

- ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

**6.** පාරිභාරික භාණ්ඩයක් සැලසුම් කිරීමේ දී,

(1) පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් නිර්මාණ විය යුතු ය.

(2) මාධ්‍යයේ ස්වභාවයට ගැළපෙන අයුරින් නිර්මාණ විය යුතු ය.

(3) පාරිභෝගිකයාගේ සිත් ගන්නා අයුරින් නිර්මාණ විය යුතු ය.

(4) වෙළඳපොලේ ඉල්ලීමට අනුව නිර්මාණ විය යුතු ය.

(5) නිර්මාණ කිරීමේ පහසුව ගැන සලකා සැලසුම් කළ යුතු ය. (.......)

**7.** ලේබලයක් නිර්මාණ කිරීමේ දී වඩාත් වැදගත් වනුයේ,

(1) රූප හා වර්ණ සංකේතවත්ව භාවිත කිරීමයි.

(2) තේමාවට ගැළපෙන කෙටි පාඨයක් උචිත අක්ෂර භාවිතයෙන් නිර්මාණය කිරීම යි.

(3) නිර්මාණශීලී, පැහැදිලි හා මනා නිමාවකින් යුතුව නිර්මාණය කිරීමයි.

(4) ලේබලය අක්ෂර මඟින් කියවා තේරුම් ගැනීමට සැලැස්වීම යි.

(5) තේමාවට අදාළ රූප හා අක්ෂර සිත්ගන්නා අයුරින් නිර්මාණය කිරීම යි. (.......)

**8.** විවිධ මාධ්‍යය භාවිතයෙන් උන්නත කැටයමක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුත්තේ,

(1) කැටයම සඳහා තෝරාගත් තලයේ හා ස්ථානයේ ස්වභාවය ගැන යි.

(2) සෞන්දර්යාත්මක කරුණු කෙරෙහි වැඩි අවධානයක් යෙදීම යි.

(3) නිර්මාණකරණයේ දී නිවැරදිව උපකරණ භාවිත කිරීම යි.

(4) උචිත ශිල්පක්‍රම භාවිතයෙන් නිමවා වර්ණ ගන්වා නිම කිරීම යි.

(5) තෝරාගත් තේමාවට හා මාධ්‍යයට ගැලපෙන සේ අර්ථවත්ව හැඩතල ගොඩනැගීම යි. (.......)

**9.** ද්‍රව්‍ය බලා ඇඳීමේ අභ්‍යාස කිරීමේ මුඛ්‍ය අපේක්ෂාව වනුයේ,

(1) දකින දෙයක් ඒ සැටියෙන් ම ඇඳීමට හුරුකරවීම යි.

(2) මූලික සිද්ධාන්ත හා ගති ලක්ෂණ නිරූපණය පිළිබඳ අවබෝධයක් ලැබීම යි.

(3) එකිනෙක වස්තූන්ගේ ගති ලක්ෂණ නිරූපණය පිළිබඳ අවබෝධයක් ලැබීම යි.

(4) වස්තූන්ගේ පරිමාණයන් හා ස්වභාවයන් එකිනෙකට වෙනස්වන බව හඳුනා ගැනීම යි.

(5) අඳුර ආලෝකය හා වස්තූන්ගේ ස්වභාවය වෙනස්වන අයුරු අධ්‍යයනය කිරීම යි. (.......)

**10.** දෘෂ්‍ය කලා මූලධර්ම වඩාත් නිවැරදිව දක්නට ලැබෙන තීරුව වන්නේ,

(1) රේඛාව, සමබරතාව, රිද්මය, වයනය

(2) වර්ණය, ආකෘතිය, ත්‍රිමාණ ලක්ෂණ, රේඛාව

(3) හැඩය, සමබරතාව, සුසංයෝගය, අවකාශය

(4) සමබරතාව, රිද්මය, පර්යාව ලෝකය, ත්‍රිමාණ ලක්ෂණ

(5) ආකෘතිය, වයනය, හැඩය, වර්ණය (.......)

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත අංක 1 සිට 7 දක්වා නම් කර ඇති ඡායාරූප ඇසුරු කරගෙන තෝරන්න.



1



2



3



4



5



6



7

**11**. කලා සිද්ධාන්තයන් ස්වභාවිකත්වයෙන් බැහැරව වෙනස් ම ආකාරයට දැකිය හැකි ශ්‍රී ලාංකේය සිතුවම් වන්නේ,

(1) 2, 4 (2) 1, 4 (3) 4, 6 (4) 2, 6 (5) 1, 2 (.......)

**12**. ස්වභාවික වස්තූන් ජ්‍යාමිතික හැඩතලවලට සංකලනය කරමින් නිරූපනය කල සිතුවම් වන්නේ,

(1) 2, 6 (2) 3, 4 (3) 2, 3 (4) 4, 6 (5) 5, 7 (.......)

**13**. ව්‍යුක්තවාදී කලා ප්‍රයෝග වඩාත් ප්‍රකට වන යුරෝපීය සිතුවම් වනුයේ,

(1) 5, 6 (2) 3, 6 (3) 3 ,4 (4) 2, 3 (5) 4, 6 (.......)

**14**. නිරූපණාත්මක කලා ලක්ෂණ වඩාත් ප්‍රකට කරවන සිතුවම් වනුයේ,

(1) 1 ,2 , 3 (2) 1 ,5 , 7 (3) 1, 2, 5 (4) 3, 5 , 7 (5) 3, 6, 7 (.......)

**15**. කලා ප්‍රවණතා එකිනෙකට වෙනස්ව ගොඩනැගීමට ඉවහල් වූ යුරෝපීය සිතුවම් වන්නේ,

(1) 2, 3, 5 (2) 2, 3, 6 (3) 4, 5, 6 (4) 3, 5, 6 (5) 5, 6, 7 (.......)

**16** සිට **20** තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

**16**. ගාන්ධාර හා මථුරා සම්ප්‍රදා එකම රාජ්‍ය සමයක බිහි වූ කලාවන් වුව ද එම සම්ප්‍රදායන්වල බුද්ධ ප්‍රතිමා එකිනෙකට වෙනස් වූයේ,

(1) හින්දු හා ථේරවාදී බෞද්ධ ලක්ෂණ නිසා ය.
(2) දේශීය හා විදේශීය කලා සම්ප්‍රදා හේතුකොටගෙන ය.
(3) විදේශීය හා මහායාන කලා සම්ප්‍රදා ඇසුරෙන් ය.
(4) ග්‍රීක හා දේශීය කලා සම්ප්‍රදා භාවිතයෙන් ය.
(5) ග්‍රීක හා රෝම කලා ආභාෂයන් ය. (.......)

**17**. ඉන්දියානු මෝගල් හා රාජ්පුට් සිතුවම්වල සමාන ආකෘතියක් දිස්වුවද රාජ්පුට් චිත්‍රවල වස්තු විෂයෙහි දක්නට ලැබෙන්නේ,

(1) යුද්ධය හා වීරත්වය පිළිඹිබු කරන සිද්ධීන් ය.
(2) රාජ්‍ය හා ආගමික සංකල්ප පිළිබඳ සිද්ධීන් ය.
(3) ස්වදේශීය හින්දු සාහිත්‍ය සංකල්ප හා සංස්කෘතික අංගයන් ය.
(4) ස්වභාවික පරිසරය හා යුධ ජයග්‍රහණ සිද්ධීන් ය.
(5) රජවාසල හා රජවරුන්ගේ රාජකීය ජීවන සිද්ධීන් ය. (.......)

**18**. 43 කණ්ඩායමේ සුවිශේෂත්වය වන්නේ,

(1) යථාර්ථවාදී කලා ශෛලි ලක්ෂණ ගුරු කොට ගැනීම යි.
(2) බහු ශෛලි කලා ලක්ෂණ පිළිබඳ විශ්වාසය පදනම් කර ගැනීම යි.
(3) පැරණි යුගවල පැවති සම්භාව්‍ය චිත්‍ර කලා ශෛලී ආභාස කර ගැනීම යි.
(4) යුරෝපීය අධිරාජ්‍යවාදී හා සාහිත්‍යවාදී කලා ශෛලී පමණක් පදනම් කර ගැනීම යි.
(5) ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ රීති ඇසුරෙන් සකසාගත් ශෛලී පදනම් කර ගැනීම යි. (.......)

**19**. එකිනෙකට සම්බන්ධව සිටින ලෙස අශ්ව හා සිංහ රූප සහිත සිතුවම් දැක්වෙන ප්‍රාග් ඓතිහාසික ගුහාව වන්නේ,

(1) ලැස්කෝ ගුහාව යි. (2) අල්ටමීරා ගුහාව යි. (3) ෆොන්ඩිගෝම් ගුහාව යි.
(4) ෂෝවේ ගුහාව යි. (5) කෝගුල් ගුහාව යි. (.......)

**20**. නිමාවන් නැති ස්වභාවය කලාත්මක මුලධර්මයන් ලෙස ස්ථාපිත කිරීමට පුරෝගාමී වූ මූර්ති ශිල්පියා වන්නේ,

(1) ඔගුස්ට් රොඩෑං ය. (2) තිස්ස රණසිංහ ය. (3) හෙන්රි මුවර් ය.
(4) පැබ්ලෝ පිකාසෝ ය. (5) ඒ මාර්ක් ය. (.......)

- ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

**21.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) ශ්‍රී ලංකාවේ ස්ථූප හා සම්බන්ධ බාහිර අංගයක් ලෙස චෛත්‍යයේ අලංකාරය සඳහා යෙදුවකි.
(2) ස්ථූපවලට සතර දිසාවෙන්, පසු කාලයේ එකතු වූ බාහිර අංගයකි.
(3) අනුරපුර යුගයේ පැරණිම කැටයම් සහිත විශාල ස්ථූපයන්ට පමණක් සීමා වූ නිර්මාණයකි.
(4) කැටයමින් හා මූර්තිවලින් අලංකාර වූ, ස්ථූපයේ සතර දිසාවේ යොදා ඇති නිර්මාණයකි. (.......)
(5) සැලැස්මෙන් හා කැටයම් යෙදීමේ දී සමානත්වයක් ඇති චෛත්‍ය ආශ්‍රිත බාහිර අංගයකි.

**22.** මෙහි දක්නට ලැබෙන්නේ,



(1) ප්‍රදක්ෂිනා පථයේ සිට මේධිය දක්වානැගීමට ඇති පඩිපෙලකි.
(2) මේධියේ සිට ප්‍රදක්ෂිනා පථයට නැගීමට ඇති ගල් පඩිපෙලකි.
(3) ස්ථූපයේ ප්‍රදක්ෂිනා පථයට නැගීමට ඇති පඩිපෙලකි.
(4) ස්ථූපයේ ගර්භය වටා නැගීමට ඇති පඩිපෙලකි.
(5) හර්මිකාවේ සිට ඡත්‍ර දක්වා නැගීමට ඇති පඩිපෙලකි. (.......)

**23.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය



(1) යුධ ජයග්‍රහණ සිහිපත් කිරීම සඳහා ඉදිකරන ලද්දකි.
(2) අධිරාජ්‍යවරුන් සිහිපත් කිරීම හා බලපරාක්‍රම දැක්වීමට ගත් උත්සාහයකි.
(3) සියුස් දෙවියන් වෙනුවෙන් ඉදිකල දෙව් මැදුරකි.
(4) ඕවලාකාර බිම් සැලැස්මකින් යුතු දැවැන්ත රඟ මඬලකි.
(5) සටන් ජවනිකා නිරූපනය කිරීමට තනන ලද ගොඩනැගිල්ලකි. (.......)

**24.** මෙහි දැක්වෙන පංච පාණ්ඩ රථ දේවාල සංකීර්ණය,



(1) එක් ගල් පර්වතයකින් නෙළන ලද දේවාල 5කින් යුක්තය.
(2) එකිනෙක ගල් කුලුවලින් නෙළන ලද දේවාල 5කින් යුක්තය.
(3) එකිනෙකට වෙනස් වූ දේවාල 5කින් යුක්තය.
(4) පල්ලව සහ චෝල කලා ලක්ෂණ මුසුවූ දේවාල 5කින් යුක්තය.
(5) සතරක් එක් ගල් කුලකින් ද අනෙක තවත් ගල් කුලකින් ද නෙළන ලද දේවාල 5කින් යුක්තය. (.......)

**25.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) පොළොන්නරුවේ රාජේන්ද්‍ර චෝල විසින් ඉදිකරන ලද අංක 1 දේවාලය යි.
(2) රාජරාජ විසින් සිය බිසව වෙනුවෙන් පොළොන්නරුවේ ඉදිකරන ලද දේවාලය යි.
(3) පොළොන්නරුවේ පාණ්ඩ්‍ය පාලන සමයේ ඉදිකරන ලද ශිව දේවාලය යි.
(4) රාජේන්ද්‍ර චෝල සිය යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස පොළොන්නරුවේ ඉදිකරන ලද දේවාලය යි.
(5) ද්‍රවිඩ පාලන සමයේ පොළොන්නරුවේ ඉදි වූ හින්දු කෝවිල් අතුරින් එකකි. (.......)

- ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් F, G, H , I, J ලෙස නම් කර ඇති මූර්ති ඇසුරෙන් තෝරන්න.



F



G



H



I



J

**26.** F අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) අබුසිම්බල්හි නෙළා ඇති පාරා රජ රූ සමූහයකි.
(2) අබුසිම්බල් දෙවොලේ දක්නට ඇති II රමේසස්ගේ මූර්ති 4කි.
(3) II රමේසස් විසින් අබුසිම්බල්හි කරවන ලද දේව රූ සතරකි.
(4) පාරාවන්ගේ තෙදබල මහිමය පෙන්වන ප්‍රතිමා සතරකි.
(5) පැරණි රාජධානි යුගයේ මිසරයේ නෙළන ලද ශෛලමය ප්‍රතිමා 4කි. (.......)

**27.** G අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
(1) ස්වභාවික කාන්තා රුව විකෘති කරමින් කරන ලද නිර්මාණයකි.
(2) මානව සිරුරේ අංගෝපාංග තත්වාකාරයෙන් නිරූපනය කිරීමකි.
(3) මානව සිරුරේ ආකෘතිය මත පදනම් වූ ව්‍යුක්ත රූපී ප්‍රකාශයකි.
(4) ශිල්පියාට ආවේනික වූ හැඩතල ඇසුරෙන් නිමවූ කාන්තා රුවකි.
(5) ස්ත්‍රී බවේ යථාරූපී ප්‍රකාශනය වෙනුවට සරලීකරණය කළ ආකෘතියකි. (.......)

**28.** H අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය,
(1) ගඩලාදෙණිය විහාරයේ, ගනේෂ්වරාචාර්ය ශිල්පියා විසින් නිමවන ලද්දකි.
(2) ගඩලාදෙනිය විහාරයේ, ස්ථපතිරායර් ශිල්පියා විසින් නිමවන ලද්දකි.
(3) ලංකාතිලක විහාරයේ, ගනේශ්වරාචාර්ය ශිල්පියා විසින් නිමවන ලද්දකි.
(4) ලංකාතිලක විහාරයේ ස්ථපතිරායර් ශිල්පියා විසින් නිමවන ලද්දකි.
(5) ගම්පල යුගයේ ඉදිවූ බුදුන්ගේ මහා පෞර්ෂය දැක්වෙන බුදු පිළිමයකි. (.......)

**29.** I අක්ෂරයෙන් දැක්වෙනුයේ,

(1) ලෝහ මාධ්‍යයෙන් නිරූපිත සරල හැඩතල සහිත මව් දෙවඟන පිළිරුවකි.

(2) සරල හැඩතලවලින් යුක්තව ටෙරා කොටා මාධ්‍යයෙන් කළ මව්දෙවඟන පිළිරුවකි.

(3) සරල බවින් හා නිමාවෙන් ජනකලා ස්වරූපය ගත් මව්දෙවඟන මූර්තියකි.

(4) නූතන කලා ශිල්පියෙකු අතින් නිමවූ මව් දෙවඟනගේ ව්‍යුක්ත රූපී නිර්මාණයකි.

(5) අච්චුවක අධාරයෙන් මැටියෙන් කළ මව්දෙවඟනගේ ව්‍යුක්ත රූපී මූර්තියකි. (.......)

**30.** J අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,

(1) අනුරාධපුර යුගයට අයත් දඹේගොඩින් හමු වූ බෝධියත්ව පිළිමයකි.

(2) ලංකාවේ හමු වූ අවලෝකිතේශ්වර පිළිම අතුරින් එකකි.

(3) ලලිතාසන ඉරියව්වෙන් කරන ලද ලෝකඩ බෝධිසත්ව පිළිරුවකි.

(4) ලෝකඩ මාධ්‍යයෙන් වාත්තු කළ වෙහෙරගලින් හමු වූ අවලෝකිතේශ්වර පිළිමය යි.

(5) අනුරපුර යුගයට අයත් රනින් කළ අවලෝකිතේශ්වර බෝසත් පිළිමය යි. (.......)

- ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර **K, L, M, N, O** ලෙස නම් කර ඇත. පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



**K**



**L**



**M**



**N**



**O**

**31.** K අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,

(1) රේඛාව හා පැතලි වර්ණයට මුල් තැන දුන් ජෙමිනි රෝයිගේ චිත්‍රයකි.

(2) ඉන්දීය චිත්‍ර ශිල්පී රවි වර්මා විසින් නිරූපණාත්මක කලාවේ ලක්ෂණ සහිතව නිම කරන ලදචිත්‍රයකි.

(3) මව් සෙනෙහස පිළිඹිබු කෙරෙන නන්දලාල් බෝස් ශිල්පියාගේ චිත්‍රයකි.

(4) යුරෝපීය කලා ශෛලීන් පමණක් ඇසුරු කොටගෙන නිර්මාණය කරන ලද චිත්‍රයකි.

(5) ජනකලා සම්ප්‍රදාවල ආභාෂය ලැබූ අම්රිතා ශර්ගිල් ශිල්පිනියගේ චිත්‍රයකි. (.......)

**32.** L අක්ෂරයෙන් දැක්වෙනුයේ,

(1) බුදුන් වහන්සේ මහියංගනයට වැඩම කිරීමේ සිද්ධිය නිරූපිත සෝලියස් මෙන්දිස් ශිල්පියාගේ සිතුවමකි.

(2) බුදුන් වහන්සේ නාගදීපයට වැඩි අවස්ථාව නිරූපිත කැළණි විහාරයේ සිතුවමකි.

(3) බුදුන් වහන්සේ කැළණි විහාරයට වැඩම කිරීමේ සිද්ධිය නිරූපිත සෝලියස් මෙන්දිස් ශිල්පියාගේ සිතුවමකි.

(4) සෝලියස් මෙන්දිස් විසින් බුදු සිරිත නිරූපිත කැළණි විහාරයේ ඇති සුවිසල් සිතුවම් අතුරින් එකකි.

(5) බුදුන් වහන්සේ ශ්‍රී පාදස්ථානයට වැඩම කිරීමේ සිද්ධිය නිරූපිත සෝලියස් මැන්දිස් ශිල්පියාගේ සිතුවමකි. (.......)

**33.** M අක්ෂරයෙන් දැක්වෙනුයේ,

(1) උපස්ථිතිවාදී ශිල්පියෙකු වූ වින්සන්ට් වැංගෝගේ නිර්මාණයකි.

(2) අජීවී වස්තුවක් සජීවීව නිරූපනය වූ පශ්චාත් උපස්ථිතිවාදී සිතුවමකි.

(3) උපස්ථිතිවාදී ශිල්පියෙකු අතින් සිතුවම් වූ අජීවී වස්තුවකි.

(4) ශාස්ත්‍රාලීය ශිල්පක්‍රම අනුගමනය කරමින් කල උපස්ථිතිවාදී සිතුවමකි.

(5) ත්‍රිමාණ ස්වරූපය දැක්වෙන යථාර්ථවාදී ශෛලියේ සිතුවමකි. (.......)

**34**. N අක්ෂරයෙන් නිරූපිත සිතුවම,

(1) බෙල්ලන්විල විහාරයේ සිතුවම් අතර ඇති සිදුහත් චරිතය නිරූපිත නිරූපණාත්මක ශෛලියේ සිතුවමකි.

(2) බෙල්ලන්විල විහාරයේ සිදුහත් චරිතය නිරූපිත සිතුවම් අතර තාත්විකවාදී ශෛලියෙන් නිරූපිත සිතුවමකි.

(3) ස්වභාවිකත්වයට නැඹුරු හා ශෛලී ගත අයුරින් සිදුහත් චරිතය නිරූපණය කල බෙල්ලන්විල විහාරයේ සිතුවමකි.

(4) නිරූපිත අංග තාත්ත්විකව භාවිතා කරමින් සිදුහත් චරිතය නිරූපණය කල බෙල්ලන්විල විහාර සිතුවමකි.

(5) විහාර සිතුවම් කලාව නවමගකට යොමුකළ වත්මන් ශිල්පියෙකුගේ ශාස්ත්‍රාලීය කලා ලක්ෂණ සහිත සිතුවමකි. (.......)

**35**. O අක්ෂරයෙන් දැක්වෙනුයේ,

(1) ''සීතාද සේරම්'' නම් වු J. D. A. පෙරේරා ශිල්පියාගේ සිතුවමකි.

(2) J. D. A. පෙරේරා ශිල්පියාගේ ''නලඟන'' නම් වු තෙල් සායම් සිතුවමකි.

(3) තෙල් සායම් මාධ්‍යයෙන් නිම වු ප්‍රීඩා කාලෝගේ ස්වයං ආලෙඛ්‍ය සිතුවමකි.

(4) උපස්ථිතිවාදී වර්ණ ගැන්වීමේ ශිල්පක්‍රම අනුව නිමවු අම්රිතා ශර්ගිල්ගේ සිතුවමකි.

(5) A. C. G. S. අමරසේකර ශිල්පියාගේ සිතුවමක් වූ සීතාද සේරම් නම් වූ සිතුවමයි. (.......)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36**. මෙම සිතුවම,

(1) තහිටියානු ජන ජීවිතය සිතුවම් කළ ගොගැන්ගේ සිතුවමකි.

(2) ඇමෙරිකානු ජාතික ශිල්පිනියක් වු මේරිකසාට්ගේ සිතුවමකි.

(3) ඕලන්ද ජාතික වින්සන්ට් වැංගෝගේ සිතුවමකි.

(4) ප්‍රංශ ජාතික සිත්තරෙක් වු එඩ්ගා ඩෙගාගේ සිතුවමකි.

(5) උපස්ථිතිවාදී පුරෝගාමියෙකු වු ක්ලොඩ් මොනේගේ සිතුවමකි. (.......)

**37**. මෙම සිතුවමෙන් අර්ථවත් වන්නේ,

(1) මාතෘත්වය නිරූපනය කිරීමයි.

(2) දරු සෙනෙහස හා මාතෘත්වය පිළිඹිබු කිරීමයි.

(3) මාතාවක් දරුවෙකුගේ පා දෝවනය කරන ආකාරයයි.

(4) මවකගේ දෛනික ජිවිතයේ එක් ක්‍රීයාකාරී අවස්ථාවකි.

(5) වැඩිහිටි හා ළදරු ජිවනයේ බැඳීමයි. (.......)

**38**. මෙම සිතුවමේ වර්ණ භාවිතයේ සුවිශේෂ ශිල්පීය ලක්ෂණය වන්නේ,

(1) මූලික වර්ණ මිශ්‍ර වී පෙනෙන අයුරින් ත්‍රිමාණ ලක්ෂණ භාවිතාකර තිබීමයි.

(2) වර්ණ ප්‍රභේද භාවිතයෙන් ස්වභාවිකත්වය දැක්වීමට උත්සාහ කර තිබීමයි.

(3) එළිය අඳුර භාවිතයෙන් වස්තූන්ගේ ත්‍රිමාණත්වය දැක්වීමට උත්සාහ දරා තිබීමයි.

(4) විෂම වර්ණයන්ගේ සංගතතාව රැකෙන පරිදි භාවිතා කොට තිබීමයි.

(5) වර්ණ පදාස දැක්වෙන පරිදි ඝණ බුරුසු පහරවල් යොදා තිබීමයි. (.......)

**39.** මෙම සංරචනයේ රූපවල විලාශය වන්නේ,

(1) ශෛලීගත හා ස්වභාවික හැඩ භාවිතා කිරීමයි.

(2) භාව රූපී හැඩ සංකලනය කර නිර්මාණය කිරීමයි.

(3) ප්‍රකාශනාත්මක හා භාවරූපී හැඩ සංකලනය කිරීමයි.

(4) ව්‍යුක්තවාදී හා තාත්වික හැඩ අර්ථවත්ව භාවිතා කිරීමයි.

(5) ස්වභාවිකවාදී හා නිරූපනාත්මක හැඩ සංකලනය කිරීමයි. (.......)

**40.** මෙම සිතුවමින් නිරූපිත සම්පිණ්ඩන ක්‍රමවේදය වන්නේ,

(1) මවට වඩා දරුවාට ප්‍රධාන තැනක් දක්වන සංරචනයකි.

(2) සමබරතාවය නොසලකා මානව රූප හසුරුවන ලද සංරචනයකි.

(3) පසුබිමේ ප්‍රකාශනයට වඩා රූපයට මුල් තැන දුන් සංරචනයකි.

(4) පසුබිමේ දර්ශනය පැහැදිලිව දක්වන සංරචනයකි.

(5) පැහැදිලි දර්ශන අපැහැදිලි වන සේ දක්වන සංරචනයකි. (.......)

* * *

## II කොටස

* ''අ'' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා''ආ'', ''ඉ'' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

### ''අ'' කොටස
### (සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** ලාංකේය සම්භාව්‍ය සම්ප්‍රදායකට උරුමකම් කියන අනුරාධපුර හා පොළොන්නරු බිතු සිතුවම් කලාවෙන් පසුව බිතු සිතුවම් කලාවේ සුවිශේෂ දායකත්වයක් මහනුවර යුගයේ චිත්‍ර කලාවෙන් කෙරේ.

(i) අනුරාධපුර යුගයේ බෞද්ධ බිතු සිතුවම් දැකිය හැකි ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අනුරාධපුර යුගයේ සහ පොළොන්නරු යුගයේ සිතුවම්වල ලක්‍ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පොලොන්නරුවේ තිවංක පිළිමගෙයි ප්‍රවේශ මණ්ඩපයේ බිතුසිතුවම් හා මහනුවර යුගයේ බිතුසිතුවම්වල ශෛලීය ලක්‍ෂණ සංසන්දනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 08)

**2.** ශ්‍රී ලාංකේය බුදු පිළිම කලාව විවිධ යුගවල දී විවිධ කලා සම්ප්‍රදාවල ආභාසය සහිතව විකාශනය විය.

(i) අනුරාධපුර යුගයෙහි කලා සම්ප්‍රදායන් දෙකකට අයත් බුද්ධ ප්‍රතිමා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අනුරාධපුර හා පොළොන්නරු යුගවල බුද්ධ ප්‍රතිමාවල කලාත්මක ලක්‍ෂණ කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(iii) අනුරාධපුර, පොලොන්නරු යුගවල සිට ගම්පොළ, මහනුවර යුග දක්වා බුදු පිළිම නිර්මාණයේ සිදු වූ වෙනස්කම් නිදසුන් සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 08)

**3.** පොළොන්නරු යුගයේ ඉදි වූ හින්දු වාස්තු විද්‍යා නිර්මාණවල ලක්‍ෂණ එකල හා ඊට පසු අවධිවල නිර්මාණය වූ බෞද්ධ ප්‍රතිමාඝර ඇසුරෙන් හඳුනාගත හැකිය.

(i) හින්දු වාස්තු විද්‍යා ආභාසය ලබා නිම වූ පොළොන්නරුවේ ප්‍රතිමාඝර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පොළොන්නරු යුගයේ ඉදි වූ බෞද්ධ ප්‍රතිමාඝර සඳහා හින්දු වාස්තු විද්‍යා ලක්‍ෂණ බලපා ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) හින්දු වාස්තු විද්‍යා ලක්‍ෂණ ගම්පොළ බෞද්ධ ප්‍රතිමාඝර කෙරෙහි බලපා ඇති අන්දම උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 08)

### ''ආ'' කොටස
### (සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සමාජ, ආගමික හා දේශපාලනික තොරතුරු ඔවුන්ගේ කලා නිර්මාණ ඇසුරෙන් විද්‍යමාන වේ.

(i) ඉන්දු නිම්නයෙන් හමු වූ මූර්ති නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන්දු නිම්නයේ පැවති සැලසුම් සහගත වාස්තු විද්‍යා ඉදිකිරීම් පිළිබඳව හමු වී ඇති සාධක ඇසුරෙන් කෙටියෙන් විමසන්න. (ලකුණු 05)

(iii) ඉන්දු නිම්නයේ පැවති ඇදහිලි හා විශ්වාස, හමු වී ඇති කැටයම් හා මූර්ති ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 08)

**5**. ස්වාභාවික හා ශෛලිගත බව එකට එක් වූ පල්ලව කලාව, චෝල කලාව සඳහා මූලික අඩිතාලම සපයා ඇති බැව් හින්දු කලා කෘතිවලින් විද්‍යාමාන වේ.

(i) මාමල්ලවපුරම්හි දක්නට ලැබෙන කැටයම සඳහා කලා විද්වතුන් දී ඇති නාම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පල්ලව හා චෝල කලා සම්ප්‍රදායන්වලට අයත් කැටයම් හා මූර්ති නිර්මාණවල කලා ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) පල්ලව වාස්තු විද්‍යා නිර්මාණ ලක්ෂණ, චෝල දේවාලවල ආකෘතිමය ලක්ෂණ කෙරෙහි බලපාන ලද ආකාරය සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08)

**''ඉ'' කොටස**

**(සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - යුරෝපය)**

**6**. ග්‍රීක කලා නිර්මාණවල ලක්ෂණ රෝමකලාව සඳහා බලපෑව ද, රෝම කලාව ස්වකීය අනන්‍යතාවය පිළිඹිබු වන සේ කලා නිර්මාණ ලොවට දායාද කරන ලදී.

(i) රෝම විද්ව (ශිර්ෂ) මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ග්‍රීක මූර්තිවලට සාපේක්ෂව රෝම මූර්තිවල දැකිය හැකි ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) රෝම වාස්තු විද්‍යා නිර්මාණවල දැකගත හැකි ආකෘති හා කැටයම් භාවිතයේ සුවිශේෂී ලක්ෂණ නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

**7**. නිරූපණාත්මක කලාවට වඩා වෙනස් මගක් ගත් අධිතාත්විකවාදී කලා ප්‍රවණතාව, අවිඥානය, හා පරිකල්පනය පදනම් කරගත් කලා ව්‍යාපාරයකි.

(i) අධියථාර්ථවාදී ෆ්‍රීඩා කාලෝ ශිල්පිනියගේ නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අධියථාර්ථවාදී කලාවේ පොදු ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) නිරූපනාත්මක කලාවට වඩා අධියථාර්ථවාදී කලාව වෙනස්වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

* * *

# (51) චිත්‍ර කලාව

**II පත්‍රය**

---

**ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය**

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැළෑටිය සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසි තලය, අර්ථවත් ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
* ද්‍රව්‍යවල හා පැළෑටියේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස්මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ ව සැලකිලිමත් වන්න.
* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
* වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්පක්‍රම අර්ථවත් ව භාවිත කරන්න.
* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.
* ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

* * *

# (51) චිත්‍ර කලාව

### III පත්‍රය

**සැලකිය යුතුයි ඃ**

* ''අ'',''ආ'' හා ''ඉ'' යන කොටස් තුනෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

---

''අ'' කොටස - චිත්‍ර සංරචනය

1. වගා ලිඳකට වැටුනු හස්තියෙකු බේරා ගැනීමට වෙහෙසෙන මිනිසුන්
2. ජල ආශ්‍රිත වන ලැහැබක නිදැල්ලේ හැසිරෙන වන සතුන්
3. වීර මද්දුම බණ්ඩාර කුමරු මරණය හමුවේ නොබිය ව වදකයාට මුහුණ දීම.
4. රාත්‍රියක ආගමික පුද පූජා වෙත යොමු වූ ඇති බැතිමතුන් පිරිසක්.

''ආ''කොටස - මෝස්තර නිර්මාණය

5. සිරස් අතට විහිදී යන අයුරින් උද්භිද හැඩතල යොදා ගනිමින් දොර රෙද්දක් සඳහා සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. සත්ත්ව හැඩතල ව්‍යුක්තව යොදා ගනිමින් අඟල් 5ක් පළලැති සාරි පල්ලුවක් සඳහා මෝස්තරයක් සැලසුම් කරන්න.
7. චිත්‍ර කලාව සඳහා වූ සම්මාන උළෙලක දී පිරිනැමීම සඳහා සුදුසු සම්මාන ඵලකයකට උචිත නවනිර්මාණයක් සැලසුම් කරන්න.

''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ

8. ''යෞවන පරපුර මත් උවදුරෙන් බේරා ගනිමු.'' යන තේමාවට උචිත වර්ණවත් පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.
9. ''අරුම පුදුම සොබා දහම'' යනුවෙන් ලියවුනු පොතක් සඳහා පිටකවරයක් සැලසුම් කරන්න.(මුල් කවරය, සනකම සහ පසු කවරය සැලසුමට අඩංගු විය යුතුය.)
10. අඟල් 3 1/2 × 2 1/2 ප්‍රමාණයේ සුවඳ සබන් කැටයක් ඇසුරුම් කිරීම සඳහා දවටනයක් සැලසුම් කරන්න.

* * *

# (52) නර්තනය (දේශීය)

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය : පැය 02කි.**
වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **25**ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **25**ක් ද, ඇතුළත් ප්‍රශ්න **50කි**. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

**II පත්‍රය -** **කාලය පැය 03කි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)
මෙම ප්‍රශ්න පත්‍රය I,II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.
I කොටසේ අනිවාර්ය ප්‍රශ්න දෙක ඇතුළු ව II හා III කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.

I කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ අනිවාර්ය ප්‍රශ්න **දෙකකි.** එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න තුනකි. එක් ප්‍රශ්නයකට ලකුණු 20කි.

III කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න තුනකි. එක් ප්‍රශ්නයකට ලකුණු 20කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = **100**

**ප්‍රායෝගික පරීක්ෂණය :** පරීක්ෂණ අයිතම 10කි. එක් අයිතමයකට ලකුණු 20කි.

1. ගායනය
2. තාල අවබෝධය
3. විෂය නිර්දේශිත කැමති නැටුමක්
4. වෙනත් සම්ප්‍රදායයන් (උඩරට/පහතරට/සබරගමු)
5. වන්නමක් /සින්දු වන්නමක්
6. ගායනය රහිත නර්තන අංගයක්
7. පූජා භාණ්ඩ භාණ්ඩ භාවිත නර්තන අංගයක්
8. ගායනය සහිත නර්තනයක්
9. වාදනය
10. නිර්මාණ

ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මුළු ලකුණු = $20 \times 10 = 200$

| | | |
|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | = | 200 |
| අවසාන ලකුණ | = | $400 \div 4 = \underline{\underline{100}}$ |

# (52) නර්තනය (දේශීය)

## I පත්‍රය

**සැලකිය යුතුයි :**

- ★ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
- ★ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

---

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** සාම්ප්‍රදායික වන්නම්වලින් බැහැරව නිර්මාණය වී ඇති නවතම වන්නම් වනුයේ,
(1) හංස, කුදිරඩි, තිසරා හා අනිලා ය. (2) ඇගලුම්,සමනළ,මහබෝ හා මන්තිරි ය.
(3) සමනළ, හංස, තිසරා හා ඇගලුම් ය. (4) ගාහක, තිසරා, හංස හා මරඟන ය.
(5) තිසරා, අනිලා, මහබෝ හා සමනළ ය. (.....)

**2.** පිළිවෙළින් ගොයම් කැපීම, කලගෙඩි, කුලු යන සිංහල ගැමි නැටුම්වලට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් ලෙස හඳුන්වනුයේ,
(1) අරිවිවෙට්ටු, චෙම්බු හා කාවඩි ය. (2) අරිවිවෙට්ටු, කරගම් හා කුම්මි ය.
(3) අරිවිවෙට්ටු, චෙම්බු හා සුලකු ය. (4) කෝලාට්ටම්, කාවඩි හා චෙම්බු ය.
(5) අරිවිවෙට්ටු, කොලුදු පරිතාල් හා කෝලාට්ටම් ය. (......)

**3.** "ගුම් දැහිං ගුඳ ගුඳ දැහිං" මෙම බෙර පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
(1) ජසයා ය. (2) නොංචි ය. (3) අණබෙරකරු ය.
(4) මුදලි ය. (5) ලෙංචිනා ය. (......)

**4.** "සිරිවස ගෙන අසු නැගෙමින් නොලෙසා" මෙහි සිරිවස යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(1) ගැට බෙරය යි. (2) හොරණෑව යි. (3) උඩැක්කිය යි. (4) දවුල යි. (5) බුම්මැඩිය යි (......)

**5.** ගම්පොළ යුගයේ නර්තන කලාව හා සබැඳි රූකම් දැකිය හැකි වන්නේ,
(1) ඇම්බැක්කේ දේවාලයෙන්, අංක 07 දරණ ශිව දේවාලයෙන් හා ගලපාත විහාරයෙන් ය.
(2) ඇම්බැක්කේ දෙවාලයෙන්, ගඩලාදෙණිය දේවාලයෙන් හා බෙන්තොට ගලපාත විහාරයෙන් ය.
(3) සැටදාගෙයින්, ඇම්බැක්කේ දේවාලයෙන් හා ගඩලාදෙණිය දේවාලයෙන් ය.
(4) සැටදාගෙයින්, ලෝවාමහා පායෙන් හා ගලපාත විහාරයෙන් ය.
(5) සැටදාගෙයින්, ගඩලාදෙණිය දේවාලයෙන් හා ගලපාත විහාරයෙන් ය. (......)

**6.** අනුපිළිවෙළින් ශෝක, භය හා ජුගුප්සා යන භාවයන්ගෙන් නිෂ්පන්න රස වන්නේ,
(1) කරුණා, භයානක හා බීභත්ස්‍ය ය. (2) කරුණා, බීභත්ස්‍ය හා වීර ය.
(3) ශාංගාර, කරුණා හා වීර ය. (4) භයානක, ශෝක හා අද්භූත ය. (......)
(5) භයානක, කරුණා හා අද්භූත ය.

**7.** රටයකුම ශාන්තිකර්මය පැවැත්වීමේ දී බෙන්තර ශෛලියේ පූර්ව චාරිත්‍ර විධිය ලෙස සැලකෙන්නේ,
(1) කප් සිටුවීමයි. (2) කලහක් වෙන් කිරීමයි. (3) තොට පේ කිරීමයි.
(4) යහන් පේ කිරීමයි. (5) මිල්ල කැපීමයි. (......)

**8.** "ලෙලවන දිගු නෙත නිලුපුල සේයා" සහ "අඳිමින් සුදුපට සළු හෙළ සඳුනෙන් තුනු තවරා" යන කවි දෙක ලියවී ඇත්තේ,
(1) ගම්පොළ යුගයට අයත් මයුර හා තිසර සංදේශ කාව්‍යවල ය.
(2) දඹදෙනි යුගයට අයත් මයුර හා කෝකිල සංදේශ කාව්‍යවල ය.
(3) කෝට්ටේ යුගයට අයත් හංස සහ සැවුල් සංදේශ කාව්‍යවල ය.
(4) කෝට්ටේ යුගයට අයත් සැළලිහිණි හා සැවුල් සංදේශ කාව්‍යවල ය.
(5) කෝට්ටේ යුගයට අයත් පරෙවි හා කෝකිල සංදේශ කාව්‍යවල ය. (......)

**9.** "අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ" මෙම කවිය,

(1) බඹර කැපීමේ දී භාවිත වේ. (2) මී බන්ධනයේ දී භාවිත වේ.
(3) පැල් කවි ගායනයේ දී භාවිත වේ. (4) පන්තේරු නර්තනයේ දී භාවිත වේ. (......)
(5) ගොයම් නර්තනයේ දී භාවිත වේ.

**10.** මුල් මාත්‍රය හා ශුද්ධ මාත්‍රය යන නර්තන අංග අයත් වන්නේ,

(1) උඩරට හා පහතරට සම්ප්‍රදායයන්ට ය. (2) උඩරට හා සබරගමු සම්ප්‍රදායයන්ට ය.
(3) පහතරට හා සබරගමු සම්ප්‍රදායයන්ට ය. (4) පහතරට හා උඩරට සම්ප්‍රදායයන්ට ය.
(5) සබරගමු හා පහතරට සම්ප්‍රදායයන්ට ය. (......)

**11.** දියගල, ගිනිගල, තෙල්ගල නමින් හඳුන්වනු ලබන්නේ,

(1) වාද්‍ය භාණ්ඩ සුසර කර ගැනීමට භාවිත කරන උපකරණයන් ය.
(2) නර්තනවලට භාවිත කරන රංග උපකරණයන් ය.
(3) බෙර වර්ග සකස් කිරීමට භාවිත කරන උපකරණයන් ය.
(4) රටයකුමේ උපත් කතාවට සම්බන්ධ පාරිභාෂික වචනයන් ය.
(5) කොහොඹා කංකාරියේ කතා පුවතට සම්බන්ධ ප්‍රදේශයන් ය. (......)

**12.** පිළිවෙළින් උඩරට, පහතරට හා සබරගමු ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය අවස්ථා වන්නේ,

(1) අඹ විදමන, නානුමුරය හා ඇත් බන්ධනය ය.
(2) මුවමල විදීම, ගුරුගේ මාලාව හා පොත්කඩේ යක්කම ය.
(3) හාතා යක්කම, නානු මුරය හා පොත්කඩේ යක්කම ය.
(4) ඌරා යක්කම, නානු මුරය හා පොත්කඩේ යක්කම ය.
(5) ඌරා යක්කම, නයා යක්කම හා වැදි යක්කම ය. (......)

**13.** පාසල් අධ්‍යාපනයට නර්තනය ඇතුළත් කළ වර්ෂය ලෙස දැක්වෙන්නේ,

(1) 1934 ය. (2) 1943 ය. (3) 1978 ය. (4) 1980 ය. (5) 1982 ය. (......)

**14.** නුගේ හැල්ල පූජා විධි අංගයේ දී ශාන්තිකර්ම භූමියේ නුග අත්තක් සිටවනු ලබන්නේ,

(1) පහන් මඩු ශාන්තිකර්මයේදී ය. (2) පූනා මඩු ශාන්තිකර්මයේදී ය.
(3) දානේ මඩු ශාන්තිකර්මයේදී ය. (4) කිරිමඩු ශාන්තිකර්මයේදී ය.
(5) ගී මඩු ශාන්තිකර්මයේදී ය. (......)

**15.** "ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට" යන කවියෙන් කියවෙන්නේ,

(1) කුජ ග්‍රහයා පිළිබඳව ය. (2) බුධ ග්‍රහයා පිළිබඳව ය. (3) හිරු ග්‍රහයා පිළිබඳව ය.
(4) සෙනසුරු ග්‍රහයා පිළිබඳව ය. (5) සිකුරු ග්‍රහයා පිළිබඳව ය.
(......)

**16.** නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු විමසීමේ දී කාලිංග උද්‍යාන ශිලා ලිපිය හා දළදා සිරිත යන මූලාශ්‍රය අයත් වන්නේ,

(1) පොළොන්නරු හා කුරුණෑගල යුගයන්ට ය. (2) පොළොන්නරු හා දඹදෙණි යුගයන්ට ය.
(3) අනුරාධපුර හා යාපහුව යුගයන්ට ය. (4) අනුරාධපුර හා කුරුණෑගල යුගයන්ට ය.
(5) කුරුණෑගල හා දඹදෙණි යුගයන්ට ය. (......)

**17.** කෝලම් නාටකයේ දී නොංචි කෝලම හා සම්බන්ධ වන අනෙකුත් චරිත වනුයේ,

(1) ජසයා හා ලෙන්චිනා ය. (2) මුදලි හා හෙන්චප්පු ය.
(3) අණබෙරකරු හා චුක්කිනියා ය. (4) ජසයා හා හෙන්චප්පු ය.
(5) මුදලි හා ලෙන්චිනා ය. (......)

**18.** ශිල්පීන් දෙදෙනෙකු අතර දක්ෂතා පෙන්වන ශාස්ත්‍රීය බෙර වාදන අවස්ථාවක් වන්නේ

(1) මඟුල්බෙර වාදනයයි. (2) පිංබෙර වාදනයයි. (3) හේවිසි වාදනයයි.
(4) අත්‍යාබෙර වාදනයයි. (5) තම්මැට්ටම් වාදනයයි. (......)

19. කාලියාම, මල නැටීම, ගරා යකුන් නැටීම යන වත්පිළිවෙත් අන්තර්ගත වනුයේ,
(1) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේදී ය.
(2) කඩවර කංකාරියේදී ය.
(3) කිරි ඉතුරුම් මංගල්‍යයේදී ය.
(4) වලියක් මංගල්‍යයේදී ය.
(5) කිරිමඩු ශාන්තිකර්මයේදී ය. (......)

20. "ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ" යන කවිය අයත් වන්නේ
(1) නමස්කාර ගායනාවලට ය.
(2) වරම් කවි ගායනාවලට ය.
(3) සිරසපාද කවි ගායනාවලට ය.
(4) මල් යහන් කවිගායනාවලට ය.
(5) සුවිසි විවරණ කවි ගායනාවලට ය. (......)

21. ගල් යුගයේ මානවයාගේ ශරීර පෙනුම වර්ණ ගැන්වීම සඳහා උපයෝගී කරගෙන ඇත්තේ
(1) ගස් පොතු, කොළ වර්ග, අයිබ්‍රෝ පෙන්සිල් ය.
(2) බුලත්විට, කොළ වර්ග, පවුඩර් ය.
(3) ගඩොල් කුඩු, කිරිමැටි, බුලත්විට ය.
(4) ගඩොල් කුඩු, කිරිමැටි, අයිබ්‍රෝ පෙන්සිල් ය.
(5) ගඩොල් කුඩු, අල්ලියාදු කුඩු, පෑන්කේක් ය. (......)

22. දෘපට්ටා සහ ලෙහෙඟා යන රංගවස්ත්‍ර භාවිත කරනු ලබන්නේ
(1) කතක් නර්තන සම්ප්‍රදායේ ය.
(2) ඔඩිසි නර්තන සම්ප්‍රදායේ ය.
(3) භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායේ ය.
(4) මනිපුරි නර්තන සම්ප්‍රදායේ ය.
(5) කතකලි නර්තන සම්ප්‍රදායේ ය. (......)

23. යහනක් නිර්මාණය කර ගැනීමට ශාන්තිකර්මවල භාවිතා කරනු ලබන්නේ,
(1) රුක්අත්තන,ගංසූරිය සහ තැල්කොළ ය.
(2) රුක්අත්තන,ගංසූරිය සහ කැන්ද කොළ ය.
(3) ගොප් අතු,කෙසෙල් පතුරු සහ හබරල කොළ ය.
(4) ගොප් අතු,කෙසෙල් කොළ සහ දෙල් කොළ ය.
(5) ගොප් අතු,දෙල් කොළ සහ පාවට්ටා කොළ ය. (......)

24. කර්ණාට තාල පද්ධතියේ මිශ්‍රචාපු තාලය සමාන වන්නේ දේශිය තාල පද්ධතියේ
(1) මාත්‍රා 2+3 තාල රූපයට ය.
(2) මාත්‍රා 2+4 තාල රූපයට ය.
(3) මාත්‍රා 2+2+3 තාල රූපයට ය.
(4) මාත්‍රා 3+3 තාල රූපයට ය.
(5) මාත්‍රා 3+4 තාල රූපයට ය. (.......)

25. රංග වින්‍යාසය හා සම්බන්ධ මූලික සංකල්ප වන්නේ
(1) තාලය, වේගය හා අවකාශයයි.
(2) චලනය, අවකාශය හා සම්බන්ධතාවයයි.
(3) තාලය, වේගය හා හැඩතලයි.
(4) තල, දිසා හා සම්බන්ධතාවයයි. (......)
(5) අංග, ප්‍රත්‍යංග හා අවකාශයයි.

- අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

26. ලිච්ජවි හෙවත් කුමාර පෙළපාලි අයත් වන්නේ ............................................................ ශාන්තිකර්මයට ය.

27. රංගවස්ත්‍රාභරණ, රංගාලෝකය හැරුණු විට වේදිකා පසුතල නිර්මාණය ද ........................................................ අභිනයට අයත් වේ.

28. මනඃකල්පිත කතා තේමාවන් භාවිත කිරීම .................................................... යුගයේ බැලේ නිර්මාණවල සුලභව දක්නට ලැබෙන ලක්ෂණයකි.

29. දරු රුකඩය රංග උපකරණයක් ලෙස භාවිත කරමින් දරු නැලවිල්ල නම් වූ නර්තනාංගය ඉදිරිපත් කරනුයේ ........................................................ ශාන්තිකර්මයේදී ය.

30. අතීතයේ වලියක් මංගල්‍යයේ දී යක් දෙස්සා පළඳිනු ලැබූ හිස් පළඳනාව ................................................ නමින් හැඳින් වේ.

31. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන විරුදාවලියෙන් පිදුම් ලද දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් ............................................. මහා කාව්‍ය රචනා කරන ලදී.

**34.**"කිරිමැස්ස"................................................ ශාන්තිකර්මයේ විශේෂ සැරසිල්ලක් වශයෙන් හැඳින්විය හැකිය.

**35.** උඩැක්කි වාදනයේ දී හඬ නිවැරදි ව උත්පාදනය කර ගැනීම සඳහා යොදා ගන්නා පටිය ..................................................නමින් හැඳින්වේ.

- අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** ඉබන් බතුතා හා ස්පිල් බර්ජන් යන දේශාටන වාර්තාකරුවන් අයත් වන්නේ කුමන යුගවලටද?
(i) ඉබන් බතුතා - ....................................    (ii) ස්පිල් බර්ජන් - ...........................

**37.** මාත්‍රා 2+2+2+4+4 තාල රූපයට අයත් උඩරට හා සබරගමු නර්තන අංග දෙක කුමක්ද?
(i) උඩරට සම්ප්‍රදාය - ................................    (ii) සබරගමු සම්ප්‍රදාය - .................................

**38.** " තහලම් කල බෙර තම්මැට පටතන්තිරි ඩමුරු" යන කවිය අන්තර්ගත සන්දේශ කාව්‍ය හා එය රචනා වූ යුගය දක්වන්න.
(i) සංදේශ කාව්‍ය : ...........................................    (ii) යුගය : ...............................................................

**39.** රාජකීය ප්‍රිය සම්භාෂණවලින් ප්‍රභවය ලත් බැලේ රංග කලාව සංවර්ධනයට දායක වූ රජු හා බිසව නම් කරන්න.
(i) රජු ...............................................................    (ii) බිසව ....................................................................


**40.** නර්තන හෝ චරිත නිරූපණයේ දී ස්ථානගත ව හා ගමන් කරමින් දක්වන චලන වර්ග දෙක නම් කරන්න.
(i) ස්ථානගත ව කරනු ලබන චලන ......................................
(ii) ගමන් කරමින් කරනු ලබන චලන ......................................

**41.** " රජ කුලයට මොන මල දෑ " මෙම ගී පදය මාත්‍රා 4 තාල රූපයට අනුව ගැයීමේ දී ඊට අයත් ගීමත් ගණන හා සැඳැස් මත් ගණන කීයද?
(i) ගීමත් ගණන.............................    (ii) සැඳැස් මත් ගණන...........................

**42.**



A



B

A හා B රූපසටහනින් දැක්වෙන අංගය හා සැරසිල්ල නම් කරන්න
(i) අංගය - ......................................    (ii) සැරසිල්ල - ......................................

**43.** ද්‍රවිඩ ගැමි නැටුම් අතර ගණ දෙවියන් සහ මුරුගන් දෙවියන් පිදීමට මූලික වූ නර්තන අංග දෙක දක්වන්න.
(i) ගණ දෙවියන් - .......................................    (ii) මුරුගන් දෙවියන් - .....................................

**44.** "උපන් පළමු එකවර ඇති කරපු මව්මරා
අතින් කඩාගෙන පියයුරු බොමින් ලේ උරා"
ඉහත කවි පද භාවිතයෙන් ඉදිරිපත් කරන චරිතය හා ඉන් මතුවන රසය නම් කරන්න.
(i) චරිතය - .......................................    (ii) රසය - ......................................

**45.** රංගා ලෝකය භාවිතයේ දී පුද්ගලයෙක් හෝ උපකරණයක් මතුකර දැක්වීමට හා ආලෝකය විසුරුවා හැරීමට භාවිතා කරන පහන් වර්ග දෙක කුමක්ද?

(i) මතුකර දැක්වීමට..............................


(ii) ආලෝකය විසුරුවා හැරීමට.....................................

**46.** ථුම්රි නර්තනය හා ලයහරෝබා නර්තනය අයත් වන සම්ප්‍රදායයන් වන්නේ

(i) ථුම්රි - .......................................

(ii) ලයහරෝබා - .......................................









A B C D

**47.** ඉහත රූපවල දැක්වෙන ආකාරයට බැලේ රංග කලාවේ දී හා කතක් නර්තන සම්ප්‍රදායේ දී දෙපයට පළඳන ආභරණ නම් කරන්න

(i) .......................................

(ii) .......................................

**48.** ඉහත **B** හා **C** රූපවලින් දැක්වෙන ආභරණ අයත් නර්තන සම්ප්‍රදායයන් දෙක කුමක්ද?

(i) B .......................................

(ii) C .......................................

**49.** "බෙරේ වෙනිවරට බඩවැල අරගන්න" මෙම කවි පදය අයත් වන ශාන්තිකර්මය හා නාට්‍යමය අවස්ථාව සඳහන් කරන්න.

(i) ශාන්තිකර්මය - .......................................

(ii) නාට්‍යමය අවස්ථාව - ................................

**50.** තිල්ලානා හා ශබ්දම් නර්තන අංග අයත් වන්නේ නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය අතුරින් කුමන ගණයටද?

(i) තිල්ලානා - .......................................

(ii) ශබ්දම් - .......................................

* * *

# (52) නර්තනය (දේශීය)

## II පත්‍රය

උපදෙස්:

- ★ පළමුවන කොටසේ ප්‍රශ්න අංක 01 හා 02 අනිවාර්ය වේ.
- ★ **II** හා **III** යන කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ඇතුළත් වන සේ තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ★ සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද, **(ii)** කොටසට ලකුණු **06** ක් ද, **(iii)** කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

---

### I කොටස ( ප්‍රස්තාර හා ඓතිහාසික පසුබිම)

**01.** (i) මංගලම්/ ශුද්ධමාත්‍රය/ මුල් මාත්‍රය නර්තන අංගයට අයත් බෙරපදයක් සහ කවි පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) පහත සඳහන් කවි පද දෙක අදාළ තිත් රූපයට (අවග්‍රහයට) අනුව ප්‍රස්තාර කරන්න.

"සිහින් සිනිඳු සළුව පැළඳ විත් උන් මරඟන
වහන්ස නුඹ අප අතහැර මන්ද මහණ වුන"

(iii) තුන්තිතේ තාලරූපයට අයත් වන්නමක හෝ සිංදු වන්නමක, කස්තිරම/ කලාසම/ ඉරට්ටිය/ ප්‍රස්තාර කර දක්වන්න.

**02.** දේශිය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු පිරික්සීමේ දී මූලාශ්‍රය හා බැඳි සාධක වැදගත් තොරතුරු සපයයි.

(i) පොළොන්නරු යුගයේ දී නර්තන කලාව පැවති තත්ත්වය, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය **දෙකක්** ඇසුරින් දක්වන්න.

(ii) දඹදෙණි යුගයේ තූර්ය වාදනය භාවිත කළ ආකාරය ලිඛිත මූලාශ්‍රයක් ඇසුරින් විග්‍රහ කරන්න.

(iii) ක්‍රි.ව. 1930 දශකයේ සිට ක්‍රි.ව. 1960 දක්වා කාලය තුළ නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සිදු වූ ආකාරය සාධක **හතරක්** ඇසුරින් විමසන්න.

### II කොටස (ශාන්තිකර්ම ක්ෂේත්‍රය හා ජන නැටුම්, ජන නාටක)

**03.** උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්වලට අයත් ශාන්තිකර්ම සුවිශේෂ අනන්‍යතාවයන්ගෙන් උපලක්ෂිත වේ.

(i) වලියක් මංගල්‍ය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

(ii) රටයකුම ශාන්තිකර්මයේ, නානුමුර පෙළපාලිය රඟ දැක්වීමේ දී ශාන්තිකර්ම ශිල්පියාගේ කලා කෞශල්‍ය ප්‍රදර්ශනය වන ආකාරය විමසන්න.

(iii) සමාජ සාරධර්ම හා සහජීවනය වර්ධනයට කිරිමඩු ශාන්තිකර්මය පැවැත්වීමෙන් ලැබෙන වටිනාකම් පිළිබඳ විග්‍රහ කරන්න.

**04.** ශාන්තිකර්මවල විචිත්‍රබව සඳහා විවිධ සැරසිලි භාවිත කරන අතර එහි උපත් කථා මගින් සමාජ සංසිද්ධි විවරණය කෙරේ.

(i) ශාන්තිකර්මයක උපත් කථාවක් ඇසුරින් සමාජ සංසිද්ධි විවරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ii) බලි ශාන්තිකර්ම සැරසිලිවල සුවිශේෂතා දැකිය හැකිය. විමසීමක් කරන්න.

(iii) සන්නියකුමේ උපත් කථාවක් ගෙනහැර දැක්වෙන නර්තන අංගයක් නම් කොට එහි රංගවස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න.

**05.** "ගැමි නැටුම් ජන සමාජයේ ජීවන රටාව විවරණය කරන කැඩපතකි."

(i) ගැමි ගායනා උදාහරණයට ගෙන ඉහත පාඨය පැහැදිලි කරන්න.

(ii) ගැමි නැටුමෙන් ප්‍රතීයමාන වන ආගමික විශ්වාස පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) සිංහල හා ද්‍රවිඩ ජන නැටුම්වල සමාන අසමානතා තුලනාත්මකව විවරණය කරන්න.

## III කොටස (විදේශීය නර්තන හා රසවින්දනය)

**06.** පහත සඳහන් වගුවෙහි (අ), (ආ), (ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ශබ්දම්, පරන්<br>වර්ණම්, ඨුම්රි<br>තිල්ලානා, තරානා | වයලීනය, සාරංගිය<br>මෘදංගම්, පඛ්වාජ්<br>නට්ටුවාංගම්, තබ්ලාව | නල දමයන්ති, කරදිය<br>බැරි සිල්, පටාචාරා<br>හංසවිල, නිදි කුමරිය |

(i) (අ) කොටසින් කතක් නර්තන සම්ප්‍රදායට අදාළ නර්තන අංගයක් තෝරා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

(ii) (ආ) කොටසින් භරත නාට්‍ය සම්ප්‍රදායට අදාළ අවනද්ධ භාණ්ඩය තෝරා එම භාණ්ඩය වාදනයේ දී දක්නට ලැබෙන සුවිශේෂිතා විමසන්න.

(iii) (ඉ) කොටසින් බටහිර බැලේ නිර්මාණයක් නම් කර රංග වස්ත්‍රාභරණ එම කාර්යයට දායකවන ආකාරය විමසන්න.

**07.** අද්‍යතන නර්තන කලා අංග විවිධාංගීකරණයේ දී පෙරදිග හා අපරදිග ආභාසය බෙහෙවින් ලබා ඇති බව ප්‍රදර්ශනය වේ.

(i) දේශිය නර්තන කලාවේ ප්‍රගමනයට බලපෑ නව ප්‍රවණතා විස්තර කරන්න.

(ii) නර්තන කලාවේ පෝෂණයට බලපෑ පෙරදිග හා අපරදිග ආභාසය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) අද්‍යතන ප්‍රාසංගික නර්තන අංග සන්නිවේදනය කිරීමෙහිලා රූපවාහිනිය දක්වන දායකත්වය අගයන්න.

**08.** අද්‍යතන ප්‍රාසංගික නර්තන නිර්මාණකරණයේ දී ආනුෂංගික කලා භාවිතය විශේෂ වේ.

(i) නර්තන නිර්මාණයක ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහිලා සංගීත කලාවෙන් ලැබෙන පිටිවහල විස්තර කරන්න.

(ii) රංගභූමි අලංකරණයේ දී ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහිලා චිත්‍ර කලාවේ දායකත්වය විග්‍රහ කරන්න.

(iii) රංගවස්ත්‍රාභරණ නිර්මාණයේ දී භාවිත ශිල්ප ක්‍රම පිළිබඳ ඇගයීමක් කරන්න.

* * *

# (52) නර්තනය (දේශීය)
## ප්‍රායෝගික පරීක්ෂණය

| අංකය | පරීක්ෂණ අයිතමය | අපේක්ෂිත චර්යා | | මුළු ලකුණු |
|---|---|---|---|---|
| 01 | ගායනය | (1) කැමති ගායනයක්<br>(2) ශාන්තිකර්ම ගායනයක්<br>(3) උඩැක්කි/ පන්තේරු<br>(4) ගැමි ගී/ සේ ගී<br>} විෂය නිර්දේශිත | 05<br>05<br>05<br>05 | 20 |
| 02 | තාල අවබෝධය | වට්ටමක අඩව්වක් තාල තබා කීම<br>වට්ටමක් නැටීම | 05<br>15 | 20 |
| 03 | කැමති නැටුමක් | ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ **විෂය නිර්දේශයට අයත්** ශිල්පීය ප්‍රාගුණ්‍ය දැක්විය හැකි ශාස්ත්‍රීය නර්තනයක්<br>(ප්‍රශ්න පත්‍රයේ ඇතුළත් නොවන) | | 20 |
| 04 | වෙනත් සම්ප්‍රදායකට අයත් නැටුමක් | ⋆ උඩරට නර්තන සම්ප්‍රදායෙන් පෙනී සිටින අයදුම්කරුවන් } ශුද්ධ මාත්‍රය හෝ මුල් මාත්‍රය<br>⋆ පහතරට නර්තන සම්ප්‍රදායෙන් පෙනී සිටින අයදුම්කරුවන් } මංගලම් හෝ මුල් මාත්‍රය<br>⋆ සබරගමු නර්තන සම්ප්‍රදායෙන් පෙනී සිටින අයදුම්කරුවන් } මංගලම් හෝ ශුද්ධ මාත්‍රය | | 20 |
| 05 | වන්නම් / සින්දු වන්නම් | වන්නමක්/ සින්දු වන්නමක් සම්පූර්ණයෙන් නැටීම. | | 20 |
| 06 | ගායනය රහිත නර්තන අංගයක් | උඩරට - ආවැන්දුම හෝ යක්ඇන්නුම<br>පහතරට - දෙවොල් පද හෝ යහන් දැක්ම හෝ පත්තිනි පද<br>සබරගමු - යහන් දැක්ම හෝ දේව කෝල් පාඩුව | | 20 |
| 07 | පූජා භාණ්ඩ භාවිත නර්තන අංගයක්<br>⋆ පූජා භාණ්ඩය නිවැරදිව හැසිරවීම අත්‍යවශ්‍ය වේ. | උඩරට - කොතල පදය හෝ බුලත් පදය<br>පහතරට - කොතල පදය හෝ දළුමුර පදය<br>සබරගමු - කෙන්ඩි පාලිය හෝ දළුමුර පාලිය | | 20 |
| 08 | ගායනය සහිත නර්තන අංගයක් | උඩරට - මංගලම් හෝ කුවේනි අස්න<br>පහතරට - ශුද්ධ මාත්‍රය හෝ විෂ්ණු මල් අස්න<br>සබරගමු - මුල් මාත්‍රය හෝ සමන් දෙවි මල් අස්න | | 20 |
| 09 | වාදනය | I බෙර සරඹ (සමගුණ, දෙගුණ, සිව්ගුණ)<br>II ගායනය සමඟ වාදනය<br>III මඟුල් බෙර වාදනය | 06<br>06<br>08 | 20 |
| 10 | නිර්මාණ | සිද්ධියක් ඇසුරින් චරිත නිරූපණය<br>(නර්තන මාධ්‍යයෙන්) | | 20 |
| | | මුළු ලකුණු | | 200 |

# (54) සංගීතය (පෙරදිග)

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය** - **කාලය : පැය 02යි.**

වරණ **5**කින් යුත් බහුවරණ ප්‍රශ්න **30**ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න **50** පහත සඳහන් ආකාරයට සකස් කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

- ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා ප්‍රශ්න බහුවරණ ප්‍රශ්න ද, 31 සිට 50 දක්වා ප්‍රශ්න කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න ද වන ආකාරයට ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.
    - උත්තර භාරතීය සංගීතයට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 25කි.
    - ජන සංගීතයට සහ දේශීය රංග සම්ප්‍රදායන්ට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 10කි.
    - වෙනත් විෂය කොටස්වලට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 15කි.

ඉහත සෑම විෂය ක්ෂේත්‍රයකට ම අදාළ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න ඇතුළත් කෙරේ.

I පත්‍රය සඳහා මුළු ලකුණු = **100**

**II පත්‍රය** - **කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.

**I කොටස** - රාගධාරී සංගීතයට අයත් නිර්දේශිත සිද්ධාන්ත හා ප්‍රායෝගික විෂය කොටස්වලට අදාළව සකස් කෙරෙන ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි**. ඉන් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **20** බැගින් ලකුණු **40**කි.

**II කොටස** - ශ්‍රී ලංකාවේ ජන සංගීතය, රංග කලා සම්ප්‍රදායන්, සංගීත ඉතිහාසය සහ සංගීත භාණ්ඩවලට අදාළව සකස් කෙරෙන, ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **දෙකකි. එක්** ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එම ප්‍රශ්නයට ලකුණු **20**කි.

**III කොටස** - ඉහත I හා II කොටස්වලට අයත් නොවන, නිර්දේශිත සෙසු සියලු ම විෂය කරුණුවලට අදාළව සකස් කෙරෙන ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **20** බැගින් ලකුණු **40**කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = **100**

**ප්‍රායෝගික පරීක්ෂණය :** ප්‍රශ්න **දහයකින්** සමන්විත වේ.

ප්‍රශ්න අංක 1 - ශ්‍රවණ පරීක්ෂණය

වරුවට නියමිත සියලු අපේක්ෂකයින් මෙම පරීක්ෂණය සඳහා එකවර ඉදිරිපත් විය යුතු ය.

ප්‍රශ්න අංක 2 සිට 10 - පරීක්ෂණ

අපේක්ෂකයින් තනි තනිව ඉදිරිපත් විය යුතු ය.

ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මුළු ලකුණු = **200**

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 100 |
| II පත්‍රය | = | 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | = | 200 |
| අවසාන ලකුණ | = | 400 ÷ 4 = 100 |

# (54) සංගීතය (පෙරදිග)

## I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** මෙම පත්‍රයේ පිළිතුරු සැපයිය යුතු ය.

---

- අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **නිවැරදි** හෝ **ඉතා ම ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

**1.** ආසාවරි සහ ජෞනපුරි රාග යුගලය
(1) සමප්‍රකෘති රාග වේ. (2) උදය සන්ධි ප්‍රකාශ රාග වේ.
(3) පරමේල ප්‍රවේශක රාග වේ. (4) සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ රාග වේ.
(5) පූර්වාංගවාදී රාග වේ. (.........)

**2.** තිහායි, මීන්ඩ්, ගමක්, ඣලා යන ශිල්ප ක්‍රම **සියල්ල ම** යොදා ගත හැක්කේ,
(1) ශාස්ත්‍රීය තබ්ලා වාදනයක දී ය. (2) ශාස්ත්‍රීය ඛ්‍යාල් ගායනයක දී ය.
(3) ශාස්ත්‍රීය සන්තූර් වාදනයක දී ය. (4) ශාස්ත්‍රීය ධ්‍රැපද් ගායනයක දී ය.
(5) ශාස්ත්‍රීය වයලින් වාදනයක දී ය (.........)

**3.** ධා ධා / දිං තා/ කිට ධා / දිං තා/ තිට කත/ ගදි ගෙන
ඉහත සඳහන් තාලය සහ එය වයනු ලබන භාණ්ඩය කුමක් ද?
(1) ඒක්තාල් - තබ්ලා (2) ධමාර් - පක්වාජ්
(3) චෞතාල් - පක්වාජ් (4) චෞතාල් - තබ්ලා
(5) ඒක්තාල් - පක්වාජ් (.........)

**4.** උදාත්ත, අනුදාත්ත, ස්වරිත යන පාරිභාෂික පද තුනෙන් හඳුන්වනු ලබන්නේ
(1) ගායන ශෛලීන් 3කි. (2) ගායන ශිල්ප ක්‍රම 3කි.
(3) නාද ස්ථාන 3කි. (4) තාල ස්ථාන 3කි.
(5) වාදන ශිල්ප ක්‍රම 3කි. (.........)

**5.** භාරතීය සංගීතඥ "ගුලාම් අලි" විසින් ප්‍රවීණතාව දක්වන ලද ගායන ශෛලියක් වන්නේ
(1) තිර්ලානා (2) ධමාර් (3) ගසල් (4) ඨුම්රි (5) චතුරංග (.........)

- පහත දැක්වෙනුයේ රාග තුනකට අදාළ විස්තර ඇතුළත් වගුවකි.

| ස්වර සංගතිය | වාදි ස්වරය | සංවාදි ස්වරය | වක්‍ර ස්වරය | විකෘති ස්වර | රාගය |
|---|---|---|---|---|---|
| රිමප | රි | ප | රි | <u>නි</u> | A |
| රිමප | <u>ධ</u> | <u>ග</u> | - | <u>ග</u> <u>ධ</u> <u>නි</u> | B |
| රිමප | රි | ප | ප | - | C |

**6.** ඉහත A, B, C අක්ෂර සඳහා ගැළපෙන රාග තුන පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) ආසාවරි - ජයජයවන්ති - තිලක්කාමෝද් (2) තිලක්කාමෝද් - ජයජයවන්ති - දේස්
(3) ආසාවරි - දේස් - තිලක්කාමෝද් (4) දේස් - ආසාවරි - ජයජයවන්ති
(5) දේස් - ආසාවරි - තිලක්කාමෝද් (.........)

**7.** ඉහත A අක්ෂරයට අදාළ රාගයෙහි වක්‍ර ස්වරය යෙදෙන ස්වර සංගතිය තෝරන්න.
(1) රි ග රි ප ම (2) ම ග රි ග රි
(3) ම ග රි ග ස (4) ප රි ම ග රි
(5) ප ධ ම ග රි (.........)

**8.** ඉහත B අක්ෂරයට අදාළ රාගයෙහි රාග ජාතිය කුමක් ද?

(1) සම්පූර්ණ - සම්පූර්ණ (2) ෂාඩව - සම්පූර්ණ
(3) ඖඩව - සම්පූර්ණ (4) ඖඩව - ෂාඩව
(5) ෂාඩව - ඖඩව (.........)

**9.** ධප / ගමග / නි - / සරිග මෙම ස්වර ප්‍රස්තාර කොටස කිසියම් රාගයකට අයත් වේ. එම ස්වර ප්‍රස්තාර කොටස අයත් රාගයේ ගානසමය සහ තාලය පිළිවෙළින් වනුයේ,

(1) සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ සමය - ජප්තාලය (2) දිවා ප්‍රථම ප්‍රහරය - දීප්චන්දි තාලය
(3) උදය සන්ධි ප්‍රකාශ සමය - ජප්තාලය (4) රාත්‍රී ප්‍රථම ප්‍රහරය - ජප්තාලය
(5) රාත්‍රී ප්‍රථම ප්‍රහරය - දීප්චන්දි තාලය (.........)

**10.** භාරතීය සංගීතයෙහි, හින්දුස්තානි හා කර්ණාටක වශයෙන් පද්ධති දෙකක් බිහි වූයේ,

(1) පර්සියානු සංගීතයේ බලපෑමෙන් පසුව ය.
(2) ගුරුකුල ක්‍රමය බිහි වීමෙන් පසුව ය.
(3) අපරදිග ජාතීන්ගේ බලපෑමට යටත් වීමෙන් පසුව ය.
(4) රබීන්ද්‍ර සංගීතය බිහි වීමෙන් පසුව ය.
(5) සාමවේද ගායනය ආරම්භ වීමෙන් පසුව ය. (.........)

**11.** පහත දැක්වෙනුයේ උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවලට අදාළ කරුණු කිහිපයකි.

A - කාකලි නිෂාද, ෂට්ශ්‍රැති රිෂභ, ආදී වශයෙන් ස්වර නාම 16 කි.
B - සියලු රාග ථාට 10 යටතේ වර්ග වේ.
C - මූලික තාල 35 කි.
D - ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය තබ්ලාව ය.

ඉහත කරුණු අතුරින් කර්ණාටක සංගීත පද්ධතියට අදාළ වන්නේ,

(1) AB (2) AC (3) AD (4) BC (5) CD (.........)

**12.** ඉහත කරුණු අතුරින් හින්දුස්තානි සංගීත පද්ධතියට අදාළ වන්නේ,

(1) AB (2) AC (3) AD (4) BC (5) BD (.........)

**13.** ගීතිකා මත අංක යොදා ගායනා කරන ආකාරය පිළිබඳ ලිඛිත සටහනක් යොදා ඇති පළමු වේද ග්‍රන්ථය වනුයේ,

(1) ඍග් වේදයයි. (2) යජුර් වේදයයි (3) සාම වේදයයි.
(4) අථර්වන් වේදයයි. (5) ගාන්ධර්ව වේදයයි. (.........)

**14.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාගවලට අයත් විශේෂ ලක්ෂණ කිහිපයකි.

A - ආරෝහණයේ කෝමල ගාන්ධාරය යෙදේ.
B - පූර්වාංග වාදී රාගයකි. රි,ප, වාදි-සංවාදි වේ.
C - ධ නි රි යන ස්වර සංගතිය යෙදේ.
D - රිෂභය වක්‍රව යෙදේ.
E - නිෂාදය කෝමල හා ශුද්ධ යන දෙයාකාරයෙන් යෙදේ.

ඉහත ලක්ෂණ අතුරින් ජයජයවන්ති රාගයට අදාළ **නොවන** ලක්ෂණ ඇතුළත් වරණය කුමක් ද?

(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D (5) D හා E (.........)

**15.** බාගේශ්‍රී රාගය ඇසුරින් නිර්මිත සරල ශාස්ත්‍රීය ගීතයක් වන්නේ

(1) ශිල්පී සුනිල් එදිරිසිංහ ගයන 'හංස රාජිනී' ගීතයයි.
(2) ශිල්පී වික්ටර් රත්නායක ගයන 'හෝපලු වන පෙත' ගීතයයි.
(3) ශිල්පී සනත් නන්දසිරි ගයන 'ඇවිලුණු ගිනිදැල්' ගීතයයි.
(4) ශිල්පිණී අමරා රණතුංග ගයන 'වස් දඬුරාවේ' ගීතයයි.
(5) ශිල්පී එඩ්වඩ් ජයකොඩි ගයන 'මුව මුක්තාලතා' ගීතයයි. (.........)

**16.** පහත දැක්වෙනුයේ පෙරදිග සංගීත භාණ්ඩයන්හි ලක්ෂණ කිහිපයකි.

A - හමක් අවුරා තිබීම　　　　B - තත් යොදා තිබීම

C - තුම්බාව ගෝලාකාර වීම　　　　D - ලී වර්ගයෙන් ආකෘතිය සැකසීම

E - පර්දා යොදා තිබීම

සාරංගි, සරෝද්, එස්රාජ් යන භාණ්ඩ තුනට ම පොදු ලක්ෂණ ඇතුළත් ඉංග්‍රීසි අක්ෂර සහිත පිළිතුර වන්නේ,

(1) A, B හා C ය.　　　　(2) A, B හා D ය.

(3) A, B හා E ය.　　　　(4) B, C හා D ය.

(5) C, D හා E ය.　　　　(.........)

**17.** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් පිළිබඳ විශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක් වේ.

A - වෙස් මුහුණු පැළඳීම

B - ඉන්නිසය, උරුට්ටුව, තෝඩායම භාවිතය

C - චරිත හඳුන්වා දීම සබේ විදානේ විසින් සිදු කිරීම

D - චරිත හඳුන්වා දීම පොතේ ගුරු විසින් සිදු කිරීම

E - "තානායම් පොළ" නම් ස්ථානයක රංගගත කිරීම

ඉහත විශේෂ ලක්ෂණ වෙන් කිරීම හා සම්බන්ධ නිවැරදි පිළිතුර ඇතුළත් වරණය කුමක් ද?

(1) කෝළම් රංග සම්ප්‍රදාය - AB　　　　(2) කෝළම් රංග සම්ප්‍රදාය - AD

(3) නාඩගම් රංග සම්ප්‍රදාය - BD　　　　(4) නාඩගම් රංග සම්ප්‍රදාය - BE

(5) කෝළම් රංග සම්ප්‍රදාය - CD　　　　(.........)

**18.** ශ්‍රී ලංකාවේ ජන සංගීතයට අයත් වන ගීතයන්ගේ විශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක් වේ.

A - උඩරට වන්නම් සම්ප්‍රදායට අයත් වේ.

B - තත්, පිත්, තොන්, නන් ආදී වශයෙන් බෙරපද වාදනය කෙරේ.

C - සුළු මහ දෙතිතට ගායනය කෙරේ.

D - මුද්‍රප්පදය සහිත ගීත ඇතුළත් වේ.

E - ශෝකාත්මක අවස්ථාවන්හිදී ගයන ගීත විශේෂයකි.

සැවුලා වන්නමට අදාළ විශේෂ ලක්ෂණ ඇතුළත් වන වරණය කුමක් ද?

(1) A හා B　　(2) A හා C　　(3) B හා E

(4) C හා E　　(5) D හා E　　(.........)

**19.** නෙළුම් ගී ගායනය සඳහා බැඳී පවතින අවනද්ධ භාණ්ඩය කුමක් ද?

(1) උඩැක්කිය　　(2) රබාන　　(3) බුම්මැඩිය

(4) තාලම්පට　　(5) ගැටබෙරය　　(.........)

**20.** නාඩගම් සම්ප්‍රදායේ පොතේ ගුරු විසින් ගායනා කරනු ලබන ගීතය කුමක් ද?

(1) තානම　　(2) ඉන්නිසය　　(3) උරුට්ටුව

(4) දොහොරාව　　(5) කවි පදය　　(.........)

**21.** මහනුවර යුගයේ ප්‍රචලිත මුද්‍රප්පද හා තානම් ඇතුළත් ගීතවල කර්ණාටක සංගීත ආභාසය ලැබී ඇත. එම ගීත වන්නේ පිළිවෙළින්,

(1) වන්නම් හා ප්‍රශස්ති වේ.　　　　(2) ප්‍රශස්ති හා වන්නම් වේ.

(3) වන්නම් හා හටන් ගී වේ.　　　　(4) හටන් ගී හා වන්නම් වේ.

(5) ප්‍රශස්ති හා සවිදම් වේ.　　　　(.........)

**22.** කර්ණාටක තාල පද්ධතිය ගොඩ නැගී ඇත්තේ,

(1) මූලික තාල 8ක් හා ජාති 4ක් වශයෙනි.


(2) මූලික තාල 7ක් හා ජාති 5ක් වශයෙනි.

(3) මූලික තාල 6ක් හා ජාති 6ක් වශයෙනි.

(4) මූලික තාල 5ක් හා ජාති 7ක් වශයෙනි.

(5) මූලික තාල 4ක් හා ජාති 8ක් වශයෙනි.　　　　(.........)

**23.** පහත දැක්වෙන ස්වර පුවරු රූප සටහනේ ලකුණු කර ඇති ස්වර 4 එකවර වැයෙන විට නිකුත් වන කෝඩ් එක නම් කරන්නේ කෙසේ ද?



(1) C Major (2) C Major 7th (3) C Minor (4) G Major 7th (5) G Minor (.........)

**24.** ඉහත රූප සටහනේ ලකුණු කර ඇති ස්වරවලින් ''ස'' ස්වරය (C) අත්හල විට නිකුත් වන කෝඩ් එක කුමක් ද?
(1) C Major 7th (2) E Major (3) E Major 7th (4) E Minor (5) G Minor (.........)


**25.** මිනිසාට සාමාන්‍යයෙන් ශ්‍රවණය කළ හැකි කම්පන වාර සංඛ්‍යාත පරාසය ඇතුළත් සීමාව දැක්වෙන වරණය තෝරන්න.
(1) 30 - 30,000 (2) 20 - 20,000
(3) 10 - 10,000 (4) 40 - 40,000
(5) 5000 - 50,000 (.........)

**26.** නාද, ස්වර, ස්වර ස්ථාන, රාග, තාල හැකියා සංවර්ධනය සඳහා හේතු වන බුද්ධිය කුමක් ද?
(1) කායික සංචලනමය බුද්ධිය (2) වාචසික භාෂාමය බුද්ධිය
(3) දෘශ්‍ය අවකාශමය බුද්ධිය (4) සංගීත - රිද්මයානුකූල බුද්ධිය
(5) පුද්ගල ඇතුලාන්ත බුද්ධිය (.........)


**27.** අප්‍රිකානු සංගීතයට අයත් නොවන සංගීත භාණ්ඩයක් වන්නේ
(1) බැලෆෝන් (Balafon) ය. (2) ජෙම්බෙ (Djembe) ය.
(3) කැපන් ලොගො (Kapan Logo) ය. (4) කොරා (Kora) ය.
(5) බැලලයිකා (Balalaika) ය. (.........)


**28.** බටහිර සංගීත, කර්ණාටක සංගීත, හින්දුස්ථානි සංගීත සම්ප්‍රදායන් අනුව වයලීනයේ තත් සුසර කරන ක්‍රම පිළිවෙළින් තෝරන්න.
(1) ප̣ ස̣ ප ස, ප̣ රි ධ ග̇, ස̣ ප̣ ස ප (2) ප̣ රි ධ ග̇, ප ස̇ ප ස̇, ස̣ ප̣ ස ප
(3) ස̣ ප̣ ස ප, ප̣ රි ධ ග̇, ප̣ ස ප ස̇ (4) ප̣ රි ධ ග̇, ස̣ ප̣ ස ප, ප̣ ස ප ස̇
(5) ප̣ ස ප ස̇, ස̣ ප̣ ස ප, ප̣ රි ධ ග̇ (.........)


**29.** පහත දී ඇති ප්‍රස්තාර කොටස සලකන්න.





ඉහත රූප සටහනින් දැක්වෙන ප්‍රස්තාර කොටසේ ටයිම් සිග්නේචරය යොදා නැත. බටහිර තාල සංකල්පය අනුව ටයිම් සිග්නේචරය යොදන්නේ කෙසේ ද?

(1) 


(2) 


(3) 


(4) 


(5) 


(.........)

**30.** ඉහත ප්‍රශ්න අංක 29 හි සඳහන් බටහිර ස්වර ප්‍රස්තාර කොටස මධ්‍යම භාවයට (F major Scale) පෙරලූ විට ගොඩ නැගෙන ස්වර පාදය තෝරන්න.

(1) ධ - - / නි - - / ස් නි ධ / ප ම - /
(2) නි - - / ස් - - / රි ස් නි / ධ ප - /
(3) ග - - / ම - - / ප ම ග / රි ස - /
(4) ස් - - / රි - - / ග් රි ස් / නි ධ - /
(5) ම - - / ප - - / ධ ප ම / ග රි - / (.........)

- අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

**31.** දී ඇති තබ්ලා රූප සටහනෙහි මුහුණත් ඇසුරින්, අවනද්ධ අක්ෂර නිකුත් වන ස්ථාන 3ක් පෙන්නුම් කර ඇත. එම අවනද්ධ අක්ෂර පමණක් තනි ව හෝ මිශ්‍ර ව යොදා ගනිමින් ගොඩ නගා ගත හැකි තාල **දෙකක්** නම් කරන්න.

(a) ............................................................

(b) ..........................................................




**32.** පාසල් සංගීත අධ්‍යාපනය සඳහා සිංහල බසින් රචිත, රාගධාරී ගී ඇතුළත් "භාවික ගීත" නමැති ග්‍රන්ථයේ රචකයා ................................................................ සූරීන් වන අතර මකුලොලුව සූරීන් විසින් රචිත, ශ්‍රී ලංකාවේ ජන ගී ප්‍රස්තාර ඇතුළත් පර්යේෂණාත්මක ග්‍රන්ථය ................................. නමින් හැඳින් වේ.

**33.** සංගීත රත්නාකර ග්‍රන්ථය ........................................................... පඬිතුමා විසින් ද, ක්‍රමික් පුස්තක් මාලිකා ග්‍රන්ථය ............................ පඬිතුමා විසින් ද රචනා කරන ලදී.

**34.** පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා ........................................................... භාණ්ඩය වාදනයට ද, පණ්ඩිත් වී.ජී. ජෝග් ........................................................ භාණ්ඩය වාදනයට ද සුප්‍රසිද්ධ ය.

- ප්‍රශ්න අංක 35 සහ 36 සඳහා පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.

"ජයනි විසින් (පාසලේ විවිධ ප්‍රසංගයේ දී) අ.පො.ස. උසස් පෙළට නිර්දේශිත රාගයකින් ශාස්ත්‍රීය වාදනයක් ඉදිරිපත් කරන ලදී. එම වාදනය අවසානයේ මිස්රාබයෙන් විවිධ රිද්මයානුකූල ක්‍රම භාවිතයෙන්, ස්වර සංගති ද්‍රැතලයෙන් යුතුව වයන ලදී. ඒ සඳහා තාල වාදනයේ යෙදුණු මිථිල විසින් ඇයගේ වාදනයට සමගාමී ව තිහායි සහ චක්‍රදාර් සහිත ව සිය වාදනය අවසන් කරන ලදී. ජයනි විසින් සිය වාදනය සඳහා මධ්‍යම ස්වරය අයත් පර්දාව කිසි විටෙකත් යොදා නොගන්නා ලදී. "

**35.** ජයනි වැයූ භාණ්ඩය ............................................... වන අතර, ඇය විසින් ද්‍රැතලයෙන් වැයූ අවසාන වාදන කොටස ............................................. යන නාමයෙන් හැඳින් වේ.

**36.** ජයනි වැයූ රාගය .................................... වන අතර මිථිල වැයූ තාලය ..................................... වේ.

**37.** "ස්මගරිස, (නි)ධ ස" මෙම ස්වර ඛණ්ඩයේ මධ්‍යමයට ඉහළින් ඇති "ස" ස්වරය .............................................. ස්වරයක් ලෙසටත්, වරහන් යෙදූ මන්ද්‍ර කෝමල නිෂාදය .................................. ස්වරයක් ලෙසටත් නම් කළ හැකි ය.

**38.** පහත දැක්වෙන එක් එක් ස්වර ඛණ්ඩය ඉදිරියෙන් එය අයත් වන රාගය නම් කරන්න.

(a) රිමපධ මගරි, ගනිස ................................................

(b) රිමපධ මග, සරිග සනි ...............................................

**39.** (a) නිස ගම පධ නිසං | නිධ පම ගරි ස – |
(b) ගගරිස පපගප නිනිපනි සංසංනිසං |
ප්‍රායෝගික භාවිතයේදී ඉහත තානාලංකාර වර්ග දෙක පිළිවෙළින් හඳුන්වනුයේ (a) ................................ නමින් හා (b) .............................. නමිනි.

**40.** (a) 1 2 3 4 5 / 6 7 / 8 9 10 / 11 12 13 14 /
(b) 1 2 / 3 4 / 5 6 / 7 8 / 9 10 / 11 12 /
ඉහත දැක්වෙන ආකාරයට තාල විභාග වෙන් වන හිංදුස්තානි තාල යොදාගෙන, ලය ගුණ කරමින් ගැයෙන පුරාණයේ සිට පැවත එන ගායන ශෛලීන් දෙක පිළිවෙළින් නම් කරන්න.
(a) ............................................................
(b ) ..........................................................

**41.** බුද්ධ |ංසර|ණෝss|sss|සිරස|දරාs|ගෙනs|sss| යන ජන ගී පාදයේ ගීමත් සංඛ්‍යාව ............. ක් වන අතර සඳැස්මත් සංඛ්‍යාව ............... ක් වේ.

**42.** දරිද්‍රතාව හා ජීවිතයේ දුක් කම්කටොළු ගීතවලින් ප්‍රකාශ වන මෙහෙ ගී විශේෂය ................................ වන අතර දාර්ශනික බව පෙන්නුම් කරන අවස්ථා ද දැක්වෙන ගී වර්ගයකි, ................................ .

**43.** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් දෙකකට අදාළ විශේෂතා දෙකක් පහත දැක් වේ. එම කරුණු ඉදිරියෙන් අදාළ සම්ප්‍රදාය නම් කරන්න.
(a) දොහොරාව ........................................... (b) උරුට්ටුව ...............................................................

**44.** ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ "දෙලොවක් අතර" චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය කරන ලදදේ ........................................................ මහතා විසින් වන අතර "ගයන ගැයුම්" ගීතයට දායක වූයේ ................................................................. ගායක කණ්ඩායමයි.

**45.** 'සිතක පිපුණු මල්' චිත්‍රපටයේ පී.වී. නන්දසිරි මහතා ගයන .......................... ගීතය ඛ්‍යාල් ගායනා ශෛලියේ ආකෘතිය අනුව නිර්මාණය වී ඇති අතර එයට පාදක වී ඇත්තේ .......................... රාගයයි.

**46.** සිනමාරූපී සංගීතයේ සන්ධිස්ථානයක් වන "සත් සමුදුර" චිත්‍රපටයේ සංගීතය ................................................... මහතා විසින් නිර්මාණය කළ අතර එහි තේමා ගීතය ගායනා කරනුයේ ............................................................. විසිනි.

**47.** "ගලන ගඟකි ජීවිතේ" වැනි සරල ස්වතන්ත්‍ර තනු ඇතුළත් මුල්ම වර්ණ චිත්‍රපටය වන .................................... චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය කළේ ........................................................ විසින් ය.

**48.** ස්වර සප්තකයේ "ස" ස්වරයේ සංඛ්‍යාතය 240 වශයෙන් සඳහන් වන විට, "ම" ස්වරයේ සංඛ්‍යාතය ........................................... වන අතර "ප" ස්වරයේ සංඛ්‍යාතය .................................... වේ.

**49.** පාසල් පද්ධතිය තුළ භාවිත වන අපරදිග සුෂිර වාද්‍ය භාණ්ඩවලින්, වාදන ඉරියව් හා ස්වර නිකුත් කිරීමේ ආකාරයේ සමාන බවක් ඇති සංගීත භාණ්ඩ ත්‍රිත්වය වන්නේ
(a) Trumpet (b) ........................... සහ (c) ......................................... ය.

**50.** සංගීතමය බුද්ධිය පිළිබඳ අදහස් දැක් වූ ........................................................................... මහතා .................................................................. ජාතික මනෝවිද්‍යාඥයකු වේ.

* * *

# (54) සංගීතය (පෙරදිග)

## II පත්‍රය

**සැලකිය යුතුයි:**

- I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, II කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් ලැබේ.)

---

### I කොටස

**01.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අයත් උත්තරාංග කොටසෙහි ස්වර සංගතීන් ය.

A - ම ප ධ̲ ධ̲ ස්̇ - ස්̇ නි̲ ධ̲ ප
B - ම ප නි නි ස්̇ - ස්̇ නි̲ ධ ප
C - ම ප ධ̲ නි̲ ස්̇ - ස්̇ නි̲ ධ̲ ප
D - ම ප ධ̲ නි ස්̇ - ස්̇ නි ධ̲ ප

(i) ඉහත ස්වර සංගතීන් අයත් වන රාග **හතර පිළිවෙළින්** නම් කරන්න. **(ලකුණු 04)**

(ii) ඉහත (A) ස්වර සංගතියට අදාළ රාගයට සමප්‍රකෘති රාගය නම් කර, එහි ආරෝහණ, අවරෝහණ, වාදි සංවාදී ස්වර, සහ ගානසමය ලියන්න. **(ලකුණු 04)**

(iii) ඉහත රාග අතුරින් උදය කාලයේ ගැයෙන රාගයක් නම් කර, එම රාගයට අදාළ ව ආලාප ඛණ්ඩයක්, ස්වර 20කට නොඅඩු වන සේ ලියා එම රාගයට අදාළ ව මාත්‍රා 16කින් යුත් තානාලංකාරයක් නිර්මාණය කර ලියන්න. **(ලකුණු 06)**

(iv) ඉහත රාග අතුරින් සම්පූර්ණ ජාතියට අයත්, රිෂභ ස්වරය වක්‍රව යෙදෙන රාගයෙහි මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ මධ්‍යලය වාදිතයක හෝ අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කර, ඊට අදාළව මාත්‍රා අටකට නො අඩුතානාලංකාර දෙකක් ද, තාලානුකූල ව ප්‍රස්තාර කරන්න. **(ලකුණු 06)**

**02.** (i) රාගධාරි සංගීතයෙහි භාවිත වන ආලාප වර්ග **දෙකක්** පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

(ii) තානාලංකාර වර්ග **දෙකක්** නම් කර උදාහරණය බැගින් ලියන්න. **(ලකුණු 04)**

(iii) තබ්ලා වාදනයක අංග **දෙකක්** නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

(iv) පහත සඳහන් වගුවේ එක් එක් තීරුවල ඇති කොටස් මාරු වී ඇත. එම කොටස් A තීරුවේ සඳහන් සංගීතඥයින් හා නිවැරදි ව සම්බන්ධ කරමින් නැවත වගුගත කරන්න. **(ලකුණු 08)**

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| I | රවි ශංකර් | වයලීනය | තත් නියගින් වයනු ලබයි | තුම්බාව හමකින් ආවරණය වී ඇත | ක්වාලම් |
| II | අලි අක්බාර් ඛාන් | සිතාරය | තත් යුගල/ත්‍රිත්ව වශයෙන් පිහිටා ඇත | එජස්ටර්ස් 4කින් යුක්ත ය | Bow(ගජ්) |
| III | ශිව කුමාර් ශර්මා | සරෝද් | තත් හතරම වාදනය සඳහා යොදා ගැනේ | පර්දා සහිත ය | මිස්රාබ් |
| IV | එන් රාජම් | සන්තූර් | ප්‍රධාන තත් එකකි | ධරණක (Bridge) රාශියකින් යුක්ත ය | ජවා |

**03.** පහත වගුව උපයෝගි කර ගනිමින් පිළිතුරු සපයන්න.

| | ගීතයේ වචන | ගායන ශෛලිය |
|---|---|---|
| A | රාම රතන ධන/ තුම බින මෝරෙ/ ප්‍රේමක චලිත | |
| B | චුප්කේ චුප්කේ/ දිවා රූසේ/ ශ්‍යාමෙ හම් | |
| C | කෞන කරත තොරි/ බල්මා මෝරි තෝරි/ යේ හෝ දාය දාය | |
| D | නාදිර් දිර් දීම්ත දෙරෙ දානී | |

(i) A, B, C, D කොටස්වල දැක්වෙන ගීතවලට අදාළ ගායන ශෛලීන් **හතර** පිළිවෙළින් නම් කර, එම එක් ගායන ශෛලියක් පිළිබඳ සුවිශේෂී කරුණු **හතරක්** විස්තර කරන්න. **(ලකුණු 06)**

(ii) B හා C හි සඳහන් ගායන ශෛලීන් සඳහා ප්‍රවීණත්වයක් උසුලන භාරතීය සංගීතඥයින් දෙදෙනකු නම් කර අදාළ ගායන ශෛලීන්ට ඔවුන්ගෙන් සිදු වූ සේවාව පිළිබඳ ව සුවිශේෂී කරුණු **හතරක්** යටතේ විස්තර කරන්න. **(ලකුණු 05)**

(iii) C කොටසෙහි දක්වා ඇති ගීත ගැයෙන තාලය නම් කර එම තාලය සම හා දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න. **(ලකුණු 04)**

(iv) පහතින් දැක්වෙනුයේ මිශ්‍ර රාගයකට අයත් ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාරයකි. ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.

| ධ - නි ස | ග ම රි ස | ග ම ධ ප | ධ නි ධ ප |

(a) ඉහත ස්වර ප්‍රස්තාරයේ (ස්වර සප්තකයට අනුව) පූර්වාංගයෙන් පිළිබිඹු වන නිර්දේශිත රාගය නම් කරන්න.

(b) ඉහත ස්වර ප්‍රස්තාරයේ උත්තරාංගයෙන් පිළිබිඹු වන නිර්දේශිත රාගය නම් කරන්න.

(c) දී ඇති ප්‍රස්තාරගත රාගය ගැයීමට සුදුසු ගාන සමය සොයා නම් කරන්න.

(d) ඉහත ස්වර ප්‍රස්තාරයට ගැළපෙන ලෙස දෙවන පේලියක් සඳහා සුදුසු ස්වර රචනාවක් ප්‍රස්තාර කරන්න. **(ලකුණු 05)**

## II කොටස

**04.** පහත සඳහන් වගුව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| a | b |
|---|---|
| වරමාතී සුභ චරිතේ ලංකාපති<br>නරේන්ද්‍රසිංහ නෘපතේ<br>භෝජරාජ සමතේජභිරාමා<br>ත්‍යාජ කාම රණ භූෂණ සෝමා | මලේ මලේ ඔය නාමල නෙලා වරෙන්<br>අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්<br>කැළණි ගඟේ ඔරු යනවා බලා වරෙන්<br>සාදුකාර දී ඔරුවක නැගී වරෙන් |

(i) ඉහත aහි සහ bහි කොටස් දෙකෙහි සඳහන් ගී දෙක අදාළ ජන ගී වර්ගය අනුව නම් කරන්න. **(ලකුණු 02)**

(ii) එම ගී වර්ග දෙක පිළිබඳ සංසන්දනාත්මක කරුණු **හතරක්** ලියන්න. **(ලකුණු 04)**

(iii) a කොටසේ සඳහන් ගී වර්ගයට අයත් වෙනත් ගීයක් නම් කර එහි මුල් පාදය ස්වර ප්‍රස්තාර කරන්න. **(ලකුණු 06)**

(iv) b කොටසේ සඳහන් ගී වර්ගයට අදාළ සුවිශේෂී ලක්ෂණ හතරක් ඉදිරිපත් කරන්න. **(ලකුණු 08)**


**05.** (i) පහත දැක්වෙන A, B කොටස් අතුරින් එක් කොටසක් තෝරාගෙන එහි දැක්වෙන සම්ප්‍රදායන්හි සංගීත ශෛලිය හා රංග ශෛලිය පිළිබඳ සැසඳීමක් කරන්න. (කරුණු 06ක් සෑහේ.)
A කෝලම් - සොකරි
B නාඩගම් - ගීත නාටක **(ලකුණු 06)**

(ii) "නූර්ති රංග සම්ප්‍රදායේ සංගීතය සඳහා උත්තර භාරතීය රාගධාරී සංගීතාභාසය ලැබී ඇත."
ඉහත කියමන නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. **(ලකුණු 08)**

(iii) ඔබ කැමති තත් වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ කොටස් හතරක් නම් කර, ප්‍රධාන තත් සුසර කිරීමේ පිළිවෙළ ලියා දක්වන්න. **(ලකුණු 06)**

## III කොටස

**06.** පහත දැක්වෙන අපරදිග ප්‍රස්තාර කොටස ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) මෙම ප්‍රස්තාරයට අයත් ස්කේලය කුමක් ද? **(ලකුණු 02)**

(ii) මෙම ප්‍රස්තාරයේ තාලයට සමාන දේශීය තිත නම් කරන්න. **(ලකුණු 02)**

(iii) මෙම ප්‍රස්තාරය කුමන ජන ගී විශේෂයකට අයත් ද? **(ලකුණු 02)**

(iv) අංක 1 සිට 8 දක්වා අංකනය කර ඇති සංකේත නම් කරන්න. **(ලකුණු 04)**

(v) මෙම ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න. **(ලකුණු 04)**

(vi) පෙරදිග ක්‍රමයට සැකසූ ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් යුතුව නැවත ප්‍රස්තාර කරන්න. **(ලකුණු 06)**

**07.** (i) පහත දැක්වෙන ගී පාද සුදුසු තාලයකට අනුව ප්‍රස්තාර කරන්න.
'' මද සුළඟ හමනා මේ සොඳුරු රාත්‍රියේ
ගී රාවයේ මිහිර මා සනහනා '' **(ලකුණු 04)**

(ii) ඔබ කැමති නිර්දේශිත රාගයක් නම් කර ඒ ඇසුරින් ඉහත පද ප්‍රස්තාරයට සුදුසු තනුවක් නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න. **(ලකුණු 08)**

(iii) එම තනුව රසවත් කිරීමට පහත දැක්වෙන කොටස් එක් කරන්න.
a. එක් එක් විභාගය මත ඊට ගැළපෙන Chords යොදන්න.
b. ගැළපෙන Introduction කොටසක් නිර්මාණය කරන්න.
c. සුදුසු Bits යොදන්න. **(ලකුණු 08)**

**08.** (i) පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් තෝරාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.
a. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ චිත්‍රපට සංගීතයට ලද භාරතීය බලපෑම
b. ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය
c. හොවාර්ඩ් ගාඩ්නර් විසින් ප්‍රකාශිත " සංගීත රිද්මයානුකූල බුද්ධිය"
d. මෙරට මුල් යුගයට අයත් සංගීත අධ්‍යාපනික ග්‍රන්ථ දෙකක් පිළිබඳ ඇගයීමක් කරන්න.
e. නිර්දේශිත සරල ගීයක් පිළිබඳ විචාරාත්මක ඇගයීමක් කරන්න. **(ලකුණු 12)**

(ii) සංගීත නිර්මාණය හා පටිගත කිරීම සඳහා යොදා ගත හැකි පරිගනක ආශ්‍රිත මෘදුකාංග තුනක් නම් කර ඉන් එකක් ප්‍රායෝගික ව යොදා ගන්නා අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 08)**

* * *

# (54) සංගීතය (පෙරදිග)

## ප්‍රායෝගික පරීක්ෂණය

උපදෙස්:

අ.පො.ස. උසස් පෙළ පෙරදිග සංගීතය විෂයයේ ප්‍රායෝගික ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍රයේ **සියලු ම** ප්‍රශ්න ඇගයීමට ලක් වේ. ප්‍රශ්න අංක 01 ශ්‍රවණ පරීක්ෂණය ලෙස නම් කෙරේ. (වරුවට නියමිත සියලු අපේක්ෂකයින් සඳහා එකවර මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරනු ඇත.) ප්‍රශ්න අංක 02 සිට 10 දක්වා අපේක්ෂකයන් **තනි තනිව** ඉදිරිපත් විය යුතු වේ.

| | ප්‍රශ්න සඳහා අදාළ විෂය කොටස් | ලකුණු |
|---|---|---|
| 01 | ශ්‍රවණ පරීක්ෂණයඃ-<br>I පරීක්ෂකවරයා විසින් ආලාප කරනු ලබන රාගය හඳුනාගෙන ලිවීම<br>II පරීක්ෂකවරයා විසින් ගයනු ලබන ස්වර ඛණ්ඩය හඳුනාගෙන ලිවීම<br>III පරීක්ෂකවරයා විසින් ගයනු ලබන ස්වර අභ්‍යාසයේ ආරෝහණයේ පළමු පියවරට අනුකූලව අවරෝහණයෙහි යෙදෙන පළමු පියවරට අයත් ස්වර පිළිවෙළින් ලිවීම.<br>IV පරීක්ෂකවරයා විසින් ගයනු ලබන ගී පාදය, ගී පද ප්‍රස්තාර කිරීම<br>V පරීක්ෂකවරයා විසින් වයනු ලබන ඨේකාව අයත් තාලය නම් කිරීම | 20 |
| 02 | අපේක්ෂකයා කැමති නිර්දේශිත රාගයකින් විලම්බ ලය ගීතයක්/ වාදිතයක් පහත දැක්වෙන අංග සහිතව ගායනය, වාදනය කිරීම<br>{පූර්ව ආලාප/ ස්ථායි/ තානාලංකාර 02ක් (අවම වශයෙන් විභාග දෙකකින්වත් ආවරණය වන පරිදි) ශිල්පීයත්වය අගයනු ලැබේ.} | 20 |
| 03 | අ.පො.ස උසස් පෙළට නිර්දේශිත රාග අතරින් මධ්‍යලය ගීතයක්/වාදිතයක් (ඉහත 02 ප්‍රශ්නයට ඉදිරිපත් වූ රාගය හැර) පහත අංග සහිතව ගායනය/ වාදනය කිරීම<br>(පූර්ව ආලාප/ ස්ථායි/ මධ්‍ය ආලාප/ අන්තරා/ සර්ගම්, අකාර, බෝල් ආදී විවිධ වර්ග තානාලංකාර 4ක් සමග) / ශිල්පීයත්වය අගයනු ලැබේ. | 24 |
| 04 | නිර්දේශිත රාග අතරින් (ඉහත 02 හා 03 ප්‍රශ්න සඳහා අපේක්ෂකයා ඉදිරිපත් කළ රාග හැර) පරීක්ෂක විසින් නම් කරනු ලබන රාගයේ, මධ්‍යලය ගීතයක්/ වාදිතයක් පහත අංග සහිතව ගායනය/ වාදනය කිරීම (ආරෝහණ/අවරෝහණ/ස්ථායි/අන්තරා/ තානාලංකාර 4) ශිල්පීයත්වය අගයනු ලැබේ. | 20 |
| 05 | I පරීක්ෂක විසින් (ඉහත 02/03/04 කොටස් සඳහා අපේක්ෂක විසින් ඉදිරිපත් නොවූ රාගයකින්) ගයා/වයා ඉදිරිපත් කරනු ලබන, රාගාශ්‍රිත ස්වර ඛණ්ඩය ගයා/වයා අනුකරණයේ යෙදීම<br>II එම රාගයට අයත් රාගාශ්‍රිත පල්ටාවක් උච්ච ෂඩ්ජය දක්වා විස්තාර කිරීම<br>III දෙන ලද ස්වර අභ්‍යාසය උච්ච ෂඩ්ජ ස්වරය තෙක් විස්තාර කර ගයා/වයා (අවරෝහණ රූපය ද සහිතව) ඉදිරිපත් කිරීම<br>IV දෙනු ලබන ස්වර 06 පිළිවෙළින් (දෘශ්‍ය මාධ්‍යයෙන්) ගැයීම<br>(**වැයීමට නොහැකිය.**)<br>V අපේක්ෂකයා තෝරා ගත් නිර්දේශිත රාගයකට අනුව, පරීක්ෂක විසින් නම් කරනු ලබන තාලයක් මත නම් කරනු ලබන ස්වරයකින් ආරම්භ කර, ස්වර රචනාවක් නිර්මාණය කර තාල ආවර්ත දෙකක් ගැයීම/වැයීම | 24 |
| 06 | ගසල්/භජන්/තරාණා අතුරින් පරීක්ෂක විසින් නම් කරනු ලබන ශෛලියක ගීයක් ගායනය/වාදනය කිරීම (වාදකයින්ට ගායනයෙන් ද ඉදිරිපත් විය හැකිය.) | 16 |
| 07 | පරීක්ෂක විසින් නම් කරනු ලබන ජන ගී වර්ගයකට අයත් කැමති ගීයක් ගැයීම.<br>(ආඝාතාත්මක/අනාඝාතාත්මක) (වාදකයින් ද ගායනයෙන්ම ඉදිරිපත් විය යුතුය.) | 08 |

| | | |
|---|---|---|
| 08 | නුර්ති/ නාඩගම්/ නව නාට්‍ය/ගීත නාටක අතුරින් පරීක්ෂක විසින් නම් කරනු ලබන ශෛලියක කැමති ගීයක් ගායනය කිරීම (වාදකයින්ද ගායනයෙන් ම ඉදිරිපත් විය යුතුය.) | 12 |
| 09 | රාගාශ්‍රිත සරල ගී/ සිංහල චිත්‍රපට ගී/ කණ්ඩායම් ගී/ හින්දි චිත්‍රපට ගී/ අතුරින් කැමති ගීයක් ගායනය/ වාදනය කිරීම (අවශ්‍ය නම් ගායකයන්ට වාදනයෙන්ද, වාදකයන්ට ගායනයෙන්ද කැමති අයුරින් ඉදිරිපත් විය හැකිය) | 12 |
| 10 | ප්‍රධාන විෂයට අමතර වශයෙන්<br>● ගායකයින් සඳහා - වෙනත් ස්වර වාද්‍ය භාණ්ඩයක් වැයීම (රාග/ගීත)<br>වාදකයින් සඳහා ගැයීම - (රාග/ගීත)<br>(අපේක්ෂකයාගේ අභිමතය අනුව රාග හෝ ගීත තෝරා ගත හැකිය.)<br>● ස්වර පුවරු භාවිතයෙන් අපේක්ෂිත ගීතයක් වැයීම<br>● තබ්ලා වාදනය (කැමති තාලයක ඨේකාව සහ කායදාවක් / පල්ටාවක්)<br>● නිර්දේශිත තාල (අතින්) හස්ත නිරූපනය (පරීක්ෂක, නම් කරන තාලයක්)<br>● ශිල්පීය කුසලතා ඇගයීම | 12<br><br><br><br>12<br>12<br>04<br>04 |
| | මුළු ලකුණු | 200 |

# (56) සංගීතය (බටහිර)

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය -** **කාලය :** පැය **02යි.**
වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **25**ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **25**කි. ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

**II පත්‍රය -** **කාලය :** පැය **03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.

**I කොටස** - සංගීත ඛණ්ඩ උපුටා ගැනීමක් පදනම් වූ අනිවාර්ය ව්‍යුහගත ප්‍රශ්නයකි. **ලකුණු 20කි.**

**II කොටස** - ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 20×2=40)

**III කොටස** - ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 20×2=40)

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

ප්‍රායෝගික පරීක්ෂණය : සංරචක හතරකින් සමන්විත වේ.

1. සංගීත කෘති තුනක් ප්‍රාසාංගික ව ඉදිරිපත් කිරීම
2. තාක්ෂණික වැඩ
3. සයිට්රීඩ් කිරීම (තාක්ෂණිකව කියවා වාදනය කිරීම)
4. ශ්‍රවණ පරීක්ෂණය

මුළු ලකුණු **100** කි.

අවසාන ලකුණු ගණනය කිරීම :

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | = | | 100 |
| II පත්‍රය | = | | 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | = | 100 × 2 = | 200 |
| අවසාන ලකුණ | = | 400 ÷ 4 = | <u>100</u> |

# (56) Music (Western)

## Structure of paper

**Paper I** - **Time : Two Hours.**

**25** multiple choice questions of **05** options and **25** short answered questions.
All questions have to be answered. **02** marks for each question.
Total marks for Paper I is **100**.

**Paper II** - **Time : Three Hours.** (In addition to that extra reading time is 10 minutes)

This paper consists of 3 parts.

**Part I** - Structured essay type question based on a music extract. It is a compulsory question. (20 marks)

**Part II** - 3 structured essay type questions will be given. Candidates should choose only two questions. (20 × 2 = 40 marks)

**Part III** - 3 structured essay type questions will be given. Candidates should choose only two questions. (20 × 2 = 40 marks)

Total marks for Paper II is 100

**Practical Test** : There are four components.

1. Three pieces - performance
2. Technical work
3. Sight reading
4. Listening

Total marks = 100

Calculation of final marks :


| | | |
|---|---|---|
| Paper I | = | 100 |
| Paper II | = | 100 |
| Practical Test | = | 100 × 2 = 200 |
| Final Marks | = | 400 ÷ 4 = 100 |




# (56) සංගීතය ( බටහිර)


**I පත්‍රය / வினாத்தாள் I / Paper I**

උපදෙස් : සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ සපයන්න.
அறிவுறுத்தல்கள் : எல்லா வினாக்களுக்கும் இத்தாளிலேயே விடையெழுதுக.
Instructions : Answer all questions on this paper itself

**01.** දී ඇති බාර් එක සම්පූර්ණ වීමට ඇස්ටරිස්ක් (⋆) එකට පහළින් යොදා ගත යුතු වන්නේ කුමන රෙස්ට් ද?
தரப்பட்டுள்ள பார் முழுமையாகுவதற்கு எஸ்ரெறிக் (⋆) இற்குக் கீழே சேர்க்கப்பட வேண்டிய றெஸ்ட் யாது?
Which rests should be inserted below the asterisk (⋆) to complete the given bar?



(1)  (2)  (3) 






(4)  (5) 

**02.** දී ඇති රිද්මයට සුදුසු ටයිම් සිග්නේචරය පහත සඳහන් ඒවායින් කුමක් ද?
பின்வருவனவற்றுள் தரப்பட்டுள்ள ரிதம் இற்கு பொருத்தமான ரைம் சிக்னேச்சர் எது?
Which of following is the correct time signature suitable for the given rhythm?




(1) 6/4 (2) 5/8 (3) 4/4 (4) 7/8 (5) 3/4





**03.** මේ ස්වරවලින් කුමන ස්වරයක් "ෆ්ලූට්" එකක වාදනය කළ නොහැකි ද?
பின்வருவனவற்றில் புல்லாங்குழலில் இசைக்க முடியாத ஸ்வரம் எது?
Which of the followig cannot be played on the flute?

(1)  (2)  (3)  (4)  (5) 

**04.** "අප් බීට්" එකක් ලෙස සඳහන් කළ හැක්කේ මේවායින් කුමක් ද?
பின்வருவனவற்றுள் "அப்பீற்" ஆகக் குறிப்பிடக்கூடியது எது?
Which of the following refers to an "upbeat"?
(i) Pulse (ii) Anacrusis (iii) Appoggiatura (iv) Accent (v) Acciaccatura

**05.** ලබා දී ඇති ටයිම් සිග්නේචරයට අනුව මෙම සංගීත පාඨය සම්පූර්ණ කළ හැක්කේ මේවායින් කුමන අවිධිමත් ස්වර ඛාණ්ඩයක් යොදා ගැනීමෙන්ද?
தரப்பட்டுள்ள ரைம் சிக்னேச்சருக்கு ஏற்ப இந்த இசைப் பகுதியைப் பூரணப்படுத்த பின்வருவனவற்றுள் எந்த சீரற்ற ஸ்வரக் கூட்டத்தைப் பயன்படுத்த முடியும்?
Which irregular note group can be used to complete the following illustration according to the given time signature?



(1)  (2)  (3)  (4)  (5) 


**06.** දී ඇති කෝඩය වඩා හොඳින් විස්තර කෙරෙන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
பின்வருவனவற்றுள் தரப்பட்டுள்ள கோட் இனை நன்கு விவரிப்பது எது?
Which of the following describes the given chord?





(i) 1st inversion of Mediant Triad in B major
(ii) 2nd inversion of Dominant Triad in G# minor
(iii) 2nd inversion of Supertonic Triad in B major
(iv) Root position of Submediant Triad in B major
(v) 2nd inversion of Mediant Triad in G# minor


**07.** මෙම අලංකරණය වාදනය කරන නිවැරදි ක්‍රමය විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
பின்வருவனவற்றுள் இந்த ஒர்ணமென்ரை இசைப்பதற்கான சரியான முறை எது?
Which of these would be the correct way of playing this ornament?




(i) 

(ii) 

(iii) 


(iv) 


(v) 

**08.** F වලින් පටන් ගන්නා, ආරෝහණ ක්‍රමයට ලියන ලද හෝල් ටෝන් ස්කේලයේ නිවැරදි අකුරු පිළිවෙළ පහත සඳහන් ඒවායින් කුමක් ද?
பின்வருவனவற்றுள் ஆரோகண முறைப்படி எழுதப்பட்ட F இல் "ஹோல் ரோன் ஸ்கேலின்" சரியான எழுத்துக்களை முறைப்படி காட்டுவது?
Which of the following has the correct order of letters of the whole tone scale of F in ascending form?
(i) F - G - A - B - C - D - E
(ii) F - G - A - B - C# - D# - F
(iii) F - G - A - Bb - C - D - E - F
(iv) F - G - Ab - Bb - C - D - E - F
(v) G - A - B - C# - D - E - F – G

**09.** පහත සඳහන් නැටුම් අතුරින් පනින රිද්මයක් සහ සාමාන්‍යයෙන් කොම්පවුන්ඩ් ඩියුපල් ටයිම් එකක් ඇති ස්විට් එකකට අයත් නැටුම කුමක්ද?
பின்வரும் நடனங்களில் தாவும் ரிதம் மற்றும் பொதுவாக கொம்பவுண்ட் டியுபல் அல்லது கொம்பவுண்ட் குவாட்ரபிள் ரைம் உள்ள சூட் இற்கு உரித்தான நடனம் எது?
In a suite, which of the following is a lively dance with skipping rhythms usually in Compound Duple or Compound quadruple time?
(i) Allemande (ii) Galliard (iii) Courante (iv) Sarabande (v) Gigue

**10.** පෙරදිග සංගීතයේ "අචල ස්වර" ලෙස හැඳින්වෙන්නේ මේවායින් කුමක් ද?
கீழைத்தேய சங்கீதத்தில் "அசவஸ்வர" என குறிப்பிடப்படுவது எது?
Which notes are called "achala swara" in oriental music?
(i) SA - GA (ii) GA - NI (iii) SA - PA (iv) PA - RI (v) MA - PA

**11.** පර්සෙල් විසින් රචිත කෘතියක් කුමක්ද?
பர்செல் என்பவரால் எழுதப்பட்ட ஆக்கம் என்ன?
Which composition was written by Purcell?
(i) Carmen
(ii) Dido & Aeneas
(iii) Zadok the Priest
(iv)Suite Bergamasque
(v) Erl-King

**12.** “ද ප්ලැනට්ස්” යන කෘතිය රචනා කළේ කවුද?
“த பிளனற்” என்ற ஆக்கத்தை எழுதியவர் யார்?
“The Planets” was a work composed by
(i) Sibelius (ii) Puccini (iii) Berlioz (iv) Vivaldi (v) Holst

**13.** සොනාටාවට විරුද්ධ ගායනා කරන කුඩා ආගමික සංගීත කෘතියක් වන්නේ කුමක්ද?
சொனாற்றாவுக்கு எதிராக பாடப்படும் சமயம் சார்ந்த அல்லது சாராத இசையாக்கம் எது?
A religious or secular little piece that is sung opposed to Sonata is?
(i) Cantata (ii) Lieder (iii) Folk song (iv) Aria (v) Canon

**14.** “ග්‍රෝසේ ට්‍රෝමෙල්” යන ජර්මානු වචනය යොදන වාද්‍ය භාණ්ඩය කුමක්ද?
பின்வருவனவற்றுள் “க்றோசே ட்ரொமெல்“ என்ற ஜெர்மன் சொல்லை பயன்படுத்தும் இசைக்கருவி எது?
which of the following instrument uses the German Word “Grosse Trommel”?
(i) Cymbals (ii) Snare drum (iii) Triangle (iv) Bass Drum (v) Tenor Drum

**15.** පහත සඳහන් ඒවා අතුරින් **නොගැළපෙන** පද මේවා අතරින් කුමක් ද?
பின்வருவனவற்றுள் பொருத்தமற்ற சோடி எது?
Which of the following pairs do **not match**?
(i)Mordent - Turn (ii)Sonata - Symphony (iii)Handel - Bach
(iv)Aria - String quartet (v)Flat - Natural

**16.** පහත සඳහන් ඒවායින් අඩුම වේගය දක්වන ටෙම්පෝව කුමක් ද?
பின்வருவனவற்றுள் வேகம் குறைந்த ரெம்போவைக் குறிப்பிடுவது எது?
Which of the following terms indicate the slowest tempo?
(i) Adagio (ii) Allegretto (iii) Agitato (iv) Ritardando (v) Calando

**17.** ඩෙබුසී ඔහුගේ දියණිය වෙනුවෙන් රචනා කළ සංගීත කෘතිය කුමක්ද?
டெபூசி தனது மகளுக்கு அர்ப்பணித்த இசை ஆக்கம் எது?
Which composition did Debussy dedicate to his daughter?
(i) Kinderscenen (ii) Childrens Corner Suite (iii) Traumerei
(iv) Submerged Cathedral (v) Carnival of Animals


**18.** ලබා දී ඇති සංගීත කණ්ඩය ඩිමිනිෂ්ඩ් 4ක් ඉහළට ලියා ඇති එක මේවායින් කුමක් ද?
தரப்பட்டுள்ள இசைப்பெயர்ப்பில் டிமினிஷ்ட் 4 ஆவது மேலாக எழுதப்பட்டுள்ளது எது?
Which of these extracts would be a Diminished 4th higher of the given extract?



(1) 

(2) 

(3) 

(4) 

(5) 

**19.** "ප්‍රෝගම්" සංගීතය ආශ්‍රිතව රචනා කළ කෘතිය කුමක්ද?
பின்வருவனவற்றுள் ப்ரோகிராம் இசையுடன் தொடர்புடையது எது?
Which of the following is associated with 'Programme music"?

(i) Maple Leaf Rag (ii) The Planets (iii) Carnival of Animals
(iv) Aida (v) Snow is Dancing

**20.** පහත සඳහන් තේමාව ඇතුළත් වන්නේ කවරකද?
எந்த ஆக்கத்தில் பின்வரும் கருப்பொருள் உள்ளடங்குகிறது?
In which composition is the given theme included?



(i) The Seasons (ii) William Tell (iii) Pastoral Symphony
(iv) Rhapsody in Blue (v) Moonlight Sonata

**21.** පහත සඳහන් ඒවායින් නිවැරදි වගන්තිය කුමක් ද?
பின்வருவனவற்றில் சரியான கூற்று யாது?
Which of the following is the correct sentence?

(i) The Cor Anaglais is a non-transposing instrument.
(ii) Courante in the first dance in a Classical Suite.
(iii) Sunil Shantha composed the National Anthem of Sri Lanka
(iv) 'Gretchen at the Spinning wheel' was composed by Schumann.
(v) The word "Chalumeau" is associated with woodwind instruments.

**22.** චයිකෝව්ස්කි විසින් රචිත "ඩාන්ස් ඔෆ් ද ශුගර් ප්ලම් ෆෙයරි" යන කෘතියේ හඳුන්වා දෙනු ලබන පර්කශන් සංගීත භාණ්ඩය පහත සඳහන් ඒවායින් කුමක් ද?
சை கோவஸ்கியினால் எழுதப்பட்ட "டான்ஸ் ஒவ் த சுகர் பிளம் fபெயரி" என்ற ஆக்கத்தில் அறிமு கப்படுத்தப்பட்ட பேர்கசன் இசைக்கருவி பின்வருவனவற்றுள் எது?
Which of the following percussion instruments is introduced in "The Dance of the sugar plum fairy" written by Tchaikovsky?

(i) Xylophone (ii) Celesta (iii) Tubular bell (iv) Vibraphone (v) Marimba


**23.** 20 වැනි ශතවර්ෂයේ ජනාදරයට පාත්‍ර වූ සිංදු රචනා කළ ඇමරිකානු සංගීතඥයා කවු ද?
20 ஆம் நூற்றாண்டில் பிரபலமான பாடல்கள் எழுதிய அமெரிக்க இசை ஆக்குநர் யார்?
Which American composer wrote songs which became popular in the 20th century?
(i) Duke Ellington (ii) Scott Joplin (iii) Stevie Wonder
(iv) Stephen Foster (v) Louis Armstrong

**24.** "බීබං" නැමැති විබ්‍රාටෝ ශබ්දය නිපදවිය හැක්කේ.
"பீபங்" எனப்படும் விப்ரடோ ஒலியை எழுப்பக்கூடியது.
The vibrato effect called "Bebung" can only be produced on the.
(i) Clavichord (ii) Harpsichord (iii) Guitar (iv) Pipe organ (v) Piano

**25.** පෙන්ටටොනික් මයිනර් ස්කේලයේ අඩංගු නොමැති ස්වර මේවායින් මොනවා ද?
பென்ரரொனிக் மைனர் ஸ்கேலில் அடங்காத ஸ்வரங்கள் எவை?
In the Pentatonic minor scale which of the following notes are omitted?


(i) 4th & 7th (ii) 3rd & 6th (iii) 2nd & 6th (iv) 5th & 7th (v) 4th & 6th

**26.** ලබා දී ඇති සංගීත ඛණ්ඩය අගය අඩකින් අඩු කර ලියන්න.
தரப்பட்டுள்ள இசைப் பகுதியின் பெறுமதியை அரைவாசியாகக் குறைத்து எழுதுக.
Write the given bar in half the value







**27.** දී ඇති සංගීත ඛණ්ඩය පෙරදිග සංගීත ක්‍රමයට ලියන්න.
தரப்பட்டுள்ளவற்றை கீழைத்தேய இசை முறைக்கேற்ப எழுதுக.
Convert the following in to oriental notation.



**28.** B ෆ්ලැට් මේජරයේ "පාසිං $\frac{6}{4}$ " එකක් ලියන්න
B பிளட் மேஜர் இன் "பாசிங் $\frac{6}{4}$ " ஒன்றினை எழுதுக.
Illustrate "Passing $\frac{6}{4}$ " in the key of B flat major.



**29.** ලබා දී ඇති ස්ටේව්වල "කොන්ට්‍රරි මෝෂන්" ක්‍රමයේ උදාහරණයක් දක්වන්න.
தரப்பட்டுள்ள ஸ்ரேவ் இல் "கொன்ட்ரரி மோஷன்" முறைக்கு உதாரணம் குறிப்பிடுக.
Illustrate contrary motion in the given stave




**30.** ලබා දී ඇති සංගීත ඛණ්ඩයේ "කෝඩ් ප්‍රොග්‍රේෂන්" එක ලියන්න.
தரப்பட்டுள்ள இசைப் பகுதியின் "கோட் ப்ரோகிரஷன்" இனை எழுதுக.
Write the chord progression in the given extract of music?



Ans. ________________

**31.** E වලින් පටන් ගන්නා ඩොරියන් මෝඩ් එක ට්‍රෙබල් ක්ලෙෆ් යොදාගෙන ලියන්න.
E இல் தொடங்கும் டொரியா மோட் உடன் ட்ரெபிள் கிளவ் பயன்படுத்தி எழுதுக.
Write the Dorian mode starting on E, using the Treble clef.



**32.** සොනාටා ෆෝම් එකේ සංගීත කෘතියක ''එක්ස්පොසිෂන්'' හා ''රිකැපියුලේෂන්'' අතර තිබෙන වෙනස්කම් මොනවාද?
சொனற்றா fபோம் இன் இசைப்பகுதியில் எக்ஸ்பொசிவுன் மற்றும் ரிகப்பிற்யுலேஷன் என்பவற்றுக்கு இடையில் காணப்படும் வேறுபாடு யாது?
What is the difference between the Exposition and the Recapitulation of a piece in Sonata Form?
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

**33.** සමූහ ගායක කණ්ඩායමකට අදාළ ව **T1,T2,B1,B2** යන්න පැහැදිලි කරන්න.
பாடகர் குழுவுக்கு உரிய T1,T2,B1,B2 ஆகியவற்றை விளக்குக.
Explain what T1,T2,B1,B2 stands for in relation to a choir.
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................
......................................................................................................................................................

**34.** ජන සංගීතය තම කෘතීන්ට අදාළව යොදා ගත් සංගීතඥයකු නම් කර ඔහුගේ ජාතිය කුමක්දැයි සඳහන් කරන්න.
தனது இசை ஆக்கங்களில் நாட்டார் இசையைப் பயன்படுத்திய இசை ஆக்குநரின் பெயரையும் அவரின் தேசிய இனத்தையும் குறிப்பிடுக.
Name a composer and his nationality who has made use of folk music in his compositions.
......................................................................................................................................................
......................................................................................................................................................

**35.** "කන්චර්ටෝ" ඒකක වාදකයාගේ තාක්ෂණික හැකියාව විදහා දැක්වීමට යොදන වචනය කුමක්ද?
கொன்சேர்டோ ஒன்றில் தனி ஆற்றுகையாளரின் தொழிநுட்பத் திறனை வெளிப்படுத்திக் காட்டுவதற்குப் பயன்படுத்தும் பதம் யாது?
Name the term used to display the technical ability of the solo performer in a concerto.
......................................................................................................................................................
......................................................................................................................................................

**36**. ඔකෙස්ට්‍රාවක සංගීත භාණ්ඩවල ශබ්ද ගුණය හා තාක්ෂණික හැකියාව පෙන්වන සංගීත කෘතියක් නම් කරන්න.
ஒகெஸ்ரா இசைக்கருவிகளின் ஒலியின் தரம் தொழினுட்பத்திறன் என்பவற்றை வெளிப்படுத்தும் இசை ஆக்கம் ஒன்றின் பெயர் குறிப்பிடுக.
Name a composition which demonstrates the tone quality and technical capabilities of the instruments of the orchestra.
......................................................................................................................................................
......................................................................................................................................................

**37.** ඔපෙරාවක හෝ කටහඬ සහ ඔකෙස්ට්‍රාව එකතුව ඇති කෘතියක හඬ කොටස් වෙන වෙනම ස්ටේව්ස්වල ලියා ඇති ස්කෝර් එකක නම් කුමක්ද?
ஓபேராவில் அல்லது குரலொலிகள் உடன் ஒகெஸ்ரா சேர்த்த ஆக்கத்தில் குரலொலிப் பகுதி வெவ்வேறாக ஸ்ரேவ்ஸ் இல் எழுதப்பட்ட ஸ்கோர் ஒன்றின் பெயர் தருக.
Name a score which gives separate staves for all the vocal parts in an opera or other work for voices and orchestra
......................................................................................................................................................
......................................................................................................................................................

**38.** "නියෝ ක්ලැසිසිසම්" යන්න පැහැදිලි කර එය සමග සම්බන්ධ වූ සංගීතඥයා නම් කරන්න.
"நியோ கிளாசிசம்" என்பதை விளக்கி அதனுடன் தொடர்புடைய இசை ஆக்குநரின் பெயர் குறிப்பிடுக.
Explain "Neo classicism" and name a composer who was involved in it.

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

**39.** ජෑස් බැන්ඩ් එකක රිද්ම කොටස් වාදනය කරන සංගීත භාණ්ඩ **දෙකක්** නම් කරන්න.
ஜாஸ் பான்ட் ஒன்றில் ரிதம் பகுதி இசைக்கும் இசைக்கருவிகள் **இரண்டின்** பெயர் குறிப்பிடுக.
Name **two** instruments of the rhythm section in a jazz band.

.......................................................................................................................................................
.......................................................................................................................................................

**40.** බීතෝවන් විසින් රචිත පියානෝ සොනාටා **දෙකක්** නම් කර ඒවායේ කීස් සඳහන් කරන්න.
பெத்தோவனால் எழுதப்பட்ட பியானோ சொனற்றா **இரண்டின்** பெயரைக் குறிப்பிட்டு அவற்றின் கீஸ் இனையும் எழுதுக.
Name **two** piano sonatas written by Beethoven and their keys

.......................................................................................................................................................
.......................................................................................................................................................

**41.** හෝල් ටෝන් ස්කේලය හා 12 ටෝන් ක්‍රමය හැර, 20වැනි ශත වර්ෂයේ සංගීතයේ අඩංගු ගති ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
ஹோல்ரோன் ஸ்கேல், 12 ரோன் முறை தவிர்ந்த 20 ஆம் நூற்றாண்டின் இசையில் அடங்கும் **இரண்டு** அம்சங்களைக் குறிப்பிடுக.
Name **two** features of 20th century music other than the whole tone scale and the twelve tone system

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

**42.** "නොන් හාර්මනි" නෝට්ස් **3ක්** නම් කරන්න.
"நொன்ஹார்மனி" நோட்ஸ் இன் **மூன்று** வகைகள் குறிப்பிடுக.
Name **three** types of Non- harmony notes.

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................

**43.** 1685 උපන් සංගීතඥයින් **දෙදෙනෙක්** නම් කර ඔවුන්ගේ ජාතිය නම් කරන්න.
1685 இல் பிறந்த இசை ஆக்குநர் **இருவரின்** பெயரையும் அவர்களின் இனத்தையும் குறிப்பிடுக.
Name **two** composers born in 1685 giving their nationalities.

.......................................................................................................................................................
.......................................................................................................................................................

**44.** ලියා ඇති ස්වර වාදනය කිරීමේ දී "පර්ෆෙක්ට් 5" ක් පහළින් ඇසෙන සංගීත භාණ්ඩ **දෙකක්** නම් කරන්න.
எழுதப்பட்ட ஸ்வரத்தை இசைக்கும் போது பேர்பெகட் 5 இன் கீழ் ஒலிக்கும் இசைக்கருவிகள் **இரண்டினைக்** குறிப்பிடுக.
Name **two** instruments which sound a perfect 5th lower than the written note.

1.....................................................    2...............................................................

**45.** නුර්ති සඳහා භාවිත කරන සංගීත භාණ්ඩ **දෙකක්** නම් කරන්න.
நூர்தி இல் பயன்படுத்தப்படும் இசைக் கருவிகள் **இரண்டினைக்** குறிப்பிடுக.
Name **two** instruments used in Nurthi.

1........................................................... 2................................................................

**46.** දකුණු අතේ ශක්තිමත් සින්කෝපේටඩ් තනුවක් සහ වම් අතේ මාච් එකක් මෙන් තනුවක් ඇති පියානෝ වාදනයට සුදුසු ශෛලියක් නම් කරන්න.
வலதுகை வலுவான சின்கோபேடற் ரியூன் மற்றும் இடதுகை மார்ச் ஒன்றைப் போன்ற ரியூனும் உள்ள பியானோ இசைக்கப் பொருத்தமான ஸ்ரைவ் ஒன்றின் பெயர் தருக.
Write the name given to the style of piano playing featuring a strong syncopated tune in the right hand and a march like tune in the left hand.

..............................................................................................................................................................

**47.** අදහසක් නැවත නැවත ඉදිරිපත් කිරීම (imitation) මත පදනම් වූ කොන්ට්‍රපන්ටල් වර්ගයට අයත් කෘතියක් හඳුන්වන්නේ කුමන නමකින්ද? මේ සඳහා උදාහරණයක් හා එය ලියන ලද සංගීතඥයා නම් කරන්න.
பாவனை செய்யும் கருத்துடைய கொன்றாபன்ரில் இசைத்துண்டின் பெயர் தருக.
What is the name given to a contrapuntal piece essentially based upon the idea of imitation. Give an example and its composer.

..............................................................................................................................................................

**48.** ට්‍රැක්ස් ගණනාවක් එකවර වාදනය කළ හැකි පරිගණක උපාංගයක් නම් කරන්න.
பெருமளவு இசை ட்ரக்ஸ் இனை ஒரே தடவையில் இசைக்கக் கூடிய இசை உபகரணத்தின் பெயர் தருக.
Name a computer device that has tracks of music which can be played back at the same time.

..............................................................................................................................................................

**49.** ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ප්‍රසිද්ධ ශාන්තිකර්මයක් නම් කරන්න.
இலங்கையின் தென்பகுதியில் பயன்படுத்தப்படும் பிரபலமான "சாந்தி கர்ம" ஒன்றினைக் குறிப்பிடுக.
Name a popular 'shanthi karma' used in the Southern part of Sri Lanka.

..............................................................................................................................................................

**50.** බේස් ක්ලෙෆ් එක යොදා ගත් ට්‍රාන්ස්පෝස් නොවන වැල්ව් සංගීත භාණ්ඩයක් නම් කරන්න.
பேஸ் கிளெவ் பயன்படுத்தும் ட்ரான்போஸ் இல்லாத வால்வ் இசைக்கருவியின் பெயர் குறிப்பிடுக.
Name a non- transposing valve instrument which uses the bass clef.

..............................................................................................................................................................

* * *

# (56) සංගීතය ( බටහිර)

## II පත්‍රය/வினாத்தாள் II/Paper II

01 වන ප්‍රශ්නය ඇතුළුව II හා III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

**முதலாம்** வினாவுக்கும் பகுதி **II, III** என்பவற்றிலிருந்து **இவ்விரண்டு** வினாக்களைத் தெரிவு செய்தும் எல்லாமாக **ஐந்து** வினாக்களுக்கு இவ்வினாத்தாளிலேயே விடை எழுதுக.

Answer **five** questions,selecting question no 01 and **two** questions **each** from parts **II** and **III**

## I කොටස/பகுதி I/Part I

01. මොසාට් විසින් රචිත මෙම සංගීත කෘතිය අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
மொஸாட் இனால் ஆக்கப்பட்ட இந்த இசை ஆக்கத்ததை அவதானித்துக் கீழே தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை தருக.
Study the following music score by Mozart and answer the questions.

### Minuet No.1

Wolfgang Amadeus Mozart
(1756 - 1791)



(a) මෙම සංගීත කණ්ඩය අයත් කී එක කුමක්ද?
இந்த இசைப் பெயர்ப்புக்கு உரிய கீ யாது?
In which key is this extract? ........................................................................................

(b) මිනියුට් කොටස මොඩියුලේට් වන විවිධ කීස් නම් කර ඒවා තිබෙන බාර්වල නොම්බර ලියන්න.
மினியூட் பகுதி மொடியுலேட் ஆகும் பல்வேறு கீஸ் இன் பெயர் குறிப்பிட்டு அவை இருக்கும் பார் எண்களையும் எழுதுக.
Identify and state to which related keys the Minuet modulates, giving their bar numbers?

........................................................................................................................
........................................................................................................................

(c) මිනුවට් කොටසේ සීක්වන්ස් එකක් තිබෙන බාරය නම් කරන්න. එය රියල් හෝ ටෝනල් සීක්වන්ස්ද යන්න සඳහන් කරන්න.
மினியூட் பகுதியில் சீக்குவன்ஸ் இருக்கும் பார் இனைக் குறிப்பிடுக. இது ரியல் அல்லது ரோனல் சீக்குவன்ஸ்ஸா என்பதைக் குறிப்பிடுக.
State in which bar of the Minuet you can find a sequence? Is it a real or a tonal sequence?
........................................................................................................................
........................................................................................................................

(d) මෙම කෘතියේ ෆෝම් එක විස්තර කරන්න.
இந்த ஆக்கத்தின் fபோம் இனை விளக்குக.
Explain the form of this piece.

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

(e) මෙහි තිබෙන අවිධිමත් නෝට් ගෘප්ස් රවුම් කර ඒවා විස්තර කරන්න.
இங்கு காணப்படும் சீரற்ற நோட் கூட்டங்களை வட்டமிட்டு அவற்றை விளக்குக.
Circle the irregular note groups used in the music and describe it?

........................................................................................................................
........................................................................................................................

(f) පහත සඳහන් ඉතාලියානු පද විස්තර කරන්න.
பின்வரும் இத்தாலிய பதங்களை விவரிக்குக.
Explain the following Italian terms.

(a)Allegro - ..........................................................................................................
(b)Minuetto da Capo al Fine.......................................................................................

(g) මිනුවට් හා ට්‍රියෝ කොටස් අවසන් වන කේඩන්සය හා කී එක නම් කරන්න.
மினியூட் மற்றும் ட்ரியோ பகுதி முடிவடையும் கேடன்ஸ் மற்றும் கீ இனைக் குறிப்பிடுக.
Name the cadence and the key that end the Minuet and Trio Parts.

Minuet ...........................................................................................................
Trio ...........................................................................................................

(h) මෙම සංගීත කෘතිය රෙපටිශන්ස් සමග වාදනය කළ යුතු ආකාරය පිළිවෙලින් දක්වන්න. උත්තර පැහැදිලි වීමට අවශ්‍ය බාර් නොම්බර යොදන්න.
இந்த இசை ஆக்கத்தை மீண்டும் மீண்டும் இசைக்கக் கூடிய முறையை ஒழுங்கு முறையில் குறிப்பிடுக. விடையை விளக்குவதற்கு தேவையான பார் எண்களைக் குறிப்பிடுக.
Explain the order as to how you would play this piece with repetitions. Give bar numbers to make your answer clear.

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................


(i) ඇස්ටරිස්ක් එකක් යොදා මෙම කෘතියේ ඇති ඩිමිනිෂ්ඩ් 7ක් සළකුණු කරන්න.
அஸ்ரெறிக் ஒன்றை இட்டு இந்தப் பெயர்ப்பில் உள்ள டிமினிஷ்ட் 7 இன்ரவெல் அடையாளப்படுத்துக.
Mark with an asterisk a Diminished 7th interval found in the extract.

(j) මෙම කෘතිය අයත් කාල වකවානුවේ ඇති ප්‍රධාන ගති ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
இந்த இசை ஆக்கத்துக்குரிய காலப்பகுதியில் காணப்பட்ட இரு முக்கிய பண்புகளை எழுதுக.
Write **two** important features of the period to which this piece of music belongs.

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

## II කොටස/ பகுதி II /PART 11

02.(a.) මෙය ඕපන් ස්කෝර් ක්‍රමයට අදාළ සංගීත භාණ්ඩවලට ලියන්න.
இப்பகுதியை ஓபன் ஸ்கோர் முறைக்கு உரிய இசைக் கருவிகளுக்கு ஏற்ப எழுதுக.
Re- write this passage in open score for the instruments indicated








(b.) වියොලාවකට වාදනය කිරීමට සුදුසු පරිදි මෙම සංගීත කාණ්ඩය මේජර් 2ක් ඉහළට ට්‍රාන්ස්පෝස් කරන්න. අදාළ ක්ලෙෆ් එක යොදන්න.
வியோலாவில் இசைக்க பொருத்தமான விதத்தில் இந்த மெலடியை மேஜர் 2 இன் மேல் ட்ரான்ஸ்போஸ் செய்க.உரிய கிளெவ் பயன்படுத்துக.
Transpose this melody a Major 2nd higher to be played by a Viola. Use the appropriate Clef.




03 (a) පළවෙනි බීට් එකෙන් පටන් ගන්නා මෙම සංගීත ඛණ්ඩයට අදාළ ස්ථානවලට සුදුසු ටයිම් සිග්නේචර් යොදන්න. මෙහි විවිධ ස්ථානවල වෙනස් ටයිම් සිග්නේචර් යෙදිය යුතුය.
முதலாவது பீற் உடன் தொடங்கும் இந்த மெலடிக்குப் பொருத்தமான இடங்களில் ரைம் சிக்னேச்சர் சேர்க்குக. பல்வேறு இடங்களிலும் வேறுபட்ட ரைம் சிக்னேச்சர் இடுதல் வேண்டும்.
Add the time signatures appropriately to the following melody that begins on the first beat of the bar,but contains changes of time signature. (1mark x 4)





(b) මෙම අලංකරණ වාදනය කළ යුතු ආකාරය ලියන්න.
இந்தப் பகுதியை மிகச்சரியாக இசைக்கப்பட வேண்டிய விதத்தில் எழுதுக.
Write out this passage exactly as it should be played. ( 4 marks)





(c) ලබා දී ඇති ආරම්භය ආධාර කරගෙන බාර් 12ක සංගීත කණ්ඩයක් නිර්මාණය කරන්න. එය ඩොමිනන්ට් හෝ රෙලටිව් මේජර් / මයිනර් එකට ගොස් ටොනික් කී එකෙන් අවසන් කරන්න. වාදනය කළ යුතු ආකාරය ද සඳහන් කරන්න.
தரப்பட்டுள்ள ஆரம்பத்தைப் பயன்படுத்தி 12 பார் இசை மெலடி ஒன்றை எழுதுக.டொமினைற் அல்லது ரிலேற்றட் மேஜர்/ மைனர் ஒன்றை அடைந்து ரொனிக் கீ இல் முடிவுறுத்துக. இசைக்கப்பட வேண்டிய விதத்தினைக் குறிப்பிடுக.
Write a 12 bar melody using the given opening, using a modulation to another key (Dominant or related major / minor key) and end in the Tonic key. Add performance directions.







(d) මෙම ඛාණ්ඩයේ පළවැනි බාර් 8 පෙරදිග සංගීතයට පරිවර්තනය කරන්න.
முதல் 8 பார்களில் எழுதப்பட்டவற்றை c கீழைத்தேய இசைக்கு மாற்றுக.
Convert the first 8 bars written in 8 into oriental notation.

.......................................................................................................................................................


.......................................................................................................................................................

පහත දී ඇති ස්කේලයන් ලියන්න.
பின்வரும் ஸ்கேல்ஸ் இனை எழுதுக.
Write the following scales.

04. (a) $\frac{3}{4}$ ටයිම් එකට සුදුසු රිද්මික් රටාවකට අනුව D පෙන්ටටොනික් මයිනර් ස්කේල ඇල්ටෝ ක්ලේෆ් හි ආරෝහණ හා අවරෝහණ ක්‍රමයට ලියන්න.

ரைம் இற்கு பொருத்தமான ரிதம் கோலத்துகமைய பென்ரரோனிக் மைனர் ஸ்கேல் $\frac{3}{4}$ அல்ரோ கிளெவ் இன் ஆரோகணம், அவரோகணம் முறைப்படி எழுதுக.

D Pentatonic minor scale beggining of D ascending and descending using a rhythmic pattern in $\frac{3}{4}$ time in the Alto clef.



(b) G වලින් ආරම්භ කරන එයෝලියන් මෝඩ් එක ට්‍රෙබල් ක්ලෙෆ්හි ආරෝහණ ක්‍රමයට ලියන්න.


G இல் ஆரம்பிக்கும் எயோலியன் மோட் இன் ட்ரெபிள் கிளவ் ஆரோகண முறையில் எழுதுக.

The Aeolian mode in ascending form starting on G, using the treble clef.

(c) ලබා දී ඇති ටයිම් සිග්නේචරයට අනුව B බ්ලූස් ස්කේලය ආරෝහණ හා අවරෝහණ ක්‍රමයට ලියන්න.

தரப்பட்டுள்ள ரைம் சிக்னேச்சர் இற்கு அமைய B புளு ஸ்கேலினை ஆரோகண அவரோகண முறையில் எழுதுக.

B blue scale ascending and descending using the given time signature.



(d) F ක්ලෙෆ් භාවිත කර හර්මොනික් ක්‍රොමැටික් $E^b$ ස්කේලය ආරෝහණ හා අවරෝහණ ක්‍රමයට කී සිග්නේචරය සහිතව මිනිම්ස්වලින් ලියන්න.

F கிளவ் பயன்படுத்தி ஹர்டொனிக் க்ரொமற்றிக் ஸ்கேலை $E^b$ இல் தொடங்கி ஒரு ஒக்ரேவ் ஆரோகணம் அவரோகணம் முறையில் கீ சிக்னேச்சர் உடன் மினிம்ஸ் இல் எழுதுக.

Write in Minims the harmonic chromatic scale beginng on $E^b$, one octave ascending and descending with key signature. Use the F clef.

(e) F ෂාප් නැචුරල් මයිනර් ස්කේලය 6/8 ටයිම්හි රිද්මීය රටාවක් යොදාගෙන ආරෝහණ ක්‍රමයට ලියන්න. අන්තිම බාරය සුදුසු රෙස්ට් යොදා සම්පූර්ණ කරන්න. ටෙනර් ක්ලෙෆ් එකේ ලියන්න.

F ஷாப் நச்சுரல் மைனர்ஸ்கேல் 6/8 ரைமில் ரிதம் கோலம் பயன்படுத்தி ஆரோகண முறையில் எழுதுக. இறுதி பார் இனை பொருத்தமான ரெஸ்ட் பயன்படுத்தி பூரணப்படுத்துக.ரெனவ் கிளெவ் இல் எழுதுக.

Write the natural minor scale beginning on F sharp ascending using a rhythmic pattern in 6/8 time. Complete the last bar using suitable rests. Write in Tenor clef.

## III කොටස/பகுதி III/ Part III

05. (a.) මෙම කෘතිය කොටස් දෙකකින් නිර්මාණය කරන්න.

இந்த ஆக்கத்தைப் பொருத்தமாக இரண்டு பகுதிகளாக பூரணப்படுத்துக.

Complete this piece in two parts as appropriate.



(b) පහත ඒවායින් දෙකකට පිළිතුරු සපයන්න.

Answer two of the following questions.

பின்வருவனவற்றுள் எவையேனும் இரண்டு வினாக்களுக்கு விடை தருக.

(i) තත් භාණ්ඩවල ස්වර කිහිපයක් උඩින් ස්ලර් සළකුණක් යෙදීමෙන් වන්නේ කුමක්ද?

நரம்பு வாத்தியத்துக்கான ஸ்வரக் கூட்டங்களுக்கு மேலே "ஸ்லர்" குறியீடு இடுவதால் குறிப்பிடப்படுவது யாது?

What does a slur indicate when placed over a group of notes written for a string instrument?

(ii) හෝන් එකකට මියුට් එකක් යෙදීමෙන් වන ශබ්දයේ වෙනස ගැන ලියන්න.

ஹோரன் ஒன்றில் மியூட் ஒன்றை இடுவதால் ஏற்படும் ஒலி வேறுபாட்டை எழுதுக.

How does a mute affect the tone of a horn?

(iii) ඩබල් හා ට්‍රිපල් ස්ටොපින් යන්න විස්තර කරන්න. ඒ වචන යොදන සංගීත භාණ්ඩ සඳහන් කරන්න.

டபிள் மற்றும் ட்ரிபிள் ஸ்ரொப்பிங் பற்றி விளக்குக.இவை எந்த இசைக்கருவிகளுக்கு பிரயோகிக்கப்படுகின்றன.

Explain what is meant by double and triple stopping and to what instruments does it apply?

(iv) ටිම්පනිය හා එහි නොටේෂන් එක ගැන කෙටි සටහනක් ලියන්න.

டிம்பனி மற்றும் அதன் நொட்டேஷன் பற்றி சுருக்கக் குறிப்பு எழுதுக.


Write a short note on the timpani and its notation.

........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

06. ලබා දී ඇති ෆිගර්ඩ් බේස් යොදා මෙම සංගීත ඛාණ්ඩය කොටස් හතරකින් සම්පූර්ණ කරන්න.

தரப்பட்டுள்ள பிகர்ட் பேஸ் பயன்படுத்தி இந்த இசைப் பகுதியை நான்கு பகுதிகளாகப் பூரணப்படுத்துக

Complete the following passage in four parts using the given figured bass.




07. (a) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

பின்வரும் அட்டவணையைப் பூரணப்படுத்துக.

Complete the following Grid.

මේවායින් හතරකට පිළිතුරු සපයන්න.

பின்வருவனவற்றுள் நான்கினுக்கு விடை எழுதுக.

Answer four of the following.

| | Name of Work | Composer | Type of work |
|---|---|---|---|
| 01 | Italian Symphony | | |
| 02 | The Turn of the Screw | | |
| 03 | Winter Journey | | |
| 04 | The Emperor Concerto | | |
| 05 | The Planets | | |
| 06 | West Side Story | | |
| 07 | Raindrop Prelude | | |
| 08 | La Traviata | | |

(b). පහත ඒවායින් **දෙකක්** පිළිබඳව කෙටි විස්තරය බැගින් ලියන්න.

Write brief descriptions of **two** of the following.

பின்வருவனவற்றுள் இரண்டினைப் பற்றிச் சுருக்கமான விவரிப்பு எழுதுக.

Toccata, Cadenza, Concerto Grosso, Pedal Point

(c) පහත ඒවායින් **දෙකකට** පිළිතුරු සපයන්න.

Answer **two** of the following.

பின்வருவனவற்றுள் இரண்டினுக்கு விடை எழுதுக.

(i) "ෆ්රෙන්ච් ඕවර්චර්" යන්න යොදා කෙටි විස්තරයක් ලියන්න.

பிரென்ச் ஓவர்சர் பற்றி சுருக்கமாக விவரிக்குக.

Give a short account of the 'French Overture".

(ii) එටෝනැලිටි යන්න විස්තර කරන්න.

எடோனலிட் பற்றி விவரிக்குக.

Explain what is known as Atonality.

(iii) "සෝං සයිකල්" වන්නේ කුමක්ද? නිදසුන් සහිත ව එය විස්තර කරන්න
"சோங் சைக்கிள் என்றால் என்ன? - உதாரணங்கள் தந்து விளக்குக.
What is a song cycle? Explain giving examples.

(iv) සීරියලිසම් යනු කවරේද?
சீரியலிசம் என்பதன் கருத்து யாது?
What is meant by serialism?

* * *

# (56) Music (Western)

## Practical Paper

The exam has four components:

| | | |
|---|---|---|
| 1 | Three pieces | (18 marks each) |
| 2 | Technical work | (10 marks) |
| 3 | Sight Reading | (10 marks) |
| 4 a) | Listening: group test (Group) | (6 marks) |
| b) | Aural test | (20 marks) |
| | Total | 100 marks |

**1 Three Pieces - Performance** (18×3 = 54 marks)

(1) Piece 1 –Play on the Recorder (with accompaniment) (**One** of the pieces of the given list)

(2) Piece 2 - Play on the Piano (**One** from the prescribed works.)

(3) Piece 3 - To Singing with accompaniment (**One** song from the given list) or play another piece on a different instrument of the candidate's choice of similar standard or play another piece on the piano from the given list

**2 Technical Work** ( 10 marks)

Scales: up to 5 sharps and 5 flats

- ★ To play 2 octaves of the Major or Minor scales (Harmonic & Melodic) hands together, one octave apart in similar motion, Legato/ staccato
- ★ Arpeggios of the above keys, two octaves one 8ve apart in similar motion.
- ★ Chromatic scales beginning on any note two octaves, hands together Legato only in similar motion.

( 10 marks)

**3 Sight Reading**

- ★ To sight read a piece of music (with a key signature up to 4 sharps or 4 flats on the Piano)
- ★ To sight sing an 8 bar melody within the range of the Treble clef Bb (below the stave) to C

  ( 3rd space)

**4 a) Listening - (Group work)** ( 20 marks)

- ★ Write the melody of 4 bars in simple time after it has been played 5 times. The key will be stated and the first note named. The melody will be within the octave in the keys of C, F major.
- ★ Identify the cadence at the end of a phrase played twice by the examiner as Perfect, Imperfect, Plagal or Interrupted in a major or minor key. The key chord will be sounded first.

- To state whether a short passage played twice by the examiner beginning in major / minor key modulating to its dominant or relative major/minor. The key chord will be sounded and named.
- To identify the name of the composition, composer, period and the type of work of 4 pieces.

b) <u>Aural Test (Individual Test)</u>

- To sing/hum or whistle a four bar melody in a Major or Minor key, played twice by the examiner. The key chord and the starting note will be sounded.
- To clap/ tap the rhythm of a short extract played twice by the examiner. (state whether it is in simple duple, triple, Quadruple or compound duple time.)
- Play on the piano or sing a four bar after phrase in simple duple or simple triple time to a fore phrase played by the examiner.

Pieces for Piano

01. Prelude in C minor  J.S. Bach
02. 1st  Movement of any Sonata  - By W A Mozart, Beethoven, or Haydn
04. Rondo Alla Turca – W.A. Mozart
03. Mazurka in B Flat Major -Frederic Chopin
04. waltz in E flat Major )p. 18. -Frederic Chopin
05. Sonatina op.36, No. 06 by. Muzio Clementid
07. Morning Bells, Op.109, No. 09 by. Friedrich Burgmuller
08. Ballad Improvisation by. Denes Agay
09. Private  Detective - Phillip Lane
10. Valse lente - Oskar Merikanto

Singing

1. Serenade by Schubert.
2. Where'er you walk composed by Handel, from opera "semele"
3. Over the Mountains (To the memory of Arnold Guy Vivian) Old English Melody.
4. Cantique de Noel (o.holy night) - Adolpha Adam.
5. Skye boat song - Original Accompaniment and Descant by Evelyn Sharpe
6. Oh, What a beautiful morning from Oklahoma,Music by Richard
7. Some Enchanted Evening, From south pacific, Music by Richard Rodgers.
8. Younger Than Spring time from South pacific, Music by Richard Rodgers.
9. You'll never walk alone from Carousel, Music by Richard Rodgers.
10. C;limb every Mountain from sound of Music, Music by Richard Rodgers.
11. Maria - by Sound of Music.
12. Panis Ange licus - Cesar Frank arranged by Flenry Geehl.
13. Over the Rainbow - The Wizard of OZ, Music by Harold Arlen
14. The Joys off love (piacer D' amor) - G Martini.

Recorder

1 Symphony in Gminor - No 40 - W.A. Mozart
2 Dance of the Reed Pipes - P. Tehaikovsky
3 Rondeau - Theme from Masterpiece Theater - Joseph Mouret
4 Chamarita - Potuguese Trad - arr. Christian Morris
5 Freylekh Zain - arr. Christian Morris
6 Sheep May Safely Graze - J.S.Bach
7 Tambourin - Suite in E minor, RCT 2, No 8 - Jean - Joseph Mouret
8 Sonata No 5 - Benedetto Marcello
9 Pastoral Symphony - G.F.Houdel
10 The Swan from Carnival of the Animals
11 Ein Madchen order Weibchen from Die Zauberflote, W.A.Mozart
12 Evening prayer - Engelbert Hamperdink - Arr.Alan Eullard

# (56) සංගීතය (බටහිර)
## ප්‍රායෝගික පරීක්ෂණය

මෙම පරීක්ෂණය සංරචක 04කින් සමන්විත වේ.

1. සංගීත කෘති 03ක් ප්‍රාසාංගික ව ඉදිරිපත් කිරීම.
2. තාක්ෂණික වැඩ
3. සයිට්රීඩ් කිරීම.(ක්ෂණිකව කියවා වාදනය කිරීම)
4. ශ්‍රවණ පරීක්ෂණය- a) කණ්ඩායම්

   b) ඒකල

**01. සංගීත කෘතීන් 3ක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම.**

(i) සංගීත කෘති (1) - රෙකෝඩරය වාදනය. සහය වාදනය සහිතව

(දෙන ලද ලැයිස්තුව අනුව එක ස්වර ප්‍රස්තාරයක් තෝරා ගත යුතුය.)

(ii) සංගීත කෘති (2) - පියානෝ වාදනය

( නිර්දේශිත ලැයිස්තුව අනුව එක ස්වර ප්‍රස්තාරයක් තෝරා ගත යුතුය.)

(iii) සංගීත කෘති (3) - ගායනය (සහය වාදනය සහිතව)

(දෙන ලද ලැයිස්තුව අනුව එක සින්දුවක් තෝරා ගත යුතුය.)

හෝ

අයදුම්කරුවාගේ අභිමතය පරිදි පියානෝව හැර වෙනත් වාද්‍ය භාණ්ඩයකින් යම් මට්ටමක ප්‍රමිතියකින් යුත් සංගීත කෘතියක්

(ස්වර ප්‍රස්තාර දෙනු නොලැබේ.)

හෝ

දී ඇති ලැයිස්තුවේ සඳහන් වෙනත් පියානෝ වාදන කෘතියක්

((ii) හි වාදනය නොකළ ප්‍රස්තාරයක් විය යුතුය.)

**02. තාක්ෂණික වැඩ**

ස්කේල්ස් - උපරිමය ශාප්ස් 5කින් හා ෆ්ලැට්ස් 05කින් සමන්විත

- සප්ත දෙකකින් යුත් මේජර් හා මයිනර් (හාර්මෝනික් හා මෙලෝඩික්) ස්කේලයන් ෂත් ස්වප්තයක පරතරයකින් යුක්ත ව ලෙගාටෝ / ස්ටෙකාටෝ (ස්ටෙකාටෝ) වශයෙන් දෑතින් ආරෝහණ හා අවරෝහණ ලෙස වාදනය කිරීම.
- ඉහත සඳහන් කී සිග්නේචර්වලින් සමන්විත ආර්ජපීයෝස් සප්ත දෙකක් දෑතින් වාදනය කිරීම.
- සප්ත 02කින් යුත් ක්‍රොමැටික් ස්කේල් දෙඅතින් ලෙගාටෝ ආකාරයෙන් වාදනය කිරීම.

**3.සයිට්රීඩ් කිරීම.(ක්ෂණිකව කියවා වාදනය කිරීම)**

- ෂාප්ස් 04කින් හෝ ෆ්ලට්ස් 04කින් යුක්ත කී සයිනයක් සමග ස්වර ප්‍රස්තාරයක්
- ටෙබල් ස්ටෙවයේ B ෆ්ලැට් තුන්වැනි ස්ටේවයෙ C අතර පරාසයේ ඇති ගීතයක් කියවා ගායනය කිරීම. (සයිඩ් සිං)

**4. a) ශ්‍රවණ පරීක්ෂණය (කණ්ඩායම්)**

- බාර් 4ක තනුවක් 05 වතාවක් වයනු ලැබේ. එම තාලය අයදුම්කරුවන් විසින් ලිවිය යුතුව ඇත. එම තනුවෙහි ස්කේලය හා පලමුවන ස්වරය දෙනු ලැබේ. වයනු ලබන තනුව C හා F මේජර්වලට සීමා වේ.
- මේජර් හා මයිනර් කී එකකට අයත් ස්වර බන්ධයක් පරීක්ෂකවරයා විසින් දෙවරක් වාදනය කළ පසු එහි නිමාවන කේඩන්සය. පර්ෆෙක්ට්, ඉම්පර්ෆෙක්ට්,ප්ලේගල් හෝ ඉන්ටරප්ටඩ් වශයෙන් හඳුනා ගැනීම. මූලික කෝඩය පළමුව වයනු ලැබේ.
- පරීක්ෂකයා විසින් දෙවරක් වාදනය කරනු ලබන මේජර් හා මයිනර් කී එකකට අයත් ස්වර බණ්ඩය මෙඩියුලේට් වන්නේ එහි ඩොමිනන්ට් ස්කේලයට හෝ රෙලටිව් මේජර්/ මයිනර් ස්කේලර්වලට ද යන්න හඳුනා ගැනීම. මූලික කෝඩය වාදනය කරනු ලැබේ.
- විෂය නිර්දේශයේ සඳහන් කර ඇති සංගීත කෘතීන් 04ක් වාදනයකින් පසු එහි සංගීතඥයා, යුගය හා වර්ගය හඳුනා ගැනීම.

**5. b) වාචික පරීක්ෂණය (කේවල)**

- පරීක්ෂකවරයා විසින් දෙවරක් වාදනය කරනු ලබන බාර් 04ක තනුවකට (මේජර් හා මයිනර්) සවන් දීම තනුව අයදුම්කරු විසින් ගායනා කිරීම.

  මූලික කෝඩය හා ආරම්භක ස්වරය පරීක්ෂක විසින් නැවත වාදනය කෙරේ.
- පරීක්ෂකයා විසින් දෙවරක් වාදනය කරනු ලබන කෙටි ස්වර බණ්ඩයක් අත්පුඩි තාල හෝ වෙනයම් අයුරකින් තාල තබා පෙන්වීම, මෙම තාලය සිම්පල් ඩියුපල්, ට්‍රිපල්, ක්වාඩ්රුපල් හෝ කම්පවුන්ඩ් ඩියුපල් වශයෙන් හඳුනා ගැනීම.
- සිම්පල් ඩියුපල් හෝ සිම්පල් ට්‍රිපල් තාලයට අයත් බාර් 04කින් යුත් සංගීත බණ්ඩයක් පියානෝවෙන් වාදනය කළ පසු එම තනුවෙහි ඉතිරි කොටස (after phrase) ගායනා කර හෝ වාදනය කර පෙන්වීම.

# Symphony in G minor
## No. 40

W. A. Mozart




13
f
f
18
p
p
23
27
f
f


31
sf
sf
35
sf
sf
sf
sf
sf
sf
sf
39
44
p
p


50
p
p
56
61
cresc.
f
cresc.
f
65
sf


70
mf
mf
74
f
f
78
p
p
82
f
f



86
90
95
98
cresc.
ff
cresc.
ff

# Dance of the Reed Pipes

**Allegro** P.Tchaikovsky




12
pp
mf


15


18
DC al
p
cresc.
cresc.

# Rondeau

Theme from Masterpiece Theater

Jean-Joseph Mouret




14
18
23
tr
tr

# Chamarita

Portuguese Trad.
arr. Christian Morris




19
25
31
36
no cres!
no cres!
rit.

# Freylekh Zain

arr. Christian Morris




14
ff
f
19
1.
2.
Fine
mp
pp
24
D.S. al Fine

# Sheep May Safely Graze

J.S.Bach




11
mf
p
mf
p
mf
15
p
mp
mp
19
f

# Tambourin

Suite in E minor, RCT 2, No. 8

Jean-Philippe Rameau






43
49
55
60

# Sonata No. 5

Benedetto Marcello




4
f
f
6
tr
p
p
8
tr

# Pastoral Symphony

from *Messiah*

G.F. Handel




10
tr
tr
Fine
13
16
19
Da Capo

# The Swan

from Carnival of the Animals

Camille Saint-Saens (1835-1921)




37
3
42
47
rall.
a tempo
pp
8va
pp
52
(8)
rit.


2
19
23
27
32

# Ein Mädchen oder Weibchen

from 'Die Zauberflöte'

**Andante** W.A. Mozart




8va
Allegro
cresc.
fp


cresc.
cresc.
fp
fp
Andante


D.S. al Coda
(8)
Coda
8va
(8)

# Evening Prayer

Engelbert Humperdink
(1852 - 1921)
Arr Alan Eullard




13
8
p


17
8


21
8
poco rit.
pp
Ped.

# (57) නාට්‍ය හා රංග කලාව (සිංහල)

**ප්‍රශ්න පත්‍ර ව්‍යුහය**

**I පත්‍රය** - **පෙරදිග නාට්‍ය කලාව**
**කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - වරණ **5** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් **මුළු ලකුණු 40කි.**

II කොටස - මෙම කොටස අනු කොටස් **දෙකකින්** සමන්විත වේ.
A කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**
B කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**
එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **15** බැගින් **මුළු ලකුණු 60 කි.**
**I පත්‍රය සඳහා මුළු ලකුණු** - 100

**II පත්‍රය** - **අපරදිග නාට්‍ය කලාව**
**කාලයඃ පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - වරණ **5** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40කි**. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් **මුළු ලකුණු 40කි.**

II කොටස - මෙම කොටස අනු කොටස් **දෙකකින්** සමන්විත වේ.
A කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**
B කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **තුනකි.**
එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **15** බැගින් **මුළු ලකුණු 60කි.**
**II පත්‍රය සඳහා මුළු ලකුණු** - 100

**ප්‍රායෝගික පරීක්ෂණය**

නාට්‍ය හා රංග කලා විෂයයේ ප්‍රායෝගික ඇගැයීම, **A, B, C** සහ **D** යනුවෙන් කොටස් හතරකින් සමන්විත වේ. **A** කොටසට අපේක්ෂකයා අනිවාර්යෙන් ම ඉදිරිපත් විය යුතු අතර උපරිම ලකුණු 60ක් උපයාගත හැකි ය. **B** කොටසේ ඇගැයීම් අතරින් අපේක්ෂකයා කැමති එක් ඇගැයීමකට (ලකුණු 15) සහ **C** කොටසේ ඇගැයීම් අතරින් අපේක්ෂකයා කැමති එක් ඇගැයීමකට (ලකුණු 15) අයදුම්කරු ඉදිරිපත් විය යුතු ය. **D** කොටස යනු වාච්‍ය පරීක්ෂණයකි. මේ සඳහා **B** සහ **C** කොටස් ඇසුරෙන් පරීක්ෂක මණ්ඩලය විමසන වාචික ප්‍රශ්න සඳහා අපේක්ෂකයා පිළිතුරු ලබා දිය යුතු ය (ලකුණු 10).

| | | |
|---|---|---|
| **A කොටස** | **රූපණය/රඟපෑම (Acting) - ලකුණු 60** | |
| A - 1 | පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (දෙන ලද පෙළ කොටස් ඇසුරෙන්) | ලකුණු 30 |
| A - 2 | එසැණ නිරූපණය | ලකුණු 15 |
| A - 3 | කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම | ලකුණු 15 |
| **B කොටස** | **රූපණය/රඟපෑම (Acting) - ලකුණු 15** | |
| B - 1 | සංගීත ඛණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය | ලකුණු 15 |
| B - 2 | නාට්‍ය ගීතයක් ගායනයෙන් හා රංගනයෙන් ඉදිරිපත් කිරීම | ලකුණු 15 |
| B - 3 | ගැමි නාටක/ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය | ලකුණු 15 |
| **C කොටස** | **නාට්‍ය නිෂ්පාදනය සහ ආනුෂංගික කලා පිළිබඳ ඇගයීම - ලකුණු 15** | |
| C - 1 | අංග රචන නිර්මාණ සැලසුම (Makeup Design) | ලකුණු 15 |
| C - 2 | වේෂ භූෂණ නිර්මාණ සැලසුම (Costume Design) | ලකුණු 15 |
| C - 3 | පසුතල නිර්මාණ සැලසුම (Set Design) | ලකුණු 15 |
| **D කොටස** | **ඉහත B සහ C කොටසට අදාළ වාච්‍ය පරීක්ෂණය - ලකුණු 10** | |

අවසාන ලකුණ ගණනය කිරීම:

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | = | ලකුණු | 100 |
| II පත්‍රය | = | ලකුණු | 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | = | ලකුණු | 100 |
| අවසාන ලකුණ | = | ලකුණු | 300 ÷ 3 = 100 |

# (57) නාට්‍ය හා රංග කලාව (සිංහල)

I පත්‍රය

**සැලකිය යුතුයි:**

★ නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුරේ අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

---

**I කොටස**

**1.** ප්‍රාසංගික කලා පමණක් අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) වීදි නාට්‍ය, සංගීතය, මූර්ති කලාව, ටෙලි නාට්‍ය, ඔපෙරා
(2) ගීත නාටක, වේදිකා නාට්‍ය, ඔපෙරා, බැලේ, නෘත්‍ය නාටක
(3) චිත්‍ර කලාව, සංගීත නාටක, ඔපෙරා, ගැමි නාටක, ගුවන් විදුලි නාට්‍ය.
(4) නර්තනය, සංගීතය, ගුවන් විදුලි නාට්‍ය, වීදි නාට්‍ය, සිනමාව
(5) සිනමාව, ටෙලි නාට්‍ය, වීදි නාට්‍ය, ඔපෙරා, බැලේ. (......)

**2.** නෘත්ත, නෘත්‍ය, නාට්‍ය වශයෙන් දැක්වෙන අර්ථ නිරූපණය පිළිබඳ ව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** පිළිතුර තෝරන්න.
(1) නෘත්‍යයෙන් කිසිදු භාවයක් ප්‍රකට නොකෙරේ.
(2) නාට්‍යය, නෘත්ත හා නෘත්‍ය තරම් ප්‍රභල නැත.
(3) භරතමුනි මේ පිළිබඳ ව කිසිවක් සඳහන් නො කර යි.
(4) නාට්‍යයට නෘත්ත හා නෘත්‍යයේ සහාය අවශ්‍ය නැත.
(5) නෘත්ත යනු ශුද්ධ නැටුම හෙවත් රිද්මයානුකූල ගාත්‍ර වික්ෂේපයක් පමණි. (......)

**3.** 'නාට්‍යධර්මී' සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) ලාලිත්‍යයෙන් යුතු අංග වික්ෂේප නාට්‍යධර්මී ලෙස හැඳින්විය හැකි ය.
(2) ජනාන්තික, අපවාරිත, ආකාශභාෂිත ආදිය නාට්‍යධර්මීගත භාෂණවිධි ය.
(3) ද්විත්ව රංගනය (double acting) ද නාට්‍යධර්මීගත රඟපෑමකි.
(4) නාට්‍යධර්මීගත සියලු රඟපෑම් ශෛලිගත රඟපෑම් ලෙස හැඳින්විය හැකි ය.
(5) යාන - වාහන, වන ගහන ආදිය සජීවී නළුවන් ලවා ඉදිරිපත් කිරීම ද නාට්‍යධර්මී ලෙස හැඳින්වේ. (......)

**4.** 'නාට්‍යශාස්ත්‍රය' කෘතිය සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) සංස්කෘත නාට්‍යයේ ප්‍රේක්ෂා ගෘහය සම්බන්ධ දීර්ඝ විස්තරයක් මෙම කෘතියෙහි අඩංගුය.
(2) භරත නම් මුනිවරයා විසින් ක්‍රි.ව. 10 සියවසේ දී පමණ රචනා කරන ලදැ යි සැලකේ.
(3) චතුර් අභිනය පිළිබඳ ව දීර්ඝ ලෙස විස්තර නොවේ.
(4) මෙහි නර්තනය ගැන සඳහන් වුව ද සංගීතය ගැන සඳහන් නොවේ.
(5) අපරදිග නාට්‍ය කලාවට ගුරු වූ සංස්කෘත විචාර ග්‍රන්ථයකි. (......)

**5.** නාට්‍ය කලාවේ සෑම පැතිකඩක් ම අළලා ලියැවුණු ලොව ප්‍රථම විචාර ග්‍රන්ථය වනුයේ,
(1) ඇරිස්ටෝටල්ගේ පොයියිටිකීස් හෙවත් කාව්‍යශාස්ත්‍රයයි.
(2) භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයයි.
(3) ධනංජයගේ දශරූපයයි.
(4) ලියෝ තෝල්ස්තෝයිගේ කලාව යනු කුමක් ද? යන ග්‍රන්ථයයි.
(5) සෙඅමි මෙතොකියෝගේ ෆුෂිකදෙන් නම් කෘතියයි. (......)

**6.** දේශීය ශාන්තිකර්ම සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) රටයකුම හෙවත් රිද්දියාගය උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්තිකර්මයකි.
(2) සිංහල වේදිකා නාට්‍යයට දේශීය ශාන්තිකර්මවලින් ආභාසයක් ලැබී නැත.
(3) දේශීය ශාන්තිකර්ම නාට්‍යමය ලක්ෂණයෙන් හීන ය.
(4) එදිරිවීර සරච්චන්ද්‍ර දේශීය ශාන්තිකර්ම ගැන පර්යේෂණ සිදුකොට නැත.
(5) රෝග නිවාරණය හා සශ්‍රීකත්වය දේශීය ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණයි. (......)

**7.** දේශීය ශාන්තිකර්මවල රඟමඬුලු සැරසිලි සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න
(1) සූනියම් යාගය සඳහා වීදී සැරසිලි නිර්මාණය නොකෙරේ.
(2) සන්නියකුම යාගයේ වෙස්මුහුණු භාවිතා වන බැවින් රංගභූමි සැරසිලි භාවිතා නො කෙරේ.
(3) රඟමඬුලු සැරසිලි ශාන්තිකර්මයේ උපත් කතාව හා සම්බන්ධයක් නැත.
(4) ශාන්තිකර්ම රඟමඩලේ ඉදි කරන මඩු, වීදී, තොරණ ආදිය පසුතල නිර්මාණ වේ.
(5) රඟමඩලු සැරසිලි නිර්මාණය වන්නේ දැව භාවිතයෙනි. (......)

**8.** සොකරි නාට්‍යයට අදාළ **නොගැළපෙන** වරණය තෝරන්න.
(1) සොකරි වූ කලී උඩරට ප්‍රදේශවල ප්‍රචලිත ගැමි නාටකයකි.
(2) එහි එන ප්‍රධාන චරිත නාම විදේශීය සම්භවයකට නෑකම් කියයි.
(3) එය රෝග නිවාරණ ශාන්තිකර්මයක් ලෙස නොසැලකේ.
(4) රඟ දැක්වීම සඳහා බහුල ව භාවිතා වන්නේ කමතයි.
(5) එහි එන ඇතැම් චරිත තාවකාලික ව සකස් කරගන්නා වෙස් මුහුණු භාවිතා කෙරෙති. (......)

**9.** කෝළම් නාටකයට සම්බන්ධ **නිවැරදි** වරණය තෝරන්න.
(1) මහාකෝල සන්නි යකා කෝළම් නාටකයේ චරිතයකි.
(2) කෝළම් නාටකයේ වඩාත් ම විචිත්‍ර අංගය වන්නේ පූර්වරංගයයි.
(3) කෝළම් නාටකයට ස්ත්‍රී චරිත අන්තර්ගත නොවේ.
(4) දහඅට සන්නිය හා කෝළම් අතර සමානතාවක් නැත.
(5) පූර්වරංගයේ පාත්‍ර වර්ගයා සඳහා පමණක් වෙස් මුහුණු භාවිතා කෙරේ. (......)

**10.** නාඩගම ගැමි නාටකයක් **නොවන්නේ,**
(1) ගැමි පරිසරයක් තුළ රඟ නොදැක්වුණු නිසා ය.
(2) ඊට පූර්වරංගයක් අයත් වූ නිසා ය.
(3) ඊට ලිඛිත පිටපතක් යොදා ගැනුණු නිසා ය.
(4) ඊට කර්ණාටක සංගීතය යොදා ගැනුණු නිසා ය.
(5) දකුණු ඉන්දීය තෙරුක්කූත්තුවල ආභාසය ලද නිසා ය. (......)

**11.** නාඩගමට පමණක් **ආවේණික** ස්ථාවර පාත්‍ර අයත් වරණය තෝරන්න.
(1) ආඬිගුරු, බහුබූතයා, සොත්තානා, හේවා කෝළම
(2) බහුබූතයා, සෙල්ලම් ළමා, දේශනාවාදී, පොතේගුරු
(3) පොතේගුරු, දේශනාවාදී, බම්මන්නා, හනුමන්තා
(4) පරයා, සොත්තානා, ආඬිගුරු, සෙල්ලම් ළමා
(5) බහුබූතයා, සොත්තානා, ලෙන්චිනා, ආඬිගුරු (......)

**12.** නූර්ති සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) නූර්තිය මෙරට ප්‍රචලිත කළෝ යුරෝපීය ජාතිකයෝ ය.
(2) සී.දොන් බස්තියන් ජයවීර නූර්ති රචකයෙක් නොවේ.
(3) රංගනයේ යෙදුණේ පුරුෂයන් පමණි.
(4) එළිමහනේ රඟ දක්වනු ලැබිණි.
(5) රොම්ලින් සහ ඇහැලේපොළ නූර්ති නාට්‍ය දෙකකි. (......)

**13.** ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ලෙස්ලි බොතේජු සහ ක්ලෙමන්ට් ප්‍රනාන්දු පාස්කු නාට්‍ය රචකයෝ ය.
(2) බොරලැස්ස පාස්කු වේදිකා නාට්‍ය සම්ප්‍රදාය ඇරඹුවේ ලෝරන්ස් පෙරේරා ය.
(3) දූවේ පාස්කු නාට්‍ය සඳහා නාඩගම් ශෛලිය ආභාසය වී නැත.
(4) දූවේ පාස්කු නාට්‍ය සඳහා භාවිත වන්නේ මර්සලීන් ජයකොඩි පියතුමාගේ පාස්කු පිටපතයි.
(5) දූවේ පාස්කු නාට්‍ය වර්තමානයේ ද රඟ දැක්වේ. (......)

**14.** ''සුවඳ පද්ම ඕළු ආදි'' ගීතය අන්තර්ගත ව ඇත්තේ,

(1) ඇහැලේපොළ නාඩගමේ ය. (2) චාල්ස් ඩයස්ගේ පද්මාවතී නූර්තියෙහි ය.

(3) ජෝන් ද සිල්වාගේ රාමායණයෙහි ය. (4) බ්‍රම්ෆෝඩ් නාඩගමේ ය.

(5) චාල්ස් ඩයස්ගේ දුටුගැමුණු නූර්තියේ ය. (......)

**15.** ශ්‍රී ලංකාවේ බෞද්ධ පූජාකර්ම සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) මිලින්ද ප්‍රශ්නය ධර්ම දේශනයක ස්වරූපයෙන් ඉදිරිපත් වන බෞද්ධ පූජාකර්මයකි.

(2) දොරකඩ අස්න නාට්‍යමය ගුණයෙන් හීන පූජා කර්මයකි.

(3) යුගාසන බණ භික්ෂූන් දෙදෙනෙකු අතර සිදුවන සංවාදයක ස්වරූපය ගනී.

(4) ආලවක දමනය රඟ දක්වන්නේ රූකඩ උපයෝගී කොට ගෙන ය.

(5) බෞද්ධ පූජාකර්මවල අනුකරණය, සමාරෝපය සහ අනුරූපණය අන්තර්ගත නොවේ. (......)

- පහත දැක්වෙන කරුණු/ සංකල්ප සුදුසු පරිදි තෝරා 16-19 දක්වා ප්‍රශ්න අංක ඉදිරියේ ඇති හිස්තැන් පුරවන්න. එසේ පිරවීමේ දී එක් පිළිතුරකට අදාළ වරණ 03 ක් ඇති බවත්, එම වරණවලට අදාළ ඉංග්‍රීසි අක්ෂර පිළිතුර සඳහා යෙදිය යුතු බවත් සලකන්න.

| | | |
|---|---|---|
| A - ප්‍රකරණ | E - පංචනාරී ඝට | I - හන |
| B - යුගෙන් | F - ඉචිකව දන්ජුරෝ | J - මහාසම්මත |
| C - නාගරාක්ෂ | G - ත්‍ර්‍යස්‍ර රංගය | K - හයෂිබෙය |
| D - ඔකින | H - ඔන්නගත | L - මාලවිකාග්නිමිත්‍ර |

**16.** සංස්කෘත නාට්‍ය හා සම්බන්ධ වන්නේ, (...........)

**17.** නෝ නාට්‍යයට අදාළ වන්නේ, (...........)

**18.** කබුකි නාට්‍යයට අදාළ වන්නේ, (...........)

**19.** කෝළම් නාට්‍යයට අදාළ වන්නේ, (...........)

- අංක 20-25 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු/සංකල්ප/නාම 05 බැගින් දී ඇත. ඒ අතුරින් සෙසු පද හා **නොගැළපෙන** එක් පදයක් ඇත. එය තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහනේ ලියන්න.

**20.** (1) කරළිය (2) පිලිප්පු සිඤ්ඤෝ (3) මද්දලය
(4) ඇහැලේපොළ (5) සී. දොන් බස්තියන් (......)

**21.** (1) බලිවාලා (2) පරාභව (3) විශ්වනාත් ලව්ජි
(4) කර්ණාටක සංගීතය (5) ජෝන් ද සිල්වා (......)

**22.** (1) දූව (2) මිරිස්ස (3) වහකෝට්ටේ
(4) පේසාලේ (5) බොරලැස්ස (......)

**23.** (1) කාමන්කූත්තු (2) නවරාත්‍රි (3) දීපාවලී
(4) තෛපොංගල් (5) මහාශිවරාත්‍රි (......)

**24.** (1) වඩමෝඩි (2) රාවනේසන් (3) තෙන්මෝඩි
(4) මහඩි (5) පරෙරමේල්ලක්කූත්තු (......)

**25.** (1) කුවේණි (2) හුණුවටයේ කතාව (3) දූන්න දූනුගමුවේ
(4) මකරා (5) දිරිය මව සහ ඇගේ දරුවෝ (......)

**26.** නූතනයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය ප්‍රවර්ධනයෙහි ලා ක්‍රියා කරන්නෝ වන්නේ,
(1) ඉන්දු ධර්මසේන, හේග් කරුණාරත්න, දීපානි සිල්වා
(2) ජෙරොම් ද සිල්වා, අර්නස්ට් මැකින්ටයර්, රුවන්ති චිකේරා
(3) ජයන්ත චන්ද්‍රසිරි, පරාක්‍රම නිරිඇල්ල, ජෙරොම් ද සිල්වා
(4) ජෙරොම් ද සිල්වා, ඉන්දු ධර්මසේන, රුවන්ති චිකේරා
(5) අර්නස්ට් මැකින්ටයර්, ඉන්දු ධර්මසේන, ජෙරොම් ද සිල්වා (......)

**27.** ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කොට ඇති සිංහල නාට්‍යකරු වන්නේ,
(1) ධර්මසිරි බණ්ඩාරනායක (2) රංජිත් ධර්මකීර්ති (3) කේ. බී. හේරත්
(4) බන්දුල විතානගේ (5) සුගතපාල ද සිල්වා (......)

**28.** බන්දුල විතානගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය තෝරන්න.
(1) බෙකට්, හිරු දහසක්, රෝමය ගිනි ගනී
(2) බෝඩිංකාරයෝ, තුරඟ සන්නිය, රෝමය ගිනි ගනි
(3) බක්මහ අකුණු, බෙකට්, මෝදර මෝල
(4) පුස්ලෝඩං, හිරු දහසක්, වෙස්මුහුණු
(5) මරාසාද්, බෙකට්, රෝමය ගිනි ගනි (......)


**29.** සංස්කෘත නාට්‍යයේ ඉතිවෘත්ත යන්නට අයත් වන්නේ,
(1) බීජ, බින්දු, පතාකා, ප්‍රකරී හා කාර්යය යි.
(2) ආරම්භ, ප්‍රයත්න, ප්‍රාපත්‍යාශා, නියතාප්ති සහ ඵලාගම යි.
(3) මුඛ, විමර්ශ, ගර්භ, අවමර්ශ හා නිර්වහණ යි.
(4) නාට්‍ය වස්තුව, නායකයා හා රස යි.
(5) ප්‍රවේශක, විෂ්කම්භක, අංකමුඛ, අංකාවතාර හා චූලිකා යි. (......)

- පහත දී ඇති වෙස්මුහුණු හඳුනාගෙන 29-33 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අදාළ අක්ෂරය යොදා හිස්තැන් පුරවන්න.

(ක)



(ග)




(ජ)



(ට)



**30.** සන්නි යකුන් යාගය හා සම්බන්ධ වෙස්මුහුණු වන්නේ, (......)

**31.** කුමදොරි හා සම්බන්ධ වන්නේ, (......)

**32.** නෝ නාට්‍ය සඳහා භාවිතා වන්නේ, (......)

**33.** කෝළම් නාට්‍යයේ වෙස්මුහුණු වන්නේ, (......)

**34.** සංස්කෘත නාටකයෙහි නායක චරිතය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අභිඥානශාකුන්තලයෙහි දුෂ්‍යන්ත රජ ධීරෝදාත්ත නායකයෙකි.
(2) සංස්කෘත නාට්‍යයෙහි දේව චරිත අයත් වන්නේ ධීරලලිත වර්ගයට ය.
(3) රත්නාවලී නාටිකාවෙහි උදයන රජ ධීර ප්‍රශාන්ත නායකයෙකි.
(4) අභිඥානශාකුන්තලයෙහි දුෂ්‍යන්ත රජ ධීරෝද්ධත නායකයෙකි.
(5) සංස්කෘත නාට්‍යයෙහි නායක චරිත අයත් වන්නේ උත්තම ගණයට පමණි. (......)

**35.** නාට්‍යශාස්ත්‍රයේ යොදනු ලැබ, පොදුවේ නාට්‍ය කලාවේ භාවිත වේෂභූෂණ යන පාරිභාෂික පදයට අදාළ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) වේෂභූෂණවලට අයත් වන්නේ වෙස්මුහුණු පමණි.
(2) අලංකාර හෙවත් ඇඳුම්-පැළඳුම්, ආභරණ හා මල්දම් වේෂභූෂණ වේ.
(3) අංගරචනා යනු නාට්‍ය කලාවේ වේෂභූෂණ වේ.
(4) කඩු, කස්තාන, ඔටුණු ආදිය වේෂභූෂණ ගණයෙහි ලා නොසැලකේ.
(5) වේෂභූෂණ අවශ්‍ය වන්නේ සංස්කෘත නාට්‍යයට පමණි. (......)

**36.** නාට්‍ය කලාව හා සෙසු ප්‍රාසංගික කලා විෂයයෙහි අදාළ වන හස්තකර්ම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) මේ පිළිබඳ සඳහන් වන්නේ නාට්‍යශාස්ත්‍රයේ 9 වැනි අධ්‍යායේ ය.
(2) මෙය අයත් වන්නේ නාට්‍යශාස්ත්‍රයේ අංගාභිනය සම්බන්ධ විස්තරයට ය.
(3) අංජලී හස්ත යනු අසංයුක්ත හස්තයකි.
(4) අසංයුක්ත හස්ත 24 ක් හා සංයුක්ත හස්ත 13 ක් ගැන නාට්‍යශාස්ත්‍රයේ සඳහන් වේ.
(5) නන්දිකේශ්වරගේ අභිනයදර්පණයෙහි ද මේ ගැන සඳහන් වේ. (......)

**37.** නාට්‍යයක සංගීතය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) නාට්‍යයක සංගීතය අයත් වන්නේ සාත්ත්වික අභිනයට ය.
(2) ගායන, වාදන, හඬ හා ශබ්ද සංකලන සංගීතය ලෙස සැලකේ.
(3) එදිනෙදා භාවිත සංගීත ආකෘති හා නාට්‍ය සංගීතය අතර වෙනසක් නැත.
(4) සංගීතය යොදා නොගෙන වුව ද නාට්‍ය නිෂ්පාදනය කළ හැක.
(5) මිනිස් හඬ පමණක් නාට්‍යයක පසුබිම් සංගීතය ලෙස යොදා ගැනීම අනුචිත ය. (......)

- පහත දැක්වෙන සුප්‍රසිද්ධ කලා නිර්මාණ උපයෝගි කරගෙන 38-40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුරේ අංකය වරහන් තුළ ඇති හිස්තැන තුළ ලියන්න.

(අ) දෝජෝ විහාරය (ආ) කරදිය (ඇ) මානසවිල

**38.** 'අ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) කබුකි නාට්‍යයකි. (2) බුගකු නාට්‍යයකි. (3) නෝ නාට්‍යයකි.
(4) ජපන් චිත්‍රපටයකි. (5) බුන්රකු නාට්‍යයකි. (......)

**39.** 'ආ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) ගීත නාටකයකි. (2) මුද්‍රා නාට්‍යයකි. (3) ගීත නාට්‍යයකි.
(4) ඔපෙරාවකි. (5) වේදිකා නාට්‍යයකි. (......)

**40.** 'ඇ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) ඉන්දියානු නෘත්‍ය නාටකයකි. (2) චිත්‍රපටයකි. (3) ගීත නාටකයකි.
(4) ඔපෙරාවකි. (5) බැලේ නාටකයකි. (......)

★★

## II කොටස

**සැලකිය යුතුයි:**

★ එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

---

## A කොටස

**1.** (i) අභිඥානශාකුන්තලයට පසුබිම් වූ පුරාවෘත්තය හඳුන්වන්න.
(ii) කාලිදාස ඉහත (i) හි සඳහන් පුරාවෘත්තයට සිදුකොට ඇති වෙනස්කම් පහක් සඳහන් කරන්න.
(iii) අභිඥානශාකුන්තලයේ සිව්වැනි අංකයේ එන හොඳ ම පද්‍ය තුනක් තෝරා, එසේ තෝරා ගැනීමට හේතු දක්වන්න. (පද්‍ය සම්පූර්ණයෙන් ලියා දැක්වීම අවශ්‍ය නො වේ) (ලකුණු 15)

**2.** (i) නෝ නාට්‍ය දෙකක් නම් කරන්න.
(ii) ඔබ නම් කළ නාට්‍ය දෙක ඇසුරින් නෝ නාට්‍යයෙන් ප්‍රකට වන ජීවන දර්ශනය පැහැදිලි කරන්න.
(iii) ඉහත නාට්‍ය දෙකෙන් එකක් ආශ්‍රය කොටගෙන නෝ නාට්‍ය කලාවට පසුබිම් වන දර්ශනය නෝ රංග ශෛලියෙන් ප්‍රකට වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 15)

**3.** (i) මූලාශ්‍රයන්හි දැක්වෙන කුවේණිය හා නාට්‍ය රචකයා දුටු කුවේණිය අතර ඔබ දකින වෙනස්කම් හතරක් දක්වන්න.
(ii) ඉන් වෙනස්කම් දෙකක් පිළිබඳ නිදසුන් සහිත සාකච්ඡාවක් කරන්න.
(iii) නාට්‍යකරු කුවේණිය ගේ චරිත ලක්ෂණ ප්‍රකට වන ලෙස සංවාද භාවිත කොට ඇති අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 15)

## B කොටස

**4.** (i) කබුකි වේදිකාවේ රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.
(ii) කබුකි වේදිකාවේ ශක්‍යතාව නෝ වේදිකාවේ ශක්‍යතාව හා සසඳන්න.
(iii) වේදිකාවේ භෞතික සැලැස්ම කබුකි රංග ශෛලිය කෙරෙහි කෙසේ උපයෝගි වන්නේ දැයි විමර්ශනයක් කරන්න. (ලකුණු 15)

**5.** (i) නාඩගම් රංග ශෛලියේ විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
(ii) නූර්ති නාට්‍ය නාඩගමට වඩා ජනප්‍රිය වීමට හේතු වූ කරුණු දෙකක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
(iii) නූර්ති අභාවයට යාමත් සමග කරළියට ආ නාට්‍ය ප්‍රභේද දෙකක් හඳුන්වා ඒ පිළිබඳ සාකච්ඡාවක් කරන්න. (ලකුණු 15)

**6.** (i) මනමේ නාට්‍යයේ මුල් ම දර්ශනයේ රඟ පෑ නළුවා හා නිළිය නම් කරන්න.
(ii) මනමේ නාට්‍යය සිංහල වේදිකා නාට්‍ය කලාවේ සන්ධිස්ථානයක් ලෙස සැලකීමට තුඩු දුන් කරුණු දෙකක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
(iii) මනමේ නාට්‍ය බිහිවීමෙන් අනතුරුව සිංහල වේදිකා නාට්‍ය කලාවේ හටගත් නව ප්‍රවණතාවන්ට මූලික වූ නාට්‍යකරුවන් දෙදෙනෙකු හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 15)

★★★

# (57) නාට්‍ය හා රංග කලාව (සිංහල)

## II පත්‍රය

**සැලකිය යුතුයි:**

- ★ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුය.**
- ★ **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

---

### I කොටස


**1.** ක්‍රි. පූ 534 දී ප්‍රථම වරට ඩිතුරම්බොස් ගායන වෘන්දයට එක් වූ නළුවා වන්නේ,
(1) පෙරියන්ඩර් ය. (2) අරියොන් ය. (3) තෙස්පීස් ය.
(4) සොලොන් ය. (5) මෙනන්ඩ්‍රොස් ය. (......)

**2.** ආරම්භයේදී දොළොස් දෙනෙකු ගෙන් සමන්විත වූ ගායන වෘන්දය පසළොස දක්වා වැඩි කළේ,
(1) ඊස්බිලස් ය. (2) සොෆොක්ලීස් ය. (3) යුරිපිඩීස් ය.
(4) අරිස්ටොෆනීස් ය. (5) මෙනන්ඩ්‍රොස් ය. (......)

**3.** ඇරිස්ටෝටල් ගේ කාව්‍යශාස්ත්‍රයේ සඳහන් පරිච්ඡේද ගණන,
(1) දහ අටකි. (2) විසි දෙකකි. (3) විසි හතරකි.
(4) විසි හයකි. (5) විසි අටකි. (......)

**4.** සටුර නාට්‍ය අතුරින් දැනට සම්පූර්ණයෙන් ම ඉතිරි වී ඇති එක ම නාට්‍යය,
(1) කුක්ලොප්ස් ය. (2) ඉක්නෙව්ටාඉ ය. (3) අබර්ණියයෝ ය.
(4) බක්බයි ය. (5) දෙබරු ය. (......)

- පහත දැක්වෙන රූපසටහන ආශ්‍රයෙන් 5 හා 6 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න



Parts of a Greek Theater

**5.** ඉහත රූප සටහනේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
(1) පැරසීනියම් (2) ප්‍රේක්ෂාලය (3) ඕර්කිස්ට්‍රා
(4) ප්‍රොස්කිනොන් (5) පැරඩොයි (......)

**6.** ඉහත රූප සටහනේ B අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
(1) ප්‍රේක්ෂාලය (2) අල්තාරය (3) වේදිකාව
(4) පැරඩොයි (5) මකීනා (......)

**7.** ඊඩිපස් නාට්‍යයේ වේදිකාව මත රඟ දක්වා පෙන්වන අවස්ථාවක් විය හැක්කේ,
(1) ඊඩිපස් කලකිරී නෙත් අඳ කරගැනීම ය.
(2) ඊඩිපස් තුන් මං හන්දියට පැමිණීම ය.
(3) ස්ෆින්ක්ස් ප්‍රහේලිකා විමසීම ය.
(4) යොකැස්ටා ඊඩිපස් වෙතින් ශෝකීව නික්මයාම ය.
(5) ඊඩිපස් අතින් ක්ෂණික කෝපයෙන් ලයියුස් ඝාතනය වීම ය. (......)

8. පශ්චාද්දෘෂ්ටිකථනය මගින් සොෆොක්ලීස් අපේක්ෂා කළ අරමුණ වූයේ,
(1) සිදුවීම් අනුපිළිවෙළින් ඉදිරිපත් කිරීමයි. (2) ප්‍රේක්ෂක කුතුහලය රඳවා ගැනීමයි.
(3) සෑම සිදුවීමක් ම වේදිකාව මතට ගෙන ඒමයි. (4) නළුවන් සංඛ්‍යාව සීමා කිරීමයි.
(5) ගායන වෘන්දයේ කාර්යභාරය පහසු කිරීමයි. (......)

9. මුල් ම මධ්‍යකාලීන ජන වන්දනා නාට්‍යය ලෙස සැලකෙන්නේ,
(1) පළමු එඬේරාගේ කතාව ය. (2) නොආගේ කතාව ය.
(3) දෙවන එඬේරාගේ කතාව ය. (4) මරියාවරුන් තිදෙනාගේ කතාව ය.
(5) සකලජන ය. (......)

10. කිතුනු සාන්තුවරයන්ගේ ජීවිත අළලා නිර්මාණය කළ නාට්‍ය වන්නේ කුමක්ද?
(1) මිස්ටරි (2) මොරැලිටි (3) මිරකල්
(4) පාස්කු (5) පසන් (......)

11. මධ්‍යකාලීන යුරෝපයේ චක්‍ර නාටකයට අදාළ **නොවන** අංගය වන්නේ,
(1) රථ වේදිකා ය. (2) සාන්තුවර කතා පුවත් ය. (3) පූජක නළුවෝ ය.
(4) යන්ත්‍ර සූත්‍ර භාවිතය ය. (5) බහු වේදිකා ය. (......)

12. ආචාර්ය ෆවුස්ටස් හා මෝල්ටාවේ යුදෙව්වා යන නාට්‍ය නිර්මාණය කළේ කවුද?
(1) තෝමස් කිඩ් (2) ජෝන් ලයිලි (3) ක්‍රිස්ටෝෆර් මාලෝ
(4) රොබර්ට් ග්‍රීන් (5) විලියම් ශේක්ස්පියර් (......)

13. පහත දැක්වෙන නාට්‍ය අතුරින් ට්‍රැජඩි හෙවත් ශෝකජනක නාටකය කුමක්ද?
(1) ද ටෙම්පස්ට් හෙවත් කුණාටුව
(2) කිං ලියර් හෙවත් ලියර් රජ
(3) මිඩ් සමර් නයිට්ස් ඩ්‍රීම් හෙවත් ගිම්හානේ මැදියම් රැයක සිහිනයක්
(4) මර්චන්ට් ඔෆ් වැනිස් හෙවත් වැනිසියේ වෙළෙන්දා
(5) කොමඩි ඔෆ් එරර්ස් හෙවත් වැරදීමේ ප්‍රහසනය (......)

14. ඉතාලි කතාකරු ගිරාල්ඩෝ සින්තියාගෝගේ 'හෙකටොමිති' නම් නාට්‍ය එකතුවෙන් සපයා ගත් කතාවක් ආශ්‍රයෙන් රචනා කළ නාට්‍යය කුමක්ද?
(1) වැනිසියේ වෙළෙන්දා (2) හැම්ලට් (3) ඔතෙලෝ
(4) ලියර් රජ (5) මැක්බත් (......)

15. ජූලියස් සීසර් නාට්‍යයට පාදක මූලාශ්‍රය වන්නේ,
(1) ප්ලූටාක්ගේ 'ග්‍රීක රෝම වංශවතුන්ගේ ජීවිත' නම් කෘතියයි.
(2) එංගලන්තයෙ, අයර්ලන්තයේ සහ ස්කොට්ලන්තයේ වංශකථායි.
(3) වර්ජිල්ගේ ඊනිඩ් කෘතියයි.
(4) හෝමර්ගේ ඔඩිසි කාව්‍යයයි.
(5) ප්ලේටෝගේ සිම්පෝසියම් සංවාදයයි. (......)

16. ජූලියස් සීසර් නාට්‍ය තුළ සීසර් ජීවමාන ව පෙනී සිටින්නේ,
(1) එක් ජවනිකාවක පමණි. (2) ජවනිකා දෙකක පමණි. (3) ජවනිකා තුනක පමණ.
(4) ජවනිකා හතරක පමණි. (5) ජවනිකා පහක පමණි. (......)

17. ''සීසර් මැරුවට පස්සේ ඇන්ටනි මැරුණු සීසර්ගෙ අප්‍රාණික අත වගේ වේවි'' යන ප්‍රකාශය කළේ කවරෙක් ද?
(1) කැසියස් (2) බ්‍රූටස් (3) සින්නා (4) ඩෙසියස් (5) කස්කා (......)

18. ''සීසර්ගේ ශරීරයේ හදපු තුවාල තිස්තුනේ පළිය ගන්නාතුරු මා මේ ඇඳගත් කඩුව කොපුවට දාන්නේ නෑ'' මෙසේ පවසන්නේ කවුරුන් ද?
(1) මාක් ඇන්ටනි (2) ලෙපිඩස් (3) ඔක්ටේවියස් (4) පබ්ලියස් (5) සිසරෝ (......)

**19.** රංග රීතිය හා සම්බන්ධ වන පදය තෝරන්න.
(1) නත්තල් ගස. (2) පශ්චාද්දෘෂ්ටි කථනය.
(3) පොරොන්දු පත්‍රය. (4) රූකඩ ගෙදර යන නාමය.
(5) ව්‍යාජ අත්සන. (......)

**20.** ''ජීවත් වෙන්නට ශෝකයක් දුකක් තරම්වත් ඉතුරු කළේ නෑ'' රූකඩ ගෙදර නාට්‍යයේ එම ප්‍රකාශය කරන්නේ කවුරුන් කාහට ද?
(1) නෝරා විසින් හෙල්මට (2) හෙල්ම විසින් රන්ක්ට
(3) රන්ක් විසින් ක්‍රොග්ස්ටඩ්ට (4) ලින්ඩ මහත්මිය විසින් නෝරාට
(5) ක්‍රොග්ස්ටඩ් විසින් ලින්ඩ මහත්මියට (......)

**21.** 'රූකඩ ගෙදර' නාට්‍යයේ නෝරාගේ මනෝභාවයන් මතුකිරීම පිණිස උදව් කරගත් නාට්‍යෝපකරණය කුමක් ද?
(1) නත්තල් ගස (2) ගෘහභාණ්ඩ (3) කැටයම් චිත්‍රය
(4) පියානෝව (5) ලියුම් පෙට්ටිය (......)

**22.** රූකඩ ගෙදර නාට්‍යයේ ක්‍රොග්ස්ටඩ් නෝරාගෙන් කරන ඉල්ලීම වන්නේ,
(1) ක්‍රිස්ටීන් රැකියාවට නොගන්නා ලෙසයි.
(2) තමා රැකියාවෙන් ඉවත් නොකරන්නැ යි හෙල්මට බල කරන ලෙසයි.
(3) සෙල්ලම් බාලට නොයන ලෙසයි.
(4) තමා පැමිණි බව හෙල්මට නොකියන ලෙසයි.
(5) ණය මුදල ගැන ක්‍රිස්ටීන් ට පවසන ලෙසයි. (......)

**23.** හෙන්රික් ඉබ්සන් රචනා කළ නාට්‍ය පමණක් අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) මිස් ජුලී, කතුවරයෙක් සොයන චරිත හයක්, සමාජයේ කුලුණු
(2) ගොඩෝ එනකං, හිරු දහසක්, අවතාර
(3) වන තාරාවා, තරුණ සංගමය, ජන හතුරා
(4) රොස්මෂෝම්, ආම්ස් ඇන්ඩ් ද මෑන්, චෙරිවත්ත
(5) අප මළවුන්ගෙන් නැගිටි කල්හ, මකරා, ගැලිලියෝ (......)

**24.** සැමුවෙල් බෙකට්, ඉයුජින් අයනෙස්කෝ, හැරල්ඩ් පින්ටර් යන නාට්‍යකරුවන් අයත් වන්නේ,
(1) විසංගත නාට්‍යකරුවන් ගණයට ය. (2) රොමැන්ටික් නාට්‍යකරුවන් ගණයට ය.
(3) එපික් නාට්‍යකරුවන්ට ය. (4) යථාර්ථවාදී නාට්‍යකරුවන්ට ය.
(5) සංකේතවාදී නාට්‍යකරුවන්ට ය. (......)

**25.** පහත සඳහන් නාට්‍යකරුවන් අතරින් ප්‍රකට ප්‍රකාශනවාදී නාට්‍යකරුවා කවුද?
(1) අර්වින් පිස්කැටර් (2) ඕගස්ට් ස්ට්‍රින්ග්න්බර්ග් (3) ඉයුජින් අයනෙස්කෝ
(4) ඇලෙක්සැන්ඩර් ඩූමා (5) ආතර් ඇඩනොෆ් (......)

**26.** බටහිර නූතන ප්‍රකාශනවාදී නාට්‍යයක් වන්නේ කුමක් ද?
(1) ජන සතුරා (2) දිරිය මව සහ ඇගේ දරුවෝ (3) ආශාවේ වීදි රිය
(4) යෙර්මා (5) මුහුදු ලිහිණියා (......)

**27.** පහත (i), (ii), (iii) යටතේ සංවාද කිහිපයක් ද, A,B සහ C ලෙස නාට්‍ය කිහිපයක නම් ද දක්වා ඇත.
(i). ''වැඩි බරපතල අමාරුවක් නෙවෙයි? එතකොට ටිකක් විනෝද වෙන්න අපේ නගරෙට එන්න ඇති''
(ii) ''මා විකාරයක් විදියට නුඹට පේනවා විය හැකියි එහෙත් නුඹගේ මා පියන් එසේ නොසිතනු ඇත''
(iii) ''ඔබ ඔබේ දර්ශනයෙන් කිසි ප්‍රයෝජනයක් ගන්නෙ නෑනේ, අහම්බෙන් පතිත වන වාසනාව ගැන ඉන් කියවෙනවනේ''
A. ජූලියස් සීසර් B. රූකඩ ගෙදර C. ඊඩිපස්

ඉහත (i), (ii), (iii) සංවාද අන්තර්ගත නාට්‍ය අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) ABC (2) ACB (3) BAC (4) BCA (5) CBA (......)

**28.** ළමා නාට්‍ය කලාවට අදාළ පහත සඳහන් වරණවලින් **නිවැරදි** වරණය තෝරන්න.
(1) ළමා නාට්‍යයට ඊට විශේෂ වූ ගති ලක්ෂණ අවශ්‍ය නැත.
(2) වයස් කාණ්ඩවලට ආවේණික චර්යා රටා ළමා නාට්‍ය සඳහා වැදගත් නොවේ.
(3) ළමා නාට්‍ය නිර්මාණයේ දී ඔවුන්ගේ හැකියා, සිතුම් පැතුම්, චර්යා අධ්‍යයනය කළ යුතු වේ.
(4) ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය සඳහා රාජ්‍ය මට්ටමේ සම්මාන උළෙලක් නොපැවැත්වේ.
(5) ළමා නාට්‍යයක් සතුටුදායක අවසානයකින් යුක්ත විය යුතු නැත. (......)

**29.** නාට්‍ය විචාරයට අදාළ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍ය විචාරය පිළිබඳ පැරණිම ග්‍රන්ථය රචනා වූයේ ශෝකජනක නාට්‍යයවලට අදාළව ය.
(2) නාට්‍ය විචාරය පිළිබඳ පිළිගත් සිද්ධාන්ත කිසිවක් නැත.
(3) නාට්‍ය විචාරකයා හොඳ රසිකයෙක් හා ප්‍රේක්ෂකයෙක් විය නොහැක.
(4) නාට්‍ය විචාරය අපරදිගට පමණක් සීමා වූ මතවාදයකි.
(5) නාට්‍ය කලාවේ අභිවෘද්ධිය උදෙසා විචාර කලාවක් අත්‍යවශ්‍ය ය. (......)

**30.** නාට්‍ය කලාවේ භූමිකා යන පරිභාෂික පදයට අදාළ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) රුකඩ ගෙදර නාට්‍යයේ 'බිරිඳ'ක ලෙස නෝරාගේ භූමිකාව 'මිතුරිය' ක ලෙස වන ඇගේ භූමිකාව හා ගැටෙයි.
(2) ජූලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස්ගේ භූමිකාව ඔහුගේ චරිත ලක්ෂණ හා ගැටෙයි.
(3) නාට්‍යයක එක් චරිතයකට භූමිකා කිහිපයක් රඟපෑමට සිදු වේ.
(4) භූමිකා ගැටුමෙන් නාට්‍ය අර්ථවත් වේ.
(5) 'කුවේණි' නාට්‍යයේ කථකයාට භූමිකාවක් නැත. (......)

**31.** නාට්‍යයක රූපණයට අදාළ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) කොන්ස්ටාන්ටින් ස්ටැනිස්ලව්ස්කි රූපණ සිද්ධාන්තයක් හඳුන්වා දුණි.
(2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් රූපණය කෙරෙහි විශේෂ අවධානයක් නොදැක්වී ය.
(3) රූපණය සඳහා නාට්‍යයක චරිත ගැඹුරින් අධ්‍යයනය කළ යුතු නැත.
(4) මෙයර්හෝල්ඩ්ගේ 'ජීව යාන්ත්‍රණය' රූපණ වේදයක් ලෙස කිසිවෙක් අත්හදා බැලුවේ නැත.
(5) රූපණය සිදුකළ යුත්තේ අධ්‍යක්ෂවරයාට අවශ්‍ය ලෙසින් පමණි. (......)

**32.** අනුකරණය යන්නට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ග්‍රීක භාෂාවෙහි අනුකරණය 'මිමෙසිස්' ලෙස හැඳින්වේ.
(2) ග්‍රීක ශෝකජනක නාට්‍යයකින් අනුකරණය කරනුයේ පුද්ගල චරිතය.
(3) පෙරදිග නාට්‍ය කලාවේ ද අනුකරණය පිළිබඳ සඳහන් වේ.
(4) ඇරිස්ටෝටල් අනුකරණය පැහැදිලි ව විග්‍රහ කොට ඇත.
(5) අනුකරණය මිනිස් ස්වභාවයේ මූලික ලක්ෂණයකි. (......)

**33.** වේදිකා නාට්‍යයක ආනුෂංගික අංග පිළිබඳ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ආනුෂංගික අංග නාට්‍යයක ප්‍රේක්ෂාවට බලපෑමක් නැත.
(2) රංගාලෝකය මීට අයත් නොවේ.
(3) ආනුෂංගික අංග උපරිම වශයෙන් යෙදීමෙන් නාට්‍යයක් සාර්ථක වේ.
(4) පෙරදිග සංකල්පය අනුව ආහාර්ය අභිනයට අයත් වේ.
(5) අධ්‍යක්ෂවරයාගේ මැදිහත් වීම අවශ්‍ය නොවේ. (......)

**34.** වේදිකා පසුතල සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) කුවේණි නාට්‍යයේ පසුතල භාවිතා කරයි.
(2) නාට්‍යධර්මී ශෛලියේ දී පසුතල අවශ්‍ය නොවේ.
(3) ශේක්ස්පියරියානු නාට්‍යවල පසුතලය පිළිබඳ හැඟීමක් දීම සංවාද වලින් ඉටු වේ.
(4) රුකඩ ගෙදර නාට්‍යයේ කිසිදු පසුතලයක් නැත.
(5) ත්‍රිමාන පසුතල භාවිතයට ආවේ තත්ත්වානුරූපී මායාව නිරූපණයට ය. (......)

**35.** නාට්‍ය සංගීතය පිළිබඳ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) සංගීතය නොමැති වේදිකා නාට්‍යයක් නැත.
(2) සංගීතය ආහාර්ය අභිනයට පමණක් අයත් වේ.
(3) කුවේණි නාට්‍යය ශෝකී ස්වභාවයකින් යුතු හෙයින් සංගීතය භාවිත කිරීම උචිත නැත.
(4) ආනුෂංගික අංගයක් ලෙස නොසැලකේ.
(5) ඇරිස්ටෝටල් ශෝකජනක නාට්‍යයේ සංගීතයට ප්‍රමුඛත්වයක් දී නැත. (......)

- පහත දී ඇති වගුව ආශ්‍රයෙන් 36-40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - පූරක | F - මෙරොපී | K- මුවා |
| B - තරන්තලා | G - ස්වෝන් | L- මැකරූන් |
| C - හෝසන්නා | H - සුගති උයන | M- මග්දලේනා |
| D- ඩෙල්ෆි | I - තීබය | N- විනිශ්චයකරු |
| E - ග්ලෝබ් | J - පෝටර් | O- රෝස් |

**36.** මධ්‍යකාලීන ජන වන්දනා නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) AIE (2) BIO (3) CHM (4) DIO (5) LNO (......)

**37.** රූකඩ ගෙදර නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) BHN (2) BJL (3) BJN (4) DJO (5) EFO (......)

38. ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) DFI (2) DJL (3) EGN (4) EIJ (5) EKM (......)

**39.** කුවේණි නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) AMN (2) AKN (3) BJN (4) DKO (5) LPR (......)

**40.** එළිසබෙතීන වේදිකාව හා සම්බන්ධ වන්නේ,
(1) EGO (2) FGN (3) FHO (4) KLN (5) MNO (......)

★★

## II කොටස

**සැලකිය යුතුයි:**

★ එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

---

### A කොටස

**1.** (i) ඇරිස්ටෝටල් කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති පරිදි ඛේදනීය වීරයා සතු විය යුතු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.

(ii) ඊඩිපස් නාට්‍යයෙහි ඛේදනීය වීර චරිතය ආශ්‍රයෙන් එකී ගුණාංග **දෙකක්** පිළිබඳ විවරණයක් කරන්න.

(iii) ඊඩිපස් රජුගේ චරිතයෙහි ප්‍රබල හා දුබල ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 15)

**2.** (i) ග්‍රීක කොමඩි නාට්‍ය රචක ඇරිස්ටොෆානිස්ගේ නාට්‍ය **හතරක්** නම් කරන්න.

(ii) ඔහුගේ නාට්‍යයට ආවේණික ලක්ෂණ **දෙකක්** සඳහන්කර විස්තර කරන්න.

(iii) ග්‍රීක කොමඩි නාටකය පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 15)

**3.** (i) එළිසබෙතීන යුගයට අයත් වේදිකාවේ රංග අවකාශ **හතරක්** නම් කරන්න.

(ii) ඉහත (i) නම් කරන ලද රංග අවකාශ **දෙකක්** පිළිබඳ විස්තරයක් කරන්න.

(iii) ශේක්ස්පියර්ගේ නාට්‍යයක් නිදසුන් වශයෙන් ගෙන එළිසබෙතීන වේදිකාවේ කෙසේ රංගගත කරන්නට ඇද්දැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 15)

### B කොටස

**4.** (i) ජූලියස් සීසර් නාට්‍යයේ සීසර්ගේ අවමඟුලේ දේශන පැවැත් වූ චරිත නම් කරන්න.

(ii) එම අවමඟුල් දේශන දෙකෙහි අන්තර්ගතය සැකෙවින් දක්වන්න.

(iii) අවමඟුල් දේශනවලට සවන් දුන් මහජනයාගේ ප්‍රතිචාර පැහැදිලි කරමින් ඒ පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 15)

**5.** (i) යථාර්ථවාදී නාට්‍ය කලාවේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(ii) ඉහත (i) හි සඳහන් කළ ලක්‍ෂණ **දෙකක්** පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(iii) රෑකඩ ගෙදර හැර වෙනත් යථාර්ථවාදී නාට්‍යයක් ගැන සාකච්ඡාවක් කරන්න. (ලකුණු 15)

**6.** (i) රෑකඩ ගෙදර නාට්‍යයේ නෝරා සහ හෙල්ම 'ජීවිතය' පිළිබඳ දරණ ආකල්ප දෙක බැගින් සඳහන් කරන්න.

(ii) ඉහත (i) හි සඳහන් ආකල්ප එකිනෙකට පටහැනි වන ආකාරය නිදසුන් මඟින් පෙන්වා දෙන්න.

(iii) ඉහත (ii) හි සඳහන් කළ පටහැනි බව ගැටුමක් දක්වා නාට්‍යෝචිත ව වර්ධනය වන ආකාරය පහදන්න. (ලකුණු 15)

★★★

# (57) නාට්‍ය හා රංග කලාව (සිංහල)

## ප්‍රායෝගික පරීක්ෂණය

### ප්‍රායෝගික පරීක්ෂණය හැඳින්වීම

2019 වර්ෂයේ පටන් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිත අ.පො.ස. උ/පෙළ විභාගයේ නාට්‍ය හා රංග කලාව ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ මූලික තොරතුරු පහත පරිදි වේ.

මෙම පරීක්ෂණය ඇගයීම් හයකින් සමන්විත වේ. ඒවා මෙසේ ය.

- රූපණය සඳහා අනිවාර්ය ඇගැයීම් 3 කි. (A කොටස)
- රූපණය සඳහා ඇගැයීම් තුනක් අතරින් තෝරා ගත් එක් ඇගැයීමක්. (B කොටස)
- නාට්‍ය නිෂ්පාදනය ආශ්‍රිතව ඇගැයීම් තුනක් ඇසුරින් තෝරාගත් එක් ඇගැයීමක්. (C කොටස)
- ඉහත රූපණය හා නිෂ්පාදනය ආශ්‍රිත තෝරාගත් ඇගැයීම් දෙක ආශ්‍රිත වාචා පරීක්ෂණය. (D කොටස)

ඒ පිළිබඳ සවිස්තර සටහනක් පහතින් දැක්වේ.

| | ඇගැයීම | අනිවාර්ය/තේරීම් | කාලය වි. | උපරිම නිර්ණායක සංඛ්‍යාව | ලකුණු |
|---|---|---|---|---|---|
| A | පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කොටස් දෙකකි) | අනිවාර්ය | (03+03)=06 | 04 | 30 |
| | එසැණ නිරූපණය | අනිවාර්ය | 03 | 03 | 15 |
| | කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම | අනිවාර්ය | 05 | 03 | 15 |
| B | සංගීත ඛණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය | තේරීම් | 04 | 03 | 15 |
| | නාට්‍ය ගීතයක් ගායනයෙන් හා රංගනයෙන් ඉදිරිපත් කිරීම | තේරීම් | 03 | 03 | 15 |
| | ගැමි නාටක / ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය | තේරීම් | 05 | 03 | 15 |
| C | අංග රචන නිර්මාණ සැලසුම | තේරීම් | 60 | 03 | 15 |
| | වේෂ භූෂණ නිර්මාණ සැලසුම | තේරීම් | 60 | 03 | 15 |
| | පසුතල නිර්මාණ සැලසුම | තේරීම් | 60 | 03 | 15 |
| D | වාචා පරීක්ෂණය | අනිවාර්ය | 05 | | 10 |

- ඉහත ඇගයීම් අතුරින් ඇතැම් ඇගැයීම් මෙතෙක් පැවැති ප්‍රායෝගික පරීක්ෂණයේ ක්‍රියාකාරකම් ම වෙනත් ස්වරූපයකින් යළි ඉදිරිපත් කිරීමක් වන අතර සෙසු ඇගැයීම් අලුතෙන් හඳුන්වා දෙනු ලබන ඒවා වේ.

- මෙම ඇගයීම් සඳහා භාවිතා කරන සෑම නිර්ණායකයකට ම, ලකුණු 0ක අවම සාධන මට්ටමක සිට ලකුණු 5ක් ප්‍රදානය කෙරෙන උපරිම සාධන මට්ටමක් දක්වා වන ලකුණු පරිමාණයක් අනුව ලකුණු ප්‍රදානය කෙරේ.

- මෙම අපේක්ෂිත සාධන මට්ටම්, ප්‍රයෝගික පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ඇගැයීමට පමණක් නොව. පංති කාමර මට්ටමේ දී අයදුම්කරුවන් පුහුණු කිරීම සඳහා ද ගුරු භවතුන්ට ප්‍රමිතියක් මෙන්ම අයදුම්කරුවන්ට ස්වයං අධ්‍යයනය සඳහා ද මගපෙන්වීමක් වනු ඇත.

- යම් නිර්ණායකයකට අදාළව ලකුණු ප්‍රදානයේ දී, උපරිම සාධන මට්ටමේ සිට අවම සාධන මට්ටම දක්වා වන පොදු ප්‍රමිතීන් පහත දැක් වේ.

| ලකුණ | ප්‍රමිතිය | විස්තරය |
|---|---|---|
| 5 | විශිෂ්ටයි | ගුණාත්මක බවින් හා ශිල්පීය මට්ටමින් ඉතා විශිෂ්ට මට්ටමේ ඉදිරිපත් කිරීමකි. |
| 4 | ඉතා හොඳයි | ගුණාත්මක බවින් ඉහළ ඉදිරිපත් කිරීමකි. අවශ්‍ය වන්නේ යම් යම් සංවර්ධනයන් කිහිපයක් පමණි. |
| 3 | හොඳයි | මූලික ශිල්පීය අවශ්‍යතාවන් හා ප්‍රමිතීන් සපුරා ඇත. තව දුරටත් සංවර්ධනය කළ හැකි ශිල්පීය හා නිර්මාණාත්මක විභවයන් විශද කරවයි. |
| 2 | වැඩි දියුණු කළ යුතුයි | අපේක්ෂිත ප්‍රමිතියට ළඟා වී නැත. පුහුණුව අවශ්‍ය යි. සූදානම ප්‍රමාණවත් නැත. මූලික මට්ටමේ ඉදිරිපත් කිරීමක් පමණි.ගුණාත්මකව පෝෂණය වී නැත. |
| 1 | දුර්වලයි | දරුවාගේ සූදානම මඳ ය. ඇගයීම පිළිබඳ අවබෝධයක් නැත. විටෙක ඇගයීම් මණ්ඩලයේ ද සහායෙන් යම් ඉදිරිපත් කිරීම් සිදු කරයි. |
| 0 | ඉතා දුර්වලයි | කිසිදු ඉදිරිපත් කිරීමක් සිදු නොකරයි. ඇගයීමට කිසිදු සූදානමක් නැත. ඉදිරිපත් කිරීමක් කළ ද එය ඉතා දුර්වල ය. ඇගයීමට අදාළ නොවන්නකි. |

## (57) නාට්‍ය හා රංග කලාව (සිංහල) (ප්‍රායෝගික පරීක්ෂණය)

**A** කොටස - රූපණය / රඟපෑම (acting) ලකුණු - 60

| | | | |
|---|---|---|---|
| A1 ඇගැයීම | පෙළ ආශ්‍රිත භාෂණය - (අනිවාර්ය)<br>**විෂය නිර්දේශගත නාට්‍ය පෙළවලින් මෙම ඇගැයීම සඳහා භාවිතා කිරීමට යෝග්‍ය කොටස් සහ මෙම ප්‍රායෝගික ඇගැයීම වෙනුවෙන් ලබා දී ඇති පෙළ කොටස් අතරින් අපේක්ෂයා තෝරාගෙන පුහුණු වී පැමිණි කොටසක් රංගනයෙන් ද ඇගැයීම් මණ්ඩලය විසින් ලබා දෙන පෙළ කොටසක් පාඨනයෙන් ද ඉදිරිපත් කළ යුතු ය.** | | |
| | A1- 1 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නිර්දේශිත පෙළ කොටස් ඇසුරින් විභාග අපේක්ෂකයා විසින් තම අභිමතය පරිදි පුහුණු වී පැමිණි ඒකල භාෂණය රඟ දැක්වීම. **(කාලය විනාඩි 02-03) (ලකුණු 20)**<br><br>A1- 2 පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන පෙළ කොටසක් උසුරුවීම (recitation) **(කාලය විනාඩි 02-03) (ලකුණු 10)** | **ලකුණු** 30 | **ඇගැයීමේ නිර්ණායක**<br>A1- 1 ඇගැයීම<br>1. කටහඬ නිපුණතාව<br>2. පෙළ ස්මරණය<br>3. චරිත නිරූපණය<br>4. ප්‍රේක්ෂක සහසම්බන්ධය<br>A1- 2 ඇගැයීම<br>1. කටහඬ නිපුණතාව<br>2. භාවාත්මක නිරූපණය |
| A2 ඇගැයීම | එසැණ නිරූපණය - (අනිවාර්ය)<br>**තෝරාගන්නා සිදුවීමක් ඇසුරින් නාට්‍යමය අවස්ථාවක් විනාඩි 02ත් 04ත් අතර කාලයක් තුළ එසැණින් නිරූපණය කර පෙන්වීම.** | | |
| | අපේක්ෂකයා විසින් තෝරා ගනු ලබන මාතෘකාවක් ඇසුරින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කිරීම.<br>අපේක්ෂකයා විසින් නිරූපණය කළ යුත්තේ එක් චරිතයක් පමණි.<br>**(කාලය විනාඩි 02-03)** | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක** 03<br>1. කටහඬ නිපුනතාව<br>2. නාට්‍යෝචිතව අවස්ථාව ගොඩනැංවීම<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය |
| A3 ඇගැයීම | කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම - (අනිවාර්ය)<br>**තමන් කැමති ඕනෑම සමාජයීය, මානවීය සහ පාරිසරික සංසිද්ධියක් පාදක කරගෙන ගොඩ නංවන කතා පුවතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම ඉදිරිපත් කිරීම විනාඩි 03ත් 05ත් අතර කාලයකින් සමන්විත විය යුතු ය.** | | |
| | කතන්දර කීම. (Story Telling)<br>තමන් අභිමත සංසිද්ධියක් පාදක කරගෙන ගොඩනංවන කතා පුවතක් ඉදිරිපත් කිරීම.<br>ආනුෂංගික අංග භාවිතයට දිරිගන්වනු නොලැබේ.<br>**(කාලය විනාඩි 02-03)** | **ලකුණු** 15 | **ඇගැයීමේ නිර්ණායක**<br>1. කටහඬ නිපුනතාව<br>2. ඉදිරිපත් කිරීමේ නිපුණතාවය<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය |

**B කොටස - රූපණය / රඟපෑම (acting) ලකුණු - 15**

<table>
<tr><td rowspan="2">B1 ඇගැයීම</td><td colspan="3">සංගීතය ඛණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය (තේරීම්)<br>වාදනය වන සංගීත ඛණ්ඩයක් ආශ්‍රිත ව අපේක්ෂකයා විසින් ඉදිරිපත් කළ යුතු අවාචික නාට්‍යානුසාරී රංගනයකි. නූතන කාය-සංචලන රංග (Physical Theatre), නූතන නෘත්‍ය රංග (Dance Theatre) භාවිතයන් ද මෙහි ලා ඇසුරු කළ හැකි ය. නාටකීය අර්ථකථනයක් නිරූපණය වන ආකාරයට මෙම රංගනය ඉදිරිපත් කළ යුතු ය.</td></tr>
<tr><td>අදාල වර්ෂයේ සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණයට ලබා දී ඇති සංගීත ඛණ්ඩම මේ සඳහා භාවිතා කරන අතර ඒවායින් අපේක්ෂකයාට අභිමු ලෙස තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙන සංගීත ඛණ්ඩයක් ආශ්‍රිතව මෙම අවාචික රංගනය සිදු කළ යුතු ය.<br><br>(කාලය උපරිම වි. 04)</td><td>ලකුණු 15</td><td>ඇගැයීමේ නිර්ණායක<br><br>1. සංගීත ඛණ්ඩයේ සුවිශේෂ ආකෘතික ලක්ෂණ හඳුනා ගැනීම හා අර්ථකථනය<br>2. මනෝභාවික අන්තර්ගතය<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය</td></tr>
<tr><td rowspan="2">B2 ඇගැයීම</td><td colspan="3">නාට්‍ය ගීතයක් ගායනයෙන් සහ රංගනයෙන් ඉදිරිපත් කිරීම - (තේරීම්)<br>අයදුම්කරුට කැමති නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ හැකි ය.</td></tr>
<tr><td>නාඩගම් සම්ප්‍රදායෙහි පටන් නූතන යුගය දක්වා වන ඕනෑ ම නාට්‍ය සම්ප්‍රදායකින්/ ශෛලියකින්/ නාට්‍යයකින් තෝරාගත් ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ යුතු ය. මෙම ගීතය මුල් නාට්‍යය තුළ චරිතයක මුවින් ගායනා කෙරෙන ගීතයක් විය යුතු අතර පසුබිම් ගායනයක් නොවිය යුතුය.<br><br>(කාලය උපරිම වි. 03)</td><td>ලකුණු 15</td><td>ඇගැයීමේ නිර්ණායක<br><br>1. සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය<br>2. මනෝභාවික අන්තර්ගතය<br>3. ශාරීරික ප්‍රකාශනය</td></tr>
<tr><td rowspan="2">B3 ඇගැයීම</td><td colspan="3">ගැමි නාටක / ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය -(තේරීම්)<br>දේශීය ගැමි නාටකයට අදාල නාට්‍යමය අවස්ථාවක් ආශ්‍රිතව කේවල වශයෙන් ඉදිරිපත් කළ හැකි චරිත නිරූපණයක් සිදු කළ යුතු ය. මෙම ඉදිරිපත් කිරීම විනාඩි 03ත් 05ත් අතර කාලයකින් සමන්විත විය යුතු ය.</td></tr>
<tr><td>අයදුම්කරු විසින් අ.පො.ස. උ/පෙළ නාට්‍ය හා රංග කලා විෂය නිර්දේශයට අදාලව දේශීය ශාන්තිකර්මවල ඇති අතුරු රංග අවස්ථා ආශ්‍රය කරගෙන හෝ සොකරි, කෝලම් ආශ්‍රය කරගෙන චරිත නිරූපණයක් කිරීම අපේක්ෂා කෙරේ.<br><br>ඉහත නිරූපණයන්හි දී අදාළ කවි ගායනා මෙන්ම සංවාද සහිතව ද චරිත නිරූපණය සිදු කිරීම අපේක්ෂිතය.<br>(කාලය වි. 03-05)</td><td>ලකුණු 15</td><td>ඇගැයීමේ නිර්ණායක<br><br>1. චරිතයට අදාළ සංවාද හා ගායනා ආශ්‍රිත කටහඬ නිපුණතාව<br>2. චරිතයට අනුකූල වීම<br>3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය</td></tr>
</table>

**C** කොටස නාට්‍ය නිෂ්පාදනය සහ ආනුෂංගික කලා පිළිබඳ ඇගයීම්     ලකුණු- 15

| | | | |
|---|---|---|---|
| **C 1 ඇගැයීම** | **අංග රචන නිර්මාණ සැලසුම/ අංගරචනය (Make Up Design) (තේරීම්)** | | |
| | විෂය නිර්දේශයට ඇතුළත් පෙළ අතරින් අහඹු ලෙස තෝරා ගන්නා කොටසක චරිතයට අදාළ අංග රචනය පිළිබඳ පිරිසැලසුමක් (design) සැකසීම අපේක්ෂා කෙරේ.<br><br>(**කාලය උපරිම වි 60**) | **ලකුණු 15** | **ඇගැයීමේ නිර්ණායක**<br>1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම<br>2. මුහුණේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම<br>3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය |
| **C 2 ඇගැයීම** | **වේශභූෂණ නිර්මාණ සැලසුම (Costume Design) (තේරීම්)** | | |
| | විෂය නිර්දේශයට ඇතුළත් පෙළ අතරින් අහඹු ලෙස තෝරා ගන්නා කොටසක චරිතයට අදාළ රංග වස්ත්‍ර නිර්මාණය පිළිබඳ පිරිසැලසුමක් (design) සැකසීම අපේක්ෂා කෙරේ.<br><br>(**කාලය උපරිම වි 60**) | **ලකුණු 15** | **ඇගැයීමේ නිර්ණායක**<br>1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම<br>2. සිරුරේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම<br>3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය |
| **C 3 ඇගැයීම** | **පසුතල නිර්මාණ සැලසුම (Set Design) - (තේරීම්) පසුතලය/ පසුතල සැකැස්ම** | | |
| | විෂය නිර්දේශයට ඇතුළත් පෙළ අතරින් මෙම ඇගැයීම සඳහා භාවිතා කිරීමට යෝග්‍ය නාට්‍ය පෙළකින් අහඹු ලෙස තෝරාගන්නා කොටසක චරිතයට අදාළ ජවනිකාවේ පසුතලය පිළිබඳ පිරිසැලසුමක් (design) සැකසීම අපේක්ෂා කෙරේ.<br><br>(**කාලය උපරිම වි 60**) | **ලකුණු 15** | **ඇගැයීමේ නිර්ණායක**<br>1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම<br>2. රංග අවකාශය පිළිබඳ අවබෝධය සහ ජවනිකාවට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම<br>3.නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය |

## C කොටස

මෙම කොටස විභාග අපේක්ෂකයා ආනුෂංගික විෂය ක්ෂේත්‍ර පිළිබඳ ව දක්වන නිපුණතා ඇගයීමට යොදා ගැනීමට අපේක්ෂිතය. මෙහි දී මූලික වශයෙන්, 1. අංග රචනය 2. රංග පසුතල 3. රංග වස්ත්‍ර යන ක්ෂේත්‍ර ආවරණය වේ.

විභාග අපේක්ෂකයා අ.පො.ස. උ.පෙළ නාට්‍ය හා රංග කලා විෂයට **නිර්දිෂ්ට නාට්‍ය පෙළ** ඇසුරෙන් මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීම අපේක්ෂා කෙරේ. ඉහත ක්ෂේත්‍ර ත්‍රිත්වයෙන් විභාග අපේක්ෂකයා තම අභිමතය පරිදි තෝරා ගත් එක් ක්ෂේත්‍රයකින් පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.
ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 60ක කාලයක් හිමි වේ.

- ★ නිර්දිෂ්ට පෙළ ඇසුරෙන් අපේක්ෂකයා අභිමු ලෙස තෝරා ගන්නා චරිතයට අදාළ අංග රචනය, රංග වස්ත්‍රය හෝ ඒ ආශ්‍රිත ජවනිකාවට අදාළ පසුතල සැකැස්ම සැලසුම් කර ඉදිරිපත් කළ යුතුය.
- ★ මේ සඳහා අවශ්‍ය පැන්සල්, පාට පැන්සල් හෝ පැස්ටල් කූරු අපේක්ෂකයා විසින් සපයා ගත යුතුය.
- ★ සැලසුම ඇඳීම සඳහා අවශ්‍ය කඩදාසි විභාග දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ. එම කඩදාසි මේ සමග අමුණා ඇති නිදර්ශක මුහුණු/ ශරීර/ වේදිකා සැලසුම සහිතව A3 ප්‍රමාණයෙන් ලබා දේ. පසුතල නිර්මාණ සැලසුමේ දී වේදිකාවේ ගුවනින් දිස්වන ආකාරයෙන් මෙන්ම (Birds eye view) ප්‍රේක්ෂකාගාර දෘෂ්ටි කෝණයෙන් ද සැලසුම ඉදිරිපත් කල යුතු ය.

**C කොටසෙහි පරීක්ෂණය පැවැත්වෙන ආකාරය**

- ★ තමන්ට නියමිත ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන දිනයේ පෙ:ව 8.30 වන විට එදිනට විභාගයට පෙනී සිටීමට නියමිත අපේක්ෂකයින් පරීක්ෂණ මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.
- ★ පෙ.ව 8.30 - 9.00 අතර ප්‍රධාන පරීක්ෂක විසින් අවශ්‍ය උපදෙස් අපේක්ෂකයන්ට ලබා දෙන අතර පෙ.ව 9.00 ට එදිනට අදාළ අපේක්ෂකයන් සඳහා ප්‍රයෝගික පරීක්ෂණ ඇරඹේ.
- ★ විනාඩි 60 ක කාලයක් ලැබෙන 'C' කොටසට අදාළ පරීක්ෂණය් පෙ.ව 10.00 ට සමාප්ත වේ.
- ★ පෙ.ව 10.30 ට නැවත 'A' හා 'B' කොටස්වලට අදාළ පරීක්ෂණය ආරම්භ කෙරේ.
- ★ 'A' හා 'B' කොටස අවසන් කරන අපේක්ෂකයන් 'D' කොටස හෙවත් වාචික පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

**D කොටස - අපේක්ෂකයා ඉදිරිපත් වූ ඉහත හා කොටස්වලට අදාල වාච්‍ය පරීක්ෂණය - ලකුණු 10**

| | | | |
|---|---|---|---|
| **ඇගැයීම 01** | අපේක්ෂකයා විසින් ඉදිරිපත් වූ 'B' හා 'C' කොටස් වලට අදාළව මෙම වාචික පරීක්ෂණය සිදු කෙරෙයි.<br><br>වාචික පරීක්ෂණය සඳහා ලකුණු 10ක් හිමි වේ. | **ලකුණු - 10** | **ඇගැයීමේ නිර්ණායක**<br><br>1. B කොටසෙන් අයදුම්කරු ඉදිරිපත් කළ ක්‍රියාකාරකම පාදකව ඊට කොටසට අදාළ ඇගැයීම් නිර්ණායකවලට අනුකූලව පරීක්ෂක මණ්ඩලය විසින් අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීම. **(ල.05)**<br><br>2. C කොටසෙන් අයදුම්කරු ඉදිරිපත් කළ ක්‍රියාකාරකම පාදකව ඊට කොටසට අදාළ ඇගැයීම් නිර්ණායකවලට අනුකූලව පරීක්ෂක මණ්ඩලය විසින් අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීම. **(ල.05)** |

## A 1-1 ඇගැයීම: පෙළ ආශ්‍රිත භාෂණ රංගනය- අයදුම්කරු පුහුණු වී පැමිණෙන පෙළ කොටස

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| **කටහඬ නිපුණතාව** | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂේපණයක් සහිතයි. හඬ පෞරුෂය අදාළ පෙළ භාෂණය සමග මැනවින් ගලපා ගනියි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැළකිළිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවිධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/ වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ. |
| **පෙළ ස්මරණය** | අනායාසයෙන් සිදු කරන පෙළ ස්මරණය බාහිරව නොපෙනෙන පරිදි රංග කාර්යය සඳහා යොදා ගනියි. තෝරාගත් පෙළ කොටසට අනුකූලව රංග විධාන ආදියෙහි වැදගත්කම පිළිබඳ මනා අවබෝධයකින් රූපණ කාර්යයේ නිරත වේ. | මනා ස්මරණයෙන් යුතුව අඛණ්ඩව පෙළ ආශ්‍රිත රංගනයේ නිරත වෙයි. මනා පුහුණුවක් ප්‍රකට කරයි. පෙළ කොටසෙහි අර්ථය මතුවන පරිදි පෙළ ස්මරණය කරයි. | අඛණ්ඩ භාෂණයක නිරත වුවද පෙළ ස්මරණය සඳහා උත්සහ ගැනීම ප්‍රකට වේ. මනා පුහුණුවක් පෙන්නුම් කරයි. වචන කෙරෙහි අවධානය යොමු කළ ද නිවැරදි අරුත් සහ රංග විධාන පිළිබඳ වැටහීමක් නැත. | ස්මරණය කරන පෙළ කොටස අඛන්ඩ ගලා යෑමක් පෙන්නුම් කළ ද වරින් වර අමතක වීම් සිදු වේ. යම් පුහුණුවක් පෙන්නුම් කරයි. පෙළ ස්මරණය සඳහා උත්සහ ගැනීමට කාලය මිඩංගු කරයි. | තෝරා ගෙන ඇති පෙළ කොටස ඉතා අපහසුවෙන් ස්මරණය කිරීමට උත්සාහ කරයි. අල්ප පුහුණුවක් ඇති බව ප්‍රකට වේ. ස්මරණය කරන පෙළ කොටස අඛණ්ඩ ගලා යාමකින් තොරය. | ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ තෝරාගත් පෙළ කොටස ස්මරණය කිරීමට අපොහොසත් ය. ස්මරණය සඳහා කිසිදු උත්සහයක් නැත. |
| **චරිත නිරූපණය** | සමස්ත ඉදිරිපත් කිරීම තුළ නළුවා/ නිළිය චරිතය මුළුමණින්ම ස්වීකරණය කරගෙන, ඊට අනන්‍ය ව ඇත. පෙළ මගින් ප්‍රදානය කර ඇති දෙන ලද තත්වයන් පිළිබඳ මනා අවබෝධයකින් රංගනයේ යෙදෙයි. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීරණතාව ඉස්මතු වන ආකාරයෙන් සහ පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ආකාරයේ ස්වාධීන ගොඩනැංවීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් චරිතය ස්වීකරණය කරගෙන තිබේ. එය මැනැවින් නිරූපණය වේ. චරිතය පිළිබඳ විශ්වසනීය ඉදිරිපත් කිරීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳී සිටීමට උත්සාහ දරයි. ඉදිරිපත් කිරීම තුළ චරිතය පිළිබඳ යම් විශ්වසනීයත්වයක් ගොඩ නැගේ. | ඉදිරිපත් කිරීම තුළ චරිත ස්වභාවය පිළිබිඹු කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් එය ස්ථාවර නැත. චරිතයේ අනන්‍යතාව පැහැදිළි ව විශද නොවේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද, චරිතය හා අවස්ථාව පිළිබඳ කිසිදු වැටහීමක් නැත. |

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| **ප්‍රේක්ෂක සහසම්බන්ධය** | ආකර්ශනීය මෙන්ම අඛණ්ඩ ප්‍රේක්ෂක සහසම්බන්ධයක් ගොඩනගා ගැනීමට සමත්ය. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරමින් අවකාශය හසුරුවා ගන්නා අතර මනා පුහුණුවීම් මගින් සුසර කරගත් ශාරීරික චලන හා මනෝභාවයන් ප්‍රකට කරයි. | අඛණ්ඩ ප්‍රේක්ෂක සහ සහසම්බන්ධයක් ගොඩනගා ගැනීමට සමත් ය. අවකාශය මෙන්ම ශාරීරික චලන අර්ථාන්විත ව හසුරුවා ගනියි. | ප්‍රේක්ෂක අවධානය රඳවා ගැනීමට සමත් වුව ද එය අඛණ්ඩව පවත්වා ගැනීමට අපොහොසත්ය. අවකාශය භාවිතය සහ ශාරීරික චලන අවබෝධයකින් යුතුව රංග කාර්ය සඳහා යොදා ගනියි. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ ප්‍රේක්ෂක සහසම්බන්ධයක් ගොඩ නැංවුව ද එය ඉක්මනින් බිඳ ගනියි. තම රූපණය සඳහා අවකාශය ගැලපෙන පරිදි හසුරුවා ගැනීමට උත්සුක වෙයි.ශාරීරික ප්‍රකාශනය ද තම රූපණයට ගැලපෙන ලෙස යොදා ගැනීමට යත්න දරයි. | ඉදිරිපත් කිරීමෙහි දී ප්‍රේක්ෂක සහසම්බන්ධයක් ගොඩ නැංවීමට උත්සහ දරයි. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. සබකෝලය හෝ පුහුණුව මද කම වඩාත් ප්‍රකට කරයි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද එහි කිසිදු සහසම්බන්ධයක් ප්‍රකට නොකරයි. |

## A 1-2 ඇගැයීම: පෙළ ආශ්‍රිත භාෂණ රංගනය- පරීක්ෂක මණ්ඩලය ලබා දෙන පෙළ කොටස පාඨනය කිරීම

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| **කටහඬ, නිපුණතාව** | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂේපණයක් සහිතයි. හඬ පෞරුෂය අදාළ පෙළ භාෂණය සමග මැනවින් ගළපා ගනියි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත යි. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැළකිලිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/ වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ පාඨනය කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ. |
| **භාවාත්මක නිරූපණය** | හඬ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් චරිතයේ සංකීර්ණ මනෝභාවයන් නිරූපණයේ දී විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු කරයි. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බෙහෙවින් අනුකූල වේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ඉදිරිපත් කිරීමෙහි යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. | පාඨනය කිරීමක් සිදු නො කරයි/ පාඨනය කළ ද එහි මනෝභාවික අන්තර්ගතයක් නැත. |

## A 2 ඇගැයීම: එ සැණ නිරූපණය

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ට යි | 4 - ඉතා හොඳ යි | 3 - හොඳ යි | 2 - වැඩි දියුණු කළ යුතු යි | 1- දුර්වල යි | 0 - ඉතා දුර්වල යි |
|---|---|---|---|---|---|---|
| කටහඬ නිපුණතාවය | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂේපණයක් සහිතයි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත යි.හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැළකිළිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සුදානමක් නැත /ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ. |
| නාටෝචිතව අවස්ථාව ගොඩ නැංවීම | නිර්මාණශීලී පරිකල්පනයකින් යුතු ව දී ඇති මාතෘකාව විනිවිද ගිය, අපූර්වත්වයකින් යුතු ක්‍රියා විකාශනයකින් සමන්විත නාට්‍යමය කූට ප්‍රාප්තියක් කරා යොමු කෙරේ. | ආරම්භයේ පටන් ක්‍රමානුකූල ව නාට්‍යමය කූටප්‍රාප්තියක් කරා ඉලක්කගත වූ ක්‍රියා විකාශනයකින් යුක්ත වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ නාටෝචිත අවස්ථා ගොඩ නැංවේ. එය අවසාන මාතෘකාවට/තේමාවට අනුකූල වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ යම් නාටෝචිත අවස්ථාවක් ගොඩ නැගුණ ද එය සංවර්ධනය වී නැත. | යම් කිසි ක්‍රියාවක් (සිද්ධියක් ඉදිරිපත් වේ) නාට්‍යමය අවස්ථාවක් නැත. එක්කෝ සිදු වීම අතර මගින් අවසන් වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නොකරයි. |
| ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. රංග කාර්යය සිදු වන සීමිත අවකාශයේ භාවිතය හා ශාරීරික ප්‍රකාශනයන් අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. | චරිත/ සිද්ධිවල අවශ්‍යතාවට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ හා අවකාශ භාවිතය පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. රංගන අවකාශයේ සීමාසහිත බව නොතකා මැනැවින් තම ඉදිරිපත් කිරීම සිදු කරයි. | තෝරාගන්නා ශාරීරික චලනයන්, හා අවකාශ භාවිතයන් බොහෝ විට චරිතයන්ට හා අවස්ථාවන්ට ගැලපෙන, ඒවා විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. රංගන අවකාශය පිළිබඳ වැටහීමකින් යුතුව ඉදිරිපත් කිරීම සිදු කරයි. | ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතයන් යම් පමණකින් චරිත හා අවස්ථාවන් ඉස්මතු කරවන සුලු වුවත් ඒවා මැනැවින් නිරූපණය නොකෙරේ. ලැබී ඇති සීමිත රංගන අවකාශය පිළිබඳ වැටහීම හා අවධානය ප්‍රමාණවත් නැත. | යම් ශාරීරික ප්‍රකාශනයක් හා අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. නොගැළපෙන හා අනවබෝධයෙන් යුතු ඉදිරිපත් කිරීමකි. ලබා දී ඇති රංගන අවකාශය පිළිබඳ කිසිදු සැලකීමක් හෝ අවබෝධයක් නැත. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද නො ගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයකි. |

# A 3 ඇගැයීම: කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ටයි | 4 - ඉතා හොඳයි | 3 - හොඳයි | 2 - වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0 - ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| කටහඬ, නිපුණතාවය | ප්‍රශස්ත හඬ ප්‍රක්ෂේප්‍ණයක් සහිතයි. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. උචිත සාත්වික අභිනයන් භාවිතා කරයි. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. කතා පුවතේ අවශ්‍යතාවයන්ට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. උචිත සාත්වික අභිනයන් භාවිතා කරයි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැළකිළිමත් වෙමින් කටහඬ පාලනය කරයි. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. කතා පුවතේ අවශ්‍යතාවයන්ට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි.එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. කතා පුවතේ අවශ්‍යතාවයන්ට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/ මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ |
| ඉදිරිපත් කිරීමේ නිපුණතාවය | නිර්මාණශීලී පරිකල්පනයකින් යුතු ව තම කතා පුවත විනිවිද දුටු සහ අපූර්වත්වයකින් යුතු ක්‍රියා විකාශනයකින් සමන්විත නාට්‍යමය කූට ප්‍රාප්තියක් කරා යොමු කෙරේ. | ආරම්භයේ පටන් ක්‍රමානුකූල ව නාට්‍යමය කූටප්‍රාප්තියක් කරා ඉලක්කගත වූ ක්‍රියා විකාශනයකින් යුක්ත වේ. | ඉදිරිපත් කරන කතා පුවත තුළ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැංවේ. එය අවසාන මාතෘකාවට/තේමාවට අනුකූල වේ. | ඉදිරිපත් කරන කතා පුවත තුළ යම් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගුණ ද එය සංවර්ධනය වී නැත. | යම් කිසි ක්‍රියාවක් (සිද්ධියක් ඉදිරිපත් වේ) නාට්‍යමය අවස්ථාවක් නැත. එක්කෝ සිදු වීම අතර මගින් අවසන් වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. |
| ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. රංග කාර්යය සිදු වන සීමිත අවකාශයේ භාවිතය හා ශාරීරික ප්‍රකාශනයන් අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. | චරිත/ සිද්ධිවල අවශ්‍යතාවට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ හා අවකාශ භාවිතය පිළිබඳ දැනුවත් තෝරා ගැනීම් සහිත ය. රංගන අවකාශයේ සීමාසහිත බව නොතකා මැනැවින් තම ඉදිරිපත් කිරීම සිදු කරයි. | තේරාගන්නා ශාරීරික චලනයන්, හා අවකාශ භාවිතයන් බොහෝ විට චරිතයන්ට හා අවස්ථාවන්ට ගැලපෙන, ඒවා විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. රංගන අවකාශය පිළිබඳ වැටහීමකින් යුතුව ඉදිරිපත් කිරීම සිදු කරයි. | ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතයන් යම් පමණකින් චරිත හා අවස්ථාවන් ඉස්මතු කරවන සුළු වුවත් ඒවා මැනැවින් නිරූපණය නොකෙරේ. ලැබී ඇති සීමිත රංගන අවකාශය පිළිබඳ වැටහීම හා අවධානය ප්‍රමාණවත් නැත. | යම් ශාරීරික ප්‍රකාශනයක් හා අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. නොගැළපෙන හා අනවබෝධයෙන් යුතු ඉදිරිපත් කිරීමකි. ලබා දී ඇති රංගන අවකාශය පිළිබඳ කිසිදු සැලකීමක් හෝ අවබෝධයක් නැත. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද නො ගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයකි. |

## B 1 ඇගැයීම: සංගීත ඛණ්ඩයකට අනුව ඉදිරිපත් කරන නිර්මාණාත්මක රංගනය

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනා ගැනීම හා අර්ථකථනය** | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. එම නාදමය සුවිශේෂතාවන් මගින් ප්‍රමුඛව ගම්‍ය කරවන අරුත් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නංවයි. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. ඊට නාටකීය බවකින් යුතු අවස්ථාවක්/සිදුවීමක් ආශ්‍රිත අර්ථයක් සම්පාදනය කරයි. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. ඊට අර්ථයක් සම්පාදනය කරයි. | සංගීත ඛණ්ඩයේ යම් යම් ආකෘතික ලක්ෂණ හඳුනාගෙන ඇත. එම ආකෘතික ලක්ෂණවලට යම් අර්ථකථනයක් සපයන බව පෙනේ. එහෙත් එය තවත් සංවර්ධනය විය යුතු ය. එක්කෝ අර්ථකථනය ප්‍රමාණවත් නැත, නැතහොත් අර්ථකථනය සංගීත ඛණ්ඩයේ ලක්ෂණ හා අනුගත නැත. | සංගීත ඛණ්ඩයේ යම් යම් ආකෘතික ලක්ෂණ හඳුනාගත් බව පෙනේ. එහෙත් යම් ආකාරයක අර්ථයක් සැපයීමට උත්සාහ කරන බවක් නොපෙනේ. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ නැතහොත් ඉදිරිපත් කිරීමක් කළ ද, සංගීත ඛණ්ඩය හඳුනා ගෙන නැත. කිසිදු අර්ථයක් ප්‍රකාශ කිරීමට සමත් නො වේ. |
| **මනෝභාවික අන්තර්ගතය** | සියුම් මනෝභාවික සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ සංගීත ඛණ්ඩය මගින් ප්‍රමුඛ ලෙස ගම්‍ය කරවන අර්ථයන් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නැගීම ආශ්‍රිතව සංකීර්ණ මනෝභාවයන්, විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනවින් පිළිබිඹු වේ. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් සහ ගොඩනගන අවස්ථාවේ නාටකීය ස්වභාවය හඳුනාගෙන ඒ පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් අනුකූල වේ. | ඉදිරිපත් කිරීම තුළ මනෝභාවික අන්තර්ගතයක් ඇත. සංගීත ඛණ්ඩයේ මනෝභාවික ලක්ෂණ හා යම් පමණකින් අනුගත ය. | ඉදිරිපත් කිරීම තුළ යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය එක්කෝ සංගීත ඛණ්ඩය හා ඍජු ව අනුගත නැත. නැතහොත් මැනැවින් විශද නො වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කිරීමක් සිදු කළ ද එහි කිසිදු භාවාත්මක අන්තර්ගතයක් නැත. සංගීත ඛණ්ඩයට කිසිදු භාවමය සම්බන්ධයක් නැත. |
| **ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. අවස්ථාවේ නාටකීය බව ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන්, සමග අත්‍යන්තයෙන් බැඳුණු, අපූර්ව ශාරීරික ප්‍රකාශනයකි. අවකාශය අර්ථවත් ව, යෝග්‍ය පරිදි භාවිත කරමින් ප්‍රබල දෘශ්‍ය රූප සංරචනයක් නිර්මාණය කෙරේ. | සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන්, සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. අවස්ථාවේ නාටකීය ස්වභාවය ඉස්මතු කරවන අපූර්ව දෘශ්‍ය රූප සංරචනයන් ඇතුළත් ශාරීරික ප්‍රකාශනයන් සහිතය. . | ශාරීරික ප්‍රකාශනයන් සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්ට, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන්ට සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් අනුකූල වේ. අවකාශය යෝග්‍ය ලෙස භාවිත කරමින් නිර්මාණාත්මක දෘශ්‍ය රූප සංරචනයක් ඉදිරිපත් කරයි. | ඉදිරිපත් කරන ශාරීරික ප්‍රකාශනයන් යම් පමණකින් සංගීත ඛණ්ඩයේ ආකෘතික ලක්ෂණ පිළිබිඹු කරවන සුලු ය. අවකාශ භාවිතය මැනැවින් සිදු නොවේ. | යම් ශාරීරික ප්‍රකාශනයක් ඇතත් සංගීත ඛණ්ඩයට නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත. |

## B 2 ඇගැයීම: නාට්‍ය ගීතයක් ගායනයෙන් හා රංගනයෙන් ඉදිරිපත් කිරීම

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ටයි | 4 - ඉතා හොඳයි | 3 - හොඳයි | 2 - වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0 - ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණ** | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි තනුව, රිද්මය, ලය, පද මාලාව හා චරිතයට සහ අවස්ථාවට උචිත ස්වර පරාසයත්, හඬ පාලනයත් නිරායාසකර ලෙස මැනැවින් පවත්වා ගනී. ඇතැම් විට මුල් ගීතයට හානිකර නොවන සියුම් නිර්මාණාත්මක එකතු කිරීම් පවා තනුව හා තාලය ආශ්‍රිත ව සිදු කරයි. | ගායනයෙහි තනුව, රිද්මය ලය හා පද මාලාව මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගන්නා අතර ම, රංගනයේ හා ශාරීරික චලනයන් ගේ ප්‍රකාශනාත්මක ගුණය ඉස්මතු වන ආකාරයේ ස්වර පරාසයකින් ඉදිරිපත් කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයේ, අවස්ථාවේ මනෝගතියට උචිත තානීය විවිධත්වයකින් හා හඬ පාලනයකින් සමන්විත ය. | ගායනයෙහි තනුව, රිද්මය හා ලය මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගනී. පද මාලාව නිවැරදි ය. ශ්‍රවණය කළ හැකි අතර මනෝභාවික හා ශාරීරික ප්‍රකාශනාත්මක ගුණයන් ඉස්මතුවන සුළු ය. | ගායනයෙහි තනුව හා/හෝ තාලය මුල් ගිතයට අනුව යම් තරමකට පවත්වා ගනී. එහෙත් එය ස්ථාවර නැත. කඩින් කඩ බිඳ වැටෙනසුළු ය. විටින් විට අපස්වර ගැයේ. නැතහොත් රිද්මයෙන් පිට පනී. ඇතැම් විට වචන අමතක වී වැරදි වචන උච්චාරණය වේ. | ගායනය ඉදිරිපත් කළ ද ගීතයෙහි තනුව හෝ තාලය යන දෙකෙන් එකක් වැරදි ය. අපස්වර ස්ථාන බහුල වීම සහ ලය ඉතා මන්දගාමී හෝ අතිශය ශීඝ්‍ර හෝ බණ්ඩනය වනු පෙනේ. පදමාලාව මතක නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ගායනා කළ ද තනුව, හා තාලය සපුරා වැරදි ය. |
| **මනෝභාවික අන්තර්ගතය** | චරිතයේ සංකීර්ණ මනෝභාවයන්, විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයකින් යුතු ව නිරූපණය කෙරේ. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීරණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ආකාරයේ මනෝභාවික අන්තර්ගතයකින් යුක්ත ය. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බොහෙවින් අනුකූල වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ගායනයේ දී චරිතයේ ඡායාමාත්‍ර මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද එහි මනෝභාවික අන්තර්ගතයක් නැත. |
| **ශාරීරික ප්‍රකාශනය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. ගීතයේ රිද්මය හා ලය සමග අත්‍යන්තයෙන් බැඳුණ, නිරායාසකර ශාරීරික ප්‍රකාශනයකි. | චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිතයේ අවශ්‍යතාවට, නාට්‍යයේ ශෛලියට, ගීතයේ රිද්මයට හා ලයට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරා ගැනීම් සහිත ය. | අයදුම්කරු තෝරා ගන්නා ශාරීරික චලන බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන අතර, චරිතය, අවස්ථාව, නාට්‍යය හා ශෛලිය විසින් ඉල්වා සිටිනු ලබන චලන වේ. ගීතයේ රිද්මයට හා තාලයට අනුකූල ය. | අයදුම්කරු ඉදිරිපත් කරන ශාරීරික චලන යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. ඉදිරිපත් කළ ද ගීතයට නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත. |

## B 3 ඇගැයීම: ගැමි නාටක / ශාන්තිකර්ම ආශ්‍රිත චරිත නිරූපණය

| ඇගැයීම් නිර්ණායක | 5 - විශිෂ්ටයි | 4 - ඉතා හොඳයි | 3 - හොඳයි | 2 - වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0 - ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **චරිතයට අදාළ සංවාද හා ගායනා ආශ්‍රිත කටහඬ, නිපුණතාව** | ශෛලියට අදාලව විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් පොහොසත් වේ. අවස්ථානුකූල හඬ උස් පහත්වීම් සහිත ය. ගීතයක් වේ නම් තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. තනුව, රිද්මය, ලය, පද මාලාව හා චරිතයට සහ අවස්ථාවට උචිත ස්වර පරාසයත්, හඬ පාලනයත් නිරායාසකර ලෙස මැනැවින් පවත්වාගනී. ඇතැම් විට මුල් ගීතයට හානිකර නොවන සියුම් නිර්මාණාත්මක එකතු කිරීම් පවා ශෛලියට හානිකර නො වන පරිදි තනුව හා තාලය ආශ්‍රිත ව සිදු කරයි. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. ශෛලියට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. ගීතයක් වේ නම් ගායනයෙහි තනුව, රිද්මය, ලය හා පද මාලාව මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගන්නා අතර ම, රංගනයේ හා ශාරීරික චලනයන් ගේ ප්‍රකාශනාත්මක ගුණය ඉස්මතු වන ආකාරයේ ස්වර පරාසයකින් ඉදිරිපත් කරයි. | ශෛලියට අනුගත පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැලකිලිමත් වෙමින් ශෛලියට අනුකූලව කටහඬ හසුරුවයි. උචිත හඬ උස් පහත්වීම් සහිත ය. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවිධත්වය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිළි ව දක්නට ඇත. ගීතයක් වේ නම් ගායනයෙහි තනුව, රිද්මය හා ලය මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගනී. පද මාලාව නිවැරදි ය. ශ්‍රවණය කළ හැකි අතර මනෝභාවික හා ශාරීරික ප්‍රකාශනාත්මක ගුණයන් ඉස්මතුවන සුළු ය. | ශෛලියට අනුකූල ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. මනා හඬ ප්‍රක්ෂේපණයකට යත්න දරයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. ගීතයක් වේ නම් ගායනයෙහි දී තනුව හා තාලය මුල් ගීතයට අනුව යම් තරමකට පවත්වා ගනී. එහෙත් එය ස්ථාවර නැත. කඩින් කඩ බිඳ වැටෙන සුළු ය. විටින් විට අපස්වර ගැයේ. නැතහොත් රිද්මයෙන් පිට පනී. ඇතැම් විට වචන අමතක වී වැරදි වචන උච්චාරණය වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු වචන කියවීමකි. ශෛලියට අනුගත නැත. අනවශ්‍ය ලෙස වේගවත් ය/ නැතහොත් මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. ගීතයක් වේ නම් එහි තනුව හෝ තාලය යන දෙකෙන් එකක් වැරදි ය. අපස්වර ස්ථාන බහුල වීම සහ ලය ඉතා මන්දගාමී හෝ අතිශය ශීඝ්‍ර හෝ ඛණ්ඩනය වනු හෝ පෙනේ. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගැයීම සඳහා කිසිදු සූදානමක් නැත/ ඉදිරිපත් කිරීමක් කළ ද කිසිදු හඬ ප්‍රක්ෂේපණයක් නොවේ |
| **චරිතයට අනුකූල වීම** | අදාළ ශෛලියට අනුකූල පරිදි නළුවා/නිළිය චරිතයට මුළුමණින්ම ස්වීකරණය ඇත. අවස්ථාව පිළිබඳ මනා අවබෝධයකින් රංගනයේ යෙදෙයි. ශෛලියට හානි කර නො වන සහ අදාළ චරිත ස්වභාවයට හානි නොවන එහෙත් ස්වාධීන ගොඩනැංවීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් චරිතය ස්වීකරණය කරගෙන තිබේ. ශෛලියට අනුකූලව එය මැනැවින් නිරූපණය කරයි. | චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. ශෛලියට අනුකූලව චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. | ඉදිරිපත් කිරීම තුළ චරිත ස්වභාවය පිළිබිඹු කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් එය ස්ථාවර නැත. චරිතයේ අනන්‍යතාව පැහැදිළි ව විශද නො වේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද, චරිතය හා අවස්ථාව පිළිබඳ කිසිදු වැටහීමක් නැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ශාරීරික ප්‍රකාශනය සහ අවකාශ භාවිතය** | චරිතයට අවස්ථාවට හා ශෛලියට අත්‍යන්තයෙන්ම අනුකූල ලෙස ශාරීරික චලන සහ අවකාශය භාවිත කරන්නේ තම ඉදිරිපත් කිරීම පොහොසත් කිරීම පිළිබඳ මනා දැනුවත් භාවයක් හා විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරවමිනි. | චරිතය අවස්ථාව හා ශෛලිය සමග අත්‍යන්තයෙන් බැඳුණු චලන ඉදිරිපත් කරයි. ශෛලියට අනුකූල ලෙස අවකාශය සහ ශරීරය භාවිත කළ යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. | දරුවා තෝරාගන්නා ශාරීරික චලන හා අවකාශ භාවිතයන් බොහෝ විට ශෛලියට, චරිතයට හා අවස්ථාවට අනුකූල චලන වේ. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතය, යම් පමණකින් ශෛලිය, චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය අදාල ශෛලිය සහ චරිතය පිළිබිඹු කිරීමට ප්‍රමාණවත් නැත. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද ශෛලියට නො ගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයකි. |

## C 1 ඇගැයීම: අංග රචන නිර්මාණ සැලසුම

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම** | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයෙන් යුතු අතර ඒවා එකිනෙකට සංගත වන අයුරින් චරිතයට අදාල නිශ්චිත කාල-අවකාශ සබඳතාව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ' | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වුව ද ඒවායෙහි එකිනෙකෙහි පරස්පරයන් ද නිරීක්ෂණය වේ. | සැලසුමක් ඉදිරිපත් කෙරුණ ද ශෛලිය, යුගය හා නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබොධයකින් තොර යම් උත්සාහයක් බව පෙනේ. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. නැතහොත් ඉදිරිපත් කළ සැලසුම යෝජිත චරිතයට කිසිසේත්ම අනුකූල නැත. |
| **මුහුණේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම** | මුහුණේ කොටස් හා චරිතයේ ස්වභාවය පිළිබඳ විශිෂ්ට අවබෝධයකින් යුතු ව සැලසුම් කර ඇත. වයස හා සබැඳි සුවිශේෂතා චරිතයට ගැළපෙන ලෙස සැකසී ඇත. | මුහුණේ කොටස් මෙන්ම චරිතයේ මනෝභාවික ස්වරූපය පිළිබඳ මනා අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | මුහුණේ කොටස් මෙන්ම චරිතයේ මනෝභාවික ස්වරූපය පිළිබඳ අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | මුහුණේ කොටස් පිළිබඳ යම් අවබෝධයකින් සැලසුම ඉදිරිපත් කරයි. චරිතයට අදාළ සුවිශේෂතා ඉස්මතු කිරීමට උත්සාහයක් දරා ඇත. | මුහුණේ කොටස් පිළිබඳ නිසි අවබෝධයක් ප්‍රකට නොකරයි. චරිතයේ සුවිශේෂතා පිළිබඳ අවබෝධය ඉතා අල්ප ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. මුහුණේ කොටස් පිළිබඳ අවබෝධයකින් තොරය. යෝජිත චරිතයට කිසිදු අනුකූලතාවක් නැත |
| **නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය** | දෙන ලද කාලය ඇතුළත සැලසුම් මූලාශ්‍ර (වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර) ඇසුරෙන් චරිත ස්වභාවය මැනැවින් පළිබිඹු වන පරිදි සහ දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳව අවබෝධයෙන් යුතුව නිර්මාණාත්මකව නිර්මාණ සැලසුම කරයි | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර සහ දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය මැනැවින් ප්‍රකට වන පරිදි නිර්මාණ සැලසුම සිදු කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය ප්‍රකට කිරීමට උත්සාහ දරා ඇත. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයක් ප්‍රකට කරයි. එහෙත් ඒවා සංකලනයේ දී දක්නට ඇත්තේ දුර්වල සංගතියකි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර හසුරුවා ගැනීමට යම් ප්‍රයත්නයක් ඇතත් ඒවායෙහි සංකලනය අතිශයින් දුර්වල ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කර නැත. |

## C 2 ඇගැයීම: රංග වස්ත්‍ර නිර්මාණ සැලසුම

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම** | ඇඳුම් පැළඳුම් ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයෙන් යුතු අතර ඒවා එකිනෙකට සංගත වන අයුරින් චරිතයට අදාල නිශ්චිත කාල-අවකාශ නිරවද්‍යතාව නිරීක්ෂණය වේ. | ඇඳුම් පැළඳුම් ශෛලිය, යුගය, චරිතයේ කාල-අවකාශ නිරවද්‍යතාව, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ඇඳුම් පැළඳුම්, ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ඇඳුම් පැළඳුම්, ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වුව ද ඒවායෙහි එකිනෙකෙහි පරස්පරයන් ද නිරීක්ෂණය වේ. | සැලසුමක් ඉදිරිපත් කෙරුණ ද ශෛලිය, යුගය හා නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබොධයකින් තොර යම් උත්සාහයක් බව පෙනේ. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. නැතහොත් ඉදිරිපත් කළ සැලසුම යෝජිත චරිතයට කිසිසේත්ම අනුකූල නැත. |
| **සිරුරේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම** | සිරුරේ හැඩය හා චරිතයේ ස්වභාවය පිළිබඳ විශිෂ්ට අවබෝධයකින් යුතුව සැලසුම් කර ඇත. වයස හා සබැඳි සුවිශේෂතා සහ ජවනිකාවේ අවස්ථාවට අනුව චරිතයට ගැළපෙන ලෙස සැකසී ඇත | සිරුරේ හැඩය හා චරිතයේ ස්වභාවය පිළිබඳ අවබෝධයකින් යුතුව සැලසුම් කර ඇත. වයස හා සබැඳි සුවිශේෂතා සහ ජවනිකාවේ අවස්ථාවට අනුව චරිතයට ගැලපෙන ලෙස සැකසී ඇත. | සිරුරේ ස්වභාවය මෙන්ම චරිතයේ මනෝභාවික ස්වරූපය පිළිබඳ අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | සිරුරේ ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් සැලසුම ඉදිරිපත් කරයි. චරිතයට අදාළ සුවිශේෂතා ඉස්මතු කිරීමට උත්සාහයක් දරා ඇත. | සිරුරේ ස්වභාවය පිළිබඳ නිසි අවබෝධයක් ප්‍රකට නොකරයි. චරිතයේ සුවිශේෂතා පිළිබඳ අවබෝධය ඉතා අල්ප ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. සිරුරේ ස්වභාවය පිළිබඳ අවබෝධයකින් තොරය. යෝජිත චරිතයට කිසිදු අනුකූලතාවක් නැත. |
| **නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය** | දෙන ලද කාලය ඇතුළත සැලසුම් මූලාශ්‍ර (වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර) ඇසුරෙන් චරිත ස්වභාවය මැනැවින් පිළිබිඹු වන පරිදි නිර්මාණාත්මකව පිරිසැලසුම් කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය මැනැවින් ප්‍රකට වන පරිදි පිරිසැලසුම සිදු කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව චරිත ස්වභාවය ප්‍රකට කිරීමට උත්සාහ දරා ඇත. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයක් ප්‍රකට කරයි. එහෙත් ඒවා සංකලනයේ දී දක්නට ඇත්තේ දුර්වල සංගතියකි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර හසුරුවා ගැනීමට යම් ප්‍රයත්නයක් ඇතත් ඒවායෙහි සංකලනය අතිශයින් දුර්වල ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කර නැත. |

## C 3 ඇගැයීම: වේදිකා පසුතල නිර්මාණ සැලසුම

| ඇගැයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම** | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ මනා අවබෝධයෙන් යුතු අතර ඒවා එකිනෙකට සංගත වන අයුරින් සහ රංග පරම බවින් යුතුව නිර්මාණ සැලසුම සිදු කර ඇත. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පළිබඳ මනා අවබෝධයකින් යුක්ත අතර පසුතලයේ රංග පරම බව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වේ. | ශෛලිය, යුගය, නිෂ්පාදන ස්වභාවය පිලිබඳ යම් අවබෝධයකින් යුක්ත බව නිරීක්ෂණය වුව ද ඒවායෙහි එකිනෙකෙහි පරස්පරයන් ද නිරීක්ෂණය වේ. | සැලසුමක් ඉදිරිපත් කෙරුණ ද ශෛලිය, යුගය හා නිෂ්පාදන ස්වභාවය පිළිබඳ අවබෝධයකින් තොර යම් උත්සාහයක් බව පෙනේ. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. නැතහොත් ඉදිරිපත් කළ සැලසුම ශෛලියට, යුගයට, නිෂ්පාදනයේ ස්වභාවයට හා කාලයට කිසිසේත්ම අනුකූල නැත. |
| **රංග අවකාශය පිළිබඳ අවබෝධය සහ ජවනිකාවට අදාළ සුවිශේෂතා හඳුනා ගැනීම** | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ විශිෂ්ට අවබෝධයකින් යුතුව සැලසුම් කර ඇත. ජවනිකාව හා සබැඳි සුවිශේෂතා උචිත පරිදි ගලපාගෙන ඇත. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ මනා අවබෝධයකින් යුතු ය. ජවනිකාව හා සබැඳි සුවිශේෂතා උචිත පරිදි ගලපා ගෙන ඇත. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ අවබෝධයක් ප්‍රදර්ශනය වේ. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ යම් අවබෝධයකින් සැලසුම ඉදිරිපත් කරයි. අවස්ථාවට අදාල සුවිශේෂතා ඉස්මතු කිරීමට උත්සාහයක් දරා ඇත. | රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ නිසි අවබෝධයක් ප්‍රකට නොකරයි. අවස්ථාවේ සුවිශේෂතා පිළිබඳ අවබෝධය ඉතා අල්ප ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. රංග අවකාශය හා ජවනිකාවේ ස්වභාවය පිළිබඳ අවබෝධයකින් තොරය. යෝජිත අවස්ථාවට කිසිදු අනුකූලතාවක් නැත. |
| **නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය** | දෙන ලද කාලය ඇතුළත සැලසුම් මූලාශ්‍ර (වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර) ඇසුරෙන් ජවනිකාවේ අවශ්‍යතාවන් මැනැවින් පිළිබිඹු වන පරිදි නිර්මාණාත්මකව පිරිසැලසුම් කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව ජවනිකාවේ අවශ්‍යතාවන් මැනැවින් ප්‍රකට වන පරිදි නිර්මාණ සැලසුම සිදු කරයි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව ජවනිකාව ප්‍රකට කිරීමට උත්සාහ දරා ඇත. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයක් ප්‍රකට කරයි. එහෙත් ඒවා සංකලනයේ දී දක්නට ඇත්තේ දුර්වල සංගතියකි. | වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර හසුරුවා ගැනීමට යම් ප්‍රයත්නයක් ඇතත් ඒවායෙහි සංකලනය අතිශයින් දුර්වල ය. | එක්කෝ කිසිදු සැලසුමක් ඉදිරිපත් කර නැත. වර්ණ, රේඛා, ආලෝකය සහ අඳුර පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කර නැත. |

## A-1.1/ A-1.2 ඇගැයීම්වල පෙළ ආශ්‍රිත භාෂණ රංගයනයන් සඳහා විෂය නිර්දේශගත නාට්‍ය පෙළවලට අතිරේක වශයෙන් නිර්දේශ කරන භාෂණ කොටස්

### 01. පුංචි පළිඟු රූප- හෙන්රි ජයසේන (පරි)

ටොම් - ඔව්, මගේ සාක්කුවේ තියෙනව නොයෙකුත් විජ්ජා, ඒත් මං විජ්ජාකාරයෙක් නොවෙයි. මං ඒකේ අනිත් පැත්ත. විජ්ජාකාරයා මායාවක් මවා පෙන්වනව ඇත්ත වගෙ. මම ඇත්ත පෙන්වනවා මායාවක් වගේ ලස්සනට සාටෝප කරල.

ආරම්භයක් ලෙස, මම කාලය හරවනවා ආපස්සට. අර තිස් ගණන්වල මහ අමුතු කාලය කරා ආපසු යනව. ඒ කාලෙ තමයි ඇමරිකාව නමැති මහා රාජ්‍යයේ මුළු මැද පන්තියම අන්ධ පාසලක ඉඳන් විභාග සමර්ථ වෙන්ඩ උත්සහ කළේ. එක්කෝ ඒ ගොල්ලගේ දෑස් පෙනුනෙ නෑ. එහෙම නැත්නම් ඇස්වලට ඒ ගොල්ල පෙනුනෙ නෑ. ඉතිං ඒ ගොල්ල මොකද කළේ? දියාරු වෙමින් පවතින ආර්ථිකය නමැති බ්‍රේල් හෝඩියක් මත තමන්ගේ දෑත් ඔබාගෙන සිටිය. ස්පාඤ්ඤයේ විප්ලවයක් තිබුණ. මෙහේ තිබුණෙ කෑ කෝ ගැසීම් හා අන්දුන් කුන්දුන් බව පමණයි.

ස්පාඤ්ඤයේ ගුවර්නිකා තිබුනා. මෙහේ කම්කරු අසහනය තිබුනා. වෙනදා බොහෝම සමකාමී නගරවල, චිකාගෝ, ක්ලිව්ලන්ඩ්, සැන් ලූවී වගේ නගරවල.......... ඒ තමයි නාට්‍යයේ සමාජ පසුබිම.
(සංගීතය)

මේ නාට්‍යය මතකයක්.
මතක නාට්‍යයක් නිසා එහි තිබෙන්නේ දුහුල් ආලෝකයක්.
එය භාවාතිශයයි.
එය තත්වානුරූපී නැහැ.
මතකයේ සෑම දෙයක්ම පාහේ සිදුවන්නේ සංගීත රාවයකට. ඒ හින්දා තමයි අර පැත්තකින් රවිකිඤ්ඤයක් අඬනව ඇහෙන්නේ. මම තමයි නාට්‍යයේ කථක. ඒ වාගේම එහි චරිතයක්. අනෙක් චරිත තමයි මගේ මව අමන්ඩා, මගේ සොයුරිය ලෝරා සහ අවසාන ජවනිකාවේ පෙනී සිටින අමුත්තෙක්. මේ නාට්‍යයෙ එන එකම ස්වාභාවික තැනැත්තා ඔහු පමණයි. ඒ ඔහු සැබෑ ලෝකයෙන්, නැතිනම් පියවි ලොවෙන් දූරස්ථ වෙලයි සිටියේ.
එහෙත් මම මේ චරිතය මේ නාට්‍යයෙදී යොදනව සංකේතයක් ලෙස. ඒ මන්ද, කවි සිතක් තියෙන මා කැමති නිසා, සංකේතවලට. ම මේ කියන අමුත්තා තමයි මේ ජීවිතයේ දී අපි කවුරුත් පාහේ බලාපොරොත්තුවන, ඒත් හැම තිස්සෙම ප්‍රමාද වන, අර මොකක්දෝ සුන්දර සිදුවීම. තවත් චරිතයක් ඉන්නව මේ නාට්‍යයේ. හැබැයි එයා හැබවින් එන්නේ නෑ. ආරුක්කුවට උඩින් එල්ලෙන විශාල ප්‍රමාණයේ පින්තූරයෙන් පමණයි එයා පෙනී සිටින්නේ.
ඒ තමයි අපේ තාත්තා. බොහෝම ඉස්සර දවසක අපව හැර ගිය තාත්තා.
එයා ටෙලිෆෝන් කොම්පැනියක වැඩ කළේ. ඒ නිසාදෝ දුර බැහැර එක්ක පෙමින් වෙළුණු කෙනෙක්.
එයා ටෙලිෆෝන් කොම්පැණියෙන් අස් වෙලා අපේ ටවුමට උඩින් සියුම් මාලක් කමක් දමල ටවුමෙන් පිටවුනා.........

---

### 02. පුංචි පළිඟු රූප- හෙන්රි ජයසේන (පරි)

අමන්ඩා : පොඩ්ඩක් ඉවසලා ඉන්න දුව ඔන්න බලන්ඩ මං පරණ ට්‍රංක පෙට්ටියෙන් ඇදල ගත්තු ඇඳුම! විලාසිතා කියන ඒවා ඒ තරම් වෙනස් වෙන්නේ නෑ!

(ඇතුල් කාමරයේ තිරය විවෘත වෙයි.)

ඔන්න බලන්න දුව අම්මා දිහා!

(ඇය කහ පැහැති වොයිල් ගවුමක් ඇඳ සිටියි. එය ඇය තරුණියකව සිටි අවධියේ අඳින ලද ගවුමකි. බඳ වටා නිල් පැහැ සේද පටියකින් ගවුම ඉනට තද වී ඇත. ඇය අත මල් පොකුරක්ද ඇත. ඇය මොහොතකට තරුණ වූවා සේය,
මේ ගවුම ඇඳ ගෙන තමා කොටිලියන් නැටුමේ පෙර ගමන් කළේ ඒ කාලේ! විලාසිතා සාදවලට ගියේ නීලගිරි ඉසව්වේ ආණ්ඩුකාරයාගේ මන්දිරයේ බාල් නැටුමට ගියේ! ඔන්න බලන්න දුවේ මං නටපු හැටි.

(ඇය ගවුම මදක් ඔසවා සාලයේ වටේ රවුමක් කැරකෙයි.)

ඒ කාලයේ වැදගත් අමුත්තෝ මාව බලන්න එනකොට මම හිටියෙ මේ ගවුම ඇඳලා. උඹලා තාත්තා

මුණගැහුණු දවසෙත් මම මේ ගවුම ඇඳලා හිටියේ! ඒ මුළු වසන්ත සෘතුවේ මැලේරියා උණ තිබුණා.මට නිතරම පුංචි උණක් තිබ්බා. ඇඳේ ඉන්න තරම් දෙයක් නෙමෙයි. ඒත් ඉහ මොළය රත් කරන කෙල්ලෙක් යාන්තමට පිස්සු වට්ටන උණක්! හැම පැත්තෙන්ම මට ආරාධනා ලැබුණ! හැමදාම වාගේ සාදයක්! ඇඳට වෙලා හිටපන්. උඹට උණ අම්මා කිව්වා! ඒත් මං නෙමෙයි ඇඳට වෙලා හිටියේ! මම ක්විනින් පෙති ගිල ගිල සාදයෙන් සාදයට ගියා. හවස නැටුම් සාද, දවල් වරුවේ කෙලවරක් නැති විනෝද ගමන් .. ඒ පළාත කොච්චර ලස්සනද මැයි මාසේ? හැමතැනම මල් පීදිලා තණ නිල්ල නිල් පලසක් වගේ අපි  අස්පය පිටේ විනෝද ගමන් යන කොට අස්පය පිටින් බැහැලා වන වදුලේ වන මල් නෙලන එක! අන්න වන මල කියපු හැටියේ ඉලන්දාරි ටික බැහැල දුවනවා මට වන මල් කඩා දෙන්ඩ! මං වන මල් ගෙනල්ල ගෙනල්ල ගේ පිරෙව්වා. අම්මා කිව්වා දුවේ දැන් නම් ගෙයි ඉඩ නෑ කියල. මං එතකොට ඒවා දෝතෙ දරාගෙන හිටියා......එතකොට තමයි මට උඹලගෙ තාත්තව මුණ ගැහුනෙ.....මැලේරියා උණයි. වනමලුයි අස්සේ එතකොට.....

(ඇය අළුත් කැටයම් පහන දල්වාලයි- සාලය මැදට විත් අත ඇති මල් කළඹ එහි ඇති භාජනයක තැන්පත් කරයි)

මේ ළමයි දෙන්න වැස්සට ඉස්සෙල්ලා එයි කියල මං හිතනව.....මං වැඩිපුර කාසි ටිකකුත් දුන්නා උඹේ මල්ලිට ටැක්සි එහෙක එන්න කියල ! අර, ඕ කෝනර් ළමයත් එක්ක !

---

## 03. වැනිසියේ වෙළෙන්දා- බන්දුල විතානගේ (පරි)

ෂයිලොක් : ඇන්ටෝනියෝ මහත්තයෝ, නෙක් වර නිරතුරුවම රියල්ටෝවලදී අපහාස කලා ඔබ මට මගේ මුදල් සහ මගේ පොලිය ගැන.
හැමවිටම එය විඳ දරා ගත්තෙමි මම ඉවසිලිවන්තව. මන්ද පීඩාව සලකුණ බැවින් අපේ වරිගේ හැම එකාගෙම. ඔබ මට කිව්ව මිත්‍යා දෘෂ්ටිකයා ජඩ බල්ලා කියල.
කෙල ගැහුව මගේ යුදෙව් ලෝගුවට.
මේ ඔක්කොම ලබාගත්තට මට උරුම මගේ දෙයක්. හොඳයි එහෙනම් දැන් මට පේන හැටියට ඔබට අවශ්‍යයි මගේ උදව්ව. පලයන් යන්න. මං ළඟට ඇවිත් කියනව උඹ, 'ෂයිලොක් අපට සල්ලි ටිකක් දෙන්න' උඹ කියනව එහෙම,
උඹ කෙළ ගැහුව මගේ රැවුලට,
උඹ මට පයින් ගැහුව පාදඩ බල්ලෙක්ට වගේ, උඹට සල්ලියි ඕනෑ?
මං මොකක්ද උඹට කියන්න ඕනෑ? මං කියන්න ඕනෑ නැද්ද?
'බල්ලෙක්ට කොයින්ද කාසි? බල්ලෙක්ට දෙන්න පුළුවන්ද රන්කාසි තුන්දාහක්,
නැත්නම් මම දෙකට නැමිල වහලෙක් වගේ පහත් ස්වරයෙන් යටහත් පහත්ව කියන්නද?
මෙහෙම 'කරුණාවන්ත මහත්මයාණෙනි, ඔබ මට කෙළ ගැහුව පහුණු බදාදා. මට පයින් ගැහුව අසවල් දා, තවත් දවසක ඔබ මට බල්ලයි කිව්වා, මෙම ත්‍යාගශීලීකම්වලට, මම ඔබට දෙනව සෑහෙන මුදලක් ණයට.'

---

## 04. වැනිසියේ වෙළෙන්දා- බන්දුල විතානගේ (පරි)

ෂයිලොක් : මාළු අල්ලන්න ඇමකට ගන්නවා ඒක. ඒකෙන් කිසිම ප්‍රයොජනයක් නැතැත්, මගේ පලිය ගන්න පුලුවන් ඒකෙන්. ඌ මට නින්දා කළා. කෝටි බාගයක් මට නැති කළා. හිනාවුනා මගේ පාඩුවලට. විහිළු කළා මගේ ආදායමට, පරිභව කළා මගේ ජාතියට, බාධාකළා මගේ ගනුදෙනුවලට, බිඳෙව්වා මගේ, මිතුරන්, කෝප කළා මගේ සතුරන්, මොකක්ද ඔහුගේ හේතුව. මම යුදෙව්වෙක්, යුදෙව්වෙක්ට ඇස් නැද්ද? යුදෙව්වෙක්ට අත් නැද්ද? හැඟීම් නැද්ද? අවයව නැද්ද? දයාව නැද්ද?, ක්‍රිස්තියානිකාරයෙක් වගේ ඔහුත් කන්නේ එකම ආහාර නොවෙයිද, ගොදුරුවන්නේ එකම රෝගවලට නෙමෙයිද? සුව වන්නෙ එකම ප්‍රතිකාරවලින් නෙමෙයිද? උණුසුම් වන්නේත් සිසිල් වන්නේත් එකම වසන්ත හා ශීත සෘතුවලින් නෙමෙයිද? උඹල අපට කිතිකැව්වොත් අපි හිනාවෙන්නේ නැද්ද? උඹලා අපට වහ දුන්නොත් අපි මැරෙන්නේ නැද්ද? උඹලා අපට සමාන නම් අපි ඒකෙදීත් උඹලට සමාන වෙනවා. යුදෙව්වෙක් වරදක් කළා නම් ක්‍රිස්තියාන් කාරයෙක්ට ඔහුගේ මනුස්සකම මොකක්ද? පලිගැනීම. ක්‍රිස්තියානිකාරයෙක් වරදක් කළා නම් යුදෙව්වෙක්ට ක්‍රිස්තියානි ආදර්ශයේ හැටියට ඔහුට ලැබෙන අවසරය මොකක්ද, ඇයි? පළිගැනීම. උඹලා අපට කියාදුන් දුෂ්ඨකම මම ක්‍රියාවට නංවන්නම්.

**<u>05.</u> හිරු නැති ලොව - රංජිත් ධර්මකීර්ති (පරි)**

මාස්ටර් : ලොකු උන්නැහැ. මගෙ සරුවාංගෙ මද්‍යසාරවලින් විස වෙන්න ඉස්සෙල්ල මට හොඳ සිහි කල්පනාවක් තිබුණ. ඒකටත් එක්ක දැං! දැං හැම දෙයක්ම විනාස වෙලා. ඉස්සර මං ඔය පේලිය කියවනකොට බලන්න එපාය. මුළු ශාලාවම දෙදරුම් කන්න අත්පොලසන් දෙනව! ඔහෙට තේරෙන්නෙ නැහැ ලොකු උන්නැහැ නළුවෙක් අත්පොලසන් නාදයෙන් ලබන සන්තෝෂය. කොටින්ම කියනවනං අත්පොලසන් නාදය හරියට වොඩ්කා වගෙයි! මං එතනට ඇවිල්ලා මෙන්න මෙහෙම හිට ගන්නවා. (එක් විදිහක සිටී.) මම මෙහෙම ඉන්නව.....මෙහෙම. (ඔහු නිහඬ වෙයි) ෂඃ හැබැවටම එක වචනයක්වත් මතක නැනෙ. එක ම වචනයක්වත් මතක නෑ. ඒක තමයි මම බොහෝම දුර්වලයි. බොහොම දුර්වලයි. එහෙම නේද ලොකු උන්නැහැ?

---

**<u>06.</u> ගජමන් පුවත- දයානන්ද ගුණවර්ධන**

කොර්නේලියා : මට සමාවන්න, උතුමාණනි, ඔබතුමා මේ විදියට මට දක්වන හිතවත්කම මට ඇස් දෙකෙන් අදහා ගන්න පුළුවන් ද කියලා හිතෙනවා. මං හිතුවා මාව ඉතිං කවදාවත් කිසි ම කෙනෙක් පිළිගන්න එකක් නැහැයි කියලා. කොටින් කියනවා නම් කාව්‍යක්කාරියක් හැටියට පවා මා ගැන තිබුණු මගේ විශ්වාසය පවා මට නැති වෙන්න පටන් ගත්තා. මගේ ඇති වැදගත්කමක් තවත් තියෙනව ද කියලා මට ම ප්‍රශ්නයක් උණා. ඔබතුමාණන්ට පෙත්සම ලියන කොට මම හිටියෙ මගේ ජීවිතය හැම අතින්ම මේ විදියට අවාසනාවන්ත විය යුතු ද යන්න මට ම අවසාන වරට තීරණය කර ගන්න ඕනෑ වුණු අවස්ථාවෙ. කොයි හැටි වෙතත් මට දැන් ධෛර්යයක් ඇති වෙලා තියෙනවා. මට හිතෙනවා. මා නැවතත් ජීවත් වෙනවා කියලා.

---

**<u>07.</u> සොක්‍රටීස්- සුනන්ද මහේන්ද්‍ර**

නිලධාරියා : මේ මරණීය දණ්ඩනයට කැප වූ හැම කෙනෙකුටම විෂ බඳුන පානය කරන්නට අණ කරන්නේ මායි. ඒ හැම අවස්ථාවකම ඒ දණ්ඩනයට කැප වූ අය මට දොස් කීවා. ගැරහුවා. ඒත් ඔබ හැම කෙනෙකුටම වඩා වෙනස්. ඔබ වැනි උත්තම ගනයේ පුද්ගලයෙක් මට කවදාවත් මුණ ගැහී නැහැ. ඔබ වැනි අතිශයින් කාරුණික පුද්ලයෙක් මට කවදාවත් හමු වී නැහැ. ඔබ වැනි නිර්භීත පුද්ලයෙක් හමු වී නැහැ. මා දන්නවා ඔබ මා සමග අමනාප නොවන බව. මා මෙහි පැමිණියේ හුදෙක් රජයේ නියෝගය ක්‍රියාත්මක කිරීමටයි! නියෝගය කෙතරම් දුෂ්ට වූවත් අසාධාරණ වූවත් අකාරුණික වූවත් එය ක්‍රියාවේ යෙදවීමට බොහෝ විට රජයේ නිලධාරීන්ට සිදුවෙනවා. නැතහොත් ඒ හා සමාන දුෂ්ට නියෝග ඒ නිලධාරියාට විරුද්ධව ක්‍රියාත්මක වීමට ඉඩ තිබෙනවා. ඔබ දන්නවා ඇති මා පැමිණි කාරණාව. සියළු දෙයක්ම පහසුවෙන් දරා ගැනීමේ ශක්තිය ඔබට ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

නිලධාරියා : පානය කරන්න. ඔබේ දෙපයට බරක් දැනෙන තුරු ඔබ මොබ ඇවිදිමින්, ඉන් පසු බිම වැතිරෙන්න. එවිට මේ විෂ ඔබගේ ශරීරය පුරා ක්‍රියා කරන්නට පටන් ගනිවී.

---

**<u>08.</u> බර්නාඩාගේ සපිරිගෙය - රංජනී ඔබේසේකර (පරි)**

පොන්චියා : ඔව්, ඔව්, මම මුර වැඩට හොඳ බැල්ලියක් තමයි. බුරන්ට කීවාම බුරනවා. උසිගැන්නුවාම හිඟන්නන්ගේ පය විකනවා. මගේ පුත්තු එයාගේ කුඹුරු වැඩ කරනවා තමයි. වාසනාවකට දෙන්නම දැන් පවුල් වෙලා. ඒ කොහොම වුනත් මට නම් දැන් ඇති වෙන්ඩ ලගයි.

පොන්චියා : එතකොට මං ඇව කාමරයක දාගෙන මූණට කෙළ ගහනවා මුළු අවුරුද්දක් තිස්සේ කෙළ ගහනවා. ඕං බර්නාඩා එදා කළ දේට.... තුං..... මෙන්න අනිත් කළ දේට.... තුඃ මේන් තවත් කළ දේට තුඃ කොල්ලෝ ගල් ගහලා වුරු කරපු කටුස්සියක් වගේ වෙනකං කෙළ ගහනවා. කටුස්සියක් තමයි ඒකි, ඒකියි මුළු හැත්තයි. මං එයාගේ ජීවිතයට ඉරිසියා කරනවා නොවේ. ඔහොම ජීවිතයක් කීයටවත් මට නම් එපා! දූවරු පස් දෙනෙකුගේ බර තවමත් තියෙනවා. ඒ මදිවට රුව නැති දූවරු පස් දෙනෙක්! හැබැයි අන්ගුස්ටියස්ට නම් සල්ලි ටිකක්වත් තියෙනවා. ඉස්සෙල්ලා මිනිහගෙ හින්දා, අනික් අයට ඇත්තෙ මොනවාද? මල් වැඩ මහන්ට රෙදි ගොඩකුයි සේද සායවල් ගොඩකුයි විතරයි. දැවැද්දට හොදියි බතුයි තමයි.

පොන්චියා : අපට ඉතින් ඇත්තෙ අපේ අත් දෙකයි. මැරුණම මහපොළවේ වලකුයි විතරයි.

**09. දොළහක් - සමන් පුෂ්ප ලියනගේ (පරි)**

3 වෙනි ජූරි සභික : හැමදේම. උසාවියේදි අනාවරණය වුන හැමදෙයක්ම. මං කියනව හැමදෙයින්ම කියන්නේ ඒකා වැරදිකාරයා කියලා. මං මෝඩයෙක් කියලද තමුසෙලාගේ හිතේ. තමුසෙලා මේ පපුව උණු වෙලා ලේ ගලන පෙන්දො රැලක්. තමුසෙලට බෑ මාව බය කරන්න. මට මගේ අදහස් දරන්න හිමිකමක් තියෙනවා. මට පුළුවන් මේ ඉලව් කාමරේ අවුරුද්දක් තිස්සේ උනත් ඉන්න.

(පිරිස නිහඬයි)

අර නාකි උන්දෑ කියපුව ගණන් නොගන්නේ ඇයි? එතන හිටියා නාකි මිනිහා. ඒකට සේරම ඇහුණා. නැත්නම් පිහිය ගමු. මොකෝ මෙයාට ඒ ජාතියෙම පිහියක් හම්බ වුන හින්දද? නාකියා දැක්ක ඒකව. හරියටම අර පඩිපෙළේදි. තත්පර කීයක් ගියත් මොකෝ.ඒකා දැක්කනේ. මොකක්ද වෙනස? හැම දෙයින්ම. පිහිය සාක්කුවේ හිලකින් වැටිච්ච එක. තමුසෙලට ඔප්පු කරනත් බෑ නාකියා දොර ලඟට ගියේ නෑ කියලා. තමුසෙලට කාමරේ පුරා නොන්ඩි ගගහ ගිය හැකි හිතේ හැටියට. හැබැයි ඒක ඔප්පු කරන්න බෑ. මං තමුසෙලට කියන්නේ හැමදේම....හැමදේම..කණපිට පෙරලුවනේ මෙතන....දැන් මේ කණ්නාඩි දෙකේ කතාව තමුසෙල දන්නෙ කොහොමද? ඒකි ඒවා දාගෙන හිටියේ නෑ කියලා...ඒ ගෑනි සහතික කරලා කිව්වා උසාවියෙදි...ඉතිං මොනවාද ඕනේ තමුසෙලට....එච්චරයි...ඒක තමයි සම්පූර්ණ කේස් එක......

(පිරිස නිහඬයි)
කොල්ලා කෑ ගහනව ඇහිච්ච එක....කිව්වේ මං තෝව මරණව කියලා..... ඒක තමයි ඌ කිව්වේ උගෙම තාත්තට.ඒ තාත්තා මොන වගේ මිනිහෙක්ද කියන එකෙන් මට ඇති කාරියක් නෑ...ඒ උගේ තාත්තා. ඔය තක්කඩි කොල්ලා මං දන්නවා ඌව. උන් මොක්කුද මොනවද කරන්නේ කියලා....දවස ගානේ උන් අපිව මරණ හැටි....දෙයියනේ තමුසෙලට පේන්නැද්ද? මට විතරද මේක පේන්නේ? දෙයියනේ මට දැනෙනව මගේ පපුවට ඒ පිහිය කිඳා බහිනවා....

---

**10. දිරිය මව- හෙන්රි ජයසේන (පරි)**

චැප්ලේන් : හම්.....මම හිතන හැටියට නම්. යුද්ධයේ වුනත් තියෙනවා එක්තරා සාමයක්. සාමයක්. සාම ක්ෂෙම භූමි වගෙ දේවල් තියෙනව යුද්ධයත්. හැම ඕනෑ එපා කමක්ම පිරිමහනව යුද්ධය - සාමයේ ඕනෑ එපා කම් පවා-ඔව් ඒ හැම එකක්ම සපයනු ලබනවා-එහෙම නැතුව යුද්දෙකට බෑ දිගටම පැවැත්වෙන්ඩ- සාමය ඉහ වහ ගිය කාලෙක වාගේම යුද්දෙකදි වුනත් පුළුවනි එලිබහින්ඩ ගන්ඩ එහෙම. එක සටනක් ඉවර වෙලා අනිත් සටනට ඉස්සර වෙලා බීර වීදුරුවක් බීගන්ඩ පුළුවනි- ගමනේ යන අතර වුනත් පුළුවනි ඇබිත්තකට ඇහැ-පියා ගන්ඩ-සමහර විට කාණු පල්ලක ඉඳගෙන හැම තිස්සෙම පුළුවනි මොන මොනවා හරි කරන්ඩ. ඇත්ත ඇන කොටා ගන්න වෙලාවක බෑ තමයි. බූරුව ගහන්ඩ-එහෙම බලනව නම් සාම කාලෙක කුඹුරක් හාන කොටත් බෑනේ බූරුවා ගහන්ඩ. ඔන්න ජයක් එහෙම ලැබුවට පස්සේ නම පුළුවන් කමක් තියෙනවා. අණ්ඩක් දෙකක් කඩාගෙන යනව වෙඩි උණ්ඩෙකට- මොකද කරන්නේ? මුලදි නම් ඉතින් ඔය ගැන සෑහෙන කාලගෝට්ටියක් කරනවා. හරියට මහ දෙයක් සිද්ද වුනා වගෙ. පස්සෙ ඒක නිකම්ම නැතිවෙලා යනවා. එහෙමත් නැත්නං බ්‍රැන්ඩි උගුරක් බීල අමතක කර දමනව, අන්තිමට එක අණ්ඩෙන් පැන පැන යන්ඩ පුරුදු වෙනවා. ඒත් යුද්දෙට අමුත්තක් වෙන්නේ නෑ තමනට ඔය පොඩි අකරතැබ්බයක් වුනාය කියල.ඒ ඇරුනු කොට මිනී මරා ගන්න අස්සෙ වුනත් මිනිස්සු නැද්ද තමන්ගෙ වර්ගයා බෝ කර ගන්ඩ කටයුතු කරන්නෙ? ඔය පිදුරු මඩුවක් හරි මොකක් හරි පිටිපස්සෙ? කොහොමටත් මිනිස්සුන්ට බෑ වැඩි කාලෙකට ඒකෙන් වැලකිලා ඉන්ඩ. එම නිසා, යුද්දෙකදි වුනත් තම තමන්ගෙ පරපුර බෝවෙලා යුද්දෙටම එක් වෙනව! යුද්දයත් හරියට ආලය වගෙ- මොකක් හරි මාර්ගයක් හොයා ගන්නව- කොහොමද ඒක ඉවර වෙන්නෙ?

---

**11. මකරා- හෙන්රි ජයසේන (පරි)**

එලිසා : දෙවියනේ! මගේ කම්මුල් දෙක දනවා! මොන තරම් නින්දාවක්ද? තව ඩිංගෙදි අර තක්කඩියගෙ කතාවට මං රැවටෙනව! එහෙනම් මමත් ඒ විදිහෙ කෙනෙක්! කමක් නෑ - මට දැං හොඳටම එපා වෙලා- කොච්චර අහිංසක. සුවච. කීකරු කෙනෙක් හැටියටද මම මෙච්චර කල් ජීවත්වුනේ! මොකක්ද මට එයින් ඇතිවුනු සෙතේ. හැමෝම කියනව අනේ හරි අහිංසක කෙල්ල කියල! හැබැයි සන්තෝස වෙන්න අනිත් අයයි - දැන් ඒ ගොල්ලො හැමෝම ගෙවල්වල ඇති.මට වෙන්ඩ යන විපත්තිය දිහා බලල විනෝද වෙන්ඩ ඒ ගොල්ලො ලක ලෑස්ති වෙනව ඇති.මට මැවිලා පෙනෙනව කැඩපත් ළඟ ඉඳගෙන හැඩ වැඩ දමනව- 'අනේ දුප්පත් එලීසා. අනේ අපූරු කෙල්ල කිය කියා මූණුවල සායම්

උලනව ඇති. මම මේ කාන්තාරයක් වාගෙ පිට්ටනියක් මැද තනියම! ඒ අස්සෙ අර තක්කඩි මුර කාරය මා දිහා බලාගෙන ඉන්නව- ගිලගන්ඩ වගේ! අද මකරා මට මොනවා කරයිද කියලා හිත හිතා! ඒ මිනිහා හෙට ජීවතුන් අතර එයාගෙ නිවාඩු දවස විවේකයෙන් ගත කරාවි. දිය ඇල්ල ළඟට යාවි ඇවිදින්ඩ! එතන දිය ඇල්ල නටනව දකිනකොට කොයිතරම් අසරණ මිනිහෙකුගෙ උනත් මූණට හිනාවක් නැගෙනව! එහෙම නැත්නම්, එයා යාවි, ඇලේ ඔරු පදින්ඩ 'අනේ අසරණ එලිසා, මෙච්චර අපූරු වෙලත්, අව්ව ටිකක් තපින්ඩ පුළුවන් කමක් නෑ එයාට කියල කියාවි මිනිස්සු. මටත් ඕනෑ ජීවත් වෙන්න හිරු එලිය එක්ක සන්තෝසෙන් හිනාවෙන්ඩ- හැම දෙයක්ම දකින්ඩ! - අහන්ඩ! මම කිණිස්ස ගෙන මගේම ජීවිතේ තුරන් කරන්ඩ හිතාගෙන- දැං ඉතිං -වෙන දෙයක් උනාවෙ!

හෙන්රි : නෝනාවරුනි, මහත්වරුනි, ප්‍රසිද්ධ කතා පැවැත්වීමට මට ඇති නුහුරුකම නිසා, මගේ කතාවේ කඩතොලු තියන්ඩ පුළුවනි. ඒ ගැන තමුන්නාන්සේලා මට සමාවෙන්ඩ ඕනෑ-මීට හරියට වසරකට පෙර, කොහේද යන අහංකාර නිකමෙක්, අර ඒ කාලෙ හිටපු අපේ එපා කරපු මකරාව සටනකට කැඳෙව්ව - මේ සටන පිළිබඳව පුර සභාව මගින් පත් කරන ලද විශේෂ කමිටුවක්, මෙන්න මේ කරුණු ස්ථිර වශයෙන්ම අනාවරණය කරල තිබෙනව. අර කම්මැලියට පුළුවන් වුනේ මකරාගේ ඇගේ සුළු සීරීමක් ඇති කිරීමට පමණයි. මෙයින් ප්‍රකෝප වූ මකරා, වඩාත් බිහිසුණු වුනා. එවිට අපේ එවකට සිටි පුරවරාධිපති තුමා, දැන් ජනපති තුමා, ඉතා නිර්භීත ලෙස, මකරාගේ ඇඟ උඩට පැනලා, නොයෙකුත් අසාමාන්‍ය වීරක්‍රියා දක්වල, මකරාව මුළුමනින් විනාශ කළා.....

(අත්පොලසන්)

මේ නයින්, අපේ ප්‍රජාවට උරවක්‍ර මාලයක්ව තිබූ වහල් භාවය නමැති බැම්මෙන් අපි සදහටම මිදුනා-
(අත්පොලසන්)

අපේ කෘතඥතාවයේ සළකුණක් වශයෙන් අපේ පුරවරය මේ ආකාරයට තීරණය කළා. අර සාපලත් මකරාට මෙම අඩවියෙන් ඉතාම සුන්දර කන්‍යාවියන් බිලිදෙන සිරිතක් තිබුණ. පසුගිය වර්ෂයේ බිල්ලට නියම වූ මෙම කන්‍යාවිය මකරාගෙ මුවින් ගලවාගත්තේ අපේ මේ නිර්භීත වීරයාටත් අඩු වශයෙන් එම සැළකිල්ලම දැක්වීම, ඉතාම ස්වාභාවික වූත්, සාධාරණ වූත් ක්‍රියාවක් බව මෙම පුරවරය තීරණය කර සිටිනවා.

(අත්පොලසන්)
එම නිසා, මෙම පුරවරයේත්, මගේත්, ඉමහත් කෘතඥතාව පළකරනු වස්. මෙම ස්වාධීන පුරවරයේ නව පුරවරාධිපති වශයෙන් මට ලැබී ඇති බලතල අනුව, මම දැන් චාරිත්‍රානකූල ලෙස මෙම විවාහය සිදුකරනවා. වාදකවරුනි, මංගල සංගීතය!

(වාදනය)

නොතාරිස් වරුනි, මංගල සිදුවීම් පිළිබඳව ලේඛනය විවෘත කරනු!

(විශාල පොතක් සහ පැන් රැගත් නොතාරිස්වරු පිවිසෙති.)

## 12. චෙරි උයන- රංජිත් ධර්මකීර්ති (පරි)

රැනවෙස්කා : මම කොයි තරම් පව්කරපු ගෑනියෙක් ද? මම හරියට පිස්සු ගෑනියෙක් වගේ කිසි ම සැලකිල්ලක් නැතුව හැම තිස්සෙ ම සල්ලි නාස්ති කෙරුව. මාව කසාද බැඳ ගත්ත මනුස්සයත් ඔහේ නිකමෙක් වගෙ හිටිය. එයා කරපු එකම දේ තමයි ණයට වැටුණ එක. මගේ ස්වාමියා ෂැම්පේන් බීල ම මැරිලා ගියා. එයා බීමට නම් රුසියෙක්. ඊට පස්සෙ මගෙ අවාසනාවට මම තවත් මිනිහෙකුට ආදරේ කරන්න පටන් අරගෙන, ඒ මිනිහත් එක්ක දීග ගියා. එතකෙට ම තමයි මගේ පළමු දඬුවම - අන්තිම දරුණු හෙණ ගෙඩිය - මගෙ ඉහට පාත් වුණේ. මගේ පුංචි කොලු පැටියා දියේ ගිලිල මැරුණ... ඔය පේන ගඟේ, ඊට පස්සෙ මම කවදාවත් මේ ඉඩමේ පස් නො පාගන්ට හිතාගෙන, මේ ගඟ කවදාවත් මගේ ඇහෙට නොපෙනෙන්ට හිතාගෙන, පිටරට ගියා. මම මගේ ඇස්දෙක පියාගෙන හරියට තෝනතුවාවෙන් වගෙ මේවා ඔක්කොම අතැරල දාල මෙතනින් පලා ගියා. ඒත් අර මිනිහත් මා පස්සෙන්ම දුවගෙන ආව; මට කිසි අනුකම්පාවක් නැතුව. ඒ මිනිහා ලෙඩ වුණා. ඒ පාර මම මෙන්ටොන්වලින් බංගලාවක් එක්ක ඉඩමක් සල්ලිවලට අර ගත්තා. එදා ඉඳලා අවුරුදු තුනක් තිස්සේ අර මනුස්සයට සාත්තු සප්පායම් කරමින් දවල් රෑ දෙකේ ම වෙහෙසෙන්ට වුණා. අර ලෙඩ මනුස්සයා මට දසවද දුන්නා. මගෙ රිරිමාංශෙත් දිය වෙලා ගියා. මගෙ ණයතුරුස් ගෙවල දාන්න. ගිය අවුරුද්දෙ, ඒ බංගලාවයි ඉඩමයි විකුණලා දාලා මම පැරිසියට ගියා. එහෙදි මාව අන්තිමට නට්ටං කරල, අර මිනිහ මාව දාල වෙනත් ගෑනියෙක් එක්ක යන්න ගියා. ඒ පාර මම වහ බොන්න උත්සහ කළා. මේවා ඔක්කොම කොයි තරම් මෝඩ නින්ද සහගත දේවල් ද? එක පාරට ම මට

රුසියාව- මගේ මව් රටට මගේ පුංචි කෙල්ලත් එක්කල ආපහු එන්න ආසාවක් ඇති වුණා. (ඇගේ කඳුළු පිස දමමින්) අනේ දෙවියනේ මට කරුණා කරන්න ඕනේ. මගේ පව්වලට සමාව දෙන්න ඕනෙ. මට මීට වැඩිය නම් දඬුවම් කරන්න එපා දෙවියනි. (ඕ සාක්කුවෙන් විදුලි පුවතක් අතට ගනී) මට මේක අදයි ලැබුණේ පැරිසියෙන්. අර මිනිහා මගෙන් සමාව ඉල්ලල ආපහු එහෙ එන්න කියල තියෙනව. (විදුලි පුවත ඉරා දමමින්) සංගීතයක් ඇහෙනව වාගෙ නේද? (ඕ ඊට සවන් දෙයි)

---

## 13. චෙරි වත්ත- රංජිත් ධර්මකීර්ති (පරි)

ට්‍රොෆි : මනුෂ්‍යා වර්ගයා ටිකෙන් ටික පරිසමාප්තියට පත් වෙමින් ඉදිරි ගමනක යෙදිලා ඉන්නව. අපිට අදල බාගන්න බැහැයි කියල හිතන බොහොම දේවල් මිනිස්සුන්ට කවද හරි ලබා ගන්න පුළුවන් වෙනව. ඒත් ඒකට අපි වැඩ කරන්න ඕනෙ. සත්‍ය ගවේෂණයේ යෙදිල ඉන්න මිනිස්සු පිටිපස්සේ වැටිල අපිත් උපරිම ශක්තිමත් යොදවන්න ඕනෙ.දැනට රුසියාවේ ජීවත් වන මිනිසුන් අතරින් වැඩ කරන්නෙ ටික දෙනයි. මම අඳුනන උගත් මිනිසුන්ගේන් වැඩි දෙනා කිසිම අලුත් දෙයක් හොයා ගෙන යන්නෙ නෑ. කිසිම වැඩක් කරන්නෙ නෑ. වැඩ කරන්න අදක්ෂකයි. ඒ කට්ටිය මහ ලොකුවට කියා ගන්නව අපි 'බුද්ධිමතුන්ය' කියල. ඒත් මිනිස්සු තමුන්ගෙ වැඩකාරයන්ට කතා කරන්නෙත් බොහොම සැර පරුෂ විදියටයි. ගොවියන් ට සලකන්නෙ සත්තුන්ට වාගෙයි. කිසි දෙයක් ඉගෙන ගන්නෙ නෑ. වැදගත් යමක් කියවන්නෙ නෑ. ඔහෙ නිකන් උඩ බලාගෙන ඉන්නවා. විද්‍යාව ගැන නම් කතා කරනව. ඒත් කලාව ගැන මෙලෝ හසරක් දන්නෙ නෑ. එක්කෝ දන්න දේ ටිකයි. හැබයි ඒ ගොල්ලෝ බොහොම තැන්පත් ගැඹුරු මිනිස්සු වාගෙ පෙනී හිටින්න හදනව. මූණුවල තියෙන පෙනුම බොහොම බැරෑරුම්. වැදගත් මාතෘකා ගැන කතා කරමින් තමුන් ගෙ දාර්ශනික මතවාද ඉදිරිපත් කරනවා විතරයි. ඒ අතරෙ කම්කරුවො කන්නෙ බොන්නෙ බොහොම තුච්ච විදියට. ඉහට කොට්ටයක්වත් නැතුව කිටි කිටියෙ හිරවෙලා ජරා ගොඩවල්වල නිදා ගන්නවා. එක කාමර කෑල්ලක හතලිස් දෙනෙක් විතර එකට ගුලි වෙලා නිදා ගන්නව. හැම තැන ම මකුණො පිරිල. ගඳ ගහනවා, සීතලයි, දුරචාරය. අපේ මේ බුද්ධිමත් සකච්ඡා අපේ අවධානයක්, අනිත් මිනිසුන්ගෙ අවධානයත් වෙන පැත්තකට හරවන්න විතරයි. ඒ බව නම් ඉතාම පැහැදිලියි. මහ ලොකුවට කතා කරනව ළදරු පාසල් ගැන! කෝ ඒව? පුළුවන් ද මට ඒව පෙන්නන්න ? ඔය කියන කියවීම් ශාලා! කොයි ලොකෙ ද තිනෙනෙ ? ඔව නිකං මිනිස්සු නවකතා වල ලියන දේවල් විතරයි. ඔව නිකං මිනිස්සු නවකතාවල ලියන දේවල් විතරයි. ඔව ඇත්ත ජීවිගේ පවතින දේවල් නොවේ. හැබැහින් තියෙන්නෙ දහජරාව. අශිෂ්ටත්වය, ග්‍රාම්‍යත්වය විතරයි. මම ඔය බැරෑරුම් මුහුණුවලට කැමති නෑ. මට ඒව පෙන්නන බෑ. ඔය ගැඹුරු සාකච්ඡාවලට මම කැමති නෑ. අපි කටවල් වහගෙන ඉන්නව වඩා හොඳයි.

---

## 14. විකෘති - සෝමලතා සුබසිංහ

සරණ : ඒ කාලයේ දොරවක මහා විද්‍යාල පහළ ස්කෝලෙ දක්ෂම ශිෂ්‍යයා මම. ගුරුවරු මට හරි ආදරෙයි. මං පහේ පංතියට පාස් උණාම ලොකු ස්කෝලෙ මහත්තයා කිව්ව මාව ශිෂ්‍යත්වයට තියෙනව කියල. ලොකු ස්කොලෙ මහත්තය මට හැමදාම හවසට වැඩිපුර ඉගැන්නුව. පහේ ශිෂ්‍යත්ව විභගෙ මං

ඉහළින්ම පාස් උණා.ලොකු ස්කෝලෙ මහත්තය අපේ අම්මව ස්කෝලෙට ගෙන්නුව."මේ සරණපාල බොහෝම ඉහළින් විභාගෙ පාස් වෙලානෙ. ලොකු හපන්කමක් කරල තියෙන්නේ පුංචි උනාට. මෙයාට යන්න පුළුවන් රටේ ලොකු ලොකු තානාන්තරවල අය ඉගෙන ගත්තු ඉස්කොලෙකට. ඒක තියෙන්නෙ කොළඹ. මෙයාට යන්න අවශ්‍ය මූලික වියදම් උනත් දෙන්න කැමතියි අපේ ගුරු මණ්ඩලය"

එතකොට අපේ අම්ම,

"අනේ මේ හය හතර නොතේරෙන කොල්ල ඔච්චර ඈතක අරින්නේ කොහොමද? වැඳල කියන්නම් ඉස්කෝලෙ මහත්තයො මේකව මේ ස්කෝලෙම තියාගන්න" කිව්ව.

අපේ අම්මල හරි අහිංසකයි. ශිෂ්‍යත්ව විභාග විශ්ව විද්‍යාල ඕව මොනවද ඒ අයට තේරෙන්නෙ නෑ. උඹ දන්නවනෙ අපේ විල්සොන් මාම...? අර පිටකොටුවෙ එළවළු ලෑල්ලක් දාගෙන ඉන්න ඉන්නෙ? මාමා කිව්වා, "අපේ එකෙක් රෝයල් කොලීජියට යනවනම් මොන තරම් නම්බුවක්ද?

උඹට බැරියෑ පුතේ එහෙ ඇවිත් ඔය තියෙන විදියකට කාලා බීල ඉන්න" කියලා. මාම විතරක් නෙමෙයි, අපේ මුළු ගමම ආඩම්බර උණා ගමෙන් එකෙක් රෝයල් කොලීජියට යනව කියලා. ඕං ඔහොමයි මං කොළඹට ආවේ.

උසස් පෙළ විභාගයට ඉගෙන ගනිද්දී මහන්සි වෙන්න අවශ්‍ය ප්‍රමාණවත් පාඩම් කරන්න අවශ්‍ය ප්‍රමාණයවත් පාඩම් කරන්න අවශ්‍ය පහසුකම් ගැනවත් අපේ අම්මලට කිසිම අවබෝධයක් නෑ. අනිත් එක මං ඉන්න තැන මට පාඩම් කරන්න තරම් නිස්කලංකයක්වත් නැනේ. ඒත් මං පුළුවං දහිරිය දාලා පාඩම් කළා. ඒත්....

## 15. තාරාවෝ ඉගිලෙති - ලූෂන් බුලත්සිංහල

පිනා - මාගේ නම පුණ්‍යසිරි! පිනට ශ්‍රියාව වුයේ කිමෙක් ද හෝ පුණ්‍යසිරි නම් වන්නේය! ඒත් ආදරේට මට කියන්නේ පිනා කියලා. සමහරු මට පින්බඩා කියලත් කියනව. මොකද කෑම මේසෙකට වාඩි වෙන්න මට පින පෑදුනොත් මගේ බඩට කෑම වැටෙනව දැකල මේසෙ හූල්ලනව. (ප්‍රේක්ෂකයෙකු අමතමින්) ඔහේ කැමතිද ඔහේගෙ පැත්තට තව එක මිනිහෙක් දිනා ගන්න? ඔහෙගෙන් පැනල යන්න හදන මිනිහෙක් දම්වැලකින් වගේ බැඳල තියා ගන්න? ලොක්කෙකුට කියල කරව ගන්න. මෙන්න ටිප් එකක්. හොඳම දේ තමයි කන්න බොන්න දෙන එක. උස්මුරුත්තාවට එනකං කන්න බොන්න දෙන එක. කවදාවත් වෙනස් වෙන්නෙ නැහැ. යන්න ගිය එකා හැරිලා එනව. හැරෙන්න ගිය එකා කැරකිලා එනව. සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා කියල බුදු හාමුදුරුවො කිව්වෙ නිකං නොවෙයි. ආහාරය කියන්නෙ පුදුම හාස්කම් තියෙන බඩුවක්. ඒකෙන් පුළුවන් තියෙන ආණ්ඩු පෙරලන්න. පෙරලුනු ආණ්ඩු පිහිටුවන්න.

ආ...... මං මේ ආවේ මගේ ප්‍රාණ සමාන මිත්‍රයා හොයාගෙන. සිංගප්පූරුවේ ඉන්න සිංහල වෙළෙන්දන්ගෙන් හිත හොඳම එකම එක මිනිහා තමයි මගේ යාලුවා. විජේ. යමක් කමක් තියෙන කොයි මිනිහත් වගේම මගේ යාළුවත් කැමතියි තමන්ගෙ දුක් ගන්නා රාළ කෙනෙක් ලඟින් ඉන්නවට. ඒකට තමයි මේ මං ඉන්නෙ. මොකද මං දුප්පත්. කොයි පෝසත් යාලුවත් දුප්පත් යාළුවෙකුට හුඟක් කැමතියි. කන්න ටිකක් දෙනව. කීයක් හරි අත මිට මොලවනව. පුංචි පහේ උදව්වක් කරනව. දුක සැප බලනව. හැබැයි යාළුවට පෝසත් වෙන මාර්ගය නම් කියල දෙන්නෙ නැහැ. කවදාවත් ඒක දැනගන්න හදන්නත් එපා. නාග මාණික්‍ය උණත් සිතූ පැතූ සම්පත් දෙන්නේ උරගෑවහමලු. පෝසත් යාලුවෙකුගෙන් උදව්වක් ගන්නත් පුළුවන් ඒ වගේ මූණ ගැහෙන මූණ ගැහෙන මිනිහ අතේ යාළුවා ගැන ප්‍රශස්ත ගී බන්දල ප්‍රචාරය කරන්න ඕනෙ. විශ්වාස කරන්න මගේ යාළුව කෑම මේසයක් ඇරියොත් ඒක හරියට සූප ශාස්ත්‍රයම ගෙනත් එක තැන ගොඩ ගැහුව වගේ. ඒකෙ උඩම තියෙන දේ ගන්න පුටුවක් උඩට නැගලම බලන්න ඕනෙ. මං කවදාවත් යාළුවගෙ ගෙට ගොඩ වෙන්නෙ නැහැ. මොකද හොඳ යාලුවෙකුට හොඳ ගෑණියෙක් ඉන්න බැරි විත්තිය මං දන්න හින්දා. ආ..... යාලුවගෙ ගෙදර දොර නම් ඇරෙනව. බලමු කව්ද එළියට බහින්නෙ කියල. බොලේ මගෙ යාලුව විජේ නේන්නං.

---

## 16. වෙළෙන්දාගේ මරණය - සේනාරත්න වීරසිංහ (පරි)

බීෆ් - (කලබලයෙන් නැගිටමින්) හැපි මේ අහපන් මං යුද්දෙට ඉස්සර ගෙදරින් ගියදා ඉඳන් නොයෙකුත් ජාතියේ අස්සාවල් විස්සකට තිහකට වඩා කළා. ඒත් ඒ හැම එකක්ම ඉවර උනේ එකම විදියට. මට පස්සෙයි ඒක තේරුම් ගන්ඩ පුලුවන් වුණේ. නැබ්රෙස්කාවලදී මම හරක් රංචුවක් බැලුවා. ඊට පස්සෙ ඩැකෝඩාවලදිත් පස්සේ ඇරිසෝනාවලදිත් ඒ ජොබ් එකම කළා. දැන් ටෙක්සාස්වල කරන්නෙත් ඒකමයි.ඒක මට තේරුම් ගන්ඩ පුලුවන් වුණ හින්දයි ආපහු දමල ගහල ගෙදර ආවේ. මම වැඩ කරපු ගොවිපළට මෙලහකට ගිම්හාන කාලෙ ඇවිත්. බලපන් උන් මෙලහකට අශ්ව නාම්බො පහළොවක් මිලට අරන් වෙළඹගෙයි අශ්ව නාම්බගෙයි දර්ශනය කියන්න බැරි තරම් සුන්දරයි. ඒ වගේ ලස්සන දර්ශනයක් නැවත කිසි කලෙක දක්නට ලැබෙන්නෙ නැහැ. ඒ වගේ මෙලහතට එහෙ හරිම ප්‍රියංකරයි.ඔව්, ටෙක්සාස්වලට මේ තමයි නියම කාලේ. මිහිරැති ගිම්හාන කාලේ. ඉතිං මට වසන්ත කාලේ ළං වෙන කොට හිතෙනව අනේ දෙයියනෙ, මෙහෙට වෙලා තැපිල්ලෙන් කිසි වැඩක් නැහැ කියල. සතියකට ඩොලර් 25ක් හොයා ගන්ඩ අශ්වයො එක්ක ඔට්ටු වෙවී මේ නටන්නේ මොන නාඩගමක්ද කියල හිතෙනව. දැන් මට අවුරුදු තිස් හතරක්. ඉතින් දැන්වත් මම මගේ අනාගතය හදා ගන්ඩ ඕනෑ කියල හිතනව. එහෙම හිතල මම ආපහු ගෙදර දුවගෙන එනව. ඔහොම ඇවිත් මේ ගෙදරට වැදුනට පස්සේ මම කළ යුත්තෙ මොකක්ද කියල අන්දෝසංසාරයක් මට තේරෙන්නේ නැහැ. (සුසුමක් හෙළමින්) මම නිතරම හිතේ තියාගෙන ඉන්නේ නිකරුණේ කාලෙ නාස්ති නොකර මොනව හරි වැඩක් කරන්ඩ ඕනෑ කියල. ඒත් ගෙදරට වැදුන ගමන් මට හිතෙන්නේ මෙච්චර කාලයක් නිකන් නිස්කාරනේ ගෙවල දැම්ම නේද කියල.

බීෆ් - කෙළෙහි ගුණයක් නැති පාහර හැත්ත

ලින්ඩා - ඒ මිනිස්සු පුත්තු තරම් ම කෙළෙහි ගුණයක් නැති අය නොවෙයි. එයා තරුණ කාලෙයි කොම්පැණිය පටන් ගත්තේ. ඒ කාලෙ කොම්පැණිය එයාට හොඳට සලකල තියෙනව.නමුත් එදා එහෙම සලකල ගෞරව කරපු මිනිස්සු ඇත් එයාට රිදවනව. නොයෙක් කෙනෙහෙළිකම් කරනව එයා පුරුදු වෙලා හිටියෙ ටෙලිපෝන් කෝල්වලින් ගණුදෙනු කරන්න. බොස්ටන්වලට දවසට කෝල් හය හතක් දානව. නමුත් දැන් එයාට සිද්ධ වෙලා තියෙනව ඔක්කොම බඩු ටික කාරෙකේ පටවගෙන තැන් තැන් ගානේ අරන් යන්ඩ. එහෙම තැන් තැන් ගානේ ගිහින් ගිහින් දැන් එයා හොඳටම හෙම්බත් වෙලා. ඉතිං එහෙම හැතැප්ම සිය ගණනක් කාරෙක පැදගෙන බඩු ටික එතනට ගෙන ගියාම සමහර ගැනුම් කාරයො එයාව තඹේකට ගණන් ගන්නේ නැහැ. බඩු ටික දිහා ඇස් ඇරලවත් බලන්නේ නැහැ. ඉතිං එහෙම හැතැප්ම සිය ගණනක් කාර් පැදල හිස් අතින් ආපහු ගෙදර එන්ඩ උනාම මිනිහෙකුට මොනව හිතෙනව ඇත්ද? එහෙම එක එයා තමන්ටම කතා

කර ගන්න එක අරුමටක්ද? ඇයි? චාලි ළඟට ගිහිල්ල ණයට සල්ලි ඉල්ල ගන මෙන්න මම සතියකට ඩොලර් පණහක් හම්බ කළා කියල නොකිය ඉදියිද? ඉතිං මෙහෙම තව කොච්චර කාලයක් ගෙවන්නද? කොච්චර කාලයක් දුක් විඳින්ඩද? උඹල දන්නවද මම කොච්චර කාලෙක ඉඳල මේවා උහුලගන ඉන්නවද කියල. ඒ මදිවට උඹල එයා හොඳ මිනිහෙක් නෙවෙයි කියල කියනව. මතක තියා ගනිල්ල එයා කවදාවත් නිවාඩු නොගෙන උඹල වෙනුවෙන් එක දිගට වැඩ කරල තියෙනව. ඒකට එයාට සම්මාන ලැබුණද? ඔව් මේ තමයි ඒකට ලැබුණු එකම සම්මානය. ඔව් අවුරුදු හැටතුනක් තිස්සේ දහදුක් විඳල තමන්ගේ ජීවිතයටත වඩා දරුවන්ට ආදරේ කරල අන්තිමට පුත්තුගෙන් ලැබුණ සම්මානය මේක තමයි. අවලම් බල්ලෝ.....

### අ.පො.ස. උ/පෙළ විභාගය
### ප්‍රායෝගික පරීක්ෂණය (නාට්‍ය හා රංග කලාව)

**සවිස්තර ලකුණු ප්‍රදාන පත්‍රිකාව** (නිදර්ශනාත්මක මූලාකෘතියකි)

**විභාග අංකයඃ-** .....................................................

| A, B සහ C කොටස්වල ඇගයීම් සඳහා ප්‍රදානය කරන ලකුණ | | | | | | | ඇගයීමට ලැබූ ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| 5- විශිෂ්ට යි / 4- ඉතා හොඳ යි / 3-හොඳ යි / 2-වැඩි දියුණු කළ යුතු යි / 1-දුර්වල යි / 0 -ඉතා දුර්වල යි | 5 | 4 | 3 | 2 | 1 | 0 | |

**අයදුම්කරු අනිවාර්යයෙන් ඉදිරිපත් විය යුතු ඇගයීම්**

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| **A-1-1 ඇගැයීම** | කටහඬ නිපුණතාව | | √ | | | | | **ලකුණු** |
| | පෙළ ස්මරණය | | | √ | | | | |
| | චරිත නිරූපණය | | √ | | | | | 16 |
| | ප්‍රේක්ෂක සහසම්බන්ධය | | | | | √ | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| **A-1-2 ඇගැයීම** | කටහඬ නිපුණතාව | | | | √ | | | **ලකුණු** |
| | භාවාත්මක නිරූපණය | | | | √ | | | 04 |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| **A-2 ඇගැයීම** | කටහඬ නිපුණතාව | | | | | | | **ලකුණු** |
| | නාට්‍යෝචිත අවස්ථාව ගොඩනැංවීම | | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | | | | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| **A-3 ඇගැයීම** | කටහඬ නිපුණතාව | | √ | | | | | **ලකුණු** |
| | ඉදිරිපත් කිරීමේ නිපුණතාව | | √ | | | | | 13 |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතයු | √ | | | | | | |

අයදුම්කරු තෝරාගත් ඇගයීම (තෝරාගත් ඇගයීමට අදාල අවකාශයේ පමණක් ලකුණු සටහන් කළ යුතු ය.)

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| **B-1 ඇගැයීම** | සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම | | | | √ | | | **ලකුණු** |
| | මනෝභාවික අන්තර්ගතය | | | | | √ | | 08 |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | | | √ | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| **B-2 ඇගැයීම** | සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | | | | | | **ලකුණු** |
| | මනෝභාවික අන්තර්ගතය | | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **B-3** **ඇගැයීම** | චරිතයට අදාල සංවාද හා ගායනා ආශ්‍රිත කටහඬ නිපුණතාව | | √ | | | | | **ලකුණු** |
| | චරිතයට අනුකූලවීම | | √ | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | √ | | | | | | |

අයදුම්කරු තෝරාගත් ඇගයීම (තෝරාගත් ඇගයීමට අදාල අවකාශයේ පමණක් ලකුණු සටහන් කළ යුතු ය.)

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **C-1** **ඇගැයීම** | 1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම | | | | | | | ලකුණු |
| | 2. මුහුණේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා අනුව හඳුනා ගැනීම | | | | | | | 13 |
| | 3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **C-2** **ඇගැයීම** | 1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම | | | | | | | ලකුණු |
| | 2. ශරීරයේ කොටස් පිළිබඳ අවබෝධය සහ චරිතයට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම | | | | | | | |
| | 3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **C-3** **ඇගැයීම** | 1. ශෛලිය, යුගය, නිෂ්පාදනයේ ස්වරූපය හා කාලීන බව හඳුනා ගැනීම | | | | | | | ලකුණු |
| | 2. රංග අවකාශය පිළිබඳ අවබෝධය සහ ජවනිකාවට අදාල සුවිශේෂතා හඳුනා ගැනීම | | | | | | | |
| | 3. නිර්මාණ සැලසුම්කරණය හා දෘශ්‍ය සන්නිවේදනය | | | | | | | |


| **D කොටස සඳහා ප්‍රදානය කරන ලකුණු** | | | | | | | ඇගයීමට ලැබූ ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| 5- විශිෂ්ට යි / 4- ඉතා හොඳ යි / 3-හොඳ යි / 2-වැඩි දියුණු කළ යුතු යි / 1-දුර්වල යි / 0 -ඉතා දුර්වල යි | 5 | 4 | 3 | 2 | 1 | 0 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| D ඇගැයීම | B කොටසේ ක්‍රියාකාරකම ආශ්‍රිත දැනුම හා අවබෝධය | | | | √ | | | **ලකුණු** |
| | C කොටසේ ක්‍රියාකාරකම ආශ්‍රිත දැනුම හා අවබෝධය | | | | √ | | | 04 |


| ඇගැයීම | A-1.1 ඇගැයීම | A-1.2 ඇගැයීම | A-2 ඇගැයීම | A-3 ඇගැයීම | B-....... ඇගැයීම | C-....... ඇගැයීම | D-....... ඇගැයීම | **ලකුණු එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|
| ලබා දිය හැකි උපරිම ලකුණු | 20 | 10 | 15 | 15 | 15 | 15 | 10 | 100 |
| අයදුම්කරු ලබා ගත් ලකුණ | 16 | 04 | 14 | 13 | 08 | 13 | 04 | 72 |

ප්‍රධාන පරීක්ෂකඃ...................... සහකාර පරීක්ෂක :.......................... සහකාර පරීක්ෂක :..........................


C1 ඇඟැයීම අංග රචන නිර්මාණ සැලසුම



## C2 ඇගැයීම : රංග වස්ත්‍ර නිර්මාණ සැලසුම



C2 ඇගැයීම : රංග වස්ත්‍ර නිර්මාණ සැලසුම



C 3 ඇගැයීම වේදිකා පසුතල නිර්මාණ සැලසුම (ඉහළින් පෙනෙන දර්ශනය) (Birds eye view)

| | | |
|---|---|---|
| ඉහළ වම | ඉහළ මැද | ඉහළ වම |
| දකුණ | මැද | වම |
| පහළ දකුණ | පහළ මැද | පහළ වම |

C 3 ඇගැයීම වේදිකා පසුතල නිර්මාණ සැලසුම (ප්‍රේක්ෂකාගාරයේ සිට පෙනෙන දර්ශනය)

(වේදිකාව)

# (59) - Drama and Theatre (English)

Structure of the paper.

**Paper I** - **Ancient/Eastern Drama and theatre**

**Time: 3 hours** (In addition, 10 minutes for reading)

This paper consists of **two** parts.

Part I - **40** multiple choice questions of **5** options. All questions have to be answered. **01** mark for each question. Total marks **40**

Part II - This part consists of two sections.

**Section A** - Three structured essay type questions.

**Section B** -Three structured essay type questions.

Selecting **two** questions from each section, **four** questions have to be answered. Each question carries **15** marks. Total marks **60.**

Total marks for paper I = 100

**Paper II** - **Western/Foreign Drama and Theatre**

**Time: 3 hours** (In addition, 10 minutes for reading)

This paper consists of two parts.

Part I - **40** multiple choice questions of **5** options. All questions have to be answered. **01** mark for each question. Total marks **40**

Part II - This part consists of two sections.

**Section A** - Three structured essay type questions.

**Section B** - Three structured essay type questions.

Selecting **two** questions from each section, **four** questions have to be answered. Each question carries **15** marks: total marks **60.**

Total marks for paper II = 100

**Practical Examination**

The Practical Evaluation consists of two sections, A and B.

A - Acting - 75 marks
B - Oral Test - 25 marks

Total marks for practical examination: 75 + 25 = 100.

**Calculation of final mark :**

| | | |
|---|---|---|
| Paper I | = | 100 |
| Paper I I | = | 100 |
| Practical Examination | = | 100 |
| Final Mark | = | 300 ÷ 3 = 100 |

# (59) - Drama and Theatre (English)

## Paper 1

**Part I** - Answer **all** questions on this paper itself and attach it to the answer scripts of **Part II**

**Part II** - Select **two** questions from each section and answer only **four** questions.

---

## Part I

- Select the correct or most appropriate answer and write its **number** in the space provided at the end of each question.

**1.** The Golden Age of Greek drama was in Athens in the
(1) 2nd century. (2) 3rd century. (3) 4th century.
(4) 5th century. (5) 6th century.
(......)

**2.** The first recorded actor was
(1) Pratinas. (2) Choerilus. (3) Thespis.
(4) Phrynichus. (5) Euripedes.
(......)

**3.** The number of dramatic genres in ancient Greece was
(1) two. (2) three. (3) four.
(4) five. (5) six.
(......)

**4.** In Aristotle's analysis of Greek tragedy, " peripeteia" referred to,
(1) purgation. (2) reversal. (3) recognition.
(4) miscalculation. (5) representation. (......)

**5.** The forte of Sophocles was
(1) comedy. (2) farce. (3) burlesque.
(4) history. (5) tragedy.
(......)

**6.** One of the iconic conventions of classical Greek theatre is the use of
(1) drums. (2) masks. (3) harps.
(4) flutes. (5) lyres.
(......)

**7.** The father of Indian theatrical art forms is
(1) Dandin. (2) Kalidasa. (3) Viswanatha.
(4) Dhananjaya. (5) Bharata.
(......)

**8.** **The Little Clay Cart** was composed by
(1) Bhasa. (2) Dandin. (3) Shudraka.
(4) Kalidasa. (5) Sri Harsha. (......)

**9.** The great Sanskrit play, **Ratnavali**, was composed by
(1) Neelakantha. (2) Kalidasa. (3) Shaktibhadra.
(4) Sri Harsha. (5) Kulasekhara.
(......)

**10.** The **Natya Shastra** was written by
(1) Kalidasa. (2) Ediriwira Sarachchandra. (3) Bharata.
(4) Dhananjaya. (5) Henry Jayasena.
(......)

**11**. Vasantasena is the heroine of the play
(1) Balacharita. (2) Svapna Vasavadattam. (3) Dutavakya.
(4) Mricchakatika. (5) Pratimanataka.
(......)

**12**. The three classical unities in a play are
(1) time, place, action. (2) time, place, situation.
(3) situation , place, action. (4) place, action, plot.
(5) place, situation, plot.
(......)

**13**. 'Tragedy was the imitation of an action' was the view of
(1) Cicero. (2) Plato. (3) Aristotle.
(4) Donatus. (5) John Tzetzes.
(......)

**14.** Mimesis refers to
(1) acting. (2) audience reaction. (3) prompting.
(4) stage properties. (5) imitating reality.
(......)

**15.** A good drama critic should be
(1) independent. (2) courageous. (3) merciless.
(4) constructive. (5) encouraging.
(......)

**16.** There cannot be a dramatic performance without
(1) a director. (2) a script. (3) an actor/actress.
(4) a stage manager. (5) a prompter.
(......)

**17.** The chief characteristic of tragedy is
(1) to create depression in the audience. (2) the downfall of the protagonist.
(3) the death of the protagonist. (4) the projection of unrealities.
(5) the use of the chorus.
(......)

**18.** The place where Sokari is performed is a/an
(1) arena. (2) rostrum. (3) stage.
(4) platform. (5) threshing floor.
(......)

**19**. Sokari is
(1) an exorcist ceremony. (2) pure farce. (3) comedy.
(4) a fertility rite. (5) social satire.
(......)

**20.** The **Nadagama** appears to have come into vogue about the
(1) mid 18th century. (2) last quarter of the 18th century.
(3) beginning of the 19th century. (4) second quarter of the 19th century.
(5) third quarter of the 19th century.

(......)

**21.** Kolam survives today chiefly in the
(1) coastal townships in the South. (2) dry zone. (3) Western Province.
(4) Central Province. (5) North Central Province.

(......)

**22.** A performance of traditional Nadagam goes on throughout
(1) the day. (2) the morning. (3) the afternoon.
(4) the evening. (5) the night.

(......)

**23.** The pioneer director in the English-language theatre of Sri Lanka was
(1) Robert Nicholl Cadell. (2) Leigh Smith. (3) E.F.C. Ludowyk.
(4) Rudi Corens. (5) Neumann Jubal.

(......)

**24.** The first play by Bertolt Brecht to the staged in Sri Lanka was
(1) The Caucasian Chalk Circle. (2) Mother Courage.
(3) The Good Women of Setzuan. (4) The Life of Galileo.
(5) The Threepenny Opera.

(......)

**25.** **Hunuwataye Kathawa** was a triumph for
(1) Sugathapala de Silva. (2) Sunanda Mahendra. (3) Henry Jayasena.
(4) Dayananda Gunawardana. (5) Premaranjitt Tilakaratne.

(......)

**26.** The Mecca of theatre in Sri Lanka at present is
(1) The Tower Hall. (2) The Lionel Wendt Theatre.
(3) The Elephinstone Theatre. (4) The John de Silva Theatre.
(5) The Bishop's College Auditorium.

(......)

**27.** **Ravanesan** is a well-known Tamil play by
(1) Professor S. Mannaguru. (2) Professor K. Sivathamby.
(3) Professor S.Vithiananthan. (4) Professor K. Kailasapathy.
(5) Professor S.Thillainanthan.

(......)

**28.** The pioneer of the modern Tamil-language theatre in Sri Lanka was
(1) Professor S. Vithiananthan. (2) Professor S.Maunaguru.
(3) Professor K. Sivathamby. (4) Professor S.Thillainanthan.
(5) Professor K.Kailasapathy. (......)

**29.** The pioneer of the modern Sinhala-language theatre was
(1) Dayananda Gunawardana. (2) Ediriwira Sarachchandra. (3) Henry Jayasena.
(4) Sugathapala de Silva. (5) Premaranjith Thilakaratne.

(......)

**30.** The classic song **Danno Budunge** was first sung in the play
(1) Ratnawali. (2) Vella Vahum. (3) Vessantara.
(4) Kada Walalu. (5) Siri Sangabo.
(......)

**31.** **Danno Budunge** was composed by
(1) John de Silva. (2) Lakshmi Bhai. (3) S.Mahinda Thero.
(4) Piyadasa Sirisena. (5) Rukmani Devi.
(......)

**32.** The most famouse actress in the Minerva Troupe was
(1) Lady Susantha de Fonseka. (2) Mabel Blythe. (3) Iranganie Serasinghe.
(4) Rukmani Devi. (5) Lakshmi Bhai.
(......)

**33.** " The benevolent despot" refers to
(1) the playwright. (2) the producer. (3) the director.
(4) the stage manager. (5) the prompter. (......)

**34.** **Vikurti** was a play written and directed by
(1) Athula Pathirana. (2) Sunanda Mahendra. (3) Somalatha Subasinghe.
(4) Sarath Kothalawala. (5) Sugathapala de Silva.
(......)

**35.** **Vikurti** focuses on the problems of
(1) youth. (2) adolescents. (3) adults.
(4) the middle aged (5) the elderly.
(......)

**36.** The Tomiya series of plays was brainchild of
(1) Eruest Macintyre. (2) Regi Siriwardana.
(3) Ruwanthie de Chickera. (4) IJndu Dharmasena.
(5) R.D.K. Jayawardena. (......)

**37.** **The Ritual** was produced by
(1) Michael de Soyza. (2) Neidra Williams. (3) Tracy Holsinger.
(4) Vinodh Senadeera. (5) Jehan Aloysius.
(......)

**38.** **The Middle of Silence** was written by
(1) Senaka Abeyaratne. (2) Ruwanthie de Chickera. (3) Jehan Bastians.
(4) Regi Siriwardena. (5) Manuka Wijesinghe.
(......)

**39.** The character 'Ralahamy' was a creation of
(1) H.C.N de Lanerolle. (2) E.M.W.Josheph. (3) Dick Dias.
(4) H. Sri Nissanka. (5) V. Ariyaratnam
(......)

**40.** **He Comes from Jaffna** was written by
(1) Ernest Macintyre (2) V. Ariyaratnam (3) E.F.C. Ludowyk
(4) Jith Peiris (5) Regi Siriwardana
(......)

**

## Part II

- Select **two** questions from each section and answer only **four** questions.

---

### Section A

**1.** i. Describe the performance of any folk drama in Sinhala **or** Tamil. (05marks.)
ii. Describe the impact of social changes on folk drama in Sinhala **or** Tamil. (05 marks.)
iii. Can folk drama in Sinhala **or** Tamil be saved from extinction?
Explain your point of view. (05 marks.)

**2.** i. Explain the themes of Sarachchandra's **Sinhabahu.** (05marks.)
ii. Why do you think Sarachchandra chose such themes? (05 marks.)
iii. Explain your view of the character of Sinhabahu. (05 marks.)

**3.** i. Explain your view of the character of Oedipus. (05 marks.)
ii. Explain the part played by fate in the destiny of Oedipus. (05 marks.)
ii. What is tragic about the destiny of Oedipus. Explain. (05 marks.)

### Section B

**4.** i. Explain the resources available to a writer of comedy to generate humour. (05 marks.)
ii. Do you think good comedy is essentially serious?
Explain and illustrate. your point of view. (05 marks.)
iii. How would you rank comedy among the genres of drama? Explain and illustrate
your point of view. (05 marks.)

**5.** i. Discuss the taste of audiences for present-day Sinhala **or** Tamil **or** English
language plays. (05 marks.)
ii. Explain the factors that have, in your opinion, shaped this taste. (05 marks.)
iii. How have dramatists/producers approached the question of audience taste?
Illustrate. (05 marks.)

**6.** i. Discuss the character of Dushyanta in **AbhijnanaSakuntalam.** (05 marks.)
ii. Describe the character of Kanva. (05 marks.)
iii. Comment on the structure of the play. (05 marks.)

***

# (59) Drama and Theatre (English)

## Paper II

- Important:

**Part I** - Answer **all** question on this paper itself and attach it to the answer scripts of Part II.

**Part II** - Select **two** questions from each section and answers only **four** questions.

---

## Part I

- Select the correct or most appropriate answer and write its **number** in the space provided at the end of each question.

  - Using the following grid, answer questions **1-6**

| Author | Style | Title | Date |
|---|---|---|---|
| *A* | *B* | **Waiting for Godot** | *C* |
| Anton Chekov | *D* | *E* | *F* |

**1.** Identify the playwright to be noted in cage *A*.
(1) Reginald Rose. (2) Samuel Beckett. (3) Ted Hughes.
(4) Edward Albee. (5) Jean Genet.
(......)

**2.** Identify the style to be noted in cage *B*.
(1) Realistic. (2) Naturalistic. (3) Absurdist.
(4) Expressionist. (5) Epic.
(......)

**3.** What is the year to be noted in cage *C* ?
(1) 1940. (2) 1945. (3) 1950.
(4) 1955. (5) 1960.
(......)

**4.** Identify the style to be noted in cage D.
(1) Realistic. (2) Naturalistic. (3) Epic.
(4) Absurdist. (5) Burlesque.
(......)

**5.** What is the title to be noted in cage *E* ?
(1) Three Sisters. (2) The Seagull. (3) Ivanov.
(4) The Cherry Orchard. (5) Ghost Sonata.
(......)

**6.** What is the year to be noted in cage *F* ?
(1) 1895. (2) 1897. (3) 1899.
(4) 1901. (5) 1903.
(......)

**7.** Andrew Lloyd Weber, whose famous productions have been staged in Colombo too, is
(1) British. (2) American. (3) Canadian.
(4) Australian. (5) South African.
(......)

**8. The Founder and Artistic Director of the theater group Mind Adventures is**
(1) Feroze Kamardeen. (2) Michelle Perera. (3) Vinodh Senadeera.
(4) Tracy Holsinger. (5) Karen Balthazaar. (......)

**9**. **Everyman** is a famous
(1) miracle play. (2) mystery play. (3) liturgical play.
(4) morality play. (5) interlude. (......)

**10.** Miracle plays was performed
(1) inside the church. (2) outside the church. **(3)** in the courtyard.
(4) in an innyard. (5) in a public park. (......)

**11.** In his time, Shakespeare's plays were performed on
(1) a proscenium stage. (2) a circular stage. (3) a square stage.
(4) an apron stage. (5) a revolving stage. (......)

**12.** In his lifetime, Shakespeare's plays were performed in
(1) Stratford-upon-Avon (2) Oxford (3) Cambridge.
(4) Bristol. (5) London. (......)

**13**. Shakespeare's audience consisted of
(1) the working class. (2) the lower middle class. (3) the upper middle class.
(4) the upper class. (5) all classes. (......)

**14.** **Hamlet** was one of Shakspeare's famous
(1) tragedies. (2) comedies. (3) romances.
(4) histories. (5) Roman plays. (......)

**15.** The great majority of plays in Elizabethan times were written for the
(1) Court. (2) universities. (3) legal inns.
(4) innyards. (5) commercial theatres. (......)

**16.** The leading exponent of "the comedy of ideas" in early 20th century Britain was
(1) Henry James. (2) Aldous Huxley. (3) G. K. Chesterton.
(4) Bernard Shaw. (5) James Barrie.
(......)

**17.** The premier exponent of verse drama in 20th-century Britain was
(1) Christopher Fry. (2) W.H Auden. (3) T.S. Eliot.
(4) W.B.Yeats. (5) John Millington Synge. (......)

**18.** 'The problem play' in Western Europe was initiated by
(1) Anton Chekov (2) Henrik Ibsen.
(3) Frederico Garcia Lorca. (4) Luigi Pirandello.
(5) August Strindberg. (......)

**19.** 'The Epic Theatre' was an innovation of
(1) Bertolt Brecht. (2) Jean-Paul Sartre. (3) Jean Anouilh.
(4) Jean Genet. (5) Max Frisch. (......)

**20.** 'The Theatre of Cruelty' was an innovation of
(1) Jean Giradoux. (2) Geroge Buchner. (3) Eugene Ionesco.
(4) Gerhart Hauptmann. (5) Antoine Artaud. (......)

**21.** **The Bald Prima Donna** was written by
(1) Alfred Jarry. (2) Luigi Pirandello. (3) Henrik Ibsen.
(4) Eugene Ionesco. (5) Friedrich Durrenmatt. (......)

**22.** ' The comedy of menace' is the forte of
(1) John Mortimer. (2) John Hopkins. (3) David Mowat.
(4) Alan Sharp. (5) Harold Pinter. (......)

**23.** A fairly recent play produced by a Sri Lankan in English concerns the short stay in Sri Lanka of the famous European playwright
(1) Henrik Ibsen. (2) Bertolt Brecht. (3) August Strindlerg.
(4) Anton Chekov. (5) Luigi Pirandello. (......)

**24.** The title of the play mentioned in question no. 23 is
(1) Prometheus. (2) The Temptations of Paradise. (3) The Long Day's Task.
(4) Almsgiving. (5) The Mannequin. (......)

**25.** The author of the play mentioned in question no. 23 is
(1) Senaka Abeyratne. (2) Jehan Aloysius. (3) Manuka Wijesinghe.
(4) R.D.K. Jayawardena. (5) Regi Siriwardena.
(......)

**26.** The flashback as a technique was initiated in European drama by
(1) Anton Chekov. (2) Bertolt Brecht. (3) Henrik Ibsen.
(4) August Strindberg. (5) Antoine Artaud.
(......)

**27.** **An Enemy of the People** was written by
(1) Jean-Paul Sartre. (2) Jean Giradoux. (3) Max Frisch.
(4) Henrik Ibsen. (5) Anton Chekov.
(......)

**28.** **An Enemy of the People** was adapted in Sinhala as **Jana Hatura** by
(1) Namel Weeramuni. (2) Sunanda Mahendra.
(3) Ranjith Dharmakeerthi. (4) Dharmasiri Bandranayake.
(5) Henry Jayasena. (......)

**29.** The '**alienation effect**' was an innovation of
(1) Henrik Ibsen. (2) August Strindberg. (3) Anton Chekov.
(4) Bertolt Brecht. (5) Luigi Pirandello.
(......)

**30.** The character Azdak was created by
(1) Max Frisch. (2) Jean Paul Sartre. (3) Eugene Ionesco.
(4) Bertolt Brecht. (5) Gerhart Hauptmann.
(......)

**31.** The Theatre of the Absurd originated in
(1) U.K. (2) U.S.A. (3) France.
(4) Germany. (5) Norway. (......)

**32.** "Kitchen Sink" drama was a trend that arose in
(1) U.K. (2) U.S.A. (3) France.
(4) Germany. (5) Norway.
(......)

**33.** **The Fiddler on the Roof,** adapted in Sinhala as **Vadakaya Vahala Uda**, is best categorized as a
(1) comedy. (2) farce. (3) burlesque.
(4) vaudeville. (5) musical. (......)

**34.** Ranjith Dharmakeerthi's play **Angara Ganga Gala Basi** in an adaptation of
(1) It Happened in Irkutsk. (2) Lower Depths. (3) The Overcoat.
(4) The Cherry Orchard. (5) Doctor Zhivago.
(......)

**35.** The original play of **Angara Ganga Gala Basi** was written by
(1) Maxim Gorki. (2) Nikolai Gogol. (3) Boris Pasternak.
(4) Anton Chekov. (5) Alexei Arbuzov .
(......)

**36.** **Mother Courage,** a play adapted in Sinhala, was written by
(1) Federico Garcia Lorca. (2) J.M. Synge. (3) Dylan Thomas.
(4) Bertolt Brecht. (5) Antoine Artaud. (......)

**37.** The world's longest running play, **The Mousetrap,** is by
(1) Mickey Spillane. (2) Earle Stanley Gardner. (3) Sexton Blake.
(4) Ian Fleming. (5) Agatha Christie.
(......)

**38.** Estragon is a character in the path-breaking play
(1) Look Back in Anger. (2) Waiting for Godot. (3) The Balcony.
(4) The Birthday Party. (5) Long Day's Journey into Night.
(......)

**39.** The famouse novelist who wrote working-class plays, was
(1) D.H. Lawrence. (2) Joseph Conrad. (3) Henry James
. (4) E.M. Forster. (5) Rudyard Kipling.
(......)

**40.** **Funny Money**, a play staged in Colombo, was written by
(1) Ray Cooney. (2) Angus Wilson. (3) Arnold Wesker.
(4) Brendon Behan. (5) G.F. Newman. (......)

**

## Part II

- Select **two** questions from each section and answer only **four** questions.

---

### Section A

**1.** "The dramatic author is a lay preacher who hawks about the ideas of his time in popular form."

i. Comment on this statement. (05 marks.)
ii. Apply this statement to stylized drama in **either** Sinhala **or** Tamil **and explain** the results. (05 marks.)
iii. Apply this statement to realistic drama in Sinhala **or** Tamil **or** English. (05 marks.)

**2.** i. Comment on the character of Julius Caesar in Shakespeare's play. (05marks.)
ii. Comment on the character of Brutus in **Julius Caesar.** (05marks.)
iii. Explain the theme of the play. (05 marks.)

**3.** i. Explain how an actor/actress could prepare himself/herself to play a lead role. (05 marks.)
ii. Explain how a lead actor/actress could perform on stage during an actual performance in relation to his/her fellow players. (05 marks.)
ii. Explain how a lead actor/actress could perform on the stage during an actual performance in relation to the audience. (05 marks.)

### Section B

**4.** i. Discuss the role of foreign plays and musicals in the English-language theatre of Sri Lanka (05 marks.)
ii. Discuss the role of plays originally written in English by local dramatists. (05 marks.)
iii. Explain the paucity of such plays. (05 marks.)

**5.** i. Analyses the character of Nora in **A Doll's House.** (05 marks.)
ii. Analyses the character of Torvald Helmer in **A Doll's House.** (05 marks.)
iii. Explain the significance of the conclusion of **A Doll's House** for Ibsen's society and for ours. (05 marks.)

**6.** i. What does the term " stage conventions" mean to you? (05 marks.)
ii. Note some conventions of the Greek stage. (05 marks.)
iii. Note some conventions of the Elizabethan stage (05 marks.)

***

# (59) Drama and Theatre (English)

## Practical Test

★ The examination consists of two sections:

**Part A - Acting** *75 marks*
**Part B - Oral** *25 marks*

**Part A - Acting**
**Time: 30 minutes**
Each candidate will appear alone before the Board of Evaluation.
Marks will be allotted under the headings given below.

A .1. *Presentation of a song/ lyric from a play or a piece of dialogue.* (10 marks)
Presenting a song / lyric from a nadagam/ nurti/modern play with appropriate gestures (3-5 minutes)

A .2. *A monologue or soliloquy* (10 marks)
Presentation of a monologue or soliloquy from a prescribed play in the appropriate tempo. (3-5 minutes)

A .3. *Mime* (15 marks)
Presenting a one-person performance on a subject given by the Board of Evaluation a few minutes earlier. Without using the resources of a voice, a situation has to be created.
*Situation*
E.g. (i) Watching a thrilling cricket match on television in the company of others.
(ii) Crossing a road in thick traffic.
(iii) A solider in action in a battlefield. (3-5 minutes)

A .4. *Portraying characters from the prescribed plays.* (20 marks)
Candidates have to portray two characters from the prescribed plays.
Candidates are free to select one character while the other will be assigned to the candidates by the Board of Evaluation. Time for each portrayal - (3-5 minutes)
Each portrayal will carry 10 marks (10 x 2 = 20 marks)

A 5. *Improvisation* (20 marks)
Candidates should perform a subject given them a few minutes earlier by the Board of Evaluation. (3-5 minutes)
Using the resources of voice and body, each candidate should create a dramatic situation.
*Situations*
E.g. (i) Participating in an open air musical show as a member of the audience.
(ii) A politician addressing a meeting during an election .
(iii) Bargaining at a Sunday Fair.

**Part B - Oral**

Time: 10 minutes
Candidates will be asked 5 question: each questions carries 5 marks (5x5 = 25 marks maximum).
Candidates will be tested on drama production on the basis of one question each under five headings.

1. Drama Production/Direction
2. Stage Lighting
3. Drama Music
4. Stage Decor/Stage Management
5. Make Up

B1. *Drama Production/Direction*
E.g. Would you consider drama production as team work ?

B2. *Stage Lighting*
E.g. How important is lighting in staging a realistic play in Sinhala **or** Tamil **or** English?

B3. *Drama Music*
E.g. What are the possible functions of music in drama production?

B4. *Stage Decor/Stage Management*
E.g. (i) How important is stage decor in a realistic play in Sinhala **or** Tamil **or** English ?
(ii) How important is the contribution of a stage manager to the success of a performance?

B5. *Make-Up*
E.g. (i) How important is make-up in projecting a male **or** female character?

ඇමුණුම **01**

# චක්‍රලේඛ අංක - 2016/13

# අ.පො.ස.(උ.පෙළ) විෂය සංයෝජන හා
# විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන

අධ්‍යාපන අමාත්‍යාංශය
“ඉසුරුපාය”, බත්තරමුල්ල

චක්‍රලේඛ අංක : 2016/13

මගේ අංකය : ඊඩී/01/12/02/06/02-(I)
පාසල් කටයුතු ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය" බත්තරමුල්ල.
2016.04.26

පළාත් ප්‍රධාන ලේකම්වරු,
පළාත් අධ්‍යාපන ලේකම්වරු,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල් ප්‍රධානීන් වෙත.

# අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන

අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2009.05.18 දිනැති අංක 2009/16 දරන චක්‍රලේඛය හා 2010.04.21 දිනැති අංක 2009/16 (I) චක්‍රලේඛ සංශෝධනය හා ඊට අදාළ ව නිකුත් කර ඇති 2013.06.11 දිනැති චක්‍රලේඛ ලිපියේ සියලු විධිවිධාන අභිබවා 2016 වර්ෂයේ හා ඉන්පසුව 12 වන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන බල පැවැත්වේ.

**2.0** අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත්වන සිසුන් විසින් අ.පො.ස. (උසස් පෙළ) පන්තියේ දී හැදෑරීමට අපේක්ෂිත විෂය ධාරා තෝරා ගැනීමේ දී විෂයයන් හෝ විෂය සංයෝජන පිළිබඳ නිසි ආකාරව අවබෝධයක් නොමැති බැවින් ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ. තව ද විශ්වවිද්‍යාලවල දැනට ක්‍රියාත්මක වන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා අවශ්‍ය වන විෂය සංයෝජන පිළිබඳව ද සිසුන්ට නිසි අවබෝධයක් නොමැති බැවින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ දී නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුව ඇත. මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා ත් සිසුන්ට මග පෙන්වීම සඳහා ත් අදාළ වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ. එම නිසා මෙම චක්‍රලේඛයේ සඳහන් අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා වන විෂය සංයෝජන පිළිබඳ 12 ශ්‍රේණියට ඇතුළත්වන සියලුම සිසුන් දැනුවත් කිරීමට විදුහල්පතිවරුන් වග බලා ගත යුතු ය.

**3.0** අ.පො.ස. (උසස් පෙළ) පංතිවල ප්‍රධාන විෂයයන් තුනක් ඉගැන්වෙන අතර, එක් විෂයක් සඳහා සතියකට කාලච්ඡේද 10ක් වෙන් කෙරේ. ඒ අනුව, එම නිර්දේශිත ප්‍රධාන විෂයයන් 03 සඳහා කාලච්ඡේද 30ක් වැය වේ. ඉතිරි කාලච්ඡේද 10න් 06ක් සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා වෙන් කළ යුතු අතර, සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විෂය සඳහා 12 ශ්‍රේණියේ පමණක් කාලච්ඡේද 02ක් වෙන් කළ යුතු ය. 12 ශ්‍රේණියේ ඉතිරි කාලච්ඡේද 02 ද 13 වන ශ්‍රේණියේ ඉතිරි කාලච්ඡේද 04 ද පාසල් කළමනාකරණ කණ්ඩායමේ අභිමතය පරිදි සිසුන්ගේ අධ්‍යාපන දියුණුවට අදාළ වන ආකාරයෙන් යොදා ගත යුතු වේ.

**4.0** නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇති සිසුන් 13 වන ශ්‍රේණියේ අවසානයේ දී ප්‍රධාන විෂයයන් 03 සමග සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා විභාගයට පෙනී සිටිය යුතු ය. සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ලබාගන්නා ලකුණු හෝ සාමර්ථ්‍යය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කර ගනු නොලැබේ. එහෙත් එම විෂය සඳහා ලබා ගන්නා ප්‍රතිඵලය අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල සහතිකයේ සටහන් කෙරේ.

## 5.0 අ.පො.ස. (උසස් පෙළ) විෂයධාරා සඳහා විෂය සංයෝජන

පාසල්වල දැනට අ.පො.ස.(උසස් පෙළ) පන්ති සඳහා අංශ තුනක් යටතේ (කලා/වාණිජ්‍යය, විද්‍යා, තාක්ෂණවේදය) විෂය ධාරා හයක් (6) ක්‍රියාත්මක කෙරේ.

### 5.1 කලා විෂය ධාරාව

ශිෂ්‍යයන් කලා විෂය ධාරාව යටතේ අධ්‍යාපනය ලැබීම සඳහා පහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව විෂය සංයෝජන තෝරා ගත යුතු ය.

5.1.1 පහත දැක්වෙන සමාජයීය විද්‍යාව/ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂය කාණ්ඩයෙන් (5.1.6 හි අ) අවම වශයෙන් එක් විෂයයක් තෝරා ගත යුතු ය. (භාෂා විෂයයන් 2ක් හෝ ජාතික භාෂා තුනම හෝ තෝරා ගන්නා සිසුන්ට මෙය අදාළ නොවේ.) ශිෂ්‍යයාගේ මනාපය අනුව, මේ කාණ්ඩයෙන් විෂයයන් දෙකක් හෝ තුනම හෝ තෝරා ගත හැකි ය.

5.1.2 පහත දැක්වෙන ආගම් හා ශිෂ්ටාචාර විෂයයන් (5.1.6හි ආ) අතුරින් යම් ආගමක් තෝරා ගන්නේ නම්, ඊට අදාළ ශිෂ්ටාචාර විෂය තෝරා ගත නොහැකි ය.

5.1.3 පහත දැක්වෙන සෞන්දර්ය අධ්‍යයන විෂයයන් (5.1.6හි ඇ) අතුරින්, විෂයක් හෝ දෙකක් හෝ තෝරා ගත හැකි ය.

5.1.4 පහත දැක්වෙන භාෂා විෂයය කාණ්ඩයේ (5.1.6හි ඈ) දැක්වෙන භාෂා විෂයයන්ගෙන් ඕනෑම භාෂා විෂයක් හෝ විෂයයන් 2ක් හෝ තෝරාගත හැකි ය. එහෙත්, විෂයයන් තුනම භාෂා විෂයයන්ගෙන් තෝරා ගන්නේ නම්, පහත සඳහන් ආකාරයට ම පමණක් විය යුතු ය.

- 5.1.6 (ඈ) (1)හි සඳහන් විෂයයන් 3ම,
- 5.1.6 (ඈ) හි (1) හා (2) යන උපකාණ්ඩ දෙකෙන් පමණක් වන පරිදි විෂයයන් තුනක්.

5.1.5 භාෂා විෂයයන් දෙකක් තෝරාගන්නා ශිෂ්‍යයකුට සිය තුන්වන විෂයය වශයෙන් සමාජයීය විද්‍යා/ව්‍යවහාරික සමාජ අධ්‍යයන, ආගම් හා ශිෂ්ටාචාර, සෞන්දර්ය අධ්‍යයන යන විෂය කාණ්ඩවලින් කැමති විෂයක් තෝරා ගත හැකි ය.

**5.1.6 කලා විෂය ධාරාව සඳහා විෂයය කාණ්ඩ**

**(අ) සමාජයීය විද්‍යා/ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂයයන්**

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ඉතිහාසය(ලංකා ඉතිහාසය සමග ඉන්දීය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ නූතන ලෝක ඉතිහාසය)
4. ගෘහ ආර්ථික විද්‍යාව
5. දේශපාලන විද්‍යාව
6. තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
7. ගිණුම්කරණය හෝ ව්‍යාපාර සංඛ්‍යානය
8. කෘෂි විද්‍යාව හෝ ගණිතය හෝ සංයුක්ත ගණිතය

9. තාක්ෂණවේදය විෂයයන්ගෙන් එක් විෂයක් (සිවිල් තාක්ෂණවේදය හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය හෝ විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය හෝ ආහාර හා තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය)
10. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**(ආ) ආගම් හා ශිෂ්ටාචාර විෂයයන්**

1. බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය
2. ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
3. හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය
4. ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය
5. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය

**(ඇ) සෞන්දර්ය අධ්‍යයන විෂයයන්**

1. චිත්‍ර කලාව
2. නර්තනය (දේශීය හෝ භරත)
3. සංගීතය (පෙරදිග හෝ කර්ණාටක හෝ බටහිර)
4. නාට්‍ය හා රංග කලාව (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි)

**(ඈ) භාෂා විෂයයන්**

1. සිංහල, දෙමළ, ඉංග්‍රීසි
2. අරාබි, පාලි, සංස්කෘත
3. චීන, මැලේ, ප්‍රංශ, ජර්මන්, රුසියන්, හින්දි, ජපන්

**5.2. වාණිජ්‍යය විෂය ධාරාව**

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් තෝරා ගත යුතු ය.

1. ගිණුම්කරණය
2. ව්‍යාපාර අධ්‍යයනය
3. ආර්ථික විද්‍යාව

ඉතිරි විෂය පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරා ගත යුතුය.

1. ව්‍යාපාර සංඛ්‍යානය
2. භූගෝල විද්‍යාව
3. දේශපාලන විද්‍යාව
4. ඉතිහාසය (ලංකා ඉතිහාසය සමග ඉන්දීය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ නූතන ලෝක ඉතිහාසය)
5. තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
6. ඉංග්‍රීසි
7. ජර්මන්
8. ප්‍රංශ
9. කෘෂි විද්‍යාව
10. සංයුක්ත ගණිතය හෝ ගණිතය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

5.3. ජෛවීය විද්‍යා විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් ජීව විද්‍යාව සමඟ පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් 2ක් තෝරා ගත යුතු ය.

1. රසායන විද්‍යාව
2. භෞතික විද්‍යාව
3. කෘෂි විද්‍යාව
4. ගණිතය

5.4. භෞතීය විද්‍යා විෂයධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් තුනක් තෝරා ගත යුතුය.

1. සංයුක්ත ගණිතය
2. රසායන විද්‍යාව
3. භෞතික විද්‍යාව
4. උසස් ගණිතය

5.5. ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයධාරාව

මෙම විෂය ධාරාව හදාරනු ලබන සිසුන් පහත සඳහන් විෂයයන් අනිවාර්යයෙන් තෝරා ගත යුතු ය.

1. ජෛව පද්ධති තාක්ෂණවේදය
2. තාක්ෂණවේදය සඳහා විද්‍යාව

තුන් වන විෂය පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරා ගත යුතු ය.

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ගෘහ ආර්ථික විද්‍යාව
4. ඉංග්‍රීසි
5. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
7. චිත්‍ර කලාව
8. ව්‍යාපාර අධ්‍යයනය
9. කෘෂි විද්‍යාව
10. ශිල්පීකරණය
11. ගණිතය

5.6 ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව

මෙම විෂය ධාරාව හදාරනු ලබන සිසුන් පහත සඳහන් විෂයයන් අනිවාර්යයෙන් තෝරා ගත යුතු ය.

1. ඉංජිනේරු තාක්ෂණවේදය
2. තාක්ෂණවේදය සඳහා විද්‍යාව

තුන් වන විෂය පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරා ගත යුතු ය.

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ගෘහ ආර්ථික විද්‍යාව
4. ඉංග්‍රීසි
5. සන්නිවේනය හා මාධ්‍ය අධ්‍යයනය
6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
7. චිත්‍ර කලාව
8. ව්‍යාපාර අධ්‍යයනය
9. කෘෂි විද්‍යාව
10. ගිණුම්කරණය
11. ගණිතය

6.0 ඉහත සඳහන් පරිදි විෂය ධාරාවන් යටතේ අදාළ විෂය සංයෝජන තෝරා ගත යුතු ය. එහෙත් අදාළ පාසලේ ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටී නම් හා කාලසටහන ලබාදීමටත්, පහසුකම් සැපයීමටත් හැකියාව ඇති විෂයයන් සඳහා පමණක් තමන්ට කැමති විෂයයන් සහිත විෂය සංයෝජනයක් තෝරා ගැනීමේ ඉඩකඩ සිසුනට ලබා දිය හැකි ය. එසේ වුව ද විෂයයන් අතුරින් "හෝ" යනුවෙන් සඳහන් කර ඇත්නම් ඉන් එක් විෂයයක් පමණක් තෝරාගත යුතු ය. මෙසේ විෂයයන් තෝරා ගන්නා සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී තෝරා ගත යුතු පාඨමාලා පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දිය යුතු ය.

7.0 සම්මත විෂය ධාරාවලට අනුගත නොවන වෙනත්, විෂය සංකලනයන් තෝරා ගත් අවස්ථාවක දී අයදුම්කරුවන් **"නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන"** යනුවෙන් හඳුන්වා දෙන අතර, විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දී "දිවයින තරාව" (Island Rank) හා "දිස්ත්‍රික් තරාව"(District Rank) නිකුත් කරනු නොලැබේ.

8.0 අ.පො.ස (උසස් පෙළ) සඳහා වන සියලුම විෂයයන් සිංහල හා දෙමළ යන මාධ්‍යයන් වලින් ඉගැන්වෙන අතර පහත සඳහන් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද ඉගැන්විය හැකි ය.

1. ජීව විද්‍යාව
2. භෞතික විද්‍යාව
3. රසායන විද්‍යාව
4. සංයුක්ත ගණිතය
5. කෘෂි විද්‍යාව
6. ගිණුම්කරණය
7. ව්‍යාපාර අධ්‍යයනය
8. ආර්ථික විද්‍යාව
9. දේශපාලන විද්‍යාව
10. භූගෝල විද්‍යාව

මීට අමතරව ඉංග්‍රීසි මාධ්‍යයෙන් වෙනත් විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය වේ නම් හා ඊට අදාළ සම්පත් ඇත්නම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉගැන්විය හැකි ය.

## 9.0 විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා සඳහා විෂය සංයෝජන

9.1 විශ්වවිද්‍යාල මගින් පවත්වනු ලබන ප්‍රථම උපාධි පාඨමාලාවන්ට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යයන් විසින් අ.පො.ස. (උසස් පෙළ) දී හදාරා තිබිය යුතු විෂය සංයෝජන පහත දැක්වේ. විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා මූලික සුදුසුකම් වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අදාළ ප්‍රධාන විෂයයන් තුනෙන් ම සමත් වී තිබිය යුතු අතර, සාමාන්‍ය පොදු පරීක්ෂණයේ දී අවශ්‍යවන ලකුණු ප්‍රමාණය ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. එහෙත් විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා පදනම හා ඇතුළත් කර ගත හැකි සංඛ්‍යාව අනුව මූලික සුදුසුකම් ලබාගත් අය අතුරින් තෝරා ගැනීමේ කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

9.2 පහත සඳහන් කරනුයේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නියම කර ඇති අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන පමණි. ඊට අදාළ වැඩි විස්තර අවශ්‍යවන්නේ නම්, ඒ ඒ අධ්‍යයන වර්ෂ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත් කරන **"ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය"** නම් අත් පොත පරිශීලනය කළ යුතු ය.

(1) කලා (ARTS)

කලා විෂය ධාරාව යටතේ දී ඇති කොන්දේසිවලට අනුව තෝරා ගත් විෂයයන් 03ක්

(2) කලා (ශ්‍රීපාලි මණ්ඩපය) - (ARTS - SRIPALI CAMPUS)

පහත සඳහන් කොන්දේසිවලට අනුව කලා විෂය ධාරාව යටතේ ලබා දී ඇති විෂයයන් 03ක්

- භාෂා විෂයයන් දෙකකට වඩා පෙනී නොසිටිය යුතු ය.
- ආගම් හා ශිෂ්ටාචාර විෂය කාණ්ඩයෙන් එක් විෂයයකට වඩා පෙනී නොසිටිය යුතු ය.
- තාක්ෂණවේදය විෂයයන් එකකට වඩා පෙනී නොසිටිය යුතු ය.
- පහත සඳහන් විෂයයන්ගෙන් එකකට වඩා පෙනී නොසිටිය යුතු ය.

  (i) ගිණුම්කරණය
  (ii) ව්‍යාපාර සංඛ්‍යානය
  (iii) ආර්ථික විද්‍යාව

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් තිබිය යුතු අතර, යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(3) කලා (සබරගමුව) - (ARTS - SABARAGAMUWA)

කලා, වාණිජ්‍යය යන කුමන හෝ විෂයධාරාවක් යටතේ තෝරා ගත් විෂයයන් 03ක්

(4) සන්නිවේදන අධ්‍යයනය (COMMUNICATION STUDIES)

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිත ව ඕනෑම විෂයයන් 03ක්

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් තිබිය යුතු ය.

(5) සාමය හා ගැටුම් නිරාකරණය (PEACE & CONFLICT RESOLUTION)

ඕනෑම විෂයයන් තුනක්

(6) ඉස්ලාම් අධ්‍යයනය (ISLAMIC STUDIES)

අවම වශයෙන් ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය විෂයය සමග වෙනත් ඕනෑම විෂයයන් දෙකක්

(7) අරාබි භාෂාව (ARABIC LANGUAGE)

අරාබි භාෂාව සමග වෙනත් ඕනෑම විෂයයන් දෙකක්

(8) සංගීතය/නර්තනය /චිත්‍ර හා නිර්මාණ/නාට්‍ය හා රංග කලාව/දෘශ්‍ය හා තාක්ෂණික කලා/දෘශ්‍ය කලා
(MUSIC/DANCING/ART & DESIGN/DRAMA & THEATRE/VISUAL & TECHNOLOGICAL ARTS/VISUAL ARTS)

හැදෑරීමට අපේක්ෂිත පාඨමාලාවට අදාළ විෂය (සංගීතය/නර්තනය/චිත්‍ර/නාට්‍ය හා රංග කලාව) සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහ අනිකුත් ඕනෑම විෂයයන් දෙකක්

මෙයට අමතරව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(9) කළමනාකරණය/කළමනාකරණය (රාජ්‍ය) විශේෂ/දේපල කළමනාකරණය සහ තක්සේරුකරණය/වාණිජ්‍යය
(MANAGEMENT/MANAGEMENT (PUBLIC)SPECIAL/ESTATE MANAGEMENT & VALUATION/COMMERCE)

ඉහත පාඨමාලා සඳහා පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

(i) ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව හා ගිණුම්කරණය

හෝ

(ii) අවම වශයෙන් ඉහත (i) හි සඳහන් විෂයයන් දෙකක් සහ පහත සඳහන් විෂයයන් අතුරින් තෝරාගත් එක් විෂයයක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | භූගෝල විද්‍යාව | ඉංග්‍රීසි |
| සංයුක්ත ගණිතය හෝ ගණිතය | භෞතික විද්‍යාව | ඉතිහාසය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ව්‍යාපාර සංඛ්‍යානය | ජර්මන් |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | දේශපාලන විද්‍යාව | ප්‍රංශ |

(10) කළමනාකරණ අධ්‍යයන (ත්‍රිකුණාමලය සහ වව්නියාව) -
(MANAGEMENT STUDIES TRINCOMALEE & VAVUNIA)

ඕනෑම විෂය ධාරාවක් යටතේ, ඕනෑම විෂයයන් තුනක්

(11) ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BUSINESS INFORMATION SYSTEMS) (SPECIAL)

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ව්‍යාපාර අධ්‍යයනය | ආර්ථික විද්‍යාව |

ඉහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් සමග පහත සඳහන් විෂයයන්ගෙන් එකක්

| | |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| සංයුක්ත ගණිතය හෝ ගණිතය | ව්‍යාපාර සංඛ්‍යානය |
| භෞතික විද්‍යාව | |

(12) වෛද්‍ය විද්‍යාව/දන්ත ශල්‍ය විද්‍යාව/පශු වෛද්‍ය විද්‍යාව
(MEDICINE/DENTAL SURGERY/VETERINARY SCIENCE)

පහත සඳහන් විෂයයන් තුනම

ජීව විද්‍යාව රසායන විද්‍යාව භෞතික විද්‍යාව

(13) **කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය**
**(AGRICULTURAL TECHNOLOGY & MANAGEMENT)**
පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

(i) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
(ii) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ගණිතය, ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(iii) රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හෝ ගණිතය

(14) **කෘෂිකර්මය** (AGRICULTURE)
ඉහත සඳහන් කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න)

(15) **ආහාර විද්‍යාව හා පෝෂණය** (FOOD SCIENCE & NUTRITION)

ඉහත සඳහන් කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න)

(16) **ආහාර විද්‍යාව හා තාක්ෂණය** (FOOD SCIENCE & TECHNOLOGY)

රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

(17) **ආයුර්වේද/යුනානි/සිද්ධ වෛද්‍ය** (AYURVEDA/UNANI/SIDDHA)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනම

(18) **ජෛවීය විද්‍යාව** (BIOLOGICAL SCIENCE)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයක්

කෘෂි විද්‍යාව ගණිතය හෝ සංයුක්ත ගණිතය
උසස් ගණිතය භෞතික විද්‍යාව

(19) **ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා)** (APPLIED SCIENCE - BIOLOGICAL SCIENCE)

ඉහත සඳහන් ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා දක්වා ඇති විෂය සංයෝජන (අංක 18 බලන්න

(20) **සෞඛ්‍ය ප්‍රවර්ධන** (HEALTH PROMOTION)

ඉහත සඳහන් ජෛවීය විද්‍යාව පාඨමාලාව සඳහා දක්වා ඇති විෂය සංයෝජන (අංක 18 බලන්න

(21) හෙද (NURSING)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනම
අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(22) ඖෂධ විද්‍යාව (PHARMACY)

රසායන විද්‍යාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම
අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(23) වෛද්‍ය රසායනාගාර විද්‍යා (MEDICAL LABORATORY SCIENCES)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(24) විකිරණ ශිල්පය (RADIOGRAPHY)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(25) භෞත චිකිත්ස (PHYSIOTHERAPY)

භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

ජීව විද්‍යාව සංයුක්ත ගණිතය උසස් ගණිතය ගණිතය

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(26) අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව
(MOLECULAR BIOLOGY & BIOCHEMISTRY)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

(27) ධීවර සහ සාගර විද්‍යාව (FISHERIES & MARINE SCIENCES)

අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව පාඨමාලාව සඳහා වූ විෂය සංයෝජනය (අංක 26 බලන්න.)

(28) පරිසර සංරක්ෂණය හා කළමණාකරණය (ENVIRONMENTAL CONSERVATION & MANAGEMENT)

ජීව විද්‍යාව හා රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්
භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය
කෘෂි විද්‍යාව ගණිතය

(29) සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව (ANIMAL SCIENCE & FISHERIES)

පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

i. රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ භෞතික විද්‍යාව
ii. රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව

(30) ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය (FOOD PRODUCTION & TECHNOLOGY MANAGEMENT)

කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න.)

(31) ඉංජිනේරු විද්‍යාව (ENGINEERING)

පහත දැක්වෙන විෂයයන් තුනම

| | | |
|---|---|---|
| රසායන විද්‍යාව | සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව |

(32) ඉංජිනේරු විද්‍යාව (EM) - භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව
(ENGINEERING) (EM)- (EARTH RESOURCES ENGINEERING)

ඉංජිනේරු විද්‍යාව පාඨමාලාවට අදාළ වූ විෂය සංයෝජනය (අංක 31 බලන්න)

(33) ඉංජිනේරු විද්‍යාව (TM) - පේෂකර්ම හා රෙදිපිළි තාක්ෂණය
(ENGINEERING) (TM) - (TEXTILE & CLOTHING TECHNOLOGY)

ඉංජිනේරු විද්‍යාව පාඨමාලාවට අදාළ වූ විෂය සංයෝජනය (අංක 31 බලන්න)

(34) භෞතීය විද්‍යාව (PHYSICAL SCIENCE)

සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය සහ රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව ඇතුළුව පහත සඳහන් විෂයයන්ගෙන් විෂයයන් තුනක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |

(35) පරිගණක විද්‍යාව (COMPUTER SCIENCE)

සංයුක්ත ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකකට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව පහත සඳහන් විෂයයන් අතුරින් තුනක්

| | | |
|---|---|---|
| සංයුක්ත ගණිතය හෝ ගණිතය | උසස් ගණිතය | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | භෞතික විද්‍යාව | |

(36) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
(INFORMATION & COMMUNICATION TECHNOLOGY)

පහත සඳහන් විෂයයන්ගෙන් එකකට සම්මාන (C) සාමර්ථ්‍යයක් සමග ඕනෑම විෂයයන් තුනක්

| | |
|---|---|
| උසස් ගණිතය | ජීව විද්‍යාව |
| ගණිතය හෝ සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව |
| ගිණුම්කරණය | රසායන විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| ව්‍යාපාර අධ්‍යයනය | සිවිල් තාක්ෂණවේදය |
| භූගෝල විද්‍යාව | යාන්ත්‍රික තාක්ෂණවේදය |
| ආර්ථික විද්‍යාව | විදුලිය ඉලෙක්ට්‍රෝනික සහ තොරතුරු තාක්ෂණවේදය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | සංගීතය (පෙරදිග හෝ කර්ණාටක හෝ බටහිර) |
| | සංස්කෘත |

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

මෙයට අමතර ව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(37) ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා)
(APPLIED SCIENCES/PHYSICAL SCIENCE)

සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය සහ රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව ඇතුළුව පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | උසස් ගණිතය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව |
| රසායන විද්‍යාව | | |

(38) ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය
(TRANSPORT & LOGISTIC MANAGEMENT)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය යන විෂයයන් තුනම

(39) කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය
(INDUSTRIAL STATISTICS & MATHEMATICAL FINANCE)

සංයුක්ත ගණිතය සමග පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් දෙකක්

උසස් ගණිතය    භෞතික විද්‍යාව    රසායන විද්‍යාව

(40) සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ
(STATISTICS & OPERATIONS RESEARCH)

සංයුක්ත ගණිතය සමග පහත දැක්වෙන විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | උසස් ගණිතය |
| රසායන විද්‍යාව | කෘෂි විද්‍යාව | ගණිතය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

(41) ආගනණය සහ තොරතුරු පද්ධති (COMPUTING & INFORMATION SYSTEMS)

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකක් සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් සහ පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් දෙකක්

සංයුක්ත ගණිතය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

(42) තොරතුරු තාක්ෂණය (INFORMATION TECHNOLOGY- IT)

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව අනිකුත් ඕනෑම විෂයයන් දෙකක්

උසස් ගණිතය
ගණිතය
සංයුක්ත ගණිතය
භෞතික විද්‍යාව

(43) කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (MANAGEMENT & INFORMATION TECHNOLOGY - MIT)

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී උසස් ගණිතය, සංයුක්ත ගණිතය, ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිතව

(i) ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් තුනකින් සමත් වීම

හෝ

(ii) ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් දෙකක් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂය සමත් වීම

මෙයට අමතරව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(44) ප්‍රමාණ සමීක්ෂණය (QUANTITY SURVEYING)

සංයුක්ත ගණිතය, උසස් ගණිතය යන විෂයයන් අතුරෙන් අවම වශයෙන් එක් විෂයයක්

සහ

පහත දැක්වෙන විෂයයන් අතුරෙන් එක් විෂයයක් හෝ විෂයයන් දෙකක්

ගිණුම්කරණය
ව්‍යාපාර සංඛ්‍යානය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ගණිතය හා ඉංග්‍රීසි විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්ද විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් ද ලබා තිබිය යුතු ය.

(45) මැනුම් විද්‍යාව (SURVEYING SCIENCE)

භෞතික විද්‍යාව, සංයුත්ක ගණිතය සමග වෙනත් ඕනෑම විෂයයක්

## (46) නගර හා ග්‍රාම නිර්මාණය (TOWN & COUNTRY PLANNING)

(i) පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | රසායන විද්‍යාව | උසස් ගණිතය |
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ජීව විද්‍යාව | ආර්ථික විද්‍යාව | දේශපාලන විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | ගණිතය | භෞතික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | භූගෝල විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |

(ii) තෙවන විෂය පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

| | | |
|---|---|---|
| අරාබි | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | මැලේ |
| බුද්ධ ධර්මය | ගෘහ ආර්ථික විද්‍යාව | පාලි |
| බෞද්ධ ශිෂ්ටාචාරය | හින්දි | රුසියන් |
| ක්‍රිස්තු ධර්මය | හින්දු ධර්මය | සංස්කෘත |
| චීන | හින්දු ශිෂ්ටාචාරය | සිංහල |
| ඉංග්‍රීසි | ඉතිහාසය | දෙමළ |
| ප්‍රංශ | ඉස්ලාම් | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය |
| ජර්මන් | ඉස්ලාම් ශිෂ්ටාචාරය | ජපන් |
| චිත්‍ර කලාව | | |

මෙයට අමතරව, අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම පිණිස 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් ඉහත (i) කාණ්ඩය යටතේ ඇති විෂයයන්ගෙන් විෂයයන් තුනක් සමත් විය යුතුය.

එසේම 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට අයදුම්කරුවන් විසින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් (B) සාමර්ථ්‍යයක් හා ගණිතය විෂයට සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

## (47) වාස්තු විද්‍යාව (ARCHITECTURE)

(i) පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයක්

| | | |
|---|---|---|
| චිත්‍ර කලාව | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | | |

සහ

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් තවත් එක් විෂයයක් හෝ විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| හින්දු ශිෂ්ටාචාරය | බෞද්ධ ශිෂ්ටාචාරය | ඉතිහාසය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | චීන | ජපන් |

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ආර්ථික විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | ගණිතය | පාලි |
| ඉංග්‍රීසි | සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ජර්මන් |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | කෘෂි විද්‍යාව | දෙමළ |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | | |

මෙයට අමතරව පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරාලිය යුතු ය.

(අ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(ආ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

මෙයට අමතරව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

## (48) නිර්මාණවේදය (DESIGN)

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනක්.
මෙයට අමතරව පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරාලිය යුතු ය.

(අ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්
(ආ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

තව ද , 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අයදුම්කරුවන් විසින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් හා ගණිතය හා විද්‍යාව විෂයයන් සඳහා සම්මාන (C) සාමර්ථ්‍යක් ලබා තිබිය යුතු ය.

මෙයට අමතරව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතුයි.

## (49) විලාසිතා නිර්මාණ සහ නිපැයුම් ප්‍රවර්ධනය (FASHION DESIGN & PRODUCT DEVELOPMENT)

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනක්.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතුය.

මෙයට අමතර ව, විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(50) නීතිය (LAW)

(i) පහත දැක්වෙන විෂයයන්ගෙන් තෝරා ගත් විෂයයන් තුනක්

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| ගණිතය හෝ සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව | ගිණුම්කරණය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

හෝ

ඉහත සඳහන් විෂයයන්ගෙන් එකක් හෝ දෙකක් හෝ සමග පහත දැක්වෙන විෂයයන්ගෙන් ඉතිරි විෂයය හෝ විෂයයන්

| | |
|---|---|
| බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය | හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය |
| ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය |
| ජපන් | චීන |
| පාලි | ඉංග්‍රීසි |
| සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | ජර්මන් |
| දෙමළ | අරාබි |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | |

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(51) පහසුකම් කළමනාකරණය (FACILITIES MANAGEMENT)

සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය සමග පහත සඳහන් විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ව්‍යාපාර සංඛ්‍යානය | භෞතික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ඉංග්‍රීසි හා ගණිතය විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හා විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

(52) පරිගණනය සහ කළමනාකරණය (COMPUTATION & MANAGEMENT)

ආර්ථික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය ඇතුළුව ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක්

(53) කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය (අග්නිදිග විශ්වවිද්‍යාලය) - MANAGEMENT & INFORMATION TECHNOLOGY (SOUTH EASTERN UNIVERSITY)

ඕනෑම විෂයයන් තුනක්

(54) විද්‍යාව හා තාක්ෂණය (SCIENCE & TECHNOLOGY)

ජෛවීය විද්‍යා සහ භෞතීය විද්‍යා පාඨමාලා සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ. (අංක 18 සහ 34 බලන්න)

(55) පරිගණක විද්‍යාව හා තාක්ෂණය (COMPUTER SCIENCE & TECHNOLOGY)

මෙම පාඨමාලාව සඳහා ද ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා සහ ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) පාඨමාලා සඳහා අවශ්‍ය විෂයයන් තුනක් (අංක 18, 34 සහ 37 බලන්න)

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(56) ව්‍යවසායකත්වය සහ කළමනාකරණය (ENTREPRENEURSHIP & MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතරව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(57) සත්ත්ව පාලන විද්‍යාව (ANIMAL SCIENCE)

ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ. (අංක 18 බලන්න.)

(58) අපනයන කෘෂිකර්මය (EXPORT AGRICULTURE)

ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ. (අංක 18 බලන්න)

(59) තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම (TEA TECHNOLOGY & VALUE ADDITION)

පහත සඳහන් විෂය සංයෝජනයකින් එක් විෂය සංයෝජනයක්

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

(60) කාර්මික තොරතුරු තාක්ෂණය (INDUSTRIAL INFORMATION TECHNOLOGY)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(61) ඛණිජ සම්පත් සහ තාක්ෂණය (MINERAL RESOURCES & TECHNOLOGY)

පහත සඳහන් එක් විෂය සංයෝජනයක්

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

(62) ජලජ සම්පත් තාක්ෂණය (AQUATIC RESOURCES TECHNOLOGY)

ජෛවීය විද්‍යා පාඨමාලාවට අදාළ වන විෂයය සංයෝජනය අදාළ වේ. (අංක 18 බලන්න)

(63) තාල සහ ක්ෂීර තාක්ෂණය හා අගය වැඩි කිරීම (PALM & LATEX TECHNOLOGY & VALUE ADDITION)

පහත සඳහන් එක් විෂය සංයෝජනයකින් විෂයයන් තුනක්

(i) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
(ii) සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව

(64) ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය (HOSPITALITY TOURISUM & EVENTS MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(65) ශාරීරික අධ්‍යාපනය (PHYSICAL EDUCATION)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(66) ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය (SPORTS SCIENCE & MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(67) කථන හා ශ්‍රවණ චිකිත්සාව (SPEECH & HEARING THERAPHY)

ජෛවීය විද්‍යාව හෝ භෞතීය විද්‍යාව හෝ කලා විෂය ධාරාවන් යටතේ ඕනෑම විෂයයන් තුනක්

(68) කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය (AGRICULTURAL RESOURCE MANAGEMENT & TECHNOLOGY)

කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂය සංයෝජන (අංක 13 බලන්න)

(69) කෘෂි ව්‍යාපාර කළමනාකරණය (AGRI BUSINESS MANAGEMENT)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

භෞතික විද්‍යාව　　　　කෘෂි විද්‍යාව
ආහාර හා තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය

(70) හරිත තාක්ෂණය (GREEN TECHNOLOGY)

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව
ආහාර හා තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(71) භූමි නිර්මාණවේදය (LANDSCAPE ARCHITECTURE)

(i) පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයක්.

| | | |
|---|---|---|
| චිත්‍ර කලාව | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | කෘෂි විද්‍යාව | |

(ii) පහත සඳහන් විෂයයන් අතුරින් තවත් එක් විෂයයක් හෝ විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| බෞද්ධ ශිෂ්ටාචාරය | ඉතිහාසය | ඉංග්‍රීසි |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ජපන් |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ආර්ථික විද්‍යාව | චීන |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | පාලි |
| දේශපාලන විද්‍යාව | ගණිතය | ප්‍රංශ |
| හින්දු ශිෂ්ටාචාරය | සංස්කෘත | දෙමළ |
| සිංහල | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ජර්මන් |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | ව්‍යාපාර අධ්‍යයනය | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්
(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(72) තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය (INFORMATION TECHNOLOGY & MANAGEMENT)

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් එකකට සම්මාන (C) සාමර්ථ්‍යයක් සහිත ව ඕනෑම විෂයයන් තුනක්

| | | |
|---|---|---|
| උසස් ගණිතය | ගණිතය | ආර්ථික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | ගිණුම්කරණය | භූගෝල විද්‍යාව |
| භෞතික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට හා ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(73) සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය (TOURISM & HOSPITALITY MANAGEMENT)

පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂයය සංයෝජනයක්

(i) වාණිජ්‍යය, ජෛවීය විද්‍යාව සහ භෞතීය විද්‍යා විෂයය ධාරා යටතේ අනුමත විෂයයන් තුනක්

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයක්
ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය

සහ

කලා විෂය ධාරාව යටතේ ඇති අනිකුත් විෂයයන් දෙකක්

(74) තොරතුරු පද්ධති (INFORMATION SYSTEMS)

පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන (C) සාමාර්ථයක් සහිතව ඕනෑම විෂයයන් තුනක්

උසස් ගණිතය
භෞතික විද්‍යාව
ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ජීව විද්‍යාව
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
සිවිල් තාක්ෂණවේදය
විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ගණිතය හෝ සංයුක්ත ගණිතය
රසායන විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
ව්‍යාපාර අධ්‍යයනය
දේශපාලන විද්‍යාව
භූගෝල විද්‍යාව
යාන්ත්‍රික තාක්ෂණවේදය

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට හා ගණිතය විෂයයට සම්මාන (C) සාමර්ථයක් මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(75) මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව (SOFTWARE ENGINEERING)

සංයුක්ත ගණිතය , භෞතික විද්‍යාව යන විෂයයන් සමග පහත දක්වා ඇති විෂයයන්ගෙන් එකක්

රසායන විද්‍යාව    උසස් ගණිතය    තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

(76) පරිවර්තන අධ්‍යයන (TRANSLATION STUDIES)

ඕනෑම විෂයයන් තුනක්
මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(77) සිනමා හා රූපවාහිනී අධ්‍යයන (CINEMA & TELEVISION STUDIES)

ඕනෑම විෂයයන් තුනක්

මෙයට අමතර ව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

(78) ව්‍යාපෘති කළමනාකරණය (PROJECT MANAGEMENT)

ඕනෑම විෂයයන් තුනක්

(79) ඉංජිනේරු තාක්ෂණවේදය (ENGINEERING TECHNOLOGY)

ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන් දෙක සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්

| | |
|---|---|
| ආර්ථික විද්‍යාව | භූගෝල විද්‍යාව |
| ගෘහ ආර්ථික විද්‍යාව | ඉංග්‍රීසි |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| චිත්‍ර කලාව | ව්‍යාපාර අධ්‍යයනය |
| කෘෂි විද්‍යාව | ගිණුම්කරණය |
| ගණිතය | |

(80) ජෛව පද්ධති තාක්ෂණවේදය (BIOSYSTEMS TECHNOLOGY)

ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන් සමග පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයක්

| | |
|---|---|
| ආර්ථික විද්‍යාව | භූගෝල විද්‍යාව |
| ගෘහ ආර්ථික විද්‍යාව | ඉංග්‍රීසි |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| චිත්‍ර කලාව | ව්‍යාපාර අධ්‍යයනය |
| කෘෂි විද්‍යාව | ගිණුම්කරණය |
| ගණිතය | |

(81) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (INFORMATION COMMUNICATION TECHNOLOGY)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමග තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන්

(82) ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම අධ්‍යයන පාඨමාලාව (TEACHING ENGLISH AS A SECOND LANGUAGE) (TESL)

ඉංග්‍රීසි විෂයය ඇතුළුව වෙනත් ඕනෑම විෂයයන් දෙකක්

(83) ආහාර ව්‍යාපාර කළමනාකරණය (FOOD BUSINESS MANAGEMENT)

පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් තුනක්

| | |
|---|---|
| රසායන විද්‍යාව | ජීව විද්‍යාව |
| භෞතික විද්‍යාව | සංයුක්ත ගණිතය |
| කෘෂි විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| ආර්ථික විද්‍යාව | ගණකාධිකරණය |

මෙයට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(84) සාගර සහ මිරිදිය විද්‍යාව (MARINE AND FRESHWATER SCIENCE)

පහත විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

(i) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
(ii) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය

(85) **භෞතීය විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය** (PHYSICAL SCIENCE - ICT)
සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්

**10.0** මෙම චක්‍රලේඛයේ නියමයන්ට අනුව, කටයුතු සිදු කළ යුතු අතර සිසුන් දැනුවත් කිරීමට ද පියවරගනු ඇතැයි අපේක්ෂා කරමි. විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා වන විෂයය සංයෝජනයන්ට අමතර ව පාඨමාලා මාධ්‍යය හා විශ්වවිද්‍යාලය තෝරා ගැනීමේ දී අවශ්‍ය වෙනත් සුදුසුකම් හා අනෙකුත් තොරතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන "**ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය**" නම් ග්‍රන්ථය පරිශීලනය කළ යුතු ය.

ඉදිරියේ දී යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව මෙම චක්‍රලේඛයේ වගන්ති ද සංශෝධනය විය හැකිය.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :-

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති
4. විගණකාධිපති
5. විභාග කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්
8. රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

ඇමුණුම 02


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, **Fax**: 2784846

ඊ මේල්/ஈ – மெயில்/E-mail : isurupaya@moe.gov.lk

எமது இல.

ඔබේ අංකය / உமது இல. / Your No. — ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය

**கல்விஅமைச்சு**

**Ministry of Education**

'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, බත්තරමුල්ල.

'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுரகோட்டை பத்தரமுல்ல

"Isurupaya", SriJayawardhanapuraKotte Battaramulla.

පාසල් කටයුතු ශාඛාව

මගේ අංකය / My No. — ED/01/12/12/05/08

දිනය / திகதி / Date — 2017.06.01


**චක්‍රලේඛ අංක - 23/2017**

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
විදුහල්පතිවරුන්, පරිවේණාධිපතිවරුන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත,

**පාසල පදනම් කර ගත් තක්සේරුකරණය 6 – 13 ශ්‍රේණි සඳහා**
**වර්ෂ 2017 සහ ඉන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම**

අධ්‍යාපනයේ නවීකරණ සහ කාලීන ප්‍රවණතා පාදක කර ගනිමින් වඩාත් ඵලදායී ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බලගැන්වීම අරමුණු කොට පාසල පදනම් කර ගත් තක්සේරුකරණය වර්ෂ 2017 සිට නව මුහුණුවරකින් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩපිළිවෙළ සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පාසල් මඟින් සිදු කරන අතර මෙහෙයවීම හා අධීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වය ඇති ව ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් ඉටු කෙරෙනු ඇත.

2.0 ඒ අනුව, 6-13 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වරින් වර මේ දක්වා නිකුත් කර ඇති සියලු ම චක්‍රලේඛ අභිබවා 2017.06.01 දින සිට පාසල පදනම් කර ගත් තක්සේරුකරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලපැවැත් වේ. ඒ අනුව 2017 වසරේ පැවැත්වෙන අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සිටම මෙම නව චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

3.0 පාසල පදනම් කරගත් තක්සේරුකරණය සම්බන්ධව මේ සමඟ නිකුත් කරන මූලික උපදෙස් සංග්‍රහයට අමතරව වැඩිදුරටත් 6-9 ශ්‍රේණිවලට අදාළ උපදෙස් ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, 10-13 ශ්‍රේණිවලට අදාළ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් ද, ඉදිරියේ දී නිකුත් කරනු ඇත. තව ද මෙම වැඩපිළිවෙලට අදාළ පුහුණු කටයුතු සිදුකිරීමට හා නියාමනය කිරීමට අදාළ

සියලු කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඒකාබද්ධව සිදු කරනු ඇත.

## 4.0 ක්‍රියාත්මක කිරීම

6 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා සියලු ම ශ්‍රේණිවල උගන්වනු ලබන සියලු ම විෂයයන් සඳහා මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ යුතු ය.

6 සිට 13 දක්වා ශ්‍රේණිවල දී සිසුන් ඉගෙනුම ලබන සෑම විෂයයක් සඳහා ම පාසල් වාරයකට එක් තක්සේරුකරණ අවස්ථාවක් බැගින් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වේ. මෙම තක්සේරුකරණ වැඩපිළිවෙළ සිසුන්ගේ පවතින ඉගෙනුම් හැකියා මට්ටම් හඳුනාගෙන ඔවුන්ට අපේක්ෂිත නිපුණතා මට්ටම් අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම පෙරදැරිව ක්‍රියාත්මක කරනු ලබන බැවින් ගුරුවරයාගේ අභිමතය අනුව ඊට වඩා වැඩි තක්සේරුකරණ අවස්ථා ගණනක් වුව ද ක්‍රියාත්මක කළ හැකි ය.

## 5.0 සහතිකකරණය සඳහා අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව:

### 5.1. පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩපිළිවෙළ 6-9 තෙක් ශ්‍රේණි
(වසර අවසාන ප්‍රගති වාර්තාවේ සඳහන් කිරීම සඳහා)

| විෂයය | නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **එක් වාරයක් තුළ** අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 6 ශ්‍රේණිය | 7 ශ්‍රේණිය | 8 ශ්‍රේණිය | 9 ශ්‍රේණිය |
| ආගම (බුද්ධ ධර්මය/ ශෛවනරි/කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය/ ඉස්ලාම්) | 1 | 1 | 1 | 1 |
| සිංහල භාෂාව / දෙමළ භාෂාව | 1 | 1 | 1 | 1 |
| ඉංග්‍රීසි | 1 | 1 | 1 | 1 |
| ගණිතය | 1 | 1 | 1 | 1 |
| විද්‍යාව | 1 | 1 | 1 | 1 |
| ඉතිහාසය | 1 | 1 | 1 | 1 |
| භූගෝල විද්‍යාව | 1 | 1 | 1 | 1 |
| ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | 1 | 1 | 1 | 1 |
| සෞන්දර්ය විෂයයන් | 1 | 1 | 1 | 1 |
| ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | 1 | 1 | 1 | 1 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 1 | 1 | 1 | 1 |
| දෙවන භාෂාව ලෙස සිංහල/ දෙමළ | 1 | 1 | 1 | 1 |

### 5.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සහතිකකරණය සඳහා

10 වන ශ්‍රේණියේ පළමුවන වාරය, දෙවන වාරය සහ තුන්වන වාරයත් 11 වන ශ්‍රේණියේ පළමුවන සහ දෙවන වාරයත් යන වාර 5ක තක්සේරුකරණ ලකුණු, නිපුණතා මට්ටම් තීරණය කිරීම සඳහා යොදා ගනු ලැබේ.

එක් එක් විෂය සඳහා එක් වාරයක් තුළ කළ යුතු තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව සහ අ.පො.ස. (සා.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා 10 සහ 11 ශ්‍රේණිවලින් ලබා ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව පහත වගුවේ දැක් වේ.

| විෂයය | අ.පො.ස.(සා.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **එක් වාරයක් තුළ** අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව | අ.පො.ස.(සා.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **10 හා 11 ශ්‍රේණිවලින්** ලබා ගන්නා **මුළු** තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|
| ආගම | 1 | 5 |
| පළමුවන භාෂාව සහ | 1 | 5 |
| ඉංග්‍රීසි භාෂාව | 1 | 5 |
| ගණිතය | 1 | 5 |
| විද්‍යාව | 1 | 5 |
| ඉතිහාසය | 1 | 5 |
| කාණ්ඩ විෂයය 1 | 1 | 5 |
| කාණ්ඩ විෂයය 2 | 1 | 5 |
| කාණ්ඩ විෂයය 3 | 1 | 5 |

### 5.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සහතිකකරණය සඳහා

12 වන ශ්‍රේණියේ පළමුවන වාරය, දෙවන වාරය සහ තුන්වන වාරයත් 13 වන ශ්‍රේණියේ පළමුවන සහ දෙවන වාරයත් යන වාර 5ක තක්සේරුකරණ ලකුණු හා කණ්ඩායම් ව්‍යාපෘති ලකුණු, නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා යොදා ගනු ලැබේ.

එක් එක් විෂය සඳහා එක් වාරයක් තුළ සිදු කළ යුතු තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව සහ අ.පො.ස. (උ.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා 12 සහ 13 ශ්‍රේණිවලින් ලබා ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව පහත වගුවේ දැක් වේ.

| විෂයය | අ.පො.ස. (උ.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **එක් වාරයක් තුළ** එක් එක් විෂය සඳහා අදාළ කර ගන්නා තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව | අ.පො.ස. (උ.පෙළ) නිපුණතා මට්ටම තීරණය කිරීම සඳහා **12 හා 13 ශ්‍රේණිවලින්** ලබා ගන්නා **මුළු** තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව |
|---|---|---|
| සියලු ම විෂයයන් | 1 | 5 |
| කණ්ඩායම් ව්‍යාපෘති | - | 1 |

මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව වැඩිදුර උපදෙස් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කරනු ලබන අතර එම උපදෙස් අනුව මෙම වැඩපිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු පියවර ඔබ විසින් ගත යුතු ය.

## 6.0 අ.පො.ස. (උ.පෙළ) පන්තිවලට ඇතුළත් වීම සඳහා සාමාන්‍ය සුදුසුකම් යටතේ පාසල පදනම් කර ගත් තක්සේරුකරණ නිපුණතා මට්ටම් යොදා ගැනීම.

2008/17 දරණ චක්‍රලේඛයෙහි 2.1 උපඡේදය හා 2.3 උපඡේදය යටතෙහි දැක්වෙන පරිදි අ.පො.ස. (උ.පෙළ) පන්තිවලට ඇතුළත්වීම සඳහා අවශ්‍ය වන සාමාන්‍ය සුදුසුකම් අවශ්‍යතාව සපුරාලීම සඳහා අ.පො.ස. (සා.පෙළ) ලිඛිත පරීක්ෂණයේ දී විෂයයන් 03 කට අවශ්‍ය සම්මාන සාමාර්ථ තුනෙන් එකක් ලබා නොමැති අවස්ථාවක දී පමණක් අ.පො.ස. (සා.පෙළ) ලිඛිත පරීක්ෂණයෙන් අදාළ විෂයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇත්නම් සහ

එම විෂයටම පාසල පදනම්කර ගත් තක්සේරුකරණ වැඩපිළිවෙළ යටතේ සම්මාන හෝ ඊට ඉහළ නිපුණතා මට්ටමක් ලබා ඇත්නම්, එය එක් සම්මාන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. එහෙත් මෙය මාධ්‍ය භාෂාව හා ගණිතය විෂයයන් සඳහා අදාළ කරගත නොහැක. අ.පො.ස.(සා.පෙළ) විභාගයට දෙවන වරට පෙනී සිට සම්මානයක අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවකුට එයට පෙර වතාවේ පාසල පදනම් කරගත් තක්සේරුකරණය යටතේ වන නිපුණතා මට්ටම් අදාළ පරිදි යොදා ගත හැකි ය.

## 7.0 නියාමනය :

මෙම වැඩපිළිවෙල නියාමනය කිරීම අභ්‍යන්තර හා බාහිර යන ක්‍රම දෙකටම සිදු කළ යුතු ය.

### 7.1. අභ්‍යන්තර නියාමනය

7.1.1 පාසල් මට්ටමේ නියාමනය :

විදුහල්පති , නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන) සහ අංශ ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.

### 7.2. බාහිර නියාමනය

7.2.1. කලාප/කොට්ඨාස මට්ටමේ නියාමනය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගුරු උපදේශකවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.

7.2.2. පළාත් මට්ටමේ නියාමනය

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගුරු උපදේශකවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.

7.2.3. ජාතික මට්ටමේ නියාමනය

අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සිදු කෙරේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -:

1. සභාපති-ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
2. සියලුම අතිරේක ලේකම්වරුන්- අධ්‍යාපන අමාත්‍යාංශය
3. විභාග කොමසාරිස් ජනරාල් - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන පරිපාලන හා විද්‍යාපීඨ ශාඛාව

ඇමුණුම 03


දුරකථන අං./தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte Battaramulla.
පාසල් කටයුතු ශාඛාව


ඔබේ අංකය / உமது இல. / Your No: ..............................

මගේ අංකය / எமது இல. / My No.: ED/01/12/12/05/08/i

දිනය / திகதி / Date: 2017.10. 31

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
.............................. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
..............................................................................

**<u>අ.පො.ස(උ.පෙළ) විභාගයට ප්‍රථම වතාව සඳහා බාහිර අපේක්ෂකයෙකු ලෙස පෙනී සිටීමට බලාපොරොත්තු වන වයස අවුරුදු 21ට අඩු අයදුම්කරුවන් ව්‍යාපෘති හා ඇගයීම් සඳහා ලියාපදිංචි වීම</u>**

අ.පො.ස(උ.පෙළ) විභාගයට ප්‍රථම වතාව සඳහා බාහිර අපේක්ෂකයෙකු ලෙස පෙනී සිටීමට බලාපොරොත්තු වන වයස අවුරුදු 21ට අඩු අයදුම්කරුවන් ව්‍යාපෘති හා ඇගයීම් සඳහා ලියාපදිංචි වීමේ වැඩසටහන 2016 වර්ෂය දක්වා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක කර ඇත.

පාසල පදනම් කරගත් නව තක්සේරුකරණ වැඩපිළිවෙළ යටතේ එම බාහිර අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක නොවන බව කාරුණිකව දන්වමි.

ඒ අනුව උක්ත කාරණය පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

එස්.යූ. විජේරත්න,
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන),
වැ.බ. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන),
අධ්‍යාපන ලේකම් වෙනුවට.